

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயல்திறன் அறிக்கை
Annual Performance Report
2022

වෙළුම I - සාමාන්‍ය අධ්‍යාපනය
இதழ் I - பொதுக் கல்வி
Volume I - General Education



වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2022

අධ්‍යාපන අමාත්‍යාංශය
වැය ශීර්ෂය - 126

- සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය -

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක **02/2020** හි **12.2** ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.

2023 ජූනි

නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව
සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

CM 38339 - 30 (2023/06) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ, තනතුරු හා නිලධාරීන් (2022.12.31 දිනට)

අධ්‍යාපන අමාත්‍ය

ආචාර්ය ඒ.ඩී.සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා

අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය

අරුණාචලම් අරවින්ද් කුමාර් මැතිතුමා

පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය
විජිත බේරුගොඩ මැතිතුමා

උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය
ආචාර්ය සුරේන් රාඝවන් මැතිතුමා

අධ්‍යාපන ලේකම්

එම්.එන්.රණසිංහ මයා

පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත් ප්‍රධාන අංශ හා නිලධාරීන්

අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැලසුම් හා කාර්යසාධන සමාලෝචන) - ආචාර්ය මදුරා එම්. වේහැල්ල මිය

අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) - එච්.යූ.ප්‍රේමතිලක මයා

අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා) - ඩබ්.එම්.එන්.ජේ.පුෂ්පකුමාර මයා

අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) - එස්.ඩී.ලියනගේ මිය

අතිරේක ලේකම් (පාසල් කටයුතු) - ඊ.ඩබ්.එල්.කේ. එගොඩවෙල මිය

අතිරේක ලේකම් (ගුරු ආයතන) - පී.කේ.එස්.සුභෝදිනී මෙය

අතිරේක ලේකම් (පාලන) - පී.එල්.පත්මකුමාර මයා

අතිරේක ලේකම් (අනධ්‍යන හා ඒකාබද්ධ සේවා) - ආර්.බී.ගන්කේවල මිය

අතිරේක ලේකම් (සෞඛ්‍ය හා පෝෂණ, ප්‍රාථමික අධ්‍යාපන හා අධ්‍යාපන සේවා) - වයි.එම්.එම්.එස්.යාපා මයා

අතිරේක ලේකම් (ඉංජිනේරු) - එස්.මහේස්වරන් මයා

ප්‍රධාන මූල්‍ය නිලධාරී I - ඩී.එස්.පද්මසිරි මයා

ප්‍රධාන මූල්‍ය නිලධාරී II - ඩී.එල්.ඒ. විජේනායක මයා

ප්‍රධාන අභ්‍යන්තර විගණක - ඩී.එස්.කේ.ධර්මවර්ධන මිය

පටුන

පරිච්ඡේද 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1	හැඳින්වීම	01
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු	01
1.3	ප්‍රධාන කාර්යයන්	02
1.4	සංවිධාන සටහන	06
1.5	අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන	07
1.6	විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	09

පරිච්ඡේද 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1	විශේෂ ජයග්‍රහණ හා ළඟා කර ගත් ප්‍රගතිය	11
2.2	පවත්නා අභියෝග	45
2.3	ඉදිරි ඉලක්ක	46

පරිච්ඡේද 03 - මූල්‍ය කාර්ය සාධනය

3.1	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	49
3.2	මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	50
3.3	මුදල් ප්‍රවාහ ප්‍රකාශ	54
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	56
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	57
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	57
3.7	මු.රෙ.208 ප්‍රකාරව වෙනත් දෙපාර්තමේන්තු සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	58
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	59
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	60

පරිච්ඡේද 04 - කාර්ය සාධන දර්ශක

4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	79

පරිච්ඡේද 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1	හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු	81
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	83

පරිච්ඡේද 06 - මානව සම්පත් පැතිකඩ

6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	85
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම	85
6.3	මානව සම්පත් සංවර්ධනය	86

පරිච්ඡේද 07 - අනුකූලතා වාර්තාව

7.1	අනුකූලතා වාර්තාව	121

ඇමුණුම - ප්‍රධාන අධ්‍යාපන දත්ත හා දර්ශක 127

01. පරිච්ඡේදය
ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

21වැනි සියවසේ අභියෝග ජයගතහැකි දැනුමෙන් කුසලතාවයන්ගෙන් හා සාරධර්මවලින් පිරිපුන් ශ්‍රී ලාංකික මානව සම්පත නිර්මාණය කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභා ප්‍රතිපත්ති රාමුවට අනුව පළාත් අධ්‍යාපන බලධාරීන්ගේ සහයෝගය ඇතිව දේශයේ අධ්‍යාපන පද්ධතිය මෙහෙයවීම අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරී ඇති සුවිශේෂී කාර්යභාරය වේ. එම කාර්යභාරය අමාත්‍යාංශය පෙර පාසල් අධ්‍යාපනයේ සිට පාසල් අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, තෘතියික හා වෘත්තීය අධ්‍යාපනය මෙන්ම පිරිවෙන් සහ භික්ෂු අධ්‍යාපනය යන විවිධ තල ඔස්සේ ක්‍රියාවට නංවනු ලැබේ.

අධ්‍යාපනයේ සමසාධාරණත්වය සහ ප්‍රවේශය තවදුරටත් තහවුරු කරමින් ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියේ අග්‍රඵලයෙන් නෙලා ගත් දැනුමින් පෝෂිත වූ ශ්‍රී ලාංකේය සමාජයක් බිහි කිරීම සඳහා අනාගත වැඩ ලෝකයට ගැලපෙන පුරවැසියෙකු නිර්මාණය කිරීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශය සිය මෙහෙවර ඉටු කරනු ලැබේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය, මානව හා භෞතික සම්පත් සැපයීම, යටිතල පහසුකම් සැපයීම, පෙළපොත් නිල ඇඳුම්, දිවා ආහාර සහ අනෙකුත් සම්පත් සැපයීම, විධිමත් ඇගයීම් ක්‍රියාවලියක් සහතික කිරීම, ගුරු අධ්‍යාපනය හා ගුරු සංවර්ධනය අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ.

එමෙන් ම අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති සියලු ම දෙපාර්තමේන්තු හා අනුබද්ධිත ආයතනවලට පැවරී ඇති කාර්ය භාරය පිළිබඳ ප්‍රගති සමාලෝචනයට අවශ්‍ය පහසුකම් සැලසීම හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීමක් වේ.

අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන වන ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යන ආයතනවලට පැවරී ඇති පාසල් විෂය මාලා සම්පාදනය, ඇගයීම හා තක්සේරුකරණය, පෙළ පොත් සම්පාදනය යන වගකීම් පිළිබඳ පසු විපරම් කිරීම හා ගුණාත්මක තහවුරුව පවත්වාගෙන යාම ද අමාත්‍යාංශයේ වගකීම ගණයට අයත් වේ.

2022.07.22 දිනැති ගැසට් නිවේදනයට අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්ය භාරය හා අනුබද්ධ ආයතන පිළිබඳ විස්තර **1.3** හා **1.5** ඡේදවලින් දැක්වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, විෂයපථය හා අරමුණු

දැක්ම

ශ්‍රී ලාංකීය අනන්‍යතාවෙහි හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් බිහිකර එමගින් විශ්ව සමාජයේ විශිෂ්ටත්වය කරා එළඹීම.

මෙහෙවර

පාර්ශ්වකරුවන් තෘප්තිමත්භාවයට පත් වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මක තත්ත්වයන් සාක්ෂාත් වන පරිදි නවීකෘත අධ්‍යාපන ප්‍රවේශයන් තුළින් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට අනුගත විය හැකි දක්ෂ පුරවැසි පිරිසක් බිහිකිරීම.

විෂය පථය

දැනුම පදනම් කරගත් සමාජ ආර්ථිකයක් කරා ශ්‍රී ලාංකීය ජනතාව නගා සිටුවීම සඳහා තිරසර ළමා මිතුරු අධ්‍යාපන ක්‍රමෝපායයන් මගින්, පර්යේෂණ හා නවෝත්පාදන පදනම් කරගත් දැනුම, ආකල්ප, කුසලතා සහ නිපුණතාවලින් සපිරි සමබර පෞරුෂ වර්ධනයක් සහිත අනාගත පරපුරක් බිහිකිරීම, මේ වෙනුවෙන් පූර්ව ළමා විය, සාමාන්‍ය අධ්‍යාපන, වෘත්තීය හා තෘතීයික අධ්‍යාපන අවස්ථා විවර කර දීමෙන් ඉහළ තාක්ෂණික හැකියාවෙන් සන්නද්ධ වූ දේශීය විදේශීය රැකියා වෙළඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම.

ආයතනයේ අරමුණු

දැනුම පදනම් කරගත් සමාජීය හා ආර්ථික සංවර්ධන මට්ටමක් කරා ශ්‍රී ලාංකීය ජනතාව නගා සිටුවීම සඳහා, තිරසර අධ්‍යාපන ක්‍රමෝපායයන් තුළින් ළමා මිතුරු, ගුණාත්මක ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන අවස්ථා සහ නවෝත්පාදන පදනම් කරගත් විශිෂ්ට උසස් අධ්‍යාපන අවස්ථා දරු පරපුර වෙත විවෘත කර දීම.

ඒ අනුව පහත සඳහන් සුවිශේෂ අරමුණු ලභා කර ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කරමින් පවතියි.

- සෑම දරුවකුට ම සම සාධාරණ අධ්‍යාපන ප්‍රවේශ සහ සහභාගීත්ව අවස්ථා ලබා දීම.
- සියලු ම දරුවන් සඳහා 21වන ශතවර්ෂයට ගැලපෙන කුසලතා සංවර්ධනය වන පරිදි ගුණාත්මක අධ්‍යාපන අවස්ථා ලබා දීම.
- අධ්‍යාපන පද්ධතියේ යහපැවැත්ම සහ භීමිකාරීත්වය ශක්තිමත් කිරීම තුළින් ගුණාත්මක අධ්‍යාපනය තහවුරු කිරීම.
- සාමය, සමාජ ඒකාග්‍රතාවය, ජාතික සංහිදියාව හා එකමුතු කමින් යුතු සමාජයක් බිහි කිරීම සඳහා අදාළ කුසලතා ලබා දීම.

1.3 ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන්

1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා අධ්‍යාපන විෂයන්ට සහ අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂම ව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.
3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය මැනවින් ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
4. පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්විතියික සහ තෘතීයික අංශ අතර මනා සම්බන්ධතාවයක් ඇතිවන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
5. ගෝලීය අභියෝගයන්ට ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතු ව ශ්‍රී ලාංකික ළමා හා යෞවන පරපුරට ප්‍රවේශවීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම.

6. පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක් ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස්කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම.

7. සෑම දරුවෙකුට ම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහතික කිරීම.

8. විෂය සමගාමී සහ බාහිර ක්‍රියාකාරකම් පාසැල් තුළ ප්‍රචලිත කිරීම.

9. ජාතික පාසැල් සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් සැපයීම.

10. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර සහ පෞද්ගලික පාසැල් නියාමනය කිරීම.

11. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සිසු විනය සහ සදාචාරය මනා අයුරින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම

12. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

13. ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

14. බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටු වන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නහා සිටුවීම.

15. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, විදුහල්පති සේවය සහ ගුරු සේවයේ පරිපාලන සහ අනෙකුත් අධ්‍යාපන සේවාවන්වල පිරිස් කළමනාකරණ කටයුතු කිරීම.

16. පාසල් පුස්තකාල ප්‍රවර්ධනය සහ සංවර්ධනය.

17. පාසල් පෙළ පොත්, නිල ඇඳුම්, වෙනත් ශිෂ්‍ය අවශ්‍යතා සහ පහසුකම් ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.

18. සියලු පාසැල්වල සනීපාරක්ෂක කටයුතු, ළමා මිතුරු පංති කාමර, ගුරුවරුන්ගේ නේවාසික හා විවේකාගාර පහසුකම් ඇතුළු සියළු භෞතික පහසුකම් දියුණු කිරීම.

19. ඉගෙනුම් හා ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා නූතන තාක්ෂණික පහසුකම් යොදාගැනීම, ප්‍රවර්ධනය සහ සංවර්ධනය

20. වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

21. අධ්‍යාපන සුදුසුකම් නොසලකා වෘත්තීය අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථා ඇති කිරීම.

22. දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම.

23. **"One TVET"** සංකල්පය යටතේ විෂයමාලා නවීකරණය කොට අදාල ආයතන ජාලගත කර තාක්ෂණවේදී උපාධි ආයතන බවට පත් කිරීම.

24. පාසැල් අධ්‍යාපනය හැරයාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකි වන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම.

25. ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම.

26. දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූපව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සංශෝධනය කිරීම.

27. වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවන්ට ව්‍යවසායකත්වය, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ අනෙකුත් භාෂා ඇතුළත් කරමින් විෂය මාලා සංශෝධනයක් සිදු කිරීම.

28. ජංගම තාක්ෂණික අධ්‍යාපන සේවා මඟින් වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම.

29. දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ ඉලක්ක කරගත් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

30. රැකියා අවස්ථාවන්ට ගැලපෙන උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතන ලෙස නගර විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට කටයුතු කිරීම.

31. ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම.

32. නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ප්‍රයෝජනයට ගැනීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම.

33. ජාතික නවෝත්පාදන ආයතනය පිහිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

34. විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

35. නව සොයා ගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම.

36. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පරිපාලනයට අයත් රාජ්‍ය විශ්වවිද්‍යාල කළමනාකරණය සහ සංවර්ධනය කිරීම.

37. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇති ව අන්තර්ජාතික ශාස්ත්‍රීය ආයතන සහ වෙනත් සංවිධාන සමඟ අනුබද්ධ වීම හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම.

38. උසස් අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශ මාර්ගයන් පුළුල් කිරීම සඳහා යෝග්‍ය නිර්නායක හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

39. දේශීය විදේශීය රැකියා වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් උපාධිධාරීන් බිහි කිරීම සඳහා සමස්ථ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය තුළ විෂයමාලා සංශෝධනය කිරීම.

40. විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ පර්යේෂණ හා නව නිපැයුම් දිරි ගැන්වීම සඳහා පහසුකම් ඇති කිරීම.

41. සුහුරු අධ්‍යාපන විශ්වවිද්‍යාල ඇති කිරීම සඳහා පියවර ගැනීම.

42. සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම්වල ඉහළ ස්ථානයකට පත්කිරීම සඳහා පියවර ගැනීම.

43. ශ්‍රී ලංකාවේ සුදුසුකම් සහිත සිසුන්ට ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශ වීමට හැකි වන ලෙස ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

44. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෞද්ගලික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන නියාමනය සහ ප්‍රතීතනය කිරීම.

45. බෞද්ධ හා පාලි අධ්‍යාපනය ඉහළ නැංවීම සහ භික්ෂූන් වහන්සේලාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

46. ගෝලීය අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය ම ආවරණය වන ලෙස අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.

47. අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් වන ජනාධිපති කාර්ය සාධක බලකාය හා විශේෂ කමිටුවල නිර්දේශ මහජන කතිකාවතකට යොමු කොට අධ්‍යාපනයේ උන්නතිය සඳහා සුදුසු පරිදි ඒවා ක්‍රියාත්මක කිරීමට වැඩ පිළිවෙලක් සකස් කිරීම.

48. තොරතුරු තාක්ෂණය සම්බන්ධ කරමින් දුරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම.

49. ඵලදායී ඉගැනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බිහිකිරීම, ගුරුවරුන් පුහුණු කිරීම හා ඔවුන්ගේ කුසලතා සංවර්ධනය.

50. අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතනයන් වෙත පැවරී ඇති අනෙකුත් සියලු විෂයන්ට අදාළ කටයුතු කිරීම.

51. අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා සියලු ආයතනයන් අධීක්ෂණය කිරීම.

1.4 අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය (2022.12.31 දිනට අනුමත)



1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන

1. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
2. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
3. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
4. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
5. ගුරු විද්‍යාල
6. ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම
7. ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
8. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව
9. අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල
10. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
11. ජාතික අධ්‍යාපන ආයතන
12. පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය
13. ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය හා අනුබද්ධ ආයතන
14. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
15. ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය (සාගර විශ්වවිද්‍යාලය)
16. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
17. ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු කිරීම් අධිකාරිය
18. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
19. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
20. ජාතික මූලික අධ්‍යයන ආයතනය
21. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
22. ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

23. ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව

24. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

25. ජාතික විද්‍යා පදනම

26. ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය

27. නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

28. ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය

29. සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල

30. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් පිළිබඳ අරමුදල

31. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

32. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජී ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය

33. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝ ටෙක්නොලොජී ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය

34. විද්‍යුතා මධ්‍යස්ථානය

35. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

36. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලු රාජ්‍ය විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන හා අනෙකුත් ආයතන

37. බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය

38. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

39. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

1.6 විදේශාධාර ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

ව්‍යාපෘතිය	ආධාර සපයන ආයතනය	ඇස්තමේන්තුගත සමස්ත ආයෝජනය	ව්‍යාපෘති කාල සීමාව
සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය **(GEMP/ WB)**	ලෝක බැංකුව	ඇ.ඩොලර් මිලියන **85.00 (25%** ජාතික මට්ටමේ ආයතන සඳහා සහ **75%** පළාත් සඳහා)	**2018** අගෝස්තු **– 2024** ජූලි
විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය සංවර්ධනය කිරීම **(GOSL/ JICA)**	**JICA**	රු. මිලියන **1.838**	**2018 - 2024**
UNESCO ක්‍රියාකාරකම්	**UNESCO**	රු. මිලියන **16.95**	වාර්ෂික
UNICEF වැඩසටහන්	**UNICEF**	රු. මිලියන **15**	**2018 - 2022**
තාක්ෂණ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය **(GOSL/ OFID)**	**OFID**	ඇ.ඩොලර් මිලියන **50.0 (**ණය) සහ ඇ. ඩොලර් මිලියන **10.70 (**ලංකා රජය)	**2018** ජූලි **– 2023** සැප්තැම්බර්
ද්විතීයික අධ්‍යාපනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකක ස්ථාපිත කිරීම **(GOSL/ EDCP)**	**The Export-Import (EXIM) Bank of KOREA**	විදේශ ආධාර රු.මි. **4821 ,** ලංකා රජයේ ආධාර රු. මි. **885**	**2019 – 2024**
තාක්ෂණ විෂය ධාරාව සඳහා ජාතික විද්‍යාපීඨයක් ස්ථාපිත කිරීම **(GOSL/KOICA)**	**KOICA**	ඇ.ඩොලර් මිලියන **14.95**	**2015 – 2025**
වතු පාසල් සංවර්ධන වැඩසටහන **(GOSL/ India)**	**Indian Assistance** (ඉන්දියානු ජනරජය)	රු. මිලියන **345**	**2019-2022**
කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අධ්‍යාපන පරිසර සංවර්ධන ව්‍යාපෘතිය **(GOSL/KOICA)**	**KOICA**	ඇ.ඩොලර් මිලියන **7.5**	**2018-2022**

1.7 විදේශාධාර ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

ව්‍යාපෘතිය	ආධාර සපයන ආයතනය	ඇස්තමේන්තුගත සමස්ත ආයෝජනය	ව්‍යාපෘති කාල සීමාව
පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ බහු වාර්ගික ත්‍රෛභාෂා ද්විතීක පාසලක් ඉදිකිරීම (GOSL/India)	Indian Assistance	රු. මිලියන 1200 (ඉන්දීය රජයේ ආධාර සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල්)	2017-2020
ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP)	Asian Development Bank	ඇ. ඩොලර් මිලියන 400	2021-2026
වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (UNFPA)	UNFPA	රු. මිලියන 3	වාර්ෂික



02. පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ හා ළඟා කරගත් ප්‍රගතිය

2.1.1 එක් එක් විෂයය ක්ෂේත්‍රය යටතේ ළඟා කර ගත් ප්‍රගතිය

2022 වර්ෂයේ ලොව පුරා සියලුම රටවල්වලට මුහුණ දීමට සිදු වූ ගෝලීය උද්ධමනකාරී වාතාවරණය සහ විශේෂයෙන් ම ශ්‍රී ලංකාව මුහුණ දුන් විදේශ විනිමය අර්බුදය, ඉන්ධන අර්බුදය මෙන්ම වරින් වර සිදු කරනු ලැබූ රාජ්‍ය වියදම් සීමා කිරීම ආදී අතිශය ගැටලු සහගත තත්ත්වයන් හේතුවෙන් සමස්ත රාජ්‍ය යාන්ත්‍රණය තුළ සිදු වූ යම් යම් පසුගාමී තත්ත්වයන් මත වුව ද අධ්‍යාපන අමාත්‍යාංශයේ එක් එක් අංශ තම ඉලක්ක සපුරා පහත ප්‍රගතිය ළඟා කර ගෙන ඇත.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය සඳහා ප්‍රවේශය හා සහභාගිත්වය ඉහළ නැංවීම	
ජාතික පාසල් සංවර්ධනය	♦ ජාතික පාසල් 396 හි ගුරු, ශිෂ්‍ය හා වෙනත් තොරතුරු හා දත්ත යාවත්කාලීන කිරීම . ♦ ජාතික පාසල් 391ක වාර්ෂික පාසල් සංවර්ධන සැලැස්ම, විශේෂ ව්‍යාපෘති හා ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදීම. ♦ GEMP (සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය) ව්‍යාපෘතියේ ජාතික පාසල් 174 ක් සඳහා රු.මිලියන 102.7 ක පාසල් පාදක ප්‍රදාන ලබා දීම. ♦ ගුණාත්මක යෙදවුම් QIP (Quality Input Project) සඳහා පාසල් 150 ක් හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සඳහා රු.මි. 20 ක් ලබා දීම. ♦ ජාතික පාසල් 125 ක් සඳහා රු.මි.20.0කට සිසු මේස හා පුටු කට්ටල ජායාපිටපත් යන්ත්‍ර ලබා දීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
නොවිධිමත් අධ්‍යාපනය	♦ නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නියාමනය සහ අධීක්ෂණය පිළිබඳ **2022.12.03** දිනැති අංක **36/2022** චක්‍රලේඛය සහ දත්ත සටහන් කිරීමේ වාර්තා පොත මුද්‍රණය කර බෙදා හැරීම, ඒ පිළිබඳ නොවිධිමත් අධ්‍යාපන කලාප නිලධාරීන් සහ ව්‍යාපෘති නිලධාරීන් **227**දෙනෙකු දැනුවත් කිරීම සහ ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම. ♦ මද්‍රසා පාසල්වල අධ්‍යාපනය ලැබූ ළමයින් **1,045**ක් සාමාන්‍ය අධ්‍යාපන ප්‍රවාහයට ඇතුළත් කිරීම. ♦ වැඩිහිටි අධ්‍යාපන සංකල්පය පිළිබඳ නොවිධිමත් අධ්‍යාපන කලාප නිලධාරීන් **98** දෙනෙකු දැනුවත් කිරීම. (සබරගමුව හා නැගෙනහිර පළාත් සඳහා) ♦ ජාත්‍යන්තර සාක්ෂර දින දැනුවත් කිරීමේ වැඩසටහන වටරැක බන්ධනාගාර රැඳවියන් සඳහා පවත්වාගෙන යනු ලබන සුනීත විද්‍යාලයේ දී පැවැත්වීම. ♦ ආදායම් ඉපයීමේ පාඨමාලා සඳහා, සාක්ෂර පාඨමාලා, ලැදියා පාඨමාලා පළාත් මට්ටමින් පවත්වාගෙන යාම.
විශේෂ අධ්‍යාපනය	♦ විශේෂ අධ්‍යාපනය හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ අංක **37/2020** චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය සම්බන්ධව පුහුණුකරුවන් පුහුණු කිරීම. (දකුණ, ඌව, උතුරුමැද, නැගෙනහිර හා උතුරු පළාත්) ♦ විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය පිළිබඳ අංක **33/2022** චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය සම්බන්ධව කලාපයීය තක්සේරු කමිටු සාමාජිකයින් **607**දෙනෙකු දැනුවත් කිරීම. (බස්නාහිර, වයඹ, ඌව, උතුරුමැද, සබරගමුව, නැගෙනහිර සහ මධ්‍යම පළාත්) ♦ විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය සම්බන්ධව ශ්‍රව්‍ය, දෘෂ්‍ය උපකරණ භාවිතය පිළිබඳ නිලධාරීන් **60**දෙනෙකු සඳහා ප්‍රායෝගික පුහුණුව ලබා දීම. ♦ පූර්ණ අන්ධ සිසුන් සඳහා අ.පො.ස. (සාමාන්‍ය පෙළ), අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා හා ගණිත විෂයයන් ඉගැන්වීම සඳහා ගුරුභවතුන් **13**දෙනෙකු පුහුණු කිරීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
විශේෂ අධ්‍යාපනය	♦ ඔටිසම් තත්ත්වයේ ළමයින් සාමාන්‍ය අධ්‍යාපන ප්‍රවාහයට ඇතුළත්කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා දෙමාපියන් දැනුවත් කිරීම. ♦ පළාත් මට්ටමින් ඇස්කණ්ණාඩි **1101**ක් සහ සවන් වහල් **05**ක් ලබා දීම. **(බස්නාහිර, වයඹ හා දකුණු පළාත්)** ♦ බුද්ධිමය ඌනතා සහිත ළමයින් ඇතුළු ව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමුන් වෙනුවෙන් "අන්තර්කරණ අධ්‍යාපනයක් කරා ...." පළමුවන හා දෙවන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සැකසීම බස්නාහිර, වයඹ, සබරගමුව යන පළාත්වල විශේෂ අධ්‍යාපන ගුරුභවතුන් පුහුණු කිරීම. ♦ කොළඹ, කුරුණෑගල දිස්ත්‍රික්කවල අන්තර්කරණ අධ්‍යාපන සංවර්ධන ජයිකා ශ්‍රී ලංකා නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, පොල්ගොල්ල හා මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ කථිකාචාර්යවරු දැනුවත් කිරීම. ♦ වෙනිවැල්කොළ, "ශිෂ්‍යෝදා" විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ජාතික ආයතනය සඳහා උපකරණ සැපයීම, නඩත්තු කටයුතු සිදුකිරීම සහ පුහුණු සැසි
වතු පාසල් සංවර්ධනය සහ දෙමළ මාධ්‍ය පාසල් සංවර්ධනය	♦ වතු පාසල් සංවර්ධනය කිරීම යටතේ ගොඩනැගිලි ඉදිකිරීම හා අලුත්වැඩියාවලට අදාළ පසුගිය වර්ෂවලට අදාළ බිල්පත් නිරවුල් කිරීම සඳහා රු.**19,906,635.00**ක ප්‍රතිපාදන නිදහස් කර ඇත. ♦ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අධ්‍යාපනික පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ **(KOICA** ව්‍යාපෘතිය**)** සම්බන්ධීකරණ කටයුතු කිරීම සහ ප්‍රගති සමාලෝචනයට අදාළව ඒකාබද්ධ සම්බන්ධීකරණ කමිටු **(JCC)** රැස්වීම මාර්ගගත තාක්ෂණය හරහා පවත්වන ලදී. ♦ ජාතික මට්ටමේ පවත්වන අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ/පෙළ) විභාගවල දෙමළ පාසල් ශිෂ්‍යාන්ගේ ප්‍රතිඵල **2016** සිට **2020** දක්වා විශ්ලේෂණය කර ඇති අතර අඩු කාර්ය සාධනයක් ඇති දෙමළ ජාතික පාසල් සහ කලාප හඳුනාගෙන ඇත. ඒ සඳහා ප්‍රතිකාර්ය සටහන් සැලසුම් කර ඇත. ♦ දෙමළ මාධ්‍ය ජාතික පාසල් අධීක්ෂණය හා ප්‍රතිපෝෂණ කටයුතු සිදු කිරීම. ♦ දෙමළ මාධ්‍ය විදුහල්පතිවරුන් අධ්‍යාපන නිළධාරීන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීමක් පවත්වීම හා ධාරිතා වැඩසටහන් පැවැත්වීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
මුස්ලිම් පාසල් අධ්‍යාපනයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම.	♦ නව පාසල් **1000** වැඩසටහන යටතේ තෝරාගත් නැගෙනහිර පළාතේ පාසල් **71** හි සංවර්ධන කටයුතු සඳහා දායක වීම. ♦ මුස්ලිම් පාසල් **21**ක් අධීක්ෂණය කිරීම ♦ මුස්ලිම් පාසල්වල සහ කාර්ය මණ්ඩලවල උද්ගත වන ගැටලු සඳහා සාර්ථක විසඳුම් ලබා දීමට පියවර ගැනීම ♦ ඉස්ලාම් ආගමික උපදේශක මණ්ඩල රැස්වීම් **1** සහ **2** පැවැත්වීම. ♦ මුස්ලිම් පාසල් නියාමන හා ඇගයීම් කටයුතු සිදු කිරීම ♦ අන්තර් පාසල් හුවමාරු වැඩසටහන පාසල් **18** ක ක්‍රියාත්මක කිරීම
පාසල් වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	♦ **6/2013** චක්‍රලේඛය කාලීන අවශ්‍යතාවය මත සංශෝධනය කිරීම. ♦ වෘත්තීය මාර්ගෝපදේශ අධ්‍යාපනික ප්‍රදර්ශනය හා සම්බන්ධ වෙමින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, දෙමාපියන් හා ගුරුභවතුන් සඳහා හැකියා ලැදියා අනුව අනාගත වෘත්තිය ප්‍රවේශයන් සඳහා ඇති අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීම. ♦ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ වෘත්තිය මාර්ගෝපදේශය සඳහා සිසු ක්‍රියාකාරකම් පිළිබඳ අත්පොතක් සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම. ♦ ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ වෘත්තිය මාර්ගෝපදේශයේ වැදගත්කම පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීමට, පුහුණුකරුවන් සඳහා අත්පොතක් සකස් කිරීම. ♦ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතය (ICTA) සමඟ එක්ව තොරතුරු තාක්ෂණයේ පුළුල් වෘත්තීය අවස්ථා පිළිබඳව පළාත් / කලාප නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන	<u>පාසල් ළමුන් සඳහා ආහාර ලබාදීමේ වැඩසටහන</u> ♦ **2022** වර්ෂය සඳහා රජයේ අරමුදල් යටතේ රු.**709,497,945.58** ක් වැය කර ඇති අතර හදිසි තත්වයන්ට මුහුණ දීම සඳහා වූ සැලැස්ම **(CERC)** යටතේ **2022.12.31** දිනට රු. **2,016,541,628.16** ක් වැය කර ඇත. ඒ යටතේ තවදුරටත් රු.**2,404,188,828.00** ක මුදලක් ගෙවීමට නියමිතය. ♦ මහජන චීන සමූහාණ්ඩුවෙන් ප්‍රදානයක් ලෙස ලද සහල් මෙ.ටො.**10,000** ආහාර ලබාදීමේ වැඩසටහනට සම්බන්ධ සිසුන් සඳහා ලබාදීම සිදු කර ඇත.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන	**<u>UNICEF වැඩසටහන</u>** ♦ **කොවිඩ් 19 රෝගය පාසල් ළමුන් අතර පැතිරීම වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා සනීපාරක්ෂක පහසුකම්වල හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා ග්‍රාමීය ප්‍රාථමික පාසල් 51 ක් සඳහා රු.510,000.00 මුදල් ලබා දී ඇත.** **<u>UNFPA වැඩසටහන</u>** ♦ **ප්‍රජනන සෞඛ්‍ය වැඩසටහන් 8ක් පවත්වා ඇති අතර රු.1,285,338.00ක වියදමක් දරා ඇත. සහභාගී වූ පිරිස 1,226 ක් වේ.** **<u>සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන (GEMP)</u>** ♦ **සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් 9 ක් පවත්වා ඇති අතර රු.1,783,410.00ක වියදමක් දරා ඇති අතර සහභාගීත්ව පිරිස 621 ක් වේ.** **<u>CERC - පානීය ජල පහසුකම් සැපයීම</u>** ♦ **පානීය ජල පහසුකම් නොමැති පාසල් සඳහා ජල පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ 2022 වර්ෂයේ දී පාසල් 143 ක් සඳහා ද, සමස්ථ ව්‍යාපෘතිය යටතේ පාසල් 313 ක් සඳහා ද ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය මඟින් ජල පහසුකම් ලබා දී ඇත. 2022 වර්ෂයේ දී රු.242,893,085.00 ක මූල්‍ය වියදමක් දරා ඇත.** **<u>CERC - සනීපාරක්ෂක පහසුකම් සැපයීම</u>** ♦ **2021/2022 සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ වැඩසටහන යටතේ පාසල් 734 ක් සඳහා පහසුකම් ලබාදුන් අතර 2022 වර්ෂයේ දී ඒ සඳහා රු.249,310,740.74 ක් ලබා දී ඇත.**

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය		
පාසල් දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයන් ඉහළ නැංවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන නිළධාරීන් එක් වී විවිධ වැඩසටහන් පාසල තුළ ක්‍රියාත්මක කරන අතර එයින් තෝරාගත් පාසල්වල දරුවන් මිලියන **1.1**ක් සඳහා දිවා ආහාර ලබා දීම වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳ විස්තර වගුවේ පරිදි වේ.	පාසල් ළමුන් සඳහා ආහාර ලබා දීමේ වැඩසටහන.		
	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභී පාසල් සංඛ්‍යාව	ප්‍රතිලාභී සිසුන් සංඛ්‍යාව
	කොළඹ	237	**43,651**
	ගම්පහ	308	**46,304**
	කලුතර	301	**39,651**
	නුවර	440	**54,007**
	මාතලේ	248	**27,411**
	නුවරඑළිය	446	**55,217**
	ගාල්ල	290	**38,461**
	මාතර	279	**42,763**
	හම්බන්තොට	283	**61,638**
	යාපනය	407	**41,475**
	මන්නාරම	119	**10,907**
	වවුනියාව	166	**16,242**
	මුලතිව්	115	**10,466**
	කිලිනොච්චි	94	**11,372**
	මඩකලපුව	307	**78,137**
	අම්පාර	377	**19,894**
	ත්‍රිකුණාමලය	257	**31,591**
	කුරුණෑගල	679	**82,794**
	පුත්තලම	256	**40,456**
	අනුරාධපුරය	465	**68,047**
	පොළොන්නරුව	229	**40,192**
	බදුල්ල	519	**59,547**
	මොනරාගල	254	**49,331**
	රත්නපුර	450	**59,711**
	කෑගල්ල	400	**35,390**
	මුළු එකතුව	**7,926**	**1,064,655**

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
ඉංජිනේරු සංවර්ධන වැඩසටහන්	♦ ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපන වැඩසටහන යටතේ පාසල් **258** ක රු.මි.**1,065.3** ක ඉදිකිරීම් හා අලුත්වැඩියා කටයුතු සිදු කර, රු.මි.**859.5** ක් ගෙවා ඇත.වියදම් කිරීමේ ප්‍රතිශතය **81%** කි. ♦ සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන වැඩසටහන යටතේ විශේෂයෙන් "ළඟම පාසල හොඳම පාසල " වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ රු.මි.**1,215.7**ක වැඩ **777**ක් නිම කර රු.මි.**1,101.9**ක් ගෙවා ඇත. වියදම් කිරීමේ ප්‍රතිශතය **91%** කි.
13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන	♦ පාසල් **525**ක උසස් පෙළ වෘත්තීය විෂයධාරාව ක්‍රියාත්මක කිරීම, සිසුන් **8000**කට මූලික වෘත්තීය දැනුම ලබා දීම සහ **NVQ 4** පාඨමාලා සඳහා පුහුණු ආයතන වෙත යොමු කිරීම. ♦ වෘත්තීය විෂයධාරාව ක්‍රියාත්මක වන පාසල්වල මානව සම්පත් විචාරවත් කිරීම යටතේ ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කර ගනිමින් පාසල් අතර ගුරුභවතුන් තුලනය කිරීම. ♦ සිසුන්ගේ වෘත්තීය පුහුණුව වෙනුවන් නව ආයතන දෙකක් සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹීම. ♦ සමාජ මාධ්‍යය **(Face Book)** භාවිත කරමින් **13** වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන වෘත්තීය විෂය ධාරාව ප්‍රචාරය කිරීම සඳහා පියවර ගැනීම.
සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම	
ප්‍රාථමික අධ්‍යාපන සිසුන්ගේ මූලික ගණිත හැකියාව සහ සාක්ෂරතාව අත්පත් කර ගැනීමේ අනාවරණ අධ්‍යයනය	♦ ප්‍රාථමික අධ්‍යාපනයේ පළමු ප්‍රධාන අවධිය සම්පූර්ණ කළ සිසුන්ගේ මූලික ගණිත හැකියාව සහ සාක්ෂරතාව අත්පත් කර ගැනීමේ ප්‍රගතිය මැන බැලීමේ අධ්‍යයනය ක්‍රියාත්මක කිරීම සහ දත්ත විශ්ලේෂණය. ♦ අධ්‍යයනයේ අනාවරණ මත භාෂා හා ගණිත කුසලතා වැඩි දියුණු කිරීම සඳහා කෙටිකාලීන ප්‍රාථමික අධ්‍යාපන සැලැස්මක් සකස් කිරීම. ♦ සාක්ෂරතාවට අදාළ ප්‍රතිකාර්ය ඉගැන්වීම් පිළිබඳව පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ගුරුමාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් සකස් කිරීම.
ගණිත අධ්‍යාපනය සංවර්ධනය	♦ සමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය **(GEMP)** යටතේ ගණිත ඉගෙනුම වැඩිදියුණු කිරීමේ **(MLE)** වැඩසටහන පැවැත්වීම. ♦ ක්‍රියාත්මක පාසල් **500**හි **6-11** ශ්‍රේණී සිසුන්ගේ ගණිත විෂය සාධනය ගණිත පොදු තක්සේරුකරණ ප්‍රශ්න පත්‍ර සැකසීම මඟින් මැනීම සහ අවශ්‍ය ප්‍රතිකාර්යය වැඩසටහන් පැවැත්වීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
ගණිත අධ්‍යාපනය සංවර්ධනය	♦ ගණිත ඉගෙනුම් චිත්‍රාගාරවල **Mathematics Learning Studios – MLS)** ඉගෙනුම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී කිරීම සඳහා අත්පොතක් සැකසීම. ♦ ගණිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා මාර්ගගත ඉගෙනුම් ක්‍රමවේදය ඵලදායීව භාවිතය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම. ♦ අ.පොෂ.ස සා/පෙළ ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා තෝරාගත් කලාප **31**ක ප්‍රතිකාර්යය අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම. ♦ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ තාක්ෂණ පීඨය හා එක්ව **Mathematics Education Teacher Awareness (META) hub** වෙබ් අඩවිය ස්ථාපනය කිරීම. ♦ අ.පොෂ.ස උ/පෙළ සංයුක්ත ගණිත විෂයය උගන්වන සියලුම ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. ♦ ප්‍රාථමික ශ්‍රේණිවල භාවිතා වන ගණිත සංකල්ප සාධනය සඳහා වූ ගණිත සංකල්ප සිතියම් පොත සැකසීම. ♦ විමසුම්පාදක ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රචලිත කිරීම සඳහා ආදර්ශ පාඩම් සැකසීම. ♦ ගණිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා වීඩියෝ පුස්තකාල වැඩසටහන ක්‍රියාත්මක කිරීම. ♦ උසස් පෙළ සංයුක්ත ගණිත විෂය හදාරණ 'සිසු නැණ පවුර' සම්මන්ත්‍රණ මාලාව ක්‍රියාත්මක කිරීම. ♦ ගණිත අධ්‍යාපනය සම්බන්ධයෙන් සිදු කරන ලද පර්යේෂණ **19**ක් පද්ධතිගත කිරීම.
විද්‍යා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම	♦ විද්‍යාගාර සේවක/සහායක නිලධාරීන් **116** දෙනෙකු පුහුණු කිරීම. ♦ අ.පොෂ.ස. උසස් පෙළ ජීව විද්‍යා, රසායන විද්‍යා සහ භෞතික විද්‍යා විෂයන් සඳහා ප්‍රශ්න බැංකු **(Question Banks) 3**ක් පිළියෙල කිරීම. ♦ අඩු සාධනයක් සහිත පාසල්වල විද්‍යා ගුරුභවතුන් සහ විදුහල්පතිවරුන් **225** දෙනෙක් පුහුණු කිරීමට ධාරිතා සංවර්ධන වැඩසටහන් **5** ක් ක්‍රියාත්මක කිරීම. ♦ විද්‍යා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන කළමනාකරුවන් සඳහා පරිසරය ආශ්‍රිත පුහුණු වැඩසටහන් **2**ක් ක්‍රියාත්මක කිරීම. ♦ හඳුනාගත නොහැකි සහ කල් ඉකුත් වූ රසායනික ද්‍රව්‍ය හඳුනාගැනීම සහ විධිමත් ව විනාශ කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා සම්පත් පුද්ගල කණ්ඩායමක් පුහුණු කිරීම සඳහා වැඩමුළු **02**ක් පැවැත්වීම. ♦ විද්‍යාගාරවල භාවිතය සඳහා ලබාදෙන උපකරණ සහ රසායන ද්‍රව්‍ය ලේඛනය සහ විද්‍යාගාර උපදෙස් සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වැඩමුළු **02** ක් පැවැත්වීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
විද්‍යා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම	♦ විද්‍යාගාර පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණ ලැයිස්තුවක් සැකසීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම. ♦ අන්තර්ජාතික තරුණ විද්‍යාඥයා තරඟාවලිය සඳහා සිසුන් 02නෙකු තෝරා මාර්ගගත තරගාවලිය සඳහා යොමු කිරීම. ♦ අ.පො.ස උසස් පෙළ විද්‍යා සිසුන් සඳහා ප්‍රශ්න පත්‍ර සකසා සිසු සම්මන්ත්‍රණ පැවැත්වීම. ♦ අ.පො.ස. උසස් පෙළ විද්‍යා ගුරුභවතුන් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්මන්ත්‍රණ පැවැත්වීම. ♦ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ වන නව විද්‍යා විෂයමාලා සම්බන්ධයෙන් පළාත් නියෝජනය වන පරිදි සම්පත් පුද්ගල කණ්ඩායමක් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම. ♦ ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා විද්‍යා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන 20 සඳහා රු. 50,000/- බැගින් ලබාදීම. ♦ යුනෙස්කෝ ව්‍යාපෘතිය යටතේ විද්‍යා ගුරුභවතුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම, මුළුතැන්ගෙය විද්‍යාගාරයක් ලෙස භාවිතා කරමින් පොතක් සහ වීඩියෝවක් සැකසීම සහ අඩු සාධන මට්ටමක් සහිත පාසල් 82 ක් සඳහා ශිෂ්‍ය පාදක වැඩසටහන් පැවැත්වීමට ප්‍රතිපාදන ලබා දීම.
ඉංග්‍රීසි හා විදේශ භාෂා අධ්‍යාපනය සංවර්ධනය	♦ සමස්ත ලංකා ඉංග්‍රීසි භාෂා සහ නාට්‍ය තරඟ පැවැත්වීම. 2022 (10 –13 ශ්‍රේණිය සිසුන් 614ක් සඳහා) ♦ ජාතික මට්ටමේ ඉංග්‍රීසි භාෂා හා නාට්‍ය තරඟ සඳහා පුහුණුකරුවන් 60ක් පුහුණු කිරීම. ♦ විදුහල්පතිවරුන් / ගුරුවරුන් / ISAs / RESCs කාර්ය මණ්ඩලය / අධීක්ෂණ කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පළාත් 9 සඳහා ම පැවැත්වීම. ♦ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති (GEMP) ඉංග්‍රීසි භාෂා ප්‍රවර්ධන වැඩසටහනට (ELLE) අදාළ පාසල් 500ක් සඳහා පශ්චාත් පරීක්ෂණ සැලසුම් කිරීම සහ පැවැත්වීම. ♦ GEMP අමතර විෂයමාලා ක්‍රියාකාරකම් පිළිබඳව ගුරුවරුන් 415ක් පුහුණු කිරීම. ♦ ඉංග්‍රීසි ප්‍රවර්ධනය සඳහා විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම / උපදෙස් අත්පොත මුද්‍රණය කිරීම සහ පොත් 3000 ක් බෙදා හැරීම . ♦ තොරතුරු සංනිවේදන තාක්ෂණය (ICT) පාදක භාෂා ඉගැන්වීමේ මොඩියුලය සඳහා ගුරුවරුන් පුහුණු කිරීම TOT. (ISA / RESC) ♦ සෑම පළාතක ම ELLE ක්‍රියාකාරකම් පිළිබඳ තෝරාගත් පාසල් වෙත අධීක්ෂණ හා ප්‍රගති සමාලෝචන වැඩමුළු පැවැත්වීම. ♦ මාර්ගගත ඉගෙනීම සඳහා සවන්දීම, කථනය සහ කියවීම, 10 සහ 11 ශ්‍රේණි සඳහා ලිවීම ඇතුළත් අන්තර්ගතයන් සකස් කිරීම. ♦ ඊ-තක්සලාව වෙත උඩුගත කිරීමට වීඩියෝ පාඩම් සකස් කිරීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
ඉංග්‍රීසි හා විදේශ භාෂා අධ්‍යාපනය සංවර්ධනය	♦ **GEMP (General Education Modelization Project)** පාසල්වල ප්‍රාථමික ශ්‍රේණිවල ඉංග්‍රීසි සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම. පාඨමාලා / ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීම. ♦ ප්‍රාථමික ඉංග්‍රීසි සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම සැලසුම් සකස් කිරීම. ♦ කථන හා ශ්‍රවණ කුසලතා වැඩි දියුණු කිරීම සහ කුසලතා ඇගයීම - ගුරු ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් **10**ක් පැවැත්වීම.
ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධනය	♦ **2022** වර්ෂයේ පළමුවන ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීමේ වැඩසටහන **"**පාසල් අධ්‍යාපනයට ප්‍රීතිමත් ආරම්භයක්**"** වැඩසටහන පිළිබඳව සියලු ම පළාත් අධ්‍යාපන බලධාරීන් සහ විදුහල්පතිවරුන් දැනුවත් කිරීම. ♦ ප්‍රාථමික අංශ සහිත ජාතික පාසල් **184**ක් සඳහා ගුණාත්මක යෙදවුම් මිල දී ගැනීමට මුදල් ප්‍රතිපාදන ලබාදීම. ♦ අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතයන් හා නිවෙස්පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් සකස් කිරීම පිළිබඳව සියලු ම පළාත් ප්‍රාථමික අධ්‍යාපන නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් **(178** ක් **)** දැනුවත් කිරීම. ♦ ප්‍රාථමික සිසුන්ගේ සමාජ චිත්තවේගීය කුසලතා සංවර්ධනය සඳහා"ගෙවත්තයි - පෝෂණයයි - අධ්‍යාපනයයි" උපදෙස් සංග්‍රහයේ මුලික කෙටුම්පත සකස් කිරීම. ♦ ප්‍රාථමික සිසුන්ගේ සාරධර්ම හා යහපත් ආකල්ප සංවර්ධනය සඳහා **"**යහමගට පිළිපන් - සිඟිති සිත් සවිමත්**" (Little minds strong values)** වැඩසටහන හා පරිසරික අත්දැකීම් ඔස්සේ මූලික විද්‍යා සංකල්ප ප්‍රාථමික සිසුන්ට ලබා දීම පිළිබඳ දැනුවත් කිරීම හා ධාරිතා වැඩසටහන් පැවැත්වීම. ♦ ප්‍රාථමික අංශ සහිත ජාතික පාසල් **34** ක් සඳහා මධ්‍යම ප්‍රමාණයේ ඩෙස් හා පුටු ලබා දීම. ♦ රිජ්වේ ආර්යා ළමා රෝහලට **2022** වර්ෂය සඳහා නව ගුරුවරුන් අනුයුක්ත කිරීම සඳහා මූලික කටයුතු සිදු කිරීම සහ නියාමනය සිදු කිරීම. ♦ **Save the Children** ආයතනය සමඟ පළාත් පහක (මධ්‍යම, ඌව, නැගෙනහිර, උතුර, සබරගමුව) තෝරාගත් ප්‍රාථමික පාසල් **140** ක සාක්ෂරතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සම්පත් දායකයින් පුහුණු කිරීම. මේ යටතේ ප්‍රාථමික අධ්‍යාපන විෂයභාර නියෝජ්‍ය/සහකාර නිලධාරීන් **33**ක් සහ ප්‍රාථමික ගුරු උපදේශකවරුන් **43**ක් පුහුණු කර ඇති අතර, ඒ මඟින් ප්‍රාථමික ගුරුවරුන් **916**කට පුහුණුවීම් ලබා දී ඇත.
තාක්ෂණ අධ්‍යාපන සංවර්ධනය	♦ නිර්මාණකරණය විෂයය පෙරහුරු ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ වැඩමුළුව පැවැත්වීම. ♦ අ.පො.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය විෂයය **(ET)**ඇගයීම් නිර්ණායක සැකසීම ♦ අ.පො.ස.(උ.පෙළ) තාක්ෂණවේදය සඳහා විද්‍යාව විෂයය **(SFT)**ඇගයීම් නිර්ණායක සකස් කිරීම

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
තාක්ෂණ අධ්‍යාපන සංවර්ධනය	♦ සමස්ත ලංකා පාසල් රොබෝ තාක්ෂණ හා නව නිර්මාණ තරඟාවලිය පැවැත්වීම. ♦ ගෘහ ආර්ථික විද්‍යා සමස්ත ලංකා දැනුම මිනුම තරඟය පැවැත්වීම. ♦ ගෘහ ආර්ථික විද්‍යා පෙරහුරු ප්‍රශ්න පත්‍රය සකස් කිරීම, තොරතුරු තාක්ෂණ විෂය දැනුම ලබාදීම. ♦ ඉංජිනේරු තාක්ෂණවේදය (ET) සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව (SFT) යන විෂයන් දෙක සඳහා නැණ පවුර ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම . ♦ නවෝත්පාදන විද්‍යාගාර පිළිබඳ සම්පත් පුද්ගල දැනුවත් කිරීම ♦ නවෝත්පාදන විද්‍යාගාර පිළිබඳ විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් (මාර්ගගත වැඩමුළු) මඟින් පළාත් මට්ටමින් දැනුවත් කිරීම. ♦ සමස්ත ලංකා පාසල් රොබෝ තාක්ෂණ හා නව නිර්මාණ තරඟාවලියේ ජයග්‍රාහකයින්ට තෑගි ලබා දීම.
ආගමික හා සාරධර්ම අධ්‍යාපනය	♦ සති පාසල" වැඩසටහන පාසල් තුළ දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීම. ♦ "නැණ පවුර" වැඩසටහන යටතේ තෝරාගත් පළාත්වල අ.පෙ.ස.(උ.පෙළ) සිසුන් සඳහා සම්මන්ත්‍රණ මාලාවක් ක්‍රියාත්මක කිරීම. ♦ "සහකම්පනය" වැඩසටහන හරහා සිසුන්ගේ සංවේදීබව සහ සුහදශීලීබව වැඩි දියුණු කිරීම සඳහා ද පාසල් පාදක වැඩසටහන් හඳුන්වාදීම. ♦ සම්පත් පුද්ගලයින් වශයෙන් කටයුතු කිරීම සඳහා ආගමික විෂයය ගුරුවරුන් 100ක් පුහුණු කිරීම. ♦ "සුචරිතවත් දරු පරපුරක් යහපත් සමාජයක්" පොත් පිංච ඇසුරු කර ගනිමින් පාසල් පද්ධතිය තුළ සාරධර්ම ක්‍රියාවට නැංවීමේ වැඩසටහන් හඳුන්වාදීම. ♦ සජීවී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධාවන් ඇතිවන අවස්ථාවන්හි දී භාවිතා කිරීමට ආගමික විෂයයන් උගන්වනු ලබන ගුරුවරුන්ගේ තොරතුරු තාක්ෂණ කුසලතා යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම.
ශිෂ්‍ය උපදේශනය හා මත්ද්‍රව්‍ය නිවාරණය	♦ නව සාමාන්‍යකරණ තත්ත්වය යටතේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ගැටලු හඳුනාගැනීම සඳහා ශාඛාව විසින් සකස් කළ "මනෝසමාජයීය සහාය ගුරු මාර්ගෝපදේශය" ඔස්සේ උපදේශන ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. ♦ මනෝසමාජයීය මධ්‍යස්ථාන පළාත් කළමනාකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
ශිෂ්‍ය උපදේශනය හා මත්ද්‍රව්‍ය නිවාරණය	♦ අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් සහ බස්නාහිර පළාත තුළ විදුහල්පතිවරුන් සඳහා විශේෂඥ වෛද්‍යවරුන් සම්බන්ධ කරගනිමින් "අධ්‍යාපනයේ ස්නායු මනෝ විද්‍යාත්මක පසුබිම" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. ♦ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හා එක්ව මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව බස්නාහිර පළාත තුළ ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය සංවර්ධනය කිරීම	♦ සමස්ථ ලංකා සිංහල භාෂා තරගය සිසුන් 1638කගේ සහභාගීත්වයෙන් රු.මිලියන 2.68ක වියදමක් දරා පැවැත්වීය.සහතික 1101ක් ප්‍රදානය කර ඇත. ♦ සමස්ථ ලංකා දෙමළ භාෂා හා සාහිත්‍ය තරගාවලිය සිසුන් 761කගේ සහභාගීත්වයෙන් රු.මිලියන 1.903ක වියදමක් දරා පැවැත්වීය.සහතික 875ක් ප්‍රදානය කර ඇත. ♦ සමස්ථලංකා/ ජාතික සමාජ විද්‍යා තරගාවලිය සිසුන් 648කගේ සහභාගීත්වයෙන් රු.මිලියන 1.43ක වියදමක් දරා පැවැත්වීය.සහතික 648ක් ප්‍රදානය කර ඇත.
ද්වී භාෂා අධ්‍යාපන හා ත්‍රෛභාෂා වැඩසටහන් අධ්‍යාපන පහසුකම් ඉහළ නැංවීම	♦ ඍත්තීය සංවර්ධන අවස්ථා සැපිරීම යටතේ 2022/2023 අධ්‍යයන වර්ෂ සඳහා ද්වීභාෂා අධ්‍යාපන ගුරුවරුන්/ නිළධාරීන් 40 දෙනෙකු වෙනුවෙන් ද්වීභාෂා අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ප්‍රදානය කිරීමට අදාළ සියලු පරිපාලන කටයුතු අවසන් කිරීම. ♦ ද්වීභාෂා අධ්‍යාපන ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා විෂයානුබද්ධ ඉංග්‍රීසි භාෂා සංවර්ධන වැඩසටහන (SELI), භාෂා සමෝධානිත ඉගෙනුම් ප්‍රවේශය (CLIL), 21 වන සියවසට අයත් හරයාත්මක හැකියා සංවර්ධන (21st Century co-skills Programme) ආදී වැඩසටහන්වලට අදාළව සකසා ගත් ඉගෙනුම් මූලාශ්‍ර ආශ්‍රයෙන් පළාත් මට්ටමින් තෝරාගත් ගුරුවරුන් වෙනුවෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
ද්වී භාෂා අධ්‍යාපන හා ත්‍රෛභාෂා වැඩසටහන් අධ්‍යාපන පහසුකම් ඉහළ නැංවීම	♦ e-තක්සලාව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සවිබල ගැන්වීම සඳහා පාර්ශවකරුවන් දැනුවත් කිරීම , පළාතේ සම්බන්ධීකරණ නිලධාරීන්ගෙන් ප්‍රතිපෝෂණ ලබා ගැනීම, නැණසැ ශාඛාව විභාග දෙපාර්තමේන්තුව ,ප්‍රකාශන දෙපාර්තමේන්තුව ආදී ආයතන සමඟ සම්බන්ධව කටයුතු කිරීම ♦ ද්වී භාෂා අධ්‍යාපනයට අදාළ දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය සහ අදාළ පාර්ශවකරුවන් සමග සාකච්ඡා කිරීම./ දැනුවත් කිරීම. ♦ ද්වී භාෂා චක්‍රලේඛ ප්‍රතිපාදන සංශෝධනය කිරීමට, අදාළ තොරතුරු රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම. ♦ පළමු දෙවන හා තෙවන කාර්තු සඳහා ප්‍රගති සමාලෝචනය . ♦ ත්‍රෛභාෂා කව සම්බන්ධ පසු විපරම, දත්ත පද්ධතිය යථාවත් කිරීම . ♦ ප්‍රථිපල විශ්ලේෂණය සහ ජාතික මට්ටමේ සිසු ප්‍රතිපෝෂණ වැඩසටහන යටතේ විභාග දෙපාර්තමේන්තුව මගින් තොරතුරු රැස් කිරීම, ද්වී භාෂා මාධ්‍යයෙන් ඉගෙනුම් විෂයන්ගේ ප්‍රථිපල විමර්ශනය ශිෂ්‍ය ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා විෂයමාලා ප්‍රතිසංස්කරණ/ අන්තර්ගත සංවර්ධනයට අදාළව අදාළ බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
සාම අධ්‍යාපනය හා සමාජ සංහිඳියාව	♦ ඉතිහාසය, පුරවැසි අධ්‍යාපනය හා විෂය සමගාමී ක්‍රියාකාරකම් වලට අදාළ අත්පොත් සඳහා සිංහල හා දෙමළ මාධ්‍යයෙන් නියාමන මෙවලම් සකස් කිරීම. ♦ මධ්‍යම, සබරගමුව, බස්නාහිර හා ඌව පළාත් නියෝජනය කරමින් බහු සංස්කෘතික ශිෂ්‍ය අත්දැකීම් හුවමාරු කර ගැනීමේ "සහෘද යාත්‍රා" වැඩසටහන් 04 ක් පාසල් ශිෂ්‍යයින් තුළ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම අරඹයා පැවැත්වීම හා ඊට අදාළ මාර්ගෝපදේශන සකස් කිරීමේ වැඩමුළු 02 ක් පැවැත්වීම. ♦ සංවේදනය සඳහා ඉගෙනුම (Learning for Empathy) වැඩසටහන් සියලුම ජාතික අධ්‍යාපන විද්‍යාපීය වල ගුරු ශිෂ්‍යයින් උදෙසා පැවැත්වීම. ♦ සාම අධ්‍යාපන ජාතික ප්‍රතිපත්තියේ වර්තමාන තත්ත්වය පිළිබඳව සමාලෝචනය කරමින් ප්‍රතිපත්තියට අදාළ සංකල්පීය රාමුවක් සකස් කිරීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
කෘෂිකර්ම හා පරිසර අධ්‍යයනය සහ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය සංවර්ධනය	♦ අ.පොෂ. (උ.පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය/ කෘෂි විද්‍යා විෂය හා අ.පොෂ. (සා.පෙළ) කෘෂි හා ආහාර තාක්ෂණ විෂය ප්‍රතිඵල සංවර්ධනය සඳහා ප්‍රතිකාර්ය වැඩසටහන් පැවැත්වීම ♦ පාසල් ආදර්ශ ගෙවතු වගා අත්පොත හා ගුරු පුහුණු මොඩියුලය සකස් කිරීම ♦ අ.පොෂ. (උ.පෙළ) කෘෂි විද්‍යා විෂය හා අ.පොෂ. (උ.පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය සඳහා නිපුණතා පාදකව කාර්ය පත්‍රිකා සකස් කිරීම හා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම පිළිබඳ මාර්ගගත මොඩියුලයක් සකස් කිරීම ♦ අ.පොෂ. (උ.පෙළ) කෘෂි විද්‍යා හා ජෛව පද්ධති තාක්ෂණවේදය හදාරන ලද සිසුන් සඳහා උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අවස්ථා පිළිබඳ මාර්ගෝපදේශයක් සකස් කිරීම ♦ සමස්ත ලංකා දැනුම මිනුම තරඟය පැවැත්වීම
වාණිජ, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය	♦ වාණිජ විෂයයභාර පළාත්/ කලාප නිලධාරීන් 76ක් සමඟ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම පිළිබඳව සාකච්ඡා කිරීමේ මාර්ගගත රැස්වීම (සිංහල/ දෙමළ) ♦ CMA ආයතනය විසින් අ.පොෂ.(උ.පෙ) ව්‍යාපාර අධ්‍යනය විෂයයේ සියලු නිපුණතා මට්ටම් ආවරණය කර සිදු කරනු ලැබූ ඉංග්‍රීසි මාධ්‍ය CD තැටි සකස් කිරීම. ♦ හොඳම වාණිජ දිනය පැවැත්වූ හොඳම වාණිජ සංගමය කලාප හා පළාත් මට්ටමින් තේරීම සඳහා නිර්නායක සකස් කර ගැනීම සම්බන්ධයෙන් CMA ආයතනය, කලාප නිලධාරීන් (වාණිජ) සමඟ රැස්වීම් පැවැත්වීම. ♦ අ.පොෂ.(සා.පෙ.)ව්‍යවසායකත්ව අධ්‍යයනය පුනරීක්ෂණ ප්‍රශ්න සංචිතය සඳහා දෙමළ මාධ්‍යයෙන් ප්‍රශ්න සකස් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම ♦ අ.පොෂ.(උ.පෙ.) ගිණුම්කරණය, ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව විෂයයන්ට අදාලව ප්‍රශ්න හා පිළිතුරු සකස් කිරීම ♦ අ.පොෂ.(උ.පෙ.) වාණිජ විෂය ධාරාව හදාරණ දෙමළ මාධ්‍යය වැඩමුළු - 06 ක් සඳහා මොඩියුල සකස් කිරීම

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
වාණිජ, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය	♦ අ.පො.ස.(උ.පෙ.) වාණිජ විෂය උගන්වන ගුරුවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළු පැවැත්වීම. (බස්නාහිර පළාත,උතුරු මැද පළාත,උතුරු පළාත) ♦ අ.පො.ස.(සා.පෙ.) වාණිජ විෂය උගන්වන ගුරුවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළු පැවැත්වීම. (දකුණු පළාත,බස්නාහිර පළාත)
පාසල් පුස්තකාල සංවර්ධනය	♦ තෝරාගත් ජාතික පාසල් පුස්තකාල 7ක් සඳහා පොත් මිල දී ගැනීමට රු.1,392,249ක මුදල් ප්‍රදාන ලබා දීම ♦ ජාතික පාසල් පුස්තකාලයාධිපතිවරුන් 75 දෙනෙකු පුහුණු කිරීම ♦ පාසල් පුස්තකාල උපදෙස් සංග්‍රහය කෙටුම්පත් කිරීම ♦ ජාතික පාසල් පුස්තකාල පිළිබඳ දත්ත පද්ධතියට අදාළ තොරතුරු ලබා ගැනීමට අදාළව Google Form යෙදුම භාවිතා කර අකෘතියක් සකස් කර ජාතික පාසල් වෙත විද්‍යුත් තැපෑල මඟින් යැවීම
විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් සංවර්ධනය	♦ පාසල් ශිෂ්‍ය නායක/ නායිකාවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළ ව පුහුණු මොඩියුලයක් සකස් කිරීම. ♦ පාසල්වල ශිෂ්‍ය නායක / නායිකාවන් තෝරාපත් කරගැනීම සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම. ♦ තෝරාගත් පාසල්වල විෂය සමගාමී විෂයභාර නියෝජ්‍ය විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් සඳහා විෂය සමගාමී, මාර්ගෝපදේශ හා උපදේශනය සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. ♦ ශිෂ්‍ය පාර්ලිමේන්තු නව චක්‍රලේඛ ප්‍රකාරව (3/2019) ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික සංකල්ප පාසල් ප්‍රජාව වෙත ලබාදීමේ වැදගත්කම පිළිබඳව විෂයය සම්බන්ධ ගුරුවරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. ♦ ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් ශාඛාව විසින් සකස් කළ "පාසල් සුරක්ෂිතතා මාර්ගෝපදේශ සංග්‍රහය" පිළිබඳව පළාත්/ කලාප හා කොට්ඨාශ විෂය සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
සෞන්දර්යය අධ්‍යාපනය	♦ නර්තන විෂයයයේ ගුරු භවතුන් **682** දෙනෙක් සඳහා ධාරිතා සංවර්ධනය වැඩසටහන් පැවැත්වීම. ♦ බටහිර සංගීතය විෂයය ධාරාවෙන් අ.පො. (උ.පෙළ) – **2022** වර්ෂයේ විභාගයට පෙනී සිටි සිසු දරුවන් **47** ක් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම. ♦ ජාතික තරුණ වාදක මණ්ඩලයේ සිසු දරුවන් **100** ක් සඳහා පුහුණු සැසි පැවැත්වීම. ♦ ජාතික තරුණ වාදක මණ්ඩලයේ **30** වන සංවත්සර උළෙල පැවැත්වීම. ♦ සෞන්දර්ය විෂයන් යටතේ ගුරු උපදේශකවරුන් **458** දෙනෙකු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. ♦ **12 – 13** ශ්‍රේණිවල සිසු දරුවන් සඳහා ඉගෙනුම් ආධාරක වශයෙන් ශ්‍රව්‍ය - දෘෂ්‍ය පාඩම් **18** ක් සකස් කිරීම. ♦ නාට්‍ය හා රංග කලාව හදාරන **6 – 11** ශ්‍රේණි සිසුන් සඳහා පාඩම්, තිර පිටපත් ආකාරයට **92** ක් සකස් කිරීම. ♦ බටහිර සංගීත විෂයය ගුරු භවතුන් **56** දෙනෙක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. ♦ සංගීත් සඟරාව පිටපත් **7000** ක් මුද්‍රණය කිරීම. ♦ පෙරදිග සංගීත විෂයය ගුරු භවතුන් **56** දෙනෙක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. ♦ සමස්ත ලංකා අන්තර් පාසල් තරග පැවැත්වීම - (පෙරදිග සංගීතය,චිත්‍ර , නර්තනය , බටහිර සංගීතය , කර්ණාටක සංගීත හා මුස්ලිම් තරග,භරත නාට්‍යම් හා කථක් තරග)
ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය	♦ ක්‍රීඩා පාසල් **23** සඳහා ශිෂ්‍යාධාර ලබා දීම. ♦ දේශීය සහ විදේශීය ක්‍රීඩා තරඟ සඳහා පාසල් සිසුන් සහභාගී කරවීම හා නියාමනය. ♦ ශ්‍රී ලංකා පාසල් ක්‍රීඩා සංගම් නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩමුළුව පැවැත්වීම. ♦ පැසිපන්දු විනිසුරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව පැවැත්වීම. ♦ **2022** සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තාක්ෂණික අත්පොත් නිර්මාණය කිරීම හා චක්‍රලේඛය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව පැවැත්වීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය	♦ පළාත් අධ්‍යක්ෂවරුන් හා තාක්ෂණික නිලධාරීන් සඳහා 2022 සමස්ත ලංකා ක්‍රීඩා උළෙල සංවිධානය කිරීම සම්බන්ධව දැනුවත් කිරීම පිණිස වැඩමුළුව පැවැත්වීම. ♦ 2022 සමස්ත ලංකා පාසල් ක්‍රීඩා උළෙලේ අර්ධ මැරතන් ධාවන තරඟය පැවැත්වීම. ♦ 2022 සමස්ත ලංකා පාසල් ක්‍රීඩා උළෙල පැවැත්වීම.
තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සහ ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ෂණීය ලෙස සංවර්ධනය	♦ පාසල් අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය ඇතුළත් වන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය හා එම විෂය පථය යටතට ගැනෙන අනෙකුත් සියළුම ආයතන, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට සම්බන්ධ බාහිර පාර්ශවද එක් ව ලංකාවේ සමස්ථ අධ්‍යාපන පද්ධතිය සඳහා ඩිජිටල් අධ්‍යාපනය සංවර්ධනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම හා එම ප්‍රතිපත්තිය පාදක කර ගනිමින් තුන් අවුරුදු ප්‍රධාන සැලසුම ක්‍රියාත්මක කිරීම. (වියදම - රු. මී. 0.16) ♦ පාසල් පරිගණක විද්‍යාගාරවල ඇති පරිගණක හා ආශ්‍රිත උපාංග අළුත්වැඩියා කිරීමේ වැඩසටහන් 06 ක් පැවැත්වීම. (වියදම - රු. මී. 1.107) ♦ ජාතික පාසල් පරිගණක විද්‍යාගාරයන්හි දෝෂ සහිත පරිගණක හා ආශ්‍රිත උපාංග අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම. (වියදම - රු. මී. 28.27) ♦ හදිසි තත්වයන්ට මුහුණ දීම සඳහා සකස් කළ සැලැසුම (CERC) යටතේ ලෝක බැංකු සහනදායී ණය ආධාර යටතේ පාසල් 719 ක අභ්‍යන්තර ජාලය ස්ථාපිත කිරීම හා අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම සඳහා 2021 වර්ෂයේදී ප්‍රතිපාදන ලබා දෙන ලදී. එම පාසල් වල මාසික අන්තර්ජාල බිල්පත් ගෙවීම සඳහා අවශ්‍ය මුදල් 2022 වර්ෂයේදී ලබා දීම. (වියදම - රු. මී. 13.30) ♦ හදිසි තත්වයන්ට මුහුණ දීම සඳහා සකස් කළ සැලැසුම (CERC) යටතේ ලෝක බැංකු සහනදායී ණය ආධාර යටතේ ග්‍රාමීය පාසල් 100 ක් සඳහා පරිගණක හා ආශ්‍රිත උපාංග ලබා දීම. (වියදම් රු.මී. 325.103) ♦ ජාතික මට්ටමේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශූරයෝ තරඟාවලිය පහත කාණ්ඩ යටතේ සිදුකර ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වීම. (වියදම රු.මී. 0.23 කි) 1. තරුණ පරිගණක විද්‍යාඥයා තරඟාවලිය (YCS) 2. ජාතික පාසල් මෘදුකාංග තරඟාවලිය (NSSC) 3. නිර්මාණාත්මක ගුරුභවතා තරඟාවලිය

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සහ ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ෂණීය ලෙස සංවර්ධනය	♦ ටැබ් පරිගණක ලබා දුන් පාසල් සහ වෙනත් විවිධ ව්‍යාපෘති යටතේ පරිගණක ලබා දුන් පාසල් මූලික කර ගනිමින් ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය සහ පළාත් මට්ටමින් අඩු සාධන මට්ටමක් සහිත විෂයයන් වෙත අවධානය යොමු කරමින් එම විෂයයන් උගන්වන ගුරුවරුන්ගේ මූලික සහ අත්‍යවශ්‍ය තොරතුරු තාක්ෂණ කුසලතාව සංවර්ධනය කිරීම සඳහා මොඩියුලයක් සකස් කිරීම. (වියදම රු. 254,926.00) හා එම මොඩියුලය මුද්‍රණය කිරීම (වියදම රු.මි.1.079). මෙහි දී පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදී. ♦ Libre Office නැමැති විවෘත හා නිදහස් මෘදුකාංගය භාවිතය පිළිබඳව ගුරුහවතුන් පුහුණු කිරීම සඳහා පුහුණු මොඩියුලයක් සකස් කිරීම. ♦ සයිබර් ආරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා හදිසි ප්‍රතිචාර සංසදය මගින් නිකුත් කර ඇති තොරතුරු හා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය අනුව ශ්‍රී ලංකා හදිසි ප්‍රතිචාර සංසදය (SL CERT), ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතන(ICTA), ළමා ආරක්ෂණ අධිකාරිය, ශ්‍රී ලංකා පොලීසිය හා රාජ්‍ය ආයතන හා එක්ව සමස්ථ පාසල් පද්ධතියම සඳහා වන සයිබර් ආරක්ෂණ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේ මූලික කටයුතු ආරම්භ කිරීම. ♦ සමස්ථ පාසල් පද්ධතියම ආවරණය වන පරිදි සෑම පාසලකම පාසල් හදිසි පරිගණක ප්‍රතිචාර සංසදය (School Level Internet Safety Readiness Team) පිහිටුවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හා පුහුණුකරුවන් පුහුණු කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර අධ්‍යාපන අමාත්‍යාංශය තුළ පරිගණක සුරක්ෂිතතා හා සිද්ධි ප්‍රතිචාර සංසදයක් (EDUCSIRT) පිහිටුවීම සඳහා මූලික කාර්යයන් මේ වන විට ආරම්භ කිරීම. ♦ අධ්‍යාපන අමාත්‍යාංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමග සර්වෝදය - ෆියුෂන් ආයතනය හා එක්ව IT යහමග වැඩසටහන යටතේ ධනාත්මක, සදාචාරාත්මක හා කාර්යක්ෂම අන්තර්ජාල හා සමාජ මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් පාසල් විදුහල්පතිවරුන්, තොරතුරු තාක්ෂණ ගුරුහවතුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. ♦ අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව, කැළණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨය හා එක්ව පාසල් අතර "Hackerthon" තරඟාවලිය සංවිධානය කිරීම. ♦ ඩයලොග් ආසියාටා ආයතනය, එලිෆන්ට් හවුස් ආයතනය හා අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව "All island talent development program for school children" නැමැති තරඟාවලිය සංවිධානය කිරීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය හා ගුරු කළමනාකරණය	
ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල තත්වය ඉහළ නැංවීම	♦ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ගුරු ශික්ෂණලාභීන් 6480 දෙනෙකු බඳවා ගැනීමට ගැසට් පත්‍රය නිකුත් කර ඇත.සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම ආරම්භ කර ඇත. ♦ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි අවශ්‍යතා සඳහා ප්‍රාග්ධන වැය විෂය යටතේ අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීම ♦ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි අවශ්‍යතා සඳහා පුනරාවර්ථන වැය විෂය යටතේ අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීම ♦ ගුණාත්මක පූර්ව සේවා ගුරු අධ්‍යාපනය ලබා දීම සඳහා වෘත්තීය කුසලතා ඇති වෘත්තීමය හා සමාජ දැනුවත් භාවය සහිත කාර්ය මණ්ඩලයක් සහ අනාගත ගුරුවරුන් සවිබල ගැන්වීම සඳහා විදේශීය අරමුදල් යටතේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් පවත්වා ඇත.
ජාතික ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය සහ ගුරු කළමනාකරණය	♦ ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථාන මඟින් අඛණ්ඩ ගුරු අධ්‍යාපන වැඩසටහන් හරහා පාසල් පද්ධතියේ ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධන තත්ත්වය ඉහළ නැංවීම . ♦ පාසල් පද්ධතිය තුළ නුපුහුණු ගුරුවරුන් 309ක් පමණ මූලික ගුරු පුහුණුව සඳහා ගුරු විද්‍යාල අටක දැනට දෑ අවුරුදු ගුරු පුහුණුව හැදාරනු ලබයි. ♦ ගුරු අධ්‍යාපන ආයතනවල ගුණාත්මක ගුරු අධ්‍යාපන වැඩසටහන් සැපයීම සඳහා අවශ්‍ය භෞතික හා මූල්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම ,ලබා දීම හා නඩත්තුව. ♦ ගුරුවරුන් සඳහා ගුරු සේවා ව්‍යවස්ථානුකූල කාර්යක්ෂම කඩයිම් පරීක්ෂණ පැවැත්වීම.

සේවාව	බඳවා ගැනීම්	උසස් කිරීම්
ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය	නැත	විශේෂ ශ්‍රේණියට - නැත I ශ්‍රේණියට - 60 II ශ්‍රේණියට - 92
ශ්‍රී ලංකා විදුහල්පති සේවය	III - 155	I ශ්‍රේණියට - 312 II ශ්‍රේණියට - 174
ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය	නැත	II ශ්‍රේණියට- 61
ශ්‍රී ලංකා ගුරු සේවය පළාත් සභා පාසල් ජාතික පාසල් (996+36)	 3649 1032	

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
අධ්‍යාපන සේවාවන්හි තනතුරු පුරප්පාඩු පිරවීම	♦ එම ඉල්ලීම රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා පත් කරන ලද නිලධාරී කමිටුව වෙත ඉදිරිපත් කරන ලදුව, එමගින් විවෘත හා සීමිත යන ක්‍රම ද්විත්වයම ඔස්සේ නියමිත අනුපාතයට යටත්ව තනතුරු පුරප්පාඩු **500**ක් පමණක් බඳවා ගැනීමට කටයුතු කිරීම නිර්දේශ කර ඇති අතර **2022.12.12** දින ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් යටෝක්ත කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ගැනීම සිදු කර ඇත. ♦ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ පවතින අධික පුරප්පාඩු ප්‍රමාණය හේතුවෙන් කටයුතු කරගෙන යාමේ ඇති අපහසුතා ද පුරප්පාඩු **1090**ම බඳවා ගැනීමේ ඇති අවශ්‍යතාවය ද දක්වමින් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ හා ලේකම්තුමාගේ උපදෙස් අනුව සකස් කරන ලද ඉල්ලීම යටෝක්ත කමිටුවේ අවධානය සඳහා සාධාරණීකරණ වාර්තාවක් ද සමග මේ වන විට ඉදිරිපත් කර ඇත.
පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන (SBPTD)	♦ දිවයින පුරා විසිරී ඇති ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථාන **112**ක් මඟින් ගුරු වෘත්තීය සංවර්ධනය උදෙසා අඛණ්ඩ ගුරු අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම, ප්‍රතිපාදන ලබා දීම හා ඒවා නියාමනය කිරීම සිදු කර ඇත. ♦ පාසල්වල සේවය කරන නුපුහුණු ගුරුවරුන් **309** ක් මූලික ගුරු පුහුණුව සඳහා ගුරු විද්‍යාල අට සඳහා බඳවා ගැනීම හා දැ අවුරුදු ගුරු පුහුණුව සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම හා නියාමනය කිරීම සිදු කර ඇත. ♦ ගුරු පුහුණුව අවසන් කරන ලද ගුරු සිසුන් **1888** ක් සඳහා අවසාන ගුරු විභාගය පැවැත්වීය. ♦ ගුරු විද්‍යාල සහ ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දීම, ගොඩනැගිළි හා යන්ත්‍රෝපකරණ හා උපකරණ ලබා දීම හා අලුත්වැඩියා කිරීම **(මිලියන 15)** සිදු කර ඇත. ♦ **SBPTD** යටතේ පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන හඳුන්වා දීම සඳහා පළාත් හා කලාප නිලධාරීන් දැනුවත් කිරීම හා ප්‍රගති සමාලෝචනය සිදු කර ඇත. ♦ කාර්ය මූල පර්යේෂණ සඳහා ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථාන හා ගුරු විද්‍යාල විදුහල්පතිවරුන් දැනුවත් කිරීම හා පර්යේෂණ කාර්යයේ යෙදවීම සිදු කර ඇත.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන (SBPTD)	♦ ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථාන අත්පොත සංශෝධනය කිරීම හා මූලික කෙටුම්පත අවසන් කිරීම සිදු කර ඇත. ♦ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවට අනුව සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ සඳහා නව මොඩියුල 10 ක් සැ කසීම ♦ ගුරු වෘත්තීය නිපුණතා රාමුවට අනුව ගුරුවරුන් දැනුවත් කිරීමේ මොඩියුලය (මූලික කෙටුම්පත) සපයා ඇත.
පාසල් බලගැන්වීමේ වැඩසටහන ශක්තිමත් කිරීම	♦ 05 ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ 2022 වර්ෂය තුළ සිසුන් 114438 දෙනෙකු සඳහා රු.මි. 842.3ක ශිෂ්‍යාධාර ලබාදී ඇත. ♦ සුභඟ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2021 වර්ෂයට අදාළව සිසුන් 493 දෙනෙකු සඳහා පළමු ශිෂ්‍යත්ව වාරිකය, 2020 වර්ෂයේ සිසුන් 452 දෙනෙකු සඳහා දෙවන ශිෂ්‍යත්ව වාරිකය සහ සිසුන් 450 දෙනෙකු සඳහා අවසන් ශිෂ්‍යත්ව වාරිකය ලෙස රු.මි. 30.39 ක ශිෂ්‍යත්ව ලබාදී ඇත. ♦ 2022 වර්ෂය සඳහා තාක්ෂණවේදය ශිෂ්‍යත්ව වැඩසටහන් යටතේ සිසුන් 650 දෙනෙකු සඳහා රු .මි. 9.75 ක ශිෂ්‍යත්ව ලබාදී ඇත. ♦ 2022 වර්ෂය සඳහා සුජාත දියණි ශිෂ්‍යත්ව වැඩසටහන් යටතේ සිසුන් 250 දෙනෙකු සඳහා රු .මි. 3.75 ක ශිෂ්‍යත්ව ලබාදී ඇත
අධ්‍යාපන ප්‍රතිපත්ති වලට අනුකූලව රජයේ අනුමත පෞද්ගලික පාසල්වල කාර්යක්ෂම, ඵලදායි සහ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම	♦ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහභාගීත්වයෙන් ඉගෙනුම් / ඉගැන්වීමේ ක්‍රියාවලිය පාසලේ මානව සම්පත් හා භෞතික සම්පත් පිළිබඳව අධීක්ෂණය හා ප්‍රතිපෝෂණය ලබා දීම සිදු කරනු ලැබේ.2022 වර්ෂයේ දී මේ යටතේ පාසල් 11 ක් නියාමනය කරනු ලැබීය. ♦ රජයේ අනුමත පෞද්ගලික පාසල් 96ක් අධීක්ෂණය කිරීමේ ක්‍රමවේද තව දුරටත් විධිමත් කිරීම සඳහා වාර්ෂික ස්වයං නියාමන පත්‍රිකාව සියලු රජයේ අනුමත පෞද්ගලික පාසල් වෙත හඳුන්වාදීම සිදු කරන ලදී. ♦ රජයේ අනුමත පෞද්ගලික පාසල් කාර්ය මණ්ඩලය සඳහා වීසා නිකුත් කිරීමට අවශ්‍ය ලිපි ලබා දීම තව දුරටත් විධිමත් කිරීම සඳහා චක්‍රලේඛය කෙටුම්පත් කිරීම (පාසල්වල සේවයට පැමිණෙන විදේශිකයන් සඳහා) සිදු කරන ලදී. ♦ විවිධ ක්‍රමවේද ඔස්සේ රැස් කරන ලද තොරතුරු අනුසාරයෙන් ජාත්‍යන්තර පාසල් 396ක් ලේඛණයක් සකසා ඇත. ♦ ජාත්‍යන්තර පාසල් 190ක ඉගෙනුම ලබන සිසුන්ගේ අධ්‍යාපනයට අදාල ලේඛන (අස්වීමේ සහතික වැනි) සම්බන්ධව පැහැදිලි කිරීම් විදේශ අමාත්‍යාංශයට ලබා දීම සිදු කර ඇත. ♦ ශාඛා පාසල් ආරම්භ කිරීම සඳහා වන ඉල්ලීම් සම්බන්ධව කටයුතු කර ඇත. ♦ ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු, අධ්‍යාපන ලේකම් විසින් පවරන රාජකාරි අනුව දහම්පාසල් පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය සමඟ කටයුතු කර ඇත. ♦ රජයේ අනුමත පෞද්ගලික පාසල් හා ජාත්‍යන්තර පාසල්වල ඉගෙනුම ලබමින් සිට රජයේ පාසල් ඉල්ලා සිටින දරුවන් හට පලාත් පාසල් ලබා දීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය තහවුරු කිරීම	
පාසල් හා අධ්‍යාපන ආයතන ඇගයීම් තුළින් ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය තහවුරු කිරීම	♦ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEM) සඳහා තෝරාගත් පාසල් 500 ක අධ්‍යාපන ගුණාත්මක තහවුරුව සම්බන්ධව දැනුවත් කිරීම. ♦ GEM ව්‍යාපෘතියෙහි තෝරාගත් පාසල් වල (1600 ක්) සම්බන්ධව අධ්‍යයනයක් සිදු කිරීම සඳහා ප්‍රශ්නාවලි සකස් කිරීම. ♦ පසුගිය වර්ෂවල ඇගයීමට ලක් කරන ලද විශිෂ්ට ව්‍යවහාර ඇතුළත් ප්‍රකාශනයක් සකස් කරීම. ♦ අධ්‍යාපන ගුණාත්මක තහවුරුවට අදාලව පර්යේෂණ සිදු කිරීම සඳහා යෝජනා ලබා ගැනීම. ♦ පසුගිය වර්ෂ වල ඇගයීමට ලක් කරන ලද පාසල් විශිෂ්ඨ ව්‍යවහාර ඇතුලත් ප්‍රකාශනයක් සකස් කිරීම. ♦ අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුවට අදාළ ප්‍රගති සමාලෝචන රැස්වීම මාර්ගගතව පැවැත්වීම. ♦ පාසල් ඇගයීම් වාර්තා ඇතුලත් කිරීම සඳහා විද්‍යුත් දත්තපාදකයක් සකස් කිරීම සහ පළාත් හා කලාප මට්ටමින් නිලධාරීන් දැණුවත් කිරීම. ♦ 2021 වර්ෂයෙහි පාසල් බාහිර ඇගයීම් සම්බන්ධව වාර්ෂික වාර්තාව සඳහා පළාත් හා කලාප මට්ටමෙන් තොරතුරු රැස් කිරීම. ♦ අපේ පාසල කොතරම් ගුණාත්මකද මාර්ගෝපදේශය සංශෝධනය කිරීම සඳහා සාකච්ඡා පැවැත්වීම. ♦ කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ඇගයීම සඳහා ඇගයීම් ක්‍රමවේද සකස් කිරීම. ♦ පාසල් ඇගයීම සඳහා සම්බන්ධ වන ඇගයීම් කරුවන් ඇගයීම් සඳහා මාර්ගෝපදේශයක් සකස් කිරීම. ♦ ගුරු උපදේශකවරුන් සඳහා නිපුණතා රාමුවක් කෙටුම්පත් කිරීම. ♦ "ගුරු ප්‍රතිභා ප්‍රභා" ගුරු හා විදුහල්පතිවරුන් ඇගයීම් වැඩසටහන පැවැත්වීම. ♦ පාසල් කලමනාකරණ මාර්ගෝපදේශය, අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා පර්යේෂණාත්මක ප්‍රවේශයක් සහ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සම්බන්ධ වාර්ෂික වාර්තාව- 2020 යන ප්‍රකාශන වෙබ්
අධ්‍යාපන ප්‍රතිසංස්කරණ	♦ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා වන මෙහෙයුම් කමිටුව පිහිටුවීම ♦ පොකුරු පාසල් පද්ධතිය පිළිබඳව යාවත්කාලීන තොරතුරු ඇතුළත් කිරීම සඳහා DSIS පද්ධතිය හඳුන්වා දීම ♦ පොකුරු පාසල් තොරතුරු ඇතුළත් කිරීම සඳහා GIS සිතියම හඳුන්වා දීම ♦ අධ්‍යාපන පරිපාලන ව්‍යුහය වෙනස් කිරීම සඳහා වන පොකුරු පාසල් පද්ධතිය පිළිබඳව පළාත් මට්ටමින් සමාලෝචනය කිරීම ♦ අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳව ගරු අමාත්‍යාවරන් සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම ♦ මාර්ගගත රැස්වීම් පැවැත්වීම සඳහා zoom තාක්ෂණය ලබා ගැනීමට කටයුතු කිරීම ♦ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මධ්‍ය කාලීන සැලසුම විෂය සමඟ ඒකාබද්ධ කිරීමේ වැඩමුළුව සැකසීම ♦ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ආකෘතිය සංවර්ධනය කිරීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
විෂයමාලා ප්‍රතිසංස්කරණ	♦ අ.පො.ස උසස් පෙළ සමස්ත විෂයමාලා ප්‍රතිසංස්කරණ සිදුකිරීම සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු කිරීම ♦ විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ පෞද්ගලික පාසල්,ජාත්‍යන්තර පාසල් හා අනෙකුත් අධ්‍යාපන ආයතන පිළිබඳ අනු කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කිරීම පිළිබඳ කාර්යයන් සිදුකිරීම ♦ අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ යටතේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්ට අදාල පර්යේෂණ හා ඇගයීම් සිදු කිරීමේ අනු කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කිරීම පිළිබඳ කාර්යයන් සිදුකිරීම ♦ විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ ඩිජිටල් අධ්‍යාපන පිළිබඳ අනු කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කිරීම පිළිබඳ කාර්යයන් සිදුකිරීම ♦ අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ යටතේ විද්‍යාපීඨ පාඨමාලා සංවර්ධනය යටතේ අනු කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කිරීම පිළිබඳ කාර්යයන් සිදුකිරීම ♦ විෂයමාලා ප්‍රතිසංස්කරණවලට අදාළව විදුහල්පති පුහුණු නියාමන වැඩසටහන (Principal's Training Pilot Programme) පිරිවෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා ලිපි සැකසීම. ♦ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්ට අනුව සකස් කරන ලද මොඩියුල සකස් කිරීමට දායක නොවූ වෙනත් තෙවන පාර්ශවයක නිරීක්ෂණයට ලක් කර අවශ්‍ය සංශෝධන කිරීම.
පාසල්, කලාප, පළාත් හා ජාතික මට්ටමේ අධ්‍යාපන කළමනාකරණ ක්‍රියාවලිය සවිබල ගැන්වීම	
තොරතුරු පද්ධතීන් යාවත්කාලීන කිරීම හා කාර්යමණ්ඩල අවශ්‍යතා නීර්ණය කිරීම.	♦ වාර්ෂික ගුරු මාරු ක්‍රියාවලිය සඳහා මාර්ගගත ක්‍රමවේදයක් හඳුන්වා දීම සහ ගුරු මාරු ශාඛාව සමඟ එහි ප්‍රගතියට සක්‍රීයව දායක වීම. ♦ සිසු තොරතුරු පිළිබඳව මාර්ගගත පද්ධතියේ වැඩසටහන් සහ ජාලකරණය පිළිබඳ දැනුම හුවමාරු සැසි පැවැත්වීම. (මාර්ගගතව) ♦ අධ්‍යාපනයේ සහ අනෙකුත් සියලුම අංශවල ඵලදායී තීරණ ගැනීම සඳහා වන ඉල්ලීම් සම්බන්ධයෙන් නිතිපතා දත්ත සැපයීම. ♦ ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සේවයේ නියුතු නිලධාරීන්ගේ දරුවන් රජයේ පාසල්වල 1 ශ්‍රේණියට ඇතුළත් කිරීමේ වැඩසටහන යටතේ 2023 වර්ෂයේ 1 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්පත් 12,155ක දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීම. ♦ 2021 වර්ෂය සඳහා 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ කඩයිම් ලකුණු නිකුත් කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම. ♦ 2019 සහ 2020 වසර දෙකක ඊට සමගාමීව විෂය නිර්දේශ දෙකකට අයත් අධ්‍යන පොදු සහතික පත්‍ර උසස් පෙළ සමතුන්ගෙන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ 2022 වර්ෂයේ ඉදිරිපත් වූ අයදුම්පත් 75,800ක ප්‍රමාණයකින් තේරීම් කටයුතු සිදුකිරීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
මානව සම්පත් සංවර්ධනය	
ශාස්ත්‍රපති පාඨමාලාවන් (දේශීය, විදේශීය)	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන යටතේ **2021-2024** කාලය තුල ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය හා විෂයමාලා සංවර්ධන කාර්යයේ නියැලෙන නිලධාරීන් සඳහා විදේශ විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව **300** ක් ලබා දීමට සැලසුම් කර තිබිණ. ඒ වන විට පැතිරුන **covid-19** වසංගත තත්ත්වය හා මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගෙන අදාල ඉලක්ක සපුරා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් දේශීය විශ්වවිද්‍යාල හා වෙනත් රාජ්‍ය විශ්වවිද්‍යාල මඟින් ශාස්ත්‍රපති උපාධි වසරකට **200** බැගින් ලබා දීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත. ඒ අනුව, පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය - **135 (2022/2023** වසර සඳහා) ජාතික අධ්‍යාපන ආයතනය **(MEd in Ed.mgt.) – 255 (2021/2022** වසර සඳහා) පාඨමාලාවන් හදාරමින් සිටී.
අධ්‍යාපන තක්සේරුව හා ඇගයීම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	ජාතික අධ්‍යාපන ආයතනය විභාග දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි එහි නිලධාරීන් **18** දෙනෙකු සහ තවදුරටත් අධ්‍යාපන පද්ධතිය තුළ අධ්‍යාපන තක්සේරුව හා ඇගයීම යාවත්කාලීන කිරීම සඳහා ත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලින් පද්ධතියට හඳුන්වා දීමට යන ඇගයීම් පද්ධතියේ ප්‍රචලිත කිරීම සඳහා එක් කලාපයකින් නිලධාරීන්/ගුරු උපදේශකවරුන් දෙදෙනෙකු බැගින් පුහුණු කිරීම ජාතික අධ්‍යාපන ආයතනය විසින් ආරම්භ කර ඇත.විභාග දෙපාර්තමේන්තුවේ - **18** පුහුණුව ලබා අවසන්ව අවසාන පරීක්ණයට පෙනී සිට ඇත.කලාපයකට නිලධාරීන්/ගුරු උපදේශකවරුන් දෙදෙනෙකු බැගින් - **185** පාඨමාලාව හදාරමින් සිටී.
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් පවත්වන පර්යේෂණ ක්‍රම විද්‍යාව පිළිබඳ සහතික පත් පාඨමාලාව හා දත්ත විශ්ලේෂණය පිළිබඳ සහතික පත් පාඨමාලාව	පර්යේෂණ ක්‍රම විද්‍යාව හා දත්ත විශ්ලේෂණය සම්බන්ධයෙන් පර්යේෂණ කාර්යයන් වල නියුක්ත නිලධාරීන් සඳහා පුළුල් අවබෝධයක් ලබා දීමේ අරමුණින් මෙම සහතික පත් පාඨමාලාව ආරම්භ කර ඇත. එයට අමතරව නිලධාරීන් **14** දෙනෙකු එක් දින/ දෙදින සම්මන්ත්‍රණ සඳහා පර්යේෂණ ක්‍රම විද්‍යාව සම්බන්ධව මෙම ආයතනය විසින් ම සංවිධානය කල පාඨමාලා සඳහා සහභාගී වී ඇත.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
මානව සම්පත් සංවර්ධනය	
සේවාරම්භක පුහුණු වැඩසටහන්	ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන (161) මාර්ගගත ක්‍රමය ඔස්සේ මීපේ අධ්‍යාපන සංවර්ධන ආයතනය මඟින් සහ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවාරම්භක පුහුණු වැඩසටහන (26) පේරාදෙණිය හා යාපනය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වලදී පවත්වන ලදී.
ධාරිතා සංවර්ධන වැඩසටහන්	♦ විදුහල්පති ශ්‍රේණිධාරීන් මූලික විදුහල්පති පාඨමාලාව (අධ්‍යාපනික හා කළමනාකරණ න්‍යායයන්, නායකත්ව සංවර්ධනය, අධ්‍යාපන හා උපාය මාර්ගික නායකත්ව කළමනාකරණය වැනි පාඨමාලා හතරක් සම්පූර්ණ කිරීම) 2022 වසර අවසන් වන විට පළාත් මට්ටමින් නිලධාරීන් 4477 දෙනෙකු සඳහා දිවයින පුරා පුහුණු කටයුතු අවසන් කර ඇත. උසස් විදුහල්පති පාඨමාලාව (තුලනාත්මක ඉගෙනුම් ඵල මෙහෙයවීම සහ කළමනාකරණය, පාසල් කාර්යාල කළමනාකරණය, පාසල් මූල්‍ය සහ පාසල් ප්‍රජාව වැනි අතිරේක පාඨමාලා හතරක් සම්පූර්ණ කිරීම) මීපේ අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය මඟින් විදුහල්පතිවරුන් 810 මේ වන විට පුහුණු කර ඇත. ♦ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය/ගුරු අධ්‍යාපනඥ සේවය අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථාවට අනුකූලව අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන් 99 දෙනෙක් ද , ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවට අනුව ධාරිතා සංවර්ධන වැඩසටහන් 229 දෙනෙකු සඳහා මහවැලි, පේරාදෙණිය, යාපනය හා මහරගම විද්‍යාපීඨවල පුහුණුව පවත්වා අවසන් කර ඇත.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
මානව සම්පත් සංවර්ධනය	♦ පාඨමාලා ගාස්තු ප්‍රතිපූරණය අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සහ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථානුකූලව හා වෘත්තීය අවශ්‍යතාවය මත හදාරනු ලබන දේශීය පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් 37 දෙනෙකු සඳහා පාඨමාලා ගාස්තු ප්‍රතිපූරණය කර ඇත.
සාමාන්‍ය අධ්‍යාපන තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීන කිරීම.	♦ 2021 අධ්‍යයන වර්ෂය සඳහා රජයේ සියලුම ජාතික හා පළාත් පාසල් (10146), පිරිවෙන් (819), පෞද්ගලික පාසල් (93) හා විශේෂ පාසල් (30) සංගණනය සඳහා අවශ්‍ය වූ සංගණන ලේඛන සකස් කර මාර්ගගත ක්‍රමයට පුහුණු වැඩසටහන් මාලාවක් අදියර අනුව පැවැත්වීම ♦ රජයේ පාසල්වල තොරතුරු ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් තෝරාගත් පෞද්ගලික ආයතනය මගින් රජයේ පාසල් සිසු, ගුරු-විදුහල්පති හා පාසල් භෞතික තොරතුරු රැස් කිරීමට සකස් කළ මාර්ගගත (Online) පරිගණක වැඩසටහන මගින් රජයේ පාසල්වල දත්ත යාවත්කාලීන කිරීම. ♦ පාසල් මට්ටමින් ඇතුළත් කළ දත්ත ගොනු මගින් ජාතික මට්ටමේ අවසන් දත්ත ගොනු සකස් කිරීම

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
සාමාන්‍ය අධ්‍යාපන තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීන කිරීම.	♦ මුළු රටේම රජයේ පාසල් දත්ත ගොනුවේ දත්ත සංස්කරණ කටයුතු, දත්ත විශ්ලේෂණ කටයුතු සිදුකර අවසන් දත්ත ගොනු අනුසාරයෙන් සංඛ්‍යාලේඛන වගු සකස් කිරීමෙන් පසු සංගණන සාරාංශ වාර්තාව සකස් කර අමාත්‍යාංශ වෙබ් අඩවියේ හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට ඇතුළත් කර දත්ත භාවිතා කරන්නන් හට පරිශීලනය සඳහා අවකාශය සැලසීම. ♦ විස්තරාත්මක අවසන් වාර්තාවේ කටයුතු 80% අවසන් අතර ඉතාම නුදුරු දිනයකදී වෙබ් අඩවියට මුදාහැරීමට නියමිත වේ. ♦ 2022 පාසල් සංගණනයේ රජයේ පාසල්වල දත්ත රැස් කිරීමට අදාළව ගුරු විදුහල්පති(Google Form) පරිගණක වැඩසටහන සැකසීමේ කටයුතු 90%ක් පමණ අවසන් කිරීම . ♦ එම සංගණනයට අවශ්‍ය ලේඛන (ආකෘති පත්‍ර හා උපදෙස් සංග්‍රහ) සකස් කිරීමේ කටයුතු 90%ක් අවසන් කිරීම
විදේශ ආයතන හා විදේශ කටයුතු	♦ අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ නිලධාරීන් හා ගුරුභවතුන් 91 දෙනෙක්ට විදේශ සංචාර සඳහා සහභාගී වීමට පහසුකම් සැලසීම. ♦ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් විවිධ පාඨමාලා සඳහා නාම යෝජනා ඉදිරිපත් කළ නිලධාරීන් 54 දෙනෙකුගේ අයදුම්පත් යවා ඇත. ♦ වීසා ලබාගැනීම නිර්දේශිත නිලධාරීන් 46 දෙනෙකු සඳහා ලබා දී ඇත. JICA ආයතනයේ ස්වේච්ඡා සේවකයින් 15 දෙනෙකු සඳහා වීසා හා පැමිණීමට අවශ්‍ය අනුමැතීන් ලබා දී ඇත.
සාක්ෂි පදනම් කර ගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය,පර්යේෂණ සහ ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම සවිබල ගැන්වීම.	
සාක්ෂි පදනම් කරගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, පර්යේෂණ සහ ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම සවිබල ගැන්වීම	♦ 2022 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම හා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම. ♦ 2023-2027 මධ්‍යකාලීන සැලසුම් සකස් කිරීමේ කටයුතු සිදු කිරීම ♦ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම. ♦ පාසල් ව්‍යුහ කටයුතු සම්බන්ධීකරණ කටයුතු කිරීම ♦ විදේශ ව්‍යාපෘති සම්බන්ධීකරණ කටයුතු කිරීම
අධ්‍යාපන පද්ධතිය නියාමනය හා ඇගයීම	♦ වාර්ෂික කාර්යසාධන වාර්තාව හා පාර්ලිමේන්තු අයවැය කාරකසභා අවස්ථාව සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රගති වාර්තාව සකස් කිරීම. ♦ අධ්‍යාපන පද්ධතියේ නියාමන හා ඇගයීම් ව්‍යවහාර පිළිබඳ පවත්නා තත්වය පිළිබඳ අනාවරණ අධ්‍යයනයක් සිදු කර වාර්තාව එළි දැක්වීම. ♦ 2021වර්ෂයේ දී සකස් කළ නියාමන හා ඇගයීම් රාමුව නැවත සමාලෝචනය කර ස්ථාවර කමිටු අනුමැතිය ලබා ගැනීම. ♦ නියාමන හා ඇගයීම් රාමුවට අදාළව පරිශීලක මාර්ගෝපදේශය සහ නියාමන ආකෘතිය සකස් කර ස්ථාවර කමිටු අනුමැතිය ලබා ගැනීම.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
අධ්‍යාපන පද්ධතිය නියාමනය හා ඇගයීම	♦ රේඛීය අමාත්‍යාංශය,උතුරු මැද පළාත සහ මධ්‍යම පළාත් නිළධාරීන් සඳහා නියාමන සහ ඇගයීම් රාමුව පිළිබඳ සාමාන්‍ය දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම. ♦ මිලියන 100ට වැඩි ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය හා අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය ව්‍යාපෘති කළමනාකරණ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත හා අදාළ අනෙකුත් අංශ වෙත වාර්තා කිරීම. ♦ ජනාධිපති කාර්යාලය මගින් මෙහෙයවන විශේෂ වැඩසටහන් සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව හා සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාත්මක කිරීමෙන් රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සුවිශේෂී ව්‍යාපෘතිවල ප්‍රගතිය සකස් කර අදාළ අංශ වෙත වාර්තා කිරීම. ♦ නියාමනය හා ඇගයීම් කාර්යයන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනෙකුත් අංශ හා බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම සහ රැස්වීම් සංවිධානය කිරීම.
අධ්‍යාපන පර්යේෂණ තුළින් අධ්‍යාපන සංවර්ධනය	♦ කොවිඩ් වසංගත තත්වය හා ආර්ථිකමය පසුබෑම හේතුවෙන් සිසු දරුවන්ට අහිමි වූ ඉගෙනුම් අවස්ථා පිළිබඳ පර්යේෂණ යෝජනාවලි පළාත් මට්ටමින් සංවර්ධනය කිරීම. ♦ අධ්‍යාපන පර්යාලෝක ජර්නලය සඳහා පර්යේෂණ ලිපි 27 ක් සමාලෝචනය කිරීම. ♦ "දැනුමින් පිරි අනාගතයකට සිසු පර්යේෂකයෝ" යන මැයෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමඟ එක්ව පළාත් මට්ටමින් තෝරාගත් සිසු පර්යේෂණ යෝජනාවලි 56 ක් ඇඟයීමට ලක් කිරීම තුළින් හා ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනාවලි 27 ක් තෝරා ගැනීම. ♦ පර්යේෂණ අධ්‍යයනවල නිසි ප්‍රමිතිකරණයක් ඇතිකිරීම සඳහා
නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය සහතික කිරීම	
පාසල් දරුවන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම	♦ සියළුම දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගත හැකි වන පරිදි,ආර්ථික අපහසුතා සහිත දරුවන් සඳහා මූල්‍ය ආධාර ලබා දීමේ අරමුණ පෙරදැරි කර ගනිමින් විවිධ නිර්ණායකයන් යොදා තෝරා ගෙන දරුවන් හට විවිධ වූ ශිෂ්‍යත්ව ප්‍රදානයන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදු කරණු ලැබේ. ♦ රු.මිලියන 30.39ක වියදමින් සුභග ශිෂ්‍යත්ව 945ක් ද රු.මිලියන 842.3ක වියදමින් 5 ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන් සඳහා ශිෂ්‍යාධාරීන් 114,438 ක් සඳහා ශිෂ්‍යාධාර ද රු.මිලියන 9.75ක වියදමින් තාක්ෂණවේදය ශිෂ්‍යත්ව 650ක් ද, මිලියන 3.75ක වියදමින් සුජාත දියණි ශිෂ්‍යත්ව 250ක් ද ලබා දී ඇත.

ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
පිරිවෙන් අධ්‍යාපන අංශය	
♦ පිරිවෙන් ගුරු වැටුප්, ශිෂ්‍යාධාර හා විශේෂ පිරිවෙන් සඳහා ආධාර ලබා දීම	පිරිවෙන් අධ්‍යාපන ශාඛාව යටතේ පිරිවෙන් අධ්‍යාපන ආයතන **825**ක් ක්‍රියාත්මක වේ. මෙම පිරිවෙන්වල පැවිදි/ ගිහි සිසුන් **77,812** ක් අධ්‍යාපනය ලබන අතර පරිවේනාචාර්‍යවරුන් **7498** දෙනෙක් සේවයේ යෙදී සිටි.ඒ අනුව වාර්ෂික ශිෂ්‍යාධාර සඳහා වැය කර ඇති මුදල රු.මිලියන **290** ක් වන අතර පිරිවෙන් ගුරු වැටුප් සඳහා වැය කර ඇති මුදල රු.මිලියන **4106** කි.
♦ පිරිවෙන් ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම	මේ සඳහා වෙන්වූ ප්‍රතිපාදනවලින් රු. මිලියන **29.82**ක් **2022** වර්ෂය සඳහා හඳුනාගත් නව ව්‍යාපෘති **24**ක් වෙනුවෙන් ද රු.මිලි.**35.89** ක් **2021** වර්ෂයේ දී සිදු කරන ලද ගොඩනැගිලි අලුත් වැඩියා කිරීම වෙනුවෙන් පැවති බැරකම් ගෙවීම සඳහා ද නිදහස් කර ඇත. **2022.12.31** දින වන විට සාර්ථකව නිම කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද මුළු වියදම රු.මිලියන **47.78**කි.
♦ ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය	ඒ යටතේ කරන ලද ගොඩනැඟිලි ඉදි කිරීම් සඳහා පැවති අතැති බිල්පත් ගෙවීම වෙනුවෙන් වැයවූ මුදල රු. මිලියන **22.45**කි.
♦ මානව සම්පත් හා ධාරිතා සංවර්ධන වැඩසටහන	**2022.12.31**දිනට මෙම වැඩසටහන වෙනුවෙන් දරන ලද මුළු වියදම රු.මිලියන **14.09** කි. ගුණාත්මක පිරිවෙන් අධ්‍යාපනයක් ස්ථාපිත කිරීම සඳහා විශාල දායකත්වයක් මෙම ධාරිතා සංවර්ධන වැඩසටහන මඟින් ලබා දී ඇත.
♦ පාවහන් සඳහා තිළිණපත් ලබා දීම	දුෂ්කර, අති දුෂ්කර හා හුදකලා ලෙස හඳුනාගත් පිරිවෙන්වල ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට, බෞද්ධ සීලමාතාවන්ට හා ගිහි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පාවහන් සඳහා තිළිණපත් ලබා දීම යටතේ තිළිණපත් ලැබූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව **22167**කි.
♦ දහම් පාසල් සංවර්ධනය	දහම් පාසල් **14**ක ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යවා ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලියන **7.09**කි. එසේම **2021** වසරේ දී සිදු කරන ලද සංවර්ධන කටයුතුවල බැරකම් ගෙවීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලියන **3.09** ක් වන අතර වර්ෂයේ සමස්ත වියදම රු. මිලියන.**6.46**කි.
♦ පිරිවෙන් අධ්‍යාපන ආයතනයන්හි සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	මෙම ව්‍යාපෘතිය ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වේ. මේ සඳහා පිරිවෙන් අධ්‍යාපන ආයතන **200**ක් තෝරා ගනු ලැබ ඇති අතර මුළු ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල් මිලියන **181.352**කි. **2022** වර්ෂය අවසන් වන විට සම්පූර්ණයෙන් වැඩ අවසන් කරන ලද සනීපාරක්ෂක පද්ධති සංඛ්‍යාව **187**කි.









ක්ෂේත්‍රය	ළඟා කර ගත් ප්‍රගතිය
ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව	
ශ්‍රී ලංකාවේ ජාතිකත්වයන් අතර අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය කිරීම	♦ ජාත්‍යන්තර සම්මේලන සඳහා ශ්‍රී ලංකාව වෙනුවෙන් සහභාගීත්වය අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් සහභාගී වූ අතර ජාත්‍යන්තර සම්මේලන පහත පරිදි වේ. * **Transforming Education Summit** * **World Conferences on Early Childhood Care and Education** * **Global Meeting 'International Literacy Day'** * **World Atlas of Language** * **17th Session of the Intergovernmental committee** * **World Conferences on Early Childhood Care and Education** * **Tokiyo Convention** * **15th Anniversary of Concerning the protection of the World cultural Naturel Heritage** * **Piloting Media** * **Intergovernmental committee meeting** * **Sanitization Strategy on the impact of illicit traffic king of cultural property** * **South-West Asia Sub regional Meeting and ESD** * **2023 Convention call for experts for category vi meeting** ♦ UNESCO STEM - ප්‍රධාන කාර්යාලය වෙතින් ශ්‍රී ලංකාවේ පාසල් වෙත බෙදා දීම සඳහා යුනෙස්කෝ පරිත්‍යාග ලෙසින් STEM කට්ටල ශ්‍රී ලංකාව වෙත ලබා දීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු ඉටු කර ඇත. ♦ ශිෂ්‍යාධාර ගෙවීමට ඇති පනතේ ප්‍රකාරව නිර්ණායක දෙකම සම්පූර්ණ කර ඇති ශිෂ්‍යත්ව ලාභීන් සඳහා ශිෂ්‍යාධාර 2022 දෙසැම්බර් මස දක්වා ගෙවීමටත් තේරීම් කමිටුව තීරණය කර ඇත. ඒ අනුව හිඟ ගෙවීම් කටයුතු 75% අවසන් කර ඇත. ♦ 2022-08-08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නිර්දේශිත පරිදි SACTD ආයතනය වෙත විධායක අධ්‍යක්ෂක වරයෙකු වසරක කාලයක් සඳහා පත් කර ඇත.

2.1.2 ශිෂ්‍ය කාර්ය සාධනය

(අ) පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය

පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව සහ ශිෂ්‍ය සාධනය (2016 – 2022)



පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය (2016 – 2022)

	2016	2017	2018	2019	2020	2021	2022
පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව	343,757	350,462	350,191	332,179	326,264	335,158	329,668
ලකුණු 70ට වඩා ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය (%)	75.67	69.40	79.09	78.10	86.83	77.12	82.97
මධ්‍යන්‍ය ලකුණ	107.86	106.43	117.98	114.38	125.65	109.31	115.11

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව

(ආ) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

	2015	2016	2017	2018	2019	2020	2021
පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව	273,224	286,251	296,812	296,029	305,427	308,134	311,321
සමත් ශිෂ්‍ය සංඛ්‍යාව	189,428	200,208	216,815	222,281	225,539	236,015	231,982
සමත් ප්‍රතිශතය %	69.3	69.9	73.05	75.09	73.84	76.59	74.52

අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් අ.පො.ස. (උ/පෙළ) සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය (2015 – 2021)

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව

පළාත් අනුව අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් අ.පො.ස. (උ/පෙළ) සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය (2020 – 2021)

පළාත	2020			2021		
	පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව	සමත් ශිෂ්‍ය සංඛ්‍යාව	සමත් ප්‍රතිශතය %	පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව	සමත් ශිෂ්‍ය සංඛ්‍යාව	සමත් ප්‍රතිශතය %
දකුණ	38695	31,113	80.41	81,299	61,854	76.08
වයඹ	36286	27.283	75.19	16,563	12,002	72.46
බස්නාහිර	80849	60,789	75.19	39,487	30,860	78.15
ඌව	21086	15,812	74.99	40,160	29,584	73.67
මධ්‍යම	41262	30,812	74.67	28,849	21,492	74.5
සබරගමුව	28836	21.498	74.55	36,874	26,613	72.17
උතුරු මැද	20796	15,428	74.19	20,901	15,257	73
නැගෙනහිර	23739	17,183	72.38	25,895	19,201	74.15
උතුර	16577	11,534	69.58	21,293	15,119	71
මුළු එකතුව	308126	231,452	75.12	311,321	231,982	74.52

අ.පො.ස. (සා/පෙළ) විභාගය (2011 –2021 ඒ ඒ විෂය සමත් ශිෂ්‍ය ප්‍රතිශතය)



මූලාශ්‍රය - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

(ඇ) අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය (පාසල් අයදුම්කරුවන්) 2017 - 2021

	2017	2018	2019 (නව නිර්දේශය)	2019 (පැරණි නිර්දේශය)	2020 (නව නිර්දේශය)	2020 (පැරණි නිර්දේශය)	2021
පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව	206,630	218,191	173,781	61,769	251,168	24146	278,602
විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය සංඛ්‍යාව	136,421	141,172	108,353	46,552	165,711	15,960	149,946
විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය (%)	66.02	64.70	62.35	75.36	65.98	66.10	63.53

එක් එක් විෂය ධාරාවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය
(පළමු වරට පෙනී සිටින 2017 - 2021)















මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව

2.2 පවත්නා අභියෝග

01. අධ්‍යාපන ක්ෂේත්‍ර සඳහා විවිධ වූ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක වුව ද, ශ්‍රී ලංකාව සඳහා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් අනුමත වී නොතිබීම. ශ්‍රී ලංකාවේ සෑම දරුවකු සඳහාම සම සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණු පෙරදැරීම, සමස්ත අධ්‍යාපන පද්ධතිය සඳහා නව අධ්‍යාපන ප්‍රතිපත්ති මාලාවක් මේ වනවිට සකස්කර ඇති අතර, අදාළ අනුමැතීන් ලබාගෙන, එම ප්‍රතිපත්ති සාක්ෂාත් කරගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ගැනීම අපේක්ෂිතය.

02. 21 වන ශත වර්ෂයට ගැලපෙන නිපුණතාවයකින් හා අනාගත ලෝකයේ රැකියා වෙළෙඳ පොළ සඳහා දරුවන් සංවර්ධනය කිරීම උදෙසා, දැනට පවතින විභාග කේන්ද්‍රීය විෂයමාලාව අභියෝගයක් ලෙස හඳුනාගැනීම තුළින්, ඉදිරියේ දී ශිෂ්‍ය කේන්ද්‍රීය, ව්‍යාපෘති පාදක/ පර්යේෂණාත්මක ක්‍රමවේදය ඇතුළත් නව විෂයමාලාවක් 2024 වර්ෂයේ සිට හඳුන්වාදීම සඳහා මේ වනවිට කටයුතු කරමින් පවතී.

03. ආර්ථික හා සාමාජීය ව්‍යසනය (පසුබෑම) ද, සමස්ත අධ්‍යාපන සංවර්ධනය සඳහාම සෘණාත්මක බලපෑමක් ඇතිකර ඇත. පාසල් ප්‍රජාවගෙන් දරුවන්ගේ අධ්‍යාපනයට සහායවීම අභියෝගයට ලක් වී ඇත. කෙසේ වෙතත්, රජය විසින් අධ්‍යාපනය සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සලසාදීමට කටයුතු කරමින් පවතී.

04. රටෙහි ආර්ථික හා සාමාජීය පසුබෑම, දරුවන්ගේ පෝෂණ ඌණතා හා සෞඛ්‍ය තත්ත්වයන් සම්බන්ධයෙන් ද බලපෑම් ඇතිකර ඇති අතර, මෙම සාධකය දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි ද බලපෑමක් ඇති කරයි. දරුවන්ගේ පෝෂණ හා සෞඛ්‍ය තත්ත්ව ඉහළ නැංවීම සඳහා මේ වනවිටත් ශ්‍රී ලංකා රජය විසින් විවිධ වූ ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

05. COVID – 19 වසංගත තත්ත්වය හා ආර්ථික ගැටලු හේතුවෙන් දීර්ඝ කාලයක් පාසල් වසා තැබීමට සිදුවීම හේතුවෙන් හා නියමිත කාලයක් තුළ ජාතික විභාග පැවැත්වීමට නොහැකිවීම විවිධ හේතූන් මත දරුවන් තුළ ඇති වී ඇති මානසික ගැටලු නිරාකරණය සඳහා ද විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙමින් පවතී. එසේම මෙම සාධක හේතුවෙන් දරුවන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියේ සිදු වූ මහහැරීම් අවම කර ගැනීම සඳහා, දරුවන්ගේ සාධන මට්ටම් පිළිබඳ ඇගයීම් පිළිබඳ අධ්‍යයනයක් සිදුකර, එම පර්යේෂණ ආවරණ උපයෝගී කොටගෙන ප්‍රතිකාර්ය ඉගෙනුම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

විශේෂයෙන්ම ප්‍රාථමික ශ්‍රේණිවල දරුවන්ට පාසලෙන් ලබාදෙන මූලික කියවීමේ හා ලිවීමේ හැකියාව, ගණිත හැකියාවන් සංවර්ධනය සඳහා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වේ.

06. විෂයානුබද්ධ ගුරු හිඟය හා දුෂ්කර ප්‍රදේශවල පවතින පාසල් හා දෙමළ මාධ්‍ය පාසල්වල පවතින ගුරු හිඟය සඳහා කඩිනම් විසඳුම් සෙවීම කළ යුතු වේ. දැනට රාජ්‍ය සේවයේ නියැලී ඇති උපාධිධාරීන්ගේ හා විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරීන්ගේ සුදුසකම්ලත් අය අතුරෙන් ගුරු සේවය සඳහා කඩිනමින් බඳවා ගැනීමට අපේක්ෂිත වේ.

07. අධ්‍යාපන පද්ධතියේ සියලුම සේවාවන්ට අදාළව පුරප්පාඩු පැවැත්වීම අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය සඳහා බාධා ඇති කරනු ලැබේ. ඉදිරි කාලසීමාව තුළ දී, සියලුම සේවාවන්ගේ පුරප්පාඩු ක්‍රමිකව පිරවීම සඳහා අපේක්ෂිත වේ.

08. සම සාධාරණ අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා සියලුම කාණ්ඩවල දරුවන් සඳහා ලබාදීම අපේක්ෂිත වුවත්, පාසල් පද්ධතියේ පවතින විෂමතා හේතුවෙන් සියලුම දරුවන් සඳහා එම අවස්ථාව මහහැරී ඇති අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා පාසල් පද්ධති විචාරවත් කිරීම තුළින් මේ සඳහා විසඳුම් ලබා දීමට අපේක්ෂිත වේ.

2.3 ඉදිරි ඉලක්ක

2020 - 2021 වර්ෂයේ පැවති කොවිඩ් වසංගතය සහ අනුක්‍රමිකව පසුව ඇති වූ ආර්ථික හා සමාජයීය අර්බුදකාරී වාතාවරණය තුළ පාසල් යන වයසේ පසුවන දරු දැරියන් හට තම පාසල් අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාමේදී දුෂ්කරතා මතුවිය. එවැනි දුෂ්කරතා මඟහරවා ගනිමින් රාජ්‍ය ප්‍රතිපත්තීන් වලට අනුගත වෙමින් **21**වෙනි සියවසට ඔබින පරිදි සිසු දරු දැරියන්ගේ කුසලතා, දැනුම හා ආකල්ප සංවර්ධනය සඳහා දැඩි අවධානය යොමුකරමින් ඒ සඳහා වඩාත් යෝග්‍ය පරිදි විෂයමාලා ප්‍රතිසංස්කරණ හා සමස්ත අධ්‍යාපන පද්ධතියෙහි පරිවර්තන ඉදිරි වර්ෂවල දී ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඇත.

1. අධ්‍යාපනයේ ප්‍රවේශ අවස්ථා තහවුරු කිරීම සහ තවදුරටත් පුළුල් කිරීම.

⇒ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තීන් තවදුරටත් තහවුරු කිරීම.

⇒ ජාතික අධ්‍යාපන කොමිසමෙහි නිර්දේශ සහිතව අධ්‍යාපනය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම. ඒ සඳහා අවශ්‍ය නීතිමය රාමුව සකස් කිරීම.

⇒ අධ්‍යාපනයේ සම සාධාරණ අවස්ථා තහවුරුවන පරිදි අධ්‍යාපන සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- නොමිලේ පෙළපොත්, පාසල් නිල ඇඳුම්, හා සිසු රක්ෂණාවරණ පහසුකම් සැපයීම.
- ශිෂ්‍යාධාර සහ ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2. පාසල් අතර සම්පත් බෙදීයාමේ විෂමතාවය අවම කිරීම සහ තවදුරටත් සම සාධාරණ අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා පුළුල් කිරීම සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම ක්‍රියාත්මක කිරීම.

⇒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

- ජාතික ප්‍රතිමාන අනුව භෞතික හා මානව සම්පත් සහිත ප්‍රමුඛ පාසල් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ඇතිවන පරිදි දැනට පවත්නා පාසල් අතුරින් නිර්ණායක මත පදනම්ව හඳුනාගත් පාසල් සංවර්ධනය කිරීම.

- එම ප්‍රමුඛ පාසල්හි සම්පත් හුවමාරු කරගැනීමට හැකිවන පරිදි පාසල් පොකුරු **(Cluster Schools)** ඇති කිරීම සහ ඒ සඳහා සුදුසු පරිදි පරිපාලන ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීම.

- සිතියම් අභ්‍යාස මඟින් හඳුනාගත් පාසල් පොකුරු අනුව අධ්‍යාපන සංවර්ධන මණ්ඩල හා නව කලාප පිහිටුවීම. පාසල් පොකුරු **(School Clusters) 1200** ක් සහ පාසල් මණ්ඩල **(School Boards) 550** ක් වන ලෙස ශ්‍රී ලංකාවේ සියලුම පාසල් ජාලගත කිරීම.

- පොකුරු පාසල් පද්ධතිය තුළ අව්‍යාජ ඉගෙනුම් පරිසරයක් **(Authentic Learning Environment)** නිර්මාණය කිරීම සඳහා පාසල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කටයුතු කිරීම.

2.3.2 අනෙකුත් වැඩසටහන්

- **13** වසරක සහතික කරන ලද අධ්‍යාපනය තවදුරටත් ක්‍රියාත්මක කිරීම.
  අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල පිළිබඳ නොසලකා, සියලුම දරුවන්ට උසස් පෙළ සඳහා ඇතුළත් විය හැකි පරිදිත්, කිසිදු වෘත්තීය කුසලතාවයකින් තොරව පාසල් පද්ධතියෙන් ඇද හැලෙන දරුවන් සඳහා වෘත්තීය කුසලතා ලබා ගත හැකි පරිදි වෘත්තීය විෂයයන් **26**කින් යුතු විෂයමාලාව උසස් පෙළ සඳහා හඳුන්වාදෙන ලදි. මෙම වැඩසටහන විෂයයන්ගේ වලංගුතාවයන් සලකා බලා විශ්ලේෂණය කර නවීකරණය තුළින් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

⇒ පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.
⇒ අන්තර්කරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය සහ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සැපයීම.
⇒ නියමිත ප්‍රමිතීන් හා ප්‍රතිමාන **(Standards and Norms)** අනුව, ආරක්ෂිත, ආකර්ශණීය සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හිතකර ඉගෙනුම් - ඉගැන්වීම් පරිසරයක් නිර්මාණය කිරීම තුළින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ඉගෙනුම් ඵල තවදුරටත් ඉහළ නැංවීම.
⇒ වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශන වැඩසටහන් ශක්තිමත් කිරීම.

- අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහල නැංවීම සහ විෂයමාලා ප්‍රතිසංස්කරණ සිදුකිරීම

රට තුල පවතින අර්බුදකාරී තත්වය හමුවේ සැලසුම්කර පැවති ආකාරයෙන් විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ යම් පසුබෑමක් ඇතිවුවද, ඒවායේ කාලානුරූපී බව සලකා අදියර වශයෙන් විෂයමාලා ප්‍රතිසංස්කරණ සිදු කිරීමට සැලසුම්කර ඇත. නියමු අධ්‍යයනවලින් **(pilot study)** පසුව එම ප්‍රතිසංස්කරණ සමස්ත පාසල් පද්ධතිය තුල ක්‍රියාත්මක කිරීමට නියමිතයි.

⇒ මහහැරී ගිය ඉගෙනුම් **(Learning losses)** අවස්ථා කඩිනමින් ආවරණය කිරීම සහ අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්පත්කර ගැනීම සඳහා සිසු දරු දැරියන් හට අවශ්‍ය සහාය ලබාදීම.

මෙතෙක් සිදුකර ඇති සමීක්ෂණ හා පර්යේෂණ ආශ්‍රයෙන් හඳුනාගත් ඉගෙනුම් අවශ්‍යතා කඩිනමින් සපුරාලීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.
පාසල් අධ්‍යාපනයෙන් ඇදහැලීමේ අවදානමට ලක්ව ඇති සිසුන් හඳුනාගෙන ඔවුන් නැවත අධ්‍යාපනය වෙත යොමු කිරීම සඳහා විවිධ සංවර්ධන පාර්ශ්වයන්ගේ දායකත්වය සහිතව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

⇒ විෂයමාලා සංවර්ධනය සහ ප්‍රතිසංස්කරණය

විභාග කේන්ද්‍රීය ක්‍රමවේදයක් වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන පද්ධතියක් සකස් කිරීම
21වන ශතවර්ෂයටත්, දැනුම් ආර්ථිකයටත් ගැළපෙන පරිදි හා තිරසර ලෙස සකස් කරන ලද විෂයමාලා රාමුවට අනුව, විෂයමාලා නවීකරණය හා විවිධාංගීකරණය කිරීම
ගුරු භවතුන් විෂයමාලා නවීකරණය සංශෝධනය පිළිබඳව දැනුම්වත් කිරීම

⇒ ප්‍රාථමික අධ්‍යාපනය

දරුවන්ගේ වර්ධනය හා සංවර්ධන ප්‍රතිපත්ති / මූලධර්මවලට අදාළව : ප්‍රාථමික විෂයමාලාව නවීකරණය
ප්‍රාථමික දරුවන්ට යෝග්‍ය පරිදි ඉගෙනුම් පරිසර නිර්මාණය කිරීම
අධ්‍යාපනය හා වෘත්තීය සංවර්ධනය

අඛණ්ඩ වෘත්තීය ගුරු සංවර්ධනය මෙන්ම ගුරුවරුන්ගේ උසස් අධ්‍යාපන ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැලසීම

⇒ ගුරු අධ්‍යාපන විෂයමාලාව නවීකරණය කිරීම

පූර්ව සේවා ගුරු පුහුණුවේ දී, අධ්‍යාපනවේදී උපාධියක් ලබා ගත හැකි පරිදි ගුරු අධ්‍යාපන විද්‍යාපීඨ, විශ්වවිද්‍යාල ආයතන ලෙස උසස් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

ශිෂ්‍ය-ගුරුවරුන් හට අධ්‍යාපන කටයුතු සඳහා සහන ණය යෝජනා ක්‍රමයක් ඇතිකිරීම

ගුරු අධ්‍යාපනය, ගුරු සංවර්ධනය සහ ගුරු කළමනාකරණය වඩාත් ඵලදායීව සිදුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධනය ශක්තිමත් කිරීම.

⇒ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සහ මාධ්‍ය තාක්ෂණය, අධ්‍යාපනය සඳහා යොදා ගැනීමට පියවර ගැනීම

සියලුම දරුවන් සඳහා තොරතුරු තාක්ෂණ ඥාණය ලබාගත හැකි පරිදි ප්‍රතිපත්ති සකස්කිරීම හා අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා පියවර ගැනීමට කටයුතු කිරීම.

ඩිජිටල් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීම සංවර්ධනය කිරීම තුළින් ඉගෙනුම් ඉගැන්වීම ක්‍රමවේද සංවර්ධනය

⇒ විධිමත් විෂයමාලාව, විෂය සමගාමී සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සංවර්ධනය

ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රම නවීකරණය කිරීම

විද්‍යා, තාක්ෂණ, ගණිතය යන විෂයයන් සංවර්ධනය සඳහා අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

සෞඛ්‍ය, ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

දරුවන්ගේ පරිවර්තීය කුසලතා **(Transversal Skills)**, සංවේදී - සාමාජයීය කුසලතා **(Socio-emotional skills)**, අගනාකම් **(Values)**, සහ ආචාරධර්ම **(Ethics)** සංවර්ධනය කිරීම සඳහා මූලිකත්වය ලබාදීම

⇒ ශිෂ්‍ය තක්සේරුකරණය සහ ඇගයීම් ක්‍රමවේද තවදුරටත් වැඩි දියුණු කිරීම

නව විෂයමාලා ප්‍රතිසංස්කරණය හා අනුගත වන පරිදි ශිෂ්‍ය තක්සේරුකරණය සහ ඇගයීම් ක්‍රමවේද නවීකරණය කිරීම.

- අධ්‍යාපනයේ භිමිකාරිත්වය සහ සේවා සැපයීම ශක්තිමත් කිරීම

- පාසල් අධීක්ෂණ ක්‍රියාවලිය සවිබල ගැන්වීම මඟින් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම

පාසල් පාදක කළමනාකරණය ශක්තිමත් කිරීම තුළින් පාසල් සවිබල ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා තවදුරටත් දායකත්වය ලබාදීම

කලාප, කොට්ඨාස, පළාත් සහ ජාතික මට්ටමේ අධ්‍යාපන පරිපාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිපුණතා රාමුව සමාලෝචනය කිරීම.

ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය හා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා නිපුණතා රාමුව කෙටුම්පත් කිරීම.

අධ්‍යාපන පරිපාලන ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම හා නව තොරතුරු පද්ධති හඳුන්වා දීම. කලාප අධ්‍යාපන කාර්යාලවලට කාර්යාල ස්වයංක්‍රීයකරණ **(Office Automation)** පද්ධතිය හඳුන්වාදීම.

- සාක්ෂි මත පදනම්ව අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීම සහ අධ්‍යාපන සැලසුම්කරණය

අධ්‍යාපන පර්යේෂණ, ප්‍රතිඵල-පාදක සැලසුම්කරණය ශක්තිමත් කිරීම

සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය නියාමනය කිරීම සඳහා ජාතික අධ්‍යාපන නියාමන රාමුව සකස් කිරීම

අධ්‍යාපනික අත්පත් කරගැනීම් සම්බන්ධව මහජනතාව දැනුම්වත් කිරීම

03. පරිච්ඡේදය
2020 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා					
	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය			රු.	
අයවැය 2022		සටහන	තක්ෂ		
			2022	නැවත ගලපන ලද 2021	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ACA-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-		
106,002,596,900	භාණ්ඩාගාර අග්‍රිම		87,785,013,526	54,770,657,285	
-	තැන්පතු		11,710,303,311	7,179,313,844	ACA-3
1,637,000,000	අත්තිකාරම් ගිණුම		1,260,460,549	1,175,956,578	ACA-4
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	ACA-5
107,639,596,900	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		100,755,777,386	63,125,927,708	
107,639,596,900	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		100,755,777,386	63,125,927,708	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		5,827,455	117,977,694	
107,639,596,900	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් (ඉ)= (ඇ)-(ඈ)		100,749,949,931	63,007,950,014	
	අඩුකළා: වියදම්				
	පුනරාවර්තන වියදම්		-	-	
79,643,676,600	වේතන, වැටුප් හා අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	78,725,534,239	38,332,006,563	
1,255,003,429	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	1,158,977,561	650,659,722	
26,048,814,971	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	20,118,379,979	3,026,251,463	ACA-2 (ii)
-	පොළී ගෙවීම්	8	-	-	
50,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
106,947,545,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		100,002,891,779	42,008,917,748	
	මූලධන වියදම්				
3,127,433,500	මූලධන වත්කම් පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම්	10	953,964,209	786,457,901	
18,281,519,740	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	14,112,685,406	13,509,540,303	
1,417,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	632,050,912	797,906,934	ACA-2 (ii)
25,000,000	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	20,000,000	-	
2,571,620,000	හැකියා වර්ධනය	14	2,428,620,379	2,181,467,140	
6,582,331,760	වෙනත් මූලධන වියදම්	15	4,263,931,665	2,378,740,877	
32,004,905,000	මුළු මූලධන වියදම් (උ)		22,411,252,571	19,654,113,155	
	තැන්පතු ගෙවීම්		12,191,157,966	6,994,290,069	
4,840,000,000	අත්තිකාරම් ගෙවීම්		1,459,655,720	1,139,865,451	ACA-4
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	ACA-5
4,840,000,000	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		13,650,813,686	8,134,155,520	
143,792,450,000	මුළු වියදම් (එ)=(ඊ+උ+ඌ)		136,064,958,036	69,797,186,422	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය (ඒ)=(ඉ-එ)		(35,315,008,105)	(6,789,236,408)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(35,315,008,106)	(6,789,236,408)	
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ACA-7
			(35,315,008,106)	(6,789,236,408)	ACA-3

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2022 (රු.)	2021 (රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	ACA-6	176,407,862,392	172,209,979,211
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ACA-5/5(a)	2,861,648,147	2,662,452,976
මුදල් හා මුදල් සමාන දෑ	ACA-3	-	-
මුළු වත්කම්		179,269,510,539	174,872,432,187
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		1,954,497,980	1,519,606,436
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		176,407,862,392	172,209,979,211
කුලී වැඩ හා අත්තිකාරම් සංචිතය	ACA-5(b)	-	
ප්‍රංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ACA-4	907,150,166.62	1,142,846,540
අග්‍රිම ශේෂය	ACA-3	-	-
මුළු වගකීම්		179,269,510,539	174,872,432,187

පිටු අංක 001 සිට 287 දක්වා ඒසීඒ -එෆ් සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 289 සිට 395 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2023.02.27.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2023.02.

ජී.එම්.ඩී. හිරන්ති එස්. ගම්ලත්
ප්‍රධාන ගණකාධිකාරී
(මූල්‍ය කළමනාකරණ)
අධ්‍යාපන අමාත්‍යාංශය
''ඉසුරුපාය''බත්තරමුල්ල.

ජලී.එන්.ඒ.ගුණසිරිත
ගණකාධිකාරී
අධ්‍යාපන අමාත්‍යාංශය
''ඉසුරුපාය''
පැළවත්ත - බත්තරමුල්ල

කේ.ඩී.එන්. කරුණාතිලක
ප්‍රධාන මූල්‍ය නිලධාරි 2
අධ්‍යාපන අමාත්‍යාංශය
''ඉසුරුපාය'' බත්තරමුල්ල

යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් ගිණුම - 2022

			1/1/2022	ශේෂය ඉ/ගේ	10,290,430.57
12/31/2022	ශේෂය ප/ගේ	10,290,430.57			
		10,290,430.57			10,290,430.57
			1/1/2023	ශේෂය ඉ/ගේ	10,290,430.57

		යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් ප්‍රදාන ගිණුම - 2022			
12/22/2022	මුදල්	128,000.00	12/31/2022	ආදායම් වියදම් ගිණුම	128,000.00
		128,000.00			128,000.00

		සමුච්චිත අරමුදල් ගිණුම - 2022			
12/31/2022	ශේෂය ප/ගේ	3,724,484.08	1/1/2022	ශේෂය ඉ/ගේ	3,067,581.70
			12/31/2022	ආදායම් වියදම් ගිණුම	656,902.38
		3,724,484.08			3,724,484.08
			1/1/2023	ශේෂය ඉ/ගේ	3,724,484.08

	ස්ථාවර තැන්පතු පොළි ලැබීම් ගිණුම (BoC) - 2022				
			1/31/2022	මුදල්	36,308.22
			4/20/2022	මුදල්	542,499.99
			7/11/2022	මුදල්	39,267.12
			12/1/2022	මුදල්	102,183.22
12/31/2022	ආදායම් වියදම් ගිණුම	784,902.38	12/1/2022	මුදල්	64,643.83
		784,902.38			784,902.38

	ස්ථාවර තැන්පතු ගිණුම (BoC) - 2022				
1/1/2022	ශේෂය ඉ/ගේ	10,850,000.00	12/2/2022	මුදල්	10,850,000.00
		10,850,000.00			10,850,000.00

	ස්ථාවර තැන්පතුව (BOC) - 2022				
1/1/2022	ශේෂය ඉ/ගේ	1,500,000.00	12/2/2022	මුදල්	1,500,000.00
		1,500,000.00			1,500,000.00

	ස්ථාවර තැන්පතු ගිණුම (BoC) පැලවත්ත - 2022				
12/2/2022	මුදල්	12,516,827.05	12/31/2022	ශේෂය ප/ගේ	12,516,827.05
		12,516,827.05			12,516,827.05
1/1/2023	ශේෂය ඉ/ගේ	12,516,827.05			

යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල			
2022 වර්ෂය - අවසාන ගිණුම්			
2022/12/31 දිනට ශේෂ පිරික්සුම			
ගිණුමේ නම හා විස්තරය		හර	බැර
යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල			10,290,430.57
ස්ථාවර තැන්පතු ගිණුම (BoC)		12,516,827.05	
ස්ථාවර තැන්පතු පොලි ලැබීම් ගිණුම			784,902.38
ශිෂ්‍යත්ව අරමුදල් ප්‍රදාන ගිණුම		128,000.00	
2022/12/31 දිනට මුදල් ශේෂය		1,498,087.60	
සමුච්චිත අරමුදල් ගිණුම			3,067,581.70
		14,142,914.65	14,142,914.65

යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල			
2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම			
ශිෂ්‍යත්ව අරමුදල් ප්‍රදාන ගිණුම	128,000.00	ස්ථාවර තැනපතු පොළි ලැබීම් ගිණුම	784,902.38
සමුච්චිත අරමුදල් ගිණුම	656,902.38		
	784,902.38		784,902.38

යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල		
2022 දෙසැම්බර් 31 දිනට		
මූල්‍ය තත්ත්වය ප්‍රකාශය		
වත්කම්		
ස්ථාවර තැන්පතුව (BoC)		12,516,827.05
මුදල් ශේෂය		1,498,087.60
මුළු වත්කම්		14,014,914.65
බැරකම්		
යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් ගිණුම		10,290,430.57
සමුච්චිත අරමුදල		3,724,484.08
මුළු වගකීම්		14,014,914.65

එල්.වයි.ආර්.පී. මනෝජී
ගණකාධිකාරී (යුනෙස්කෝ)

L.Y. R. P. Manoji
Accountant (Payment)
Ministry of Education
"Isurupaya"
Battaramulla.

මහාචාර්ය සිරිමලි ප්‍රනාන්දු
ලේකම් ජනරාල් (යුනෙස්කෝ)

මහාචාර්ය සිරිමලි ප්‍රනාන්දු
ලේකම් ජනරාල්
යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිසම
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා

ජී.එම්.ඩී. හිරන්ති එස්. ගමලත්
ප්‍රධාන ගණකාධිකාරී
අධ්‍යාපන අමාත්‍යාංශය

ජී.එම්.ඩී. හිරන්ති එස්. ගමලත්
ප්‍රධාන ගණකාධිකාරී
(මූල්‍ය කළමනාකරණ)
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය" බත්තරමුල්ල.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කත්‍ය	
	2022 වර්ෂය රු.	නැවත ගලපන ලද 2021 වර්ෂය රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	3,147,818,974	2,584,134,927
අග්‍රිම ලැබීම්	87,785,013,526	54,770,657,285
අත්තිකාරම් අයකර ගැනීම්	1,486,939,871	1,228,841,165
තැන්පතු ලැබීම්	11,683,616,844	7,179,313,844
විවිධ	410,941,016	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	104,514,330,231	65,762,947,221
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	82,798,608,704	37,143,976,038
සහනාධාර සහ මාරුකිරීම්	8,081,326,053	3,026,251,463
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	(4,873,535,747)	6,737,963,874
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	5,827,455	117,977,694
අත්තිකාරම් ගෙවීම්	1,510,938,947	1,177,906,635
තැන්පතු ගෙවීම්	12,178,480,773	6,994,290,069
විවිධ	119,222,844	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	99,820,869,029	55,198,365,773
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	4,693,461,202	10,564,581,448
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන	4,693,461,202	10,564,581,449
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	4,693,461,202	10,564,581,449
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(4,693,461,202)	(10,564,581,449)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-

	තත්‍ය	
	2022 වර්ෂය රු.	**2021** වර්ෂය රු.
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි **01** දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් **31** දිනට අවසාන මුදල් ශේෂය	-	-
දෙසැම්බර් **31** දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ

අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුව% ලෙස
අදාළ නොවේ					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනාරාවර්ථන	104,112,200	106,947,545	100,002,892	**94**
මූලධන	28,912,500	32,004,905	22,411,253	**70**

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන (පුනරාවර්තන)

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තත්‍ය වියදම රු.	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන රු.	අවසන් ප්‍රතිපාදන රු. ,		
1	ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	126-2-3-4-1409 වෙනත්	18,509,145	18,509,145	13,468,000	73%
2	සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව	පාසල් පෝෂණ වැඩසටහන 126-1-2-1-1501	117,878,,783.50	117,878,,783.50	117,888,160.30	100%
3	කාන්තා හා ළමා කටයුතු හා සමාජ බලගැන්වීම් අමාත්‍යාංශය	පාවහන් වැඩසටහන 126-2-5-10-1501	30,000,000.00	30,000,000.00	29,000,000.00	97%
4	කාන්තා හා ළමා කටයුතු හා සමාජ බලගැන්වීම් අමාත්‍යාංශය	නිල ඇඳුම් වැඩසටහන 126-1-2-2-1501	317,782,011.00	317,782,011.00	317,046,901	1000%
5	කාන්තා හා ළමා කටයුතු හා සමාජ බලගැන්වීම් අමාත්‍යාංශය	පාවහන් වැඩසටහන 126-1-2-3-1501	394,750,000.00	394,750,000.00	362,240,826.00	92%
6	කාන්තා හා ළමා කටයුතු හා සමාජ බලගැන්වීම් අමාත්‍යාංශය	සුරක්ෂා රක්ෂණ වැඩසටහන 126-1-2-11-1501	67,100,000.00	67,100,000.00	67,100,000.00	100%
7	කාන්තා හා ළමා කටයුතු හා සමාජ බලගැන්වීම් අමාත්‍යාංශය	වෙනත් 126-2-3-2-1409	110,000,000.00	110,000,000.00	110,000,000.00	100%5
8	ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව	සම්මාදම් හා දායක මුදල් 126-2-3-2-1409	18,634,397.88	18,634,397.88	18,634,397.88	100%
9	විදේශ කටයුතු අමාත්‍යාංශය	සම්මාදම් හා දායක මුදල් 126-1-2-0-1505	115,148,114.37	115,148,114.37	115,148,114.37	100%

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන (ප්‍රාග්ධන)

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තත්‍ය වියදම රු.	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන රු. ,000	අවසන් ප්‍රතිපාදන රු. ,000		
10	අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව	පෙළපොත් මුද්‍රණය 126-1-2-4-1501	875,879,000.00	875,879,000.00	813,208,658.66	93%
11	අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දෙපාර්තමේන්තුව	සංවර්ධන නිලධාරී වැටුප් 130-1-2-0-1001	4,912,440.00	4,912,440.00	4,757,952.74	97%
12	නිපුණතා සංවර්ධන	සංවර්ධන නිලධාරී වැටුප් 130-1-2-0-1001	5,290,320.00	,290,320.00	4,853,695.99	92%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.000)	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.000)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	51,611,098	51,611,098	-	-
9152	යන්ත්‍රෝපකරණ	10,074,502	10,074,502	-	-
1953	ඉඩම්	108,376,228	108,376,228	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	3,975	3,975	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	6,342,059	6,342,059	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. EDU/A/MOE/2022/SR/29 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 30 වන

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

ශීර්ෂය 126 - අධ්‍යාපන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 126 - අධ්‍යාපන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ)	මිලදී ගැනීම්වල අගයන් හා ACA2 i අගයන් සමාන විය යුතු වීම.	1.6.1. (ආ)
1.6.1. (ආ)	සමාලෝචිත වර්ෂයේ ආරම්භක හා ඉකුත් වර්ෂයේ අවසාන මූල්‍ය වත්කම් ශේෂ	1.6.1 (අ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.172,273,922,034 ක් වූ අතර 2022 ජනවාරි 01 දිනට එම ශේෂය රු.177,219,581,019 ක් වීමෙන් රු. 4,945,658,985 ක වෙනසක් තිබුණි. එසේම මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.172,209,979,211 ක් වූ අතර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව එම ශේෂයෙහි රු.5,009,601,808 ක වෙනසක් පැවතුණි.

(ආ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි 2022 වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම සමඟ මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් 2101,2102,2103,2104,2106 යන වැය විෂයන් යටතේ වත්කම් වෙනුවෙන් සිදු කර ඇති වියදම් සැසඳීමේ දී මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම ලෙස රු.3,722,761,428 ක් දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් වටිනාකම රු.14,113,135,406 ක් වූයෙන් රු.10,390,373,978 ක වෙනසක් තිබුණි.

(ඇ) 2022 ඔක්තෝබර් 25 දිනැති මාරු කිරීම් පත්‍රය අනුව ශීර්ෂ අංක 421 යටතේ පැවති නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයට අයත් රු.5,538,752,522 ක් වටිනා වත්කම් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා දී තිබුණද එම වත්කම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. එමෙන්ම පවරාගත් අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ වලට අදාළ මාරු කිරීමේ පත්‍ර විගණනයට ඉදිරිපත් නොවූ අතර අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශවලින් පවරාගත් වත්කම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත්ව ඇති බව තහවුරු කර ගත නොහැකි විය.

(ඇ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ දී අපහරණය කරන ලද රු. 5,075,421,388 ක වත්කම්වලට අදාළ අපහරණ පිළිබඳ විස්තරාත්මක ලැයිස්තු විගණනය වෙත ඉදිරිපත් නොවූ බැවින් අපහරණය කරන ලද වත්කම් වටිනාකමෙහි නිවැරදිකාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඉ) SA 80, SA 82 (ACA 6), ACA2(i), මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් වියදම් සාරාංශ යන ලේඛණ තුළ මූල්‍ය නොවන වත්කම් වලට අදාළ වටිනාකම් වල වෙනස්කම් නිරීක්ෂණය විය. එම වෙනස්කම් තහවුරු කර ගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඊ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව 2022 වර්ෂය තුළ ආරම්භක ශේෂයට එකතු කරන ලද වටිනාකම් වලට අදාළව විගණනයට ඉදිරිපත් කරන ලද ලේඛනයෙහි ඇති රු. 3,082,959,009 ක තක්සේරු වටිනාකමක් සහිත ශේෂයක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත්ව නොතිබීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව පාලන ගිණුමේ වර්ෂ අවසාන ශේෂ සමඟ සැසඳීමේ ප්‍රකාශයෙහි, නැගෙනහිර පළාතේ 1990 කාලවලට අයත් පළාත් සභා ණය ශේෂ නිරවුල් කිරීම ලෙස එකතු කර ඇති රු.22,424,325ක් හා අඩු කර ඇති රු.48,909,855ක් වූ භාණ්ඩාගාර 7004 ගිණුම හරහා පළාත් සභා ණය ශේෂ නිරවුල් කිරීම ලෙස දක්වා ඇති අයිතමයන් දෙක සැසඳුම්වල ආකාරය පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ ඇතුලත් කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව සහ පාලන ගිණුමේ අවසාන ශේෂය අතර වෙනස ගැලපීම සඳහා වූ සැසඳුම් ප්‍රකාශය තුල ඇතුලත් හඳුනා නොගත් ශේෂය ලෙස සඳහන් ශුද්ධ අගය වූ රු.3,691,790 ක ණය ශේෂයන් වලට අදාල මූලාශ්‍ර ලියකියවිලි නොවූ බැවින් එම ශේෂයන්ගේ නිවැරදිකාවය තහවුරු නොවුණි.

1.6.2 ගිණුම් ශේෂ අතර නොසැසඳීම

(අ) 2022 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ නිවැරදි කළ පාලන ගිණුම් ශේෂය රු.2,805,377,162ක් වූ අතර කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයට අනුව එම ශේෂය රු.2,800,692,805ක් වේ. ඒ අනුව පාලන ගිණුම හා කේවල ගිණුම් සාරාංශය අතර රු.4,684,357ක වෙනසක් දක්නට ලැබුණි. භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු. 2,861,648,147 ක් වූ බැවින් පාලන ගිණුම් හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂය අතර රු. 56,270,986 ක වෙනසක් දක්නට ලැබුණි.

(ආ) ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයට අනුව කේවල ශේෂ මුළු එකතුව රු.2,801,003,005 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.2,861,648,147 ක් විය. ඒ අනුව භාණ්ඩාගාර පොත් අනුව ශේෂය හා ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අතර රු.60,645,142 ක වෙනසක් පැවතුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) අයවැය ඇස්තමේන්තුව යටතේ ප්‍රතිපාදන නොතිබූ ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා රු.100,000,000ක පරිපූරකයක් ලබාගෙන තිබූ අතර 2022 වර්ෂය තුළ දී රු.6,544,000ක වියදමක් දරා තිබුණි. ඒ අනුව ඉතිරි වූ පරිපූරක ප්‍රමාණය රු.93,456,000ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 93 ක ප්‍රමාණයක් විය.

(ආ) පාසල් පාදක ගුරු වෘත්තිය සංවර්ධන වැඩසටහන (BPTD) ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පොදු රාජ්‍ය මණ්ඩලීය අරමුදල මඟින් මුදල් ලබා දීමට ගිවිසුම්ගත වී තිබුණු නමුත් මේ සඳහා වාර්ෂික අයවැය යටතේ ප්‍රතිපාදන වෙන් කිරීමකින් තොරව මු.රෙ. 66 යටතේ රු.4,600,000 ක් මාරු කරගෙන තිබුණි. ඉහත වැඩ සටහනට අදාළ වියදම් ලෝක බැංකු අරමුදල (GEM project) තුලින් දැරීම හේතුවෙන් මු.රෙ. 66 මඟින් මාරු කරන ලද මුළු ප්‍රතිපාදනය වන රු.4,600,000 ම ඉතිරි වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) අමාත්‍යාංශයේ වැය විෂයන් 22 ක් සඳහා මු.රෙ. 66 මඟින් රු.208,094,861 ක ප්‍රතිපාදන මාරු කර තිබූ අතර එම ප්‍රතිපාදන මඟින් රු.180,935,319 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එය මාරු කරන ලද මු.රෙ.66 ප්‍රතිපාදනයෙන් සියයට 87 ක ඉතිරියක් බවත් වැය විෂයයන් 10 ක මු.රෙ.66 යටතේ මාරු කර තිබූ ප්‍රතිපාදනයන් සියයට 100 ක්ම ඉතිරි වී තිබූ බවත් නිරීක්ෂණය විය.

(ඈ) පිරිවෙන් සඳහා ශිෂ්‍ය ඩෙස් හා පුටු සැපයීම හා බෙදාහැරීම සඳහා වෙළඳපලේ අමුද්‍රව්‍ය මිල ගණන් වැඩිවීම හේතුවෙන් සැපයුම්කරු විසින් අදාළ අමුද්‍රව්‍ය මිලදී ගත් මිල ගණන් සැලකිල්ලට නොගෙන ඇස්තමේන්තු ප්‍රමාණයන් පදනම් කර ගෙන 2021 මාර්තු 26 දින ඉදිරිපත් කරන ලද ලංසුවලට අදාළව මිල විචලනයන් ලෙස රු. 2,585,000 ක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව ගෙවීම් කර තිබුණි. 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කළ යුතු කොන්ත්‍රාත්තුව සඳහා කව් දුරටත් ගෙවිය යුතු මිල විචලනය සඳහා බැඳීම් ඇති කර ගැනීමේදී මුදල් රෙගුලාසි 94 (3) හා 447 (5) රෙගුලාසි ප්‍රකාරව ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබිය යුතු වුවත් ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබියදී මුළු පිරිවැය ඇස්තමේන්තුව ඉක්මවා ගෙවීම් අනුමත කර තිබුණි.

2.2 සීමා ඉක්මවීම්

2022 වර්ෂය තුළ 1,459,655,720 ක මුදලක් සේවක ණය/අත්තිකාරම් ලෙස ලබා දී තිබූ අතර ලැබීමට ඇති ණය/කාල විශ්ලේෂණයට අනුව රු.162,053,328 ක් අයකර ගැනීමට තිබුණි. මෙයින් රු.69,419,033ක් අවුරුදු 5ට වැඩි ශේෂයක් විය. සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශයට රු.1,260,460,548ක් පමණක් අයකර ගැනීමට හැකි වී තිබූ අතර විසර්ජන පනතින් දෙනු ලැබූ අවම ලැබීම් සීමාව වූ රු.1,637,000,000ක සීමාව තුළ ණය අයකර ගැනීමට නොහැකි වී තිබූ අතර අවම ලැබීම් සීමාව රු.1,100,000,000ක් දක්වා අඩු කර ගැනීමට සංදේශයක් යවා තිබුණු අතර ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය විගණන දින දක්වාම ලැබී නොතිබුණි. 2021 වර්ෂයේදීද විසර්ජන පනතින් දෙනු ලැබූ අවම ලැබීම් සීමාව වූ රු.1,700,000,000 තුළ ණය අයකර ගැනීමට නොහැකි වී තිබූ අතර එම වර්ෂයේද අවම ලැබීම් සීමාව රු.900,000,000 දක්වා අඩු කර ගැනීමට කටයුතු කර තිබුණි. වර්ෂ දෙක තුළ දී ම අවම ලැබීම් සීමාව තුළ කටයුතු කිරීමට නොහැකි වී තිබූ අතර ණය අයකර ගැනීමට හැකි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම වෙනුවට අවම ලැබීම් සීමාව සංශෝධනය කර ගැනීමට කටයුතු කර තිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) 2017අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(ඇ) ඡේදය අනුව යම් මුදල් වර්ෂයකට අදාළව සියළුම බැරකම් එම වර්ෂය තුළදී මුදල් ගෙවා නිදහස් කළ යුතු අතර කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළදී නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවටත් උපදෙස් ලබා දී තිබූ නමුත් 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල රු.3,124,434,401 ක බැඳීමක්ද රු.236,431,182 ක බැරකමක්ද ඇති කරගෙන තිබූ අතර එක් වැය විෂයයක් සඳහා රු.327,006 ක ඉතිරිය ඉක්මවා බැරකම් ඇති කරගෙන තිබුණි.

(ආ) තාක්ෂණ විෂය සඳහා වන ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය ඉදිකිරීම වෙනුවෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) ආයතනය වෙත ලබාදී ඇති සියයට 20 ක අත්තිකාරම් මුදල වන රු. 500,038,941 ක් සඳහා එකතු කළ අගය මත බදු මුදල වන රු. 75,005,841ක මුදලින් රු.64,651,221 ක මුදලක් 2022.12.30 වන දින ගෙවීම් කර ඇතත් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති බදු මුදල රු. 65,779,050 ක් වීම නිසා රු.1,127,830 ක වෙනසක් දක්නට ලැබුණි. එමෙන්ම මෙම වැය විෂයය යටතේම රු. 16,720,950ක ශේෂයක් පැවතියද ගෙවීමට ඉතිරිව ඇති එකතු කළ අගය මත බදු මුදල වන රු. 10,354,620ක වටිනාකම බැරකම් යටතේ හඳුනාගෙන නොතිබුණි.

(ඇ) ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරු අංශයට වෙන්වී ඇති වැය විෂයන්ට අදාළව රු. 5,439,907,245 ක බැරකම් ප්‍රමාණයක් නිරීක්ෂණය වූ අතර එම ප්‍රමාණය 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට හෝ හෙලිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

	නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	2012.09.22 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 2012/34 දරණ පාසල් පිහිණුම් තටාක/ශ්‍රවණාගාර/රහල් සහ ක්‍රීඩා සංකීර්ණ කළමණාකරන චක්‍රලේඛයේ 1.2 ඡේදය	පිහිණුම් තටාක විධිමත්ව පාසල් සංවර්ධන සමිතිය මඟින් කළමනාකරණය කිරීම කළ යුතු වුවද ඊට පටහැනි ලෙස කොළඹ පිහිටි ජාතික පාසලක පිහිනුම් තටාකය පුද්ගලික සමාගමක් විසින් කළමනාකරණය කිරීමත්, එම පරිශ්‍රයේ වර්ග අඩි 12000කින් පමණ සමන්විත තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර එම ගොඩනැගිල්ල වාර්ෂික බදු පදනම මත බාහිර පාර්ශවයන් වෙත ලබාදීමත් සිදු කර විශාල ආදායමක් ලබාගෙන තිබුණි.
(ආ)	2015 අගෝස්තු 21 දිනැති අංක	ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව

	1928/28 අතිවිශේෂ ගැසට් පත්‍රය	ලැයිස්තුගත ජාතික පාසල් 64ක් සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් විදුහල්පතිවරුන් වශයෙන් පත් කළ යුතුව තිබුණ නමුත් පාසල් 30 කට අදාළව පත්කිරීම් එපරිදි සිදු කර නොතිබුණි.
(ඇ)	2016 මාර්තු 29 දිනැති ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යෝජනා ක්‍රමයේ II අදියර ගිවිසුම ගිවිසුමේ 2.2 ඡේදයේ වගන්තිය (b)	ණය මුදල් ලබාදීම සම්බන්ධයෙන් අදාල වන සියළුම ඉල්ලුම්පත් අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කල යුතු වුවත්, 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලියාපදිංචි කල ප්‍රතිලාභීන් 1,308 කින් ප්‍රතිලාභීන් 1,127 ක් වෙනුවෙන් රු. 491,134,875 ක ණය මුදලක් ලබාදී තිබුණත් අමාත්‍යාංශයේ මැදිහත් වීමකින් තොරව ණය ලබාදෙන බැංකු විසින්ම ණයලාභීන් තෝරාගෙන ණය ප්‍රදානය කර තිබුණි.

2.6 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව අතුරු අග්‍රිම උපරිම සීමාව ඉක්මවා අවස්ථා 14 කදී එකතුව රු. 3,749,230 ක් සහ අග්‍රිම නිකුත් කිරීම මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවද භික්ෂු අධ්‍යාපන අංශයට අදාලව රු. 2,541,986 ක් වටිනා අත්තිකාරම් අවස්ථා 39 කදී මාණ්ඩලික නොවන නිලධාරීන් 7 දෙනෙකුට නිකුත් කර තිබුණි.

2.6.1 යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව

(අ) ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව 1949 වර්ෂයේ සිට ක්‍රියාත්මක වුවද විගණිත දින තෙක් යුනෙස්කෝ කොමිෂන් සභාවේ ව්‍යවස්ථාව නීතිගත කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂම සභාව සඳහා අනුමත කාර්යය මණ්ඩලයක් නොමැති අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් මෙම කොමිෂම් සභාව වෙත කාර්ය මණ්ඩලය අනුයුක්ත කර තිබුණි. ඒ අනුව යුනෙස්කෝ ජාතික කොමිෂම සභාව ව්‍යවස්ථාපිත ආයතනයක් කර කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට කටයුතු නොකර වැටුප් ගෙවීම අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් සිදු කර තිබුණි.

2.8 තැන්පතු

මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පත් කල දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුල රාජ්‍ය ආදායමට බැර නොකල තැන්පතු ගිණුම් 05ක වටිනාකම රු.373,724,038ක් වූ අතර, එම වටිනාකම තුළ වර්ෂ 5ක් ඉක්ම වූ රු.32,581,899 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

(අ) අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යභාරය අනුව ලෝක තරඟකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීමේ කාර්යය සම්පූර්ණයෙන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) 1991 අප්‍රේල් 19 දිනැති 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් සකස් කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 1992, 2003 සහ 2016 වර්ෂවලදී නිර්දේශ ඉදිරිපත් කර තිබුණු නමුත් 2022 වර්ෂය අවසාන වන විටද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අධ්‍යාපන පහසුකම් සැපයීම ඇතුළුව ළමයින් සඳහා අන්තර්කරණය අධ්‍යාපනය ලබාදීම පිළිබඳ අංක 37/2020 දරණ වක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය 2020 දෙසැම්බර් 03 දින නිකුත් කර තිබුණද උපදෙස් සංග්‍රහයේ ඇතුළත් කාර්යයන් ඉටුකිරීමට නොහැකි වී තිබුණි.

(ආ) 2022 වර්ෂය තුල අවසන් කිරීමට සැලසුම් කරන ලද කාර්යයන් අතුරින් කිසිදු ප්‍රගතියක් ලභාකර නොගත් අංශ 12කට අයත් කාර්යන් 30ක් පමණ වූ අතර, ඒවායේ ඇස්තමේන්තු වටිනාකම රු.793,372,000ක් විය.

(ඇ) භික්ෂු අභ්‍යාස ආයතන සහ පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනවල අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා විෂය නිර්දේශ සම්පාදනය කිරීම වෙනුවෙන් 2022 පෙබරවාරි 02 දිනැති අංක NIE/DID/P/78/C-2021 දරන ජාතික අධ්‍යාපන ආයතනයේ ලිපිය අනුව රු. 2,000,000 ක් 2022 අගෝස්තු 22 දින පළමු අදියර වශයෙන් ජාතික අධ්‍යාපන ආයතනය වෙත ලබා දී තිබුණි. එම මුදලින් සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් පැවැත්වීම සඳහා පමණක් රු. 739,681 ක් වැය කර තිබුණද අදාළ කාර්යය ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. ඉතිරි රු. 1,260,319 ක මුදල පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන අංශයේ අත්තිකාරම් ලෙස දැක්වීම වෙනුවට 422-2-03.03-2401 දරන වැය විෂයයට වර්ෂයේ වියදමක් ලෙස හර කර තිබුණි.

(ඈ) 2021 වර්ෂයේ දී පිරිවෙන් අධ්‍යාපන ශාඛාව විසින් ශබ්දාගාරයක් සකස් කර ඒ මඟින් පිරිවෙන් විෂය නිර්දේශ ආවරණය වන සේ වීඩියෝ පාඩම් මාලාවන් සකස් කිරීම, You Tube නාලිකාව සඳහා අවශ්‍ය වීඩියෝ නිර්මාණය කිරීම, දිවයිනේ විවිධ දක්ෂතා ඇති පිරිවෙන් සිසුන්ගේ ධර්ම දේශනා හා වෙනත් නිර්මාණාත්මක වැඩසටහන් පටිගත කිරීම හා ප්‍රචාරය කිරීම යන කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් වටිනාකම රු.1,315,070 ක් වූ උපකරණ වැය විෂය අංක 2103 (යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ) මිලදී ගෙන වසරකට අධික කාලයක් ගත වී තිබුණ ද 2023 ජනවාරි 20 දින වන විටද ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පරිදි ශබ්දාගාරය සකස් කර නොතිබුණි.

(ඉ) අධ්‍යාපන අමාත්‍යාංශය (උසස් අධ්‍යාපන අංශය) විසින් ස්ථාපිත අරමුණු අතර උසස් අධ්‍යාපනය සම්බන්ධ අවස්ථා හා පිවිසුම් වැඩි කිරීම හා ගෝලීය සම්බන්ධතා සහ හුවමාරු කිරීම් වර්ධනය කිරීම ප්‍රධාන වේ. අමාත්‍යාංශයේ මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට, වාර්ෂිකව විදේශීය රාජ්‍යයන් විසින් මෙන්ම අධ්‍යාපනික ආයතන මඟින්ද උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ශ්‍රී ලාංකික සිසුන් සඳහා ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීමේ කාර්ය විධිමත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මාර්ගෝපදේශයන් 2022 දෙසැම්බර් 31 දින වන විටද නිකුත් කර නොතිබුණි. අමාත්‍යාංශය විසින් සිසුන් තෝරාගෙන, සිසුන්ගේ නම් අදාළ විශ්වවිද්‍යාලය වෙත යොමු කිරීමෙන් පසු විශ්වවිද්‍යාල විසින් තෝරා ගනු නොලබන සිසුන් හේතුවෙන් ඇතිවෙන පුරප්පාඩු සඳහා නැවත සිසුන් යොමු කිරීමේ ක්‍රමවේදයක් මෙන්ම ශිෂ්‍යත්වලාභීන් ලෙස අදාළ විශ්ව විද්‍යාලය විසින් තෝරා ගැනීමෙන් පසුව අදාළ ශිෂ්‍යයන් වෙත පිරිනමනු ලබන උපාධි පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් අධ්‍යාපන අමාත්‍යාංශය තුළ නොපැවතුණි.

3.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

(අ) අමාත්‍යාංශයේ ශාඛා අතරින් ශාඛා 16 කට අයත් කාර්යයන් 30ක ප්‍රගතිය සියයට 4 සිට සියයට 50 දක්වා පරාසයක පැවති අතර ප්‍රගති වාර්තාව අනුව ලඟා කර නොගත් කාරයයන් හි ඇස්තමේන්තුගත වටිනාකම රු.1,220,892,366 ක් විය.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම අනුව 2022 වර්ෂයේ අපේක්ෂිත කාර්යන් සඳහා වූ මුලු ඇස්තමේන්තුගත වියදම රු. 29,883,920,000 ක් වූවද ප්‍රගති වාර්තාව අනුව ඇස්තමේන්තුගත වියදම රු. 15,290,490,000 ක් විය. සමාලෝචිත වර්ෂයේ සත්‍ය වියදම ප්‍රගති වාර්තාව ප්‍රකාරව රු. 9,094,073,000 ක් වී තිබුනු අතර ඒ අනුව ලඟා කර නොගත් ප්‍රගතිය හේතුවෙන් මුලු වටිනාකමෙන් රු. 20,789,847,000 ක් හෙවත් සියයට 70 ක් ඉතිරි වී තිබූ අතර අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට නොහැකි වී තිබුණි. එමෙන්ම ක්‍රියාකාරී සැලැස්ම අනුව හා ප්‍රගති වාර්තාව අතර ඇස්තමේන්තුගත වියදමෙහි රු. 14,593,430,000 ක වෙනසක්ද නිරීක්ෂණය විය.

(ඇ) පාසල් කටයුතු ශාඛාව සඳහා සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන ක්‍රියාකාරකම් 9ක් වෙනුවෙන් ඇස්තමේන්තුගත වියදම රු. 1,009,750,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දැරූ වියදම රු. 693,100,000 ක් වී තිබුණි. ඒ අනුව අත්කර නොගත් ප්‍රගතිය රු. 316,650,000 ක් බව නිරීක්ෂණය විය. මෙම ශාඛාව යටතේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම යන ක්‍රියාකාරකම යටතේ ක්‍රියාවට නංවා තිබූ වැඩසටහන් 03හි සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන නොතිබුණි.

(ඈ) ගණිත ශාඛාව සඳහා ක්‍රියාකාරකම් 11ක් වෙනුවෙන් ලෝක බැංකු ණය මුදල් හා ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ රුපියල් මිලියන 22ක ඇස්තමේන්තුවක් සහිතව සැලසුම් සකස් කර තිබුණු අතර 2022 වර්ෂය තුළදී ලභා කරගෙන තිබූ මූල්‍ය ප්‍රගතිය සියයට 17 ක් පමණ බව නිරීක්ෂණය විය. ලෝක බැංකු ණය මුදල් යටතේ රුපියල් මිලියන 15.012 ක ඇස්තමේන්තුවක් සහිතව Improving student's Achievement level in selected 500 schools යන ක්‍රියාකාරකම සැලසුම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී 6-11 ශ්‍රේණි සඳහා වූ ඇගයීම් ප්‍රශ්න පත්‍ර සකස් කිරීම සිදු කර තිබුණි. එම ප්‍රශ්න පත්‍ර මුද්‍රණ කටයුතු 2022.12.31 දින වන විටත් සිදු කර නොතිබුණු අතර ඒ අනුව ලභා කර නොගත් මූල්‍ය ප්‍රගතිය සියයට 97 කි. එමෙන්ම ආසියානු බැංකු ණය ආධාර යටතේ තෝරා ගත් පාසල් 750 තුළ ගණිත විෂය සඳහා වූ ඉගෙනුම් පරිසරය වැඩිදියුණු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 2ක ඇස්තමේන්තුවකට යටත්ව සැලසුම් සකස් කර තිබූ නමුත් අත්කරගෙන තිබූ මූල්‍ය ප්‍රගතිය සියයට 4 ක් පමණ වන බව නිරීක්ෂණය විය.

(ඉ) විශේෂ අවශ්‍යතා ඇති ළමුන් වෙනුවෙන් කහතුඩුව වෙනිවැල්කොළ ප්‍රදේශයේ රු.247,252,882 ක වියදමක් දරා විශේෂ අධ්‍යාපන මධ්‍යස්ථානයක් නිර්මාණය සහ ඉදිකිරීම් ක්‍රමයට (Design & Build) ඉදිකිරීමට කොන්ත්‍රාත්කරුවකුට ලබාදී තිබුණද අවශ්‍යතාවය ඇති ළමයින්ට උචිත ලෙස සකස් කර නොතිබූ බව පසුව හඳුනාගෙන තිබූ නමුත් කොන්ත්‍රාත් ප්‍රදානය ට පෙර තම අවශ්‍යතාවය ගැන සැලකිලිමත් වී නොතිබුණි.

(ඊ) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම

i. 2020 අගෝස්තු 20 දිනැති අංක 2187/27 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවා තිබුණු අතර 2020, 2021 හා 2022 යන වර්ෂ 03 තුළදී රු. 5,219,297,390 ක වියදමක් දරා තිබුණි. සැලසුම් කළ පරිදි ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමට අපොහොසත් වී තිබුණු අතර 2022 ජූලි 22 දිනැති අංක 2289/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ඉහත රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී තිබුණු අතර විෂය පථයට අයත් ව තිබූ කාර්යයන් හා කර්තව්‍යයන් එදින සිට අධ්‍යාපන අමාත්‍යාංශය යටතට නතුකොට තිබුණි. එමෙන්ම මෙම ප්‍රතිසංස්කරණයන් වෙනුවෙන් පසුගිය වර්ෂ 03 තුළ දී අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විවෘත විශ්ව විද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් දැරූ රු.5,219,297,390ක මුදල හා ජාතික අධ්‍යාපන ආයතනය විසින් දැරූ රු.350,552,393 ක වියදමද නිශ්කාර්ය වියදමක් වීමේ අවධානමක් ද පවතින බව නිරීක්ෂණය කෙරේ.

ii. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර 06ක් හඳුනාගෙන තිබූ අතර සියලු ම කාර්යයන්ට අදාළ මූලික ක්‍රියාකාරකම් පස් අවුරුදු ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව 2021 ජනවාරි, පෙබරවාරි, මාර්තු යන මාසයන් තුළදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත් මෙම කටයුතු සැලසුම් කළ කාල සීමාවන් තුළදී ඉටු කිරීමට රාජ්‍ය අමාත්‍යාංශයට නොහැකි වී තිබූ අතර විෂයමාලා හා ඇගයීම් ප්‍රතිසංස්කරණය සඳහා පමණක් කැබිනට් අනුමැතිය ලැබී තිබුණද ඉතිරි ප්‍රතිසංස්කරණ 5 සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.

iii. ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර හා ලෝක බැංකු ණය ආධාර මඟින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් සඳහා මුදල් යොදවන බැවින් මෙම ප්‍රතිසංස්කරණයන් නිසි පරිදි ක්‍රියාත්මක නොකලහොත් වර්තමානයේ රට පත්ව ඇති ආර්ථික දුෂ්කරතා හමුවේ බැඳීම් ගාස්තු (Commitment charges), ණය පොලී (Interest charges) ගෙවීම් මත විශාල මූල්‍යමය පාඩුවක් විය හැකි අතර ණය ගිවිසුම් අවලංගු වීමේ අවධානමක් ද පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

iv. ලෝකයේ තාක්ෂණික සංවර්ධනයක් සමඟ ඊට අනුගත වන පරිදි අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් ඇති විය යුතු අතර 21 වන සියවසට ගැලපෙන, තාක්ෂණික ලෝකය හා සමාන්තරව ගමන් කළ හැකි දැනුම හා කුසලතාවයන්ගෙන් සමන්විත සිසු පරපුරක් බිහි කිරීම උදෙසා අවශ්‍ය වන්නා වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් අවම වශයෙන් 2000 වර්ෂයේ සිට ක්‍රියාත්මක විය යුතු නමුත් රටෙහි පවත්නා අධ්‍යාපන පද්ධතිය එම මට්ටමට ලඟා වී නොමැත. ඒ හේතුවෙන් ප්‍රමාද වී හෝ ආරම්භ කර ඇති මෙම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් ඉතා කඩිනමින් හා විධිමත් ව රටේ පවත්නා අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක කළ යුතු බව හා එහි දැඩි අවශ්‍යතාවයක් පවතින බව

විගණනයට නිරීක්ෂණය වූ අතර ඒ සඳහා වගකීම දරන සියලුම පාර්ශවයන් විසින් ඒ සඳහා අවශ්‍යවන්නා වූ තීන්දු තීරණයන් කඩිනමින් ගත යුතු බව නිරීක්ෂණය කෙරේ.

v. ජනප්‍රිය යැයි සම්මත පාසල්වල මෙන් සියලු භෞතික හා මානව පහසුකම්වලින් සම්පූර්ණ පාසල් තුන (03) බැගින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පිහිටුවා ඒවා ජාතික පාසල් ලෙස උසස් කර ඒ අනුව 353ක් වූ මෙරට ජාතික පාසල් සංඛ්‍යාව දහසක් (1000) දක්වා ඉහළ නැංවීම මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි අනෙකුත් පාසල්වල දරුවන්ට එම පහසුකම් භුක්ති විඳීමට අයිතිය සැලසෙන පොකුරු පාසල් ක්‍රමයක්ද බිහි කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩ සටහන ආරම්භ කර තිබුණු අතර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් 2021 වර්ෂය තුළදී පාසල් 622ක අන්තර්ජාල පහසුකම් සංවර්ධන වෙනුවෙන් රු.මිලියන 576 ක් ද කාන්තා හා ළමා සංවර්ධන පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය මඟින් පාසල් 822 ක් සඳහා එක් පාසලකට රු.මිලියන 2 බැගින් ද තවත් පාසල් 9ක් සඳහා භෞතික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.මි.44.7ක් ද උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 20.5 ක් ද ලෙස මුළු වියදම රු.මිලියන 2285.2 ක් වැයකර තිබුණද පාසල් 22 ක් පමණක් ජාතික පාසල් බවට පත්කර තිබුණි.

vi. පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථානය හෝ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය යනුවෙන් හැඳින්වෙන ආයතන පද්ධතිය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉතා වැදගත් අංශ ලෙස හඳුනාගනිමින් පෙර පාසල් අධ්‍යාපන ප්‍රතිපත්තිය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය මඟින් 2021 වර්ෂයේදී සකස් කර තිබූ අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව හා ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව 2022 වර්ෂයේ දී සැලසුම් කර තිබූ නමුත් 2022 වර්ෂය අවසන් වන විටදී ද එම කටයුතු අවසන් කර නොතිබුණි.

vii. ශ්‍රී ලංකාවේ සමස්ථ ගුරු කාර්ය මණ්ඩලයම උපාධිධාරීන් බවට පත් කිරීම, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විශ්ව විද්‍යාල පීඨ තත්වයට උසස් කිරීම යන මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2019 දෙසැම්බර් 02 දින ඉදිරිපත් කර තිබූ අතර ඒ සඳහා වූ ප්‍රතිපත්තිමය අනුමැතිය 2019 දෙසැම්බර් 31 දින අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දී තිබුණ නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සාකච්ඡා මට්ටමේ පැවතුණි.

3.1.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය.

2018 අයවැය යෝජනාවක් මත වෛද්‍ය උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව 300 කින් වැඩි කිරීම, ජාතික සෞඛ්‍ය සේවා, වෛද්‍ය හා හෙද වෘත්තිය වැඩි දියුණු කිරීම, පශ්චාත් වෛද්‍ය උපාධි අභ්‍යාසලාභීන් බඳවා ගැනීම වැඩි දියුණු කිරීම, සායනික පුහුණුව පිළිබඳ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම යන ඉලක්ක ළඟාකර ගැනීමේ අරමුණ මත 2019 ජූනි 24 දින මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම වෙත මෙම ඒකකය පිහිටුවීමේ ව්‍යාපෘතිය පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2022 ජූනි 16 දින වැඩ නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2023 පෙබරවාරි මස 11 වන දින දක්වා විශ්වවිද්‍යාලයේ උපකුලපති හා කවුන්සලය විසින් දින දීර්ඝ කිරීම් ලබා දී තිබුනද 2023 පෙබරවාරි 15 වන දින වන විටත් මහල් 06 ක් දක්වා අභ්‍යන්තර ව්‍යුහය සකස් කිරීමේ කටයුතු පමණක් සිදු කොට තිබුණි.

(ආ) රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් 12 ක ගොඩනැගිල්ලක් ඉදි කිරීම.

කරාපිටිය වෛද්‍ය පීඨයට ඇතුලත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව වැඩි කිරීම හා පර්යේෂණ ධාරිතාවය (Research Capabilities) වැඩි කිරීමේ අරමුණ සහිතව රසායනාගාර, විභාග හා දේශන ශාලා පහසුකම් වැඩි කිරීම වෙනුවෙන් රු. මිලියන 1,092 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව 2020 ජූනි 01 වන දින මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යාංශය වෙත ඉහත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2021 සැප්තැම්බර් 06 වන දින වැඩ නිම කිරීමට අපේක්ෂිතව තිබුණ ද 2023 ජනවාරි 15 දින දක්වා විශ්වවිද්‍යාලයේ උපකුලපති, කවුන්සලය හා අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් දින දිර්ඝ කිරීම් ලබාදී තිබූ නමුත් 2023 පෙබරවාරි 15 දින වන විට මෙම ව්‍යාපෘතියේ මහල් 08 ක් දක්වා Slab දැමීම සිදුකර, 03 වැනි මහල දක්වා අභ්‍යන්තර ව්‍යුහය සකස් කිරීමේ කටයුතු පමණක් සිදුකර තිබුණි.

(ඇ) රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය.

වෛද්‍ය රසායනාගාර පුහුණුලාභීන්ගේ විශාල හිඟයක් සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ පවතින බැවින් සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ පවතින ගැටළුකාරී තත්ත්වය මගහරවා ගැනීමේ ප්‍රමුඛ අරමුණ සහිතව මෙම පීඨය කඩිනමින් ඉදිකිරීමට අපේක්ෂා කරයි. මීට අමතරව පීඨය ඉදිකිරීමෙන් පසුව සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාල නව පාඨමාලා 4 ක් ආරම්භ කිරීමට තීරණය කර ඇති අතර එමඟින් වසරකට උපාධිධාරීන් 350 ක් පමණ බිහිකිරීමට සැලසුම් ක්‍රියාත්මක කෙරේ. යෝජිත නව පාඨමාලා තුළින් බිහිවන උපාධිධාරීන්ගේ සේවාවන් සමස්ථ සමාජය කරාම ව්‍යාප්ත කළ හැකි වන පරිදි උපතින්ම, සමාජ ක්‍රියාකාරකම් සහ ලෙඩ රෝග ආදිය නිසා අත්පා අහිමිවුවන්ට නවීන තාක්ෂණික ක්‍රමවේදවලට අනුකූලව නිර්මාණය කරනු ලබන කෘත්‍රිම උපාංග නිෂ්පාදනය කර සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි ලබා දීම මේ තුළින් අපේක්ෂා කරයි.
මෙවැනි අරමුණු සහිත පීඨය ස්ථාපිත කිරීම සඳහා ගොඩනැගිලි 3ක් ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව 2020 දෙසැම්බර් 03 දින සහිත බිල්ඩර්ස් ප්‍රයිවට් ලිමිටඩ් වෙත රු. මිලියන 1,501 කට ප්‍රදානය කර ඇති අතර 2023 ජූනි 02 දින නිම කිරීමට අපේක්ෂා කර තිබුණද නැවත 2023 ජූලි 14 දින දක්වා දින දිර්ඝ කිරීමක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙතින් කොන්ත්‍රාක්කාර සමාගම විසින් ලබාගෙන තිබුණි. 2023 පෙබරවාරි 22 වගණිත දින වන විටත් මෙම ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය 59% ක මට්ටමේ පැවතුණි.

3.1.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) 2016 පෙබරවාරි 11 දිනැති අංක අමප/16/0167/716/008 දරණ කැබිනට් පත්‍රිකාවෙන් ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට ලබාදී තිබූ අනුමැතිය මත අවශ්‍ය ඉඩම් කොටස පවරා ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු. මිලියන 280 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි අයිතිය අමාත්‍යාංශය වෙත ලැබී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේද විස්තරාත්මක ඉලක්ක යටතේ අවස්ථා 07 ක් ඉලක්ක කරමින් රු. මිලියන 60 ක් වෙන්කර තිබුණු අතර මධ්‍යස්ථානය ඉදිකිරීම කටයුතු මාස 24 ක් තුල නිම කිරීමට යෝජනා වී තිබුණි. ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු. 2,819,711,538 ක් වුවත් මෙම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර 2022 වර්ෂය වෙනුවෙන් මේ සඳහා මුදල් වෙන් කර නොතිබුණි.

(ආ) පර්යේෂණ හා නව නිපැයුම් අංශයේ සමාජීය නවෝත්පාදන පරීක්ෂණාගාර ව්‍යාපෘතිය 2017 අගෝස්තු 10 දින ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශයකට අනුව 2017 සැප්තැම්බර් 12 දින ලබාදී තිබූ කැබිනට් අනුමැතිය මත පිහිටවනු ලැබූ අතර ඒ සඳහා රු. මිලියන 35 ක් 2017 සිට

2019 දක්වා වැයකර තිබුණද එම ව්‍යයදම්වලට අදාල පිළිගත හැකි ලිඛිත සාක්ෂි වරින් වර ඉල්ලුවත් මේ දක්වා ලබා නොදුන් අතර, සමාජීය නවෝත්පාදන පරීක්ෂණාගාරය පිහිටුවීම තුලින් අපේක්ෂිත අරමුණු කරා ළඟා වී තිබෙද රටේ ජාතික ආර්ථිකයට වූ සේවාව හෝ ප්‍රතිලාභ සම්බන්ධයෙන් හා ව්‍යාපෘතිය යටතේ සිදු කරනා ලද Mozzapp Dengue Prevention & Control Application හි සම්පූර්ණ ප්‍රගති වාර්තාවක්ද සමාලෝචිත වර්ෂය වන විටත් මෙම අංශය වෙත ලබාගෙන නොමැති අතර ඒ පිළිබඳ පසු විපරම් කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ඇ) සූර්යපැනල මූලාකෘතීන් නිෂ්පාදනය සඳහා පහසුකම් සපයාදෙන විද්‍යා තාක්ෂණ සහ පර්යේෂණ අධ්‍යාපනික පුහුණු වැඩසටහන යටතේ ශ්‍රී ලංකා රජයේ රු. මිලියන 240 ක දායකත්වය මත වර්ෂ 06 ක ව්‍යාපෘති කාලයක් සහිත (වර්තමාන දින දීර්ඝ කිරීම් ඇත) ප්‍රස්තුත ව්‍යාපෘතිය වෙනුවෙන් අනුමැතිය ලබාදී තිබුණි. නමුත් දේශීය අරමුදල් රු. මිලියන 240 ක දායකත්වයෙන් වසර 06 ක් ගත වී තිබියදීත් උපයෝජනය කර තිබුණේ ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 43 ක් වූ අතර පර්යේෂණ පත්‍රිකා 30 ක් SCI Indexed journal හි ප්‍රකාශයට පත් කිරීම මෙම ව්‍යාපෘතියේ එක් අරමුණක් වුවද විගණික දිනය වන විට එසේ ප්‍රකාශයට පත්කර තිබුණේ පත්‍රිකා 04 ක් වීමත් විශ්වවිද්‍යාලවල විදුලි බලය ජනනය කිරීම සඳහා යොදාගත හැකි සූර්ය පැනල 10 ක් නිපදවීම අරමුණක් වුවද මේ දක්වා නිපදවා තිබුණේ Laboratory Scale Prototype Solar Pannel 04 ක් වීමත් සූර්ය පැනල මූලාකෘතීන් සවිකිරීම නිර්දේශ කර තිබුණද එම අරමුණු ඉටු කරගෙන නොතිබීමත් ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ සභායෙන් තෝරාගත් පළාත් පාලන ආයතන සමඟ නියමු ව්‍යාපෘති ආරම්භ කිරීම සිදුකර නොතිබීමත් හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි.

(ඈ) යුරෝපා න්‍යෂ්ටික සංවිධානයෙහි අධිශක්ති භෞතික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධි හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම යටතේ යුරෝපා න්‍යෂ්ටික සංවිධානය (CERN) විසින් අධිශක්ති භෞතික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ අරමුණින් ශ්‍රී ලාංකීය තරුණ විද්‍යාඥයින් සහ පර්යේෂකයින් හට අධිශක්ති භෞතික විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ ආචාර්ය උපාධි වැඩසටහන් 2018 ජනවාරි සිට ආරම්භ කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ යුරෝපා න්‍යෂ්ටික පර්යේෂණ සංවිධානය (CERN) අතර 2017 පෙබරවාරි 08 දින ජිනීවා නිදී ගිවිසුම් අත්සන් කර තිබුණි. 2018 වර්ෂයේ රු. 31,967,792 ක් වියදම් දරා තිබුණු අතර එයින් රු. 22,847,984 ක්ම න්‍යෂ්ටික පර්යේෂණ සංවිධානය (CERN) වෙත ගෙවා තිබුණත් ක්‍රියාකාරී සැලැස්ම අභිබවා රු. 4,367,984 ක් අතිරික්තව ගෙවා තිබුණි. එසේම 2019 වර්ෂයේදී අනුමත ක්‍රියාකාරී සැලැස්මේ නොමැති කාර්යයන් සඳහා රු. 3,806,809 ක් වියදම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේද අයවැය ඇස්තමේන්තුව අභිබවා රු. 20,884,740 ක් වියදම් කර තිබූ අතර ක්‍රියාකාරී සැලැස්ම අභිබවා රු. 51,854,740 ක අතිරික්ත මුදලක්ද ගෙවීමට තිබුණි.

(ඉ) 2019 වර්ෂයේ සිට හඳුනාගන්නා ලද ජාතික වෘත්තීය පහසුකම් (NVQ) මට්ටම් 07 කින් යුත් වර්තමාන ක්‍රමය මට්ටම් 10 දක්වා වැඩි කිරීම හා 2020 වර්ෂයේ සිට හඳුනාගෙන තිබූ පශ්චාත් උපාධි මට්ටම් දක්වා වෘත්තීය අධ්‍යාපනය හැදෑරීමට අධ්‍යාපන අවස්ථා ලබාදීම යන කාර්යයන් මේ වන තෙක් ඉටුකර නොතිබුණි.

(ඊ) වෘත්තීය පුහුණු කොමිෂන් සභා මාර්ගෝපදේශ සංග්‍රහය අනුව 2023 අප්‍රේල් 27 වන විට TVEC ලියාපදිංචි ආයතන 3,316 ක් වූ අතර ආයතන 2,161 ක ලියාපදිංචි කාලය ඉකුත් වී තිබුණි. එසේ ලියාපදිංචි කාලය ඉකුත් වූ ආයතන අතුරින් නැවත ලියාපදිංචිය අලුත් කිරීම සඳහා අයදුම් කර තිබුණේ ආයතන 170 ක් පමණි.

(ඇ) 2017 සැප්තැම්බර් 12 දැවති අමාත්‍ය මණ්ඩල තීරණයකට හා 2017 නොවැම්බර් 9 දිනැති MF/NB/CM/2017/202 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලිපිය පරිදි 2017 අයවැය යෝජනා යටතේ මාතර ජාතික වෘත්තීය පුහුණු ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා වෙන්කරන ලද රු.මිලියන 200 ක් උපයෝජනය කර ගනිමින් එහි මූලික ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමටත්, ඉහිරි පිරිවැය නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ ප්‍රතිපාදනවලින් දැරීමේ අපේක්ෂාවෙන් කිලිනොච්චිය ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ සිසුන් 400 දෙනෙකු සඳහා රු. මිලියන 300 ක සමස්ථ පිරිවැයක් යටතේ ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීමට අනුමත කර තිබුණි. 2018 වර්ෂයේ වෙන් කරන ලද මුදලින් උපදේශක සේවා ගාස්තු ගෙවීම සඳහා රු. 6,028,015 ක මුදලක් වියදම් කර තිබුණු අතර, 2019 වර්ෂය සඳහා රු. මිලියන 100 ක මුදලක් වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් මෙම ඉදිකිරීම් කටයුතුවලින් මූලික කටයුතු පමණක් සිදුකර තිබුණි.

3.2. විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

(අ) ද්විතියික අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම.

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ක්‍රියාත්මක කිරීම සඳහා වූ විස්තීරණ යෝජනාවලියක ප්‍රතිඵලයක් ලෙස මෙම තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන (ICT Hub) ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව කොරියන් Exim බැංකු මූල්‍ය දායකත්වයෙන් මෙම මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා 2019 නොවැම්බර් මස 05 වන දින ඇ.ඩො.35,663,773 ක ණය ගිවිසුමකට එලඹ තිබුණු අතර ජාතික මට්ටමේ එක් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් හා පළාත් මට්ටමේ මධ්‍යස්ථාන 02ක් ඉදිකිරීමට යෝජිතව තිබුණි. මූලික අදියරේ දී ජාතික මට්ටමේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය කුලියාපිටිය ප්‍රදේශයේද පළාත් මධ්‍යස්ථාන, නිල්වලා අධ්‍යාපන විද්‍යාපීඨය තුළ හා අඩිඩාලවිච්චන අධ්‍යාපන විද්‍යාපීඨය තළද ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ නමුත් එපරිදි පිහිටුවීම ප්‍රායෝගික නොවන බව සඳහන් කරමින් අමාත්‍ය මණ්ඩල තීරණයන් මඟින් එම ප්‍රදේශයන් නැවත සංශෝධනය කර තිබුණි. ඉහත පරිදි අදාළ මධ්‍යස්ථාන ඉදිකිරීමට අදාළ වූ යෝජිත ඉඩම් තාක්ෂණික කරුණු මත විරින්වර වෙනස් වූ හෙයින් ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුම 2019 වර්ෂයේ අත්සන් කළ ද ව්‍යාපෘතිය සක්‍රීය කිරීමට නොහැකි වී තිබුණු අතර අත්සන් කළ ණය ගිවිසුම 2022 නොවැම්බර් 10 දින අහෝසි වී තිබුණි.

(ආ) ඉන්දියානු රජයේ ආධාර යටතේ වතු පාසල් වල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

මධ්‍යම, ඌව, සබරගමුව හා දකුණ යන පළාත් වල තෝරාගත් වතු පාසල් 09 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු: මිලියන 300ක් වූ මෙම ව්‍යාපෘතියට 2019 ජූනි 19 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එම පාසල් 09 හි ඉදිකිරීම් හා අලුත්වැඩියා කටයුතු හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කර මිල ගණන් කැඳවීම 2021 වර්ෂයේ දී සිදු කර තිබූ නමුත් කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේදී පැවති මිල ගණන් වලට කොන්ත්‍රාත් කටයුතු ඉටු කිරීමට නොහැකි වී තිබුණි. 2023 වර්ෂය වන විට අවස්ථා කිහිපයකදීම ඇස්තමේන්තු සංශෝධනය සිදු කර තිබූ නමුත් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඇ) යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

ඉන්දියානු රජයේ ආධාර යටතේ රු: 74,909,900 ක වියදමින් 2019 වර්ෂයේ දී පුස්සැල්ලාව සරස්වති මධ්‍ය විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබූ අතර පරිගණක උපාංග හා ගෘහ භාණ්ඩ මිල දී ගැනීම වෙනුවෙන් රු: 17,590,000 ක ප්‍රතිපාදනයක් වෙන් වී තිබුණි. 2021 පෙබරවාරි මාසයේ දී

පාසල වෙත රු: 620,000 ක උපකරණ ලබා දී තිබුණු අතර ඉතිරි වූ රු: 16,970,000ක වටිනාකමක් සහිත මිලදී ගැනීම් 2022 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර නොතිබුණි.

(ඇ) තාක්ෂණ විෂය සඳහා වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ඉදිකිරීම.

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2013 වසරේදී උසස් පෙළ විෂය ධාරාව සඳහා තාක්ෂණවේදය විෂය හඳුන්වාදීමත් සමඟ ඇති වූ ගුරු අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේ අරමුණින් තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් කොරියානු රජයේ ආධාර යටතේ කුලියාපිටිය නාරංගල්ල ප්‍රදේශයේ ඉදිකිරීමට 2017 ජනවාරි 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දී තිබූ අතර ඒ අනුව කොරියානු ජනරජයේ ඇමරිකානු ඩොලර් මිලියන 14.95ක ආධාර සහ දේශීය අරමුදල් මඟින් මෙම විද්‍යාපීඨය ස්ථාපනයට නියමිත ව තිබුණි.

2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ මෙම ව්‍යාපෘතිය 2021 වර්ෂය තෙක්ම ප්‍රමාද වීම හේතුවෙන් සංශෝධිත කාර්යබද්ධ පත්‍රිකාවට අනුව කොරියානු ජනරජයට අනුබද්ධිත අන්තර්ජාතික කොරියානු සහයෝගිතා ඒජන්සිය (KOIKA) මෙම ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු වලින් ඉවත් වී එහි වගකීම අමාත්‍යාංශයට පවරා දී තිබූ අතර ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඇ:ඩො: ලක්ෂ 08 ක මුදලක් 2021 වසරේ දෙසැම්බර් මාසයේ මහා භාණ්ඩාගාරයට ලබා දී තිබුණි. 2016 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය විවිධ හේතූන් මත ප්‍රමාද වීම නිසා KOIKA ආයතනය විසින් මෙම ඉදිකිරීම් කඩිනමින් අවසන් කළ යුතු බව දන්වා ඇති බැවින් මෙම කොන්ත්‍රාත්තුව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය (CECB) වෙත ලබා දී තිබුණ ද ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණේ 2022 දෙසැම්බර් මස වූ අතර ඒ අනුව ඉදිකිරීම් කටයුතු වල භෞතික ප්‍රගතිය සියයට 15 ක් වී තිබුණි.

(ඉ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බහු වාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදිකිරීම.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදි කිරීම සඳහා 2017.10.25 දින රු.297,843,626 ක් වටිනා කොන්ත්‍රාත්තුවකට පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර 2018 වර්ෂයේදී රු.59,568,725 ක ප්‍රාරම්භක අත්තිකාරම් සහ එයට අදාලව රු. 8,935,309 ක වැට් බදු එම වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට හර කර තිබුණි. ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් 2020.01.22 දින එම ගිවිසුම අවසන් කර තිබුණු අතර එදිනට අය වීමට තිබූ ප්‍රාරම්භක අත්තිකාරම් මුදල රු.40,850,633 ක් සහ වැට් බදු රු.6,127,600 ක් විය. එසේම ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය ප්‍රමාදයට අදාලව ඉල්ලුම්කල උපදේශන ගාස්තුව රු. 6,367,091 කි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට මෙහි ප්‍රගතිය සියයට 42 ක් වූ අතර ව්‍යාපෘතිය අවසන් වන තෙක්ම ප්‍රමාද කාලයට උපදේශන ගාස්තු ගෙවීමට අමාත්‍යාංශයට සිදුවනු ඇත.

ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් අදියර 06 කදී රු.111,043,064ක මුදලක් ගෙවා තිබුණු අතර රු.186,800,562 ක මුදලක් ඉතිරි වී තිබුණි. කොන්ත්‍රාත්කරු ඉවත් වීමෙන් පසු නව කොන්ත්‍රාත්කරු වන මධ්‍යම ඉංජිනේරු සේවා පෞද්ගලික සමාගම (CESL) වෙත 2022 ඔක්තෝම්බර් 18 දින රු.200,664,128 ක නව කොන්ත්‍රාත් මුදලකට ලබා දී තිබුණු අතර කොන්ත්‍රාත් පිරිවැය රු.13,863,566 කින් ඉහළ ගොස් තිබුණි. එම කොන්ත්‍රාත් මුදල දින 191ක් වන පරිදි 2022 ජුනි 22 සිට 2022 දෙසැම්බර් 30 යන කාලසීමාවට යටත් තිබුණි. වෙළඳපොළ මිල උච්චාවචනයන් හේතුවෙන් මෙසේ ව්‍යාපෘතිය නිම කිරීමට පමා වීමෙන් මේ සඳහා යන පිරිවැය ඉහළ යාම මත ඉන්දියානු දායකත්වය ඉහළ යාම හේතුවෙන් ව්‍යාපෘතිය නිම කිරීම පිළිබඳ අවධානමක් පැවතුණි.

(ඊ) ආසියානු සංවර්ධන බැංකු (SESIP) ණය මුදල යටතේ ක්‍රියාත්මක ද්විතිසික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩ සටහන

i. ආසියානු සංවර්ධන බැංකු (SESIP) ණය මුදල යටතේ ක්‍රියාත්මක මෙම වැඩ සටහන් සඳහා වෙන් වූ මුළු ඉද්ධ ප්‍රතිපාදනය රු.800,000,000 ක් වූ අතර වර්ෂය තුළ දැරූ මුළු වියදම රු.386,072,201කි. ඒ අනුව ඉතිරි වූ මුළු ප්‍රතිපාදනය රු.413,927,799ක් බවත් එය මුළු ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 52 ක් බවත් නිරීක්ෂණය විය. SESIP වැඩසටහන යටතේ ඉලක්කගත විසර්ජන සබැඳි දර්ශකයන් ලභා කර ගැනීම තුළින් අයවැයට අත්වැලක් වූ මෙම ණය මුදල ලබා ගන්නා බැවින් අදාළ ඉලක්කයන් නියමිත කාලරාමු තුළ ලභා කරගැනීම අත්‍යවශ්‍ය වේ. නමුත් 03/2022 රාජ්‍ය වියදම් පාලන චක්‍රලේඛය පදනම් කරගනිමින් නවෝත්පාදන විද්‍යාගාර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය භාණ්ඩ හා උපකරණ මිල දී ගැනීම හා තෝරාගත් විෂයන් 13ක් සංවර්ධනය කිරීම වෙනුවෙන් වූ වියදම් අත්හිටුවා තිබුණි. අයවැයට අත්වැලක් වශයෙන් ලබා දෙන මෙම ණය මුදල අවණ්ඩ ව ලබා ගැනීමට නම් ඉලක්කයන් නියමිත කාල රාමුව තුළ ලභා කරගත යුතුව පවතී.

ii. 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව තාක්ෂණ අධ්‍යාපන ශාඛාව සඳහා ප්‍රධාන කාර්යභාරයන් 08ක් යටතේ උප ක්‍රියාකාරකම් 46 ක් වෙනුවෙන් ඇස්තමේන්තුගත වියදම රු. 705,000,000 ක් වූ අතර ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ දැරූ වියදම රු. 8,260,764 ක් විය. ඒ අනුව ළභා කර නොගත් ප්‍රගතිය හේතුවෙන් මුළු ප්‍රමාණයෙන් රු. 696,939,236 ක් හෙවත් සියයට 98 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර අපේක්ෂිත ඉලක්ක ලභා කර ගැනීමට නොහැකි වී තිබුණි. ආසියානු සංවර්ධන බැංකු ණය මුදල හා ලෝක බැංකු ණය මුදල යටතේ මෙම ක්‍රියාකාරකම් වෙනුවෙන් මූල්‍යමය ප්‍රතිපාදන ලබා දී තිබූ අතර 03/2022 භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව නවෝත්පාදන විද්‍යාගාර වෙනුවෙන් වූ ප්‍රසම්පාදනයන් අත්හිටුවා තිබුණි. මෙම විසර්ජන සබැඳි දර්ශකයන්ට අදාළ ඉලක්ක නියමිත කාල පරාසය තුළ ලභා කර නොගැනීම ආසියානු සංවර්ධන බැංකු ණය මුදල් ලබා ගැනීමට බාධාකාරී සාධකයක් වන බැවින් මෙම ක්‍රියාකාරකම් නියමිත පරිදි ඉටුකිරීම අවශ්‍යව තිබුණි.

iii. ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව යටතේ ද්විතිසික අධ්‍යාපනික ආංශික සංවර්ධන වැඩසටහනට (SESIP) අයත් විසර්ජන සබැඳි දර්ශක 03 (DLI 03) වෙනුවෙන් රු. 380,000,000ක් වෙන් වී තිබුණි. සමාලෝචිත වර්ෂය සලකා බැලීමේදී මෙම ක්‍රියාකාරකමෙහි කිසිදු ප්‍රගතියක් ලබාගෙන නොතිබුණු අතර තවමත් සැලසුම් කිරීමේ අදියරෙහි පමණක් පවතින බව නිරීක්ෂණය විය. ආසියානු සංවර්ධන බැංකු ණය මුදල ලබා ගැනීමට නම් මෙම විසර්ජන සබැඳි ඉලක්කයන් ක්‍රමානුකූලව ලභාකර යුතු වුවත් ඊට අනුගතවී නොතිබුණි.

iv. ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ, ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා තෝරාගත් පාසල් 750ක, ඉලක්කගත විෂයන් 13ක සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා රු. 295,000,000 ක් අදියර 04කදී පාසල් 750ක් වෙත ලබා දී තිබුණු අතර 07/2022 චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට පළාත් අධ්‍යාපන බලධාරීන් , කලාප අධ්‍යාපන බලධාරීන් හා විදුහල්පතිවරුන්ට නියම කර තිබුණි. එම චක්‍රලේඛය ප්‍රකාරව ඉහත මුදල් 2022 දෙසැම්බර් 31 දිනට වියදම් කර අවසන් කළ යුතු බව සඳහන් වුවද පාසල් වෙත ලබා දුන් ප්‍රදානයන්ගෙන් රු. 270,000,000ක් එනම් සියයට 91 ක් වසරේ අවසන් කාර්තුව තුළදී ලබා දී තිබීම නිසා එම මුදල් උපයෝජනයට ප්‍රමාණවත් කාලයක් නොලැබීම මත අපේක්ෂිත ඉලක්ක 2022 දෙසැම්බර් 31 දිනට ලභා කර ගැනීමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් එම කාර්යය 2023 වර්ෂය දක්වාද විහැන් වී තිබුණි.

3.3 ප්‍රසම්පාදනයන්

(අ) පාසල් 19 කට අදාළව රු. 32,471,000 ක් වැය කර තාක්ෂණීය සඳහා සූර්ය පැනල සවි කර ඇතත් සැපයුම්කරු ගිවිසුම් පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් කාර්යය සාධන ඇපකරය ලබා ගැනීමට කටයුතු කළද අවශ්‍ය වන සේවා නොලැබීම මත සවි කළ සෝලා පැනල බොහෝමයක් ක්‍රියාත්මක නොවී පැවති බැවින් අවශ්‍ය සේවා ලබා ගැනීම සඳහා සැපයුම්කරුනවකු තෝරා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයන් සිදු කර නොතිබුණි.

(ආ) උසස් අධ්‍යාපන අංශයට අදාලව යෝජිත නැගෙනහිර මධ්‍යකලපුව කලාපීය ITDLH මධ්‍යස්ථානයේ චිත්‍රාගාරය වෙනුවෙන් රු.3,803,600 ක් වටිනා උපකරණ මිලට ගෙන චිත්‍රාගාර ස්ථාපිත කිරීමට අදාල මධ්‍යස්ථාන වෙත ලබා දී තිබුණ ද 2023 මාර්තු 17 දින වන විට ද අදාළ පරිශ්‍ර චිත්‍රාගාරය සංවර්ධනය නොකර එම මධ්‍යස්ථානයේ දේශනශාලාවල එම උපකරණ තාවකලිකව රඳවා තිබුණි.

(ඇ) උසස් අධ්‍යාපන අංශයට විසින් පළමු අදියර යටතේ පළාත් 09 ට චිත්‍රාගාර 09 ක් වන සේ චිත්‍රාගාර ස්ථාපිත කිරීමට තීරණය කර තිබුණද විගණික දිනය වන විටත් බස්නාහිර පළාත් චිත්‍රාගාරය ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබූ අතර රාජ්‍ය අමාත්‍යාංශය පරිශ්‍රයේ පිහිටි තාවකාලික චිත්‍රාගාරයේ උපකරණ වලට නිසි ආරක්ෂාවක් සැලසෙන පරිදි ස්ථිර ස්ථානයක මෙම චිත්‍රාගාරය ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම චිත්‍රාගාරය ද මෙම චිත්‍රාගාරය ස්ථාපනයට සුදුසු හා නිශ්චිත ස්ථානයක් තෝරා ගැනීමකින් තොරව රු.3,821,100 ක් වටිනා චිත්‍රාගාර උපකරණ 2022 අගෝස්තු 28, 31 හා සැප්තැම්බර් 27 යන දින මිලදී ගෙන තිබුණු අතර 2022 ඔක්තෝබර් 22 වන දින සිට චිත්‍රාගාරය වසා දමා තිබුණි. එසේම 2022 ජූනි18 වන දින සිට මෙහි රාජකාරී සඳහා ස්ථිරව නිලධාරීන් අනුයුක්ත කිරීමකින් තොරව රාජ්‍ය අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකයේ නියුතු නිලධාරීන් තිදෙනෙකු අනුයුක්ත කර තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නමට ලියාපදිංචි කරන ලද මෝටර්රථ 255 ක් මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලේඛන අනුව පැවතියද අධ්‍යාපන අමාත්‍යාංශය සතුව වාහන 161 ක් පමණක් තිබුණි.

3.5 පාඩු හා හානි

(අ) රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ නිල නිවස 2018 සැප්තැම්බර් 07 දින හදිසියේ ගිනි ගැනීමකට ලක්වී තිබූ අතර මෙම ගොඩනැගිල්ලේ අගය රු. 3,100,000 ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර තිබූ අතර එම අනතුර සම්බන්ධයෙන් හා මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ මධ්‍යස්ථානයේ ශ්‍රවණාගාරයට 2019 පෙබරවාරි 09 වන දින ඇතිවූ ගින්නකින් රු.මි.72ක තක්සේරු වටිනාකමට වූ හානියට අදාළව මු.රෙ. 104(4) යටතේ කටයුතු කර නොතිබුණි.

(ආ) 2013/2014 වර්ෂයේදී පත්තලගෙදර උපකරණ ගබඩාවේ රු. 12,905,806ක් ලෙස වාර්ථා ගතව ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් වූ වටිනාකම ද මීගමුව/නිවුස්වැඩ බාලිකා විද්‍යාලේ 2015 වර්ෂයේ සිදුවී ඇති බවට වාර්ථාවී ඇති කුවිතාන්සි පොත්වල සිදුවූ අක්‍රමිකතා සම්බන්ධයෙන් වූ වටිනාකම රු 4,510,409 ක් හා මීගමුව හරිස්චන්ද්‍ර ජාතික පාසලේ පාසල් සංවර්ධන සමිතියට ලද මුදල් බැංකුගත කිරීමේදී සිදුවී ඇති සිද්ධියකට අදාලව තවදුරටත් අයවිය යුතුව පවතින රු.1,384,225 ක්

සම්බන්ධයෙන් ද වූ අක්‍රමිකතා තුනකට අදාලව මු.රෙ.104 පරිදි කටයුතු කිරීමට සමාලෝචිත වර්ෂය තුලදීද අපොහොසත් වී තිබුණි.

3.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

විගණන විමසුම් පිළිබඳව අප්‍රමාදව ක්‍රියාකොට ඒවාට සම්පූර්ණ පිළිතුරු සැපයීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් සිදු කළ යුතු වුවත් විගණන විමසුම් 24 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි.

3.7 කළමනාකරණ දුර්වලතා

(අ) රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව අමාත්‍යාංශයේ සිට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, පලාත් සභා වලට ස්ථාන මාරු වී ගිය, මිය ගිය, විශ්‍රාමගිය, වැඩ තහනම් කළ, සේවය හැර ගිය හා සේවයෙන් මුදාහල නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු ශේෂය රු.162,053,327 ක් වූ අතර ඉන් වර්ෂ 5 ඉක්මවූ ශේෂය රු.69,419,033 විය. වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පලාත් සභා වෙත නිරවුල් කළ යුතු ශේෂය රු.39,994,516 ක් වූ අතර ඉන් වර්ෂ 5 ඉක්මවූ ශේෂය රු. 24,586,484 ක් විය. එම ශේෂ නිරවුලු කිරීමට හෝ අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) අධ්‍යාපන ලේකම්ගේ අංක 37/2020 හා 2020.12.13 දිනැති චක්‍රලේඛයෙහි උපදෙස් පත්‍රිකාවේ 12 ඡේදයේ සඳහන් කරුණුවලට පටහැනි ලෙස විශේෂ අධ්‍යාපනය සම්බන්ධව පුහුණුව සහිත ගුරු පත්වීම් ලබා සිටින නමුත් වෙනත් විෂයයන් ඉගැන්වීම් කටයුතු වල නිරත වන ගුරුභවතුන් 147 දෙනෙක් පාසල් 135ක සිටින බව නිරීක්ෂණය වුවද මෙම ගුරුභවතුන් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) විද්‍යාපීඨ සඳහා බදවාගන්නා ලද ශික්ෂණලාභීන්ගෙන් 2022 වර්ෂයේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට බදවා ගැනීමේදී විශේෂ අධ්‍යාපනය සම්බන්ධයෙන් පළාත් පාසල් හා ජාතික පාසල් සඳහා ශික්ෂණලාභීන් 89 දෙනෙකු බදවාගෙන තිබුණු අතර එයින් පුරප්පාඩු නොමැති පාසල් සඳහා 19 දෙනෙකුද විශේෂ අධ්‍යාපන ඒකකයක් නොමැති පාසල් සඳහා 8 දෙනෙකුටද පත්වීම් ලබා දීමට කටයුතු කර තිබුණි.

4 යහපාලනය

2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රාජ්‍ය ආයතනයක් වෙතින් සේවාවන් ලබන මහජනතාවට අවශ්‍යතාවයන් කඩිනම්ව, කාර්යක්ෂමව, ඉණාත්මකව හා අඛණ්ඩව ඉටු කරන බවට ලිඛිත බැඳීමක් ආකාරයෙන් සෑම රාජ්‍ය ආයතනයක්ම පුරවැසි- සේවාලාභී ප්‍රඥප්තියක් ස්ථාපිත කිරීම කල යුතු වුවද, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක් සකස් කිරීම හා පවත්වාගෙන ගොස් නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	2118	977	1141	-
තෘතීයික මට්ටම	65	21	44	-
ද්විතීයික මට්ටම	1676	1293	383	-
ප්‍රාථමික මට්ටම	1457	1347	110	-
එකතුව	5316	3638	1678	-

(අ) ජ්‍යෙෂ්ඨ සහ තෘතීයික මට්ටමේ නිලධාරීන් පුරප්පාඩු 1185 ක් පැවති අතර වැය විෂයයන් 11 ක් යටතේ උසස් අධ්‍යාපන අංශය හා රාජ්‍ය අමාත්‍යාංශ සඳහා පුද්ගල පඩිනඩි වෙනුවෙන් අධ්‍යාපන අංශය විසින් රු. 775,581,213 ක් 2022 වර්ෂයේදී ගෙවා තිබුණු නමුත් සේවක සංඛ්‍යාව පිළිබඳ දත්තයන් ඉහත සංඛ්‍යා යටතට ඇතුළත්ව නොතිබුණි. එසේම අමාත්‍යාංශය යටතේ ජාතික පාසල්වල විදුහල්පති, ගුරු භවතුන් හා අනෙකුත් කාර්ය මණ්ඩලයද ඇතුළත් වී නොතිබුණි.

(ආ) විශේෂ අධ්‍යාපන අංශයක් ඇති පාසල්වල ළමුන් සහ ගුරුවරුන් 5:1 අනුපාතයට අනුව සිටිය යුතු වුවත් අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා ගුරු පත්වීම් ලබා දී තිබූ බැවින් පලාත් 09 හි පාසල් 55 ක ගුරුභවතුන් 66 ක් අතිරික්තව සිටි අතර පාසල් 212 ක පුරප්පාඩු 349 ක් ද පැවතුණි.

(ඇ) 2020 නොවැම්බර් 19 දිනැති DMS/SM/ 12 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික මට්ටමේ නිළධාරීන්ගෙන් සෑදුම්ලත් 70 දෙනෙකුගෙන් යුතු කාර්යය මණ්ඩලයක් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල දූරස්ථ අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා අනුමත කර තිබුණ ද අනුමැතියකින් තොරව බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් 45 දෙනෙකුගේ අතිරික්තයක් තිබුණි.

T.R.M.W

ටී.ආර්.එම්.වීරරත්න

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

04. පරිච්ඡේදය
කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	ළඟා කර ගත් නිමැවුම	තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස		
		90% - 100%	75% - 89%	50% - 74%
අධ්‍යාපනයට ප්‍රවේශවීම හා ඒ තුළ රැඳී සිටීම වර්ධනය කිරීම සහ ද්විතියික මට්ටම දක්වා අධ්‍යාපනය සම්පූර්ණ කිරීම				
ශුද්ධ ලේඛනගත ශිෂ්‍ය අනුපාතය (Net Enrolment Rate)	ප්‍රාථමික (1-5) : 87.83 % කණිෂ්ඨ ද්විතීයික : 96.95 % ජ්‍යෙෂ්ඨ ද්විතීයික : 92.88 % ද්විතීයික : 95.87 % අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාව : 92.81 %	√		
දළ ඇතුළත් කිරීමේ අනුපාතය (Gross Intake Rate)	ප්‍රාථමික (1-5) : 81 % කණිෂ්ඨ ද්විතීයික : 93 % ජ්‍යෙෂ්ඨ ද්විතීයික : 96 %	√		
දෙවන ජාතික භාෂා ඒකකය මධ්‍යම පළාත් දෙ.ජා.භාෂා විෂය සම්බන්ධීකරණ නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් සඳහා පැවති වැඩමුළුව වයඹ හා උතුරු මැද පළාත් දෙ.ජා.භාෂා විෂය සම්බන්ධීකරණ නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් සඳහා පැවති වැඩමුළුව නැගෙනහිර පළාත් දෙ.ජා.භාෂා විෂය සම්බන්ධීකරණ නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් සඳහා පැවති වැඩමුළුව උතුරු පළාත් දෙ.ජා.භාෂා (සිංහල)ගුරුවරුන්ගේ හා ගුරු උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමේ නේවාසික වැඩමුළුව	20 28 85 45	දින 02 දින 02 දින 02 දින 02		0.063 0.151 0.198 0.30	දෙවන ජාතික භාෂා දැනුම වර්ධනය කිරීම

වැඩසටහන	පුහුණු කළ නිලධාරීන් ගණන	වැඩසටහන් කාලය	ආයෝජනය රු.මිලියන		ලබා දුන් පුහුණුව
			දේශීය	විදේශීය	
සමාජ විද්‍යා ඒකකය					
තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය උගන්වන ගුරුභවතුන් සඳහා වාරියපොළ, සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වූ ධාරිතා සංවර්ධන වැඩමුළුව	**40**	දින **01**		**0.072**	තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය විෂය සම්බන්ධ දැනුම ලබා දීම.
තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය උගන්වන ගුරුභවතුන් සඳහා මෙනේරිපිටිය , සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වූ ධාරිතා සංවර්ධන වැඩමුළුව	**21**	දින **01**		**0.108**	තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය විෂය සම්බන්ධ දැනුම ලබා දීම.
සිසු ගුරු නැණ පවුර ගුරු පුහුණු වැඩසටහන යටතේ අ.පො.ස(උ.පෙ) සමාජ විද්‍යා විෂයන් උගන්වන ගුරුවරුන් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වූ ධාරිතා සංවර්ධන වැඩමුළුව	**5313**	**2022.8.5-2022.9.14** දින දක්වා		**0.200**	තර්ක ශාස්ත්‍රය ,දේශපාලන විද්‍යාව ,ඉතිහාසය, භූගෝල විද්‍යාව ,සිංහල හා දෙමළ මාධ්‍ය ගුරු භවතුන් සඳහා විෂය දැනුම ලබාදීම සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම.
භූගෝල විද්‍යාත්මක තොරතුරු පද්ධතිය **(GIS)** පිළිබඳ ප්‍රායෝගික වැඩමුළුව	**40**	දින **01**		**0.100**	භූගෝල විද්‍යාත්මක තොරතුරු පද්ධතිය **(GIS)** පිළිබඳ ප්‍රායෝගික පුහුණුව උසස් පෙළ භූගෝල විද්‍යා ගුරුභවතුන් වෙත ලබා දීම.


Grade 2 - R



07. පරිච්ඡේදය
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් එ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග
1.	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.6	වෙනත්			
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **267/2018** ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම.	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූල වේ		
03.	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් එ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග
3.4	**2014.05.11** දිනැති අංක **171/2004** දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4.	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට **(NBD)** නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5.	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ		
6.	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. **134(2)DMA/1-2019** අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ		
6.3	**2018** අංක **19** දරණ ජාතික විගණන පනතේ **40(4)** උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණ වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි **134(3)** ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7.	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	**DMA** චක්‍රලේඛ **1-2019** අනුව, අවම වශයෙන් විගණන හා කලමනාකරණ කමිටු **04**ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම.	අනුකූල නොවේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් එ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග
8.	වත්කම් කළමනාකරණ			
8.1	අංක **01/2017** දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ **07** වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ **13** වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරන සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක **05/2016** අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. **772** අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස **06** කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.**103,104,109** හා **110** ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක **2016/30** දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ **3.1** ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් එ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගනණය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ.94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම.	අනුකූල වේ		
12	රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.**571** ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචන වර්ෂ අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ.**371** ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් එ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග
14.3	මු.රෙ.**371** ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රීම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රීම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අදාළ නොවේ		
15.3	මු.රෙ.**176** අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාළ නොවේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති **MSD** චක්‍රලේඛ අංක 04/2017ප්‍රකාරව සියලු වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම.			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙක් පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ **08** වන **10** වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් එ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා **05/2018 (1)** දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ **2.3** ඡේදයේ පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **02/**2018 ඇමුණුම් **02** ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම **01** හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ **6.5** ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල නොවේ		

ඩී.එම්.කෝ.ධර්මවර්ධන
ප්‍රධාන අභ්‍යන්තර විගණක

ඇමුණුම

ඇමුණුම 1

ප්‍රධාන අධ්‍යාපන දත්ත සහ දර්ශක

දර්ශකය	2018	2019	2020	2021
	පාසල් (a)			
රජයේ පාසල් සංඛ්‍යාව	10,175	10,165	10,155	10,146
පාසල් වර්ගය අනුව (b)				
1ඒබී පාසල්	1,044	1,012	1,000	**1,011**
1සී පාසල්	1,845	1,899	1,932	1,941
2 වර්ගයේ පාසල්	3,227	3,225	3,224	3,226
3 වර්ගයේ පාසල්	4,059	4,029	3,999	3,968
පන්ති පරාසය අනුව				
ප්‍රාථමික පන්ති පමණක්	3,890	3,891	3,884	3,893
1 ශ්‍රේණියේ සිට **8** ශ්‍රේණිය දක්වා	169	138	115	75
1 ශ්‍රේණියේ සිට **11** ශ්‍රේණිය දක්වා	3,207	3,207	3,204	**3,206**
1 ශ්‍රේණියේ සිට **13** ශ්‍රේණිය දක්වා	1,892	1,925	1,949	1,975
6 ශ්‍රේණියේ සිට **11** ශ්‍රේණිය දක්වා	20	18	20	20
6 ශ්‍රේණියේ සිට **13** ශ්‍රේණිය දක්වා	997	986	983	**977**
පරිපාලන අධිකාරිය අනුව				
ජාතික පාසල්	353	373	373	396
පළාත් පාසල්	9,822	9,792	9,782	9,750
ඉගැන්වීමේ මාධ්‍ය අනුව				
සිංහල පමණක්	6,370	6,347	6,357	6,323
දෙමළ පමණක්	3,031	3,030	3,042	3,026
සිංහල හා දෙමළ	35	45	42	40
සිංහල හා ඉංග්‍රීසි	531	542	524	552
දෙමළ හා ඉංග්‍රීසි	170	168	157	170
සිංහල,දෙමළ හා ඉංග්‍රීසි	38	33	33	35
පිහිටීම අනුව (c)				
නාගරික	1,037	1,035	1,034	1,032
ග්‍රාමීය	9,138	9,130	9,121	9,114
ශිෂ්‍ය සංඛ්‍යාව අනුව				
1 - 50	1,480	1,468	1,439	1,419
51 - 500	6,319	6,388	6,382	6,418
501 - 2500	2,165	2,132	2,158	2,130
2501 - 5000	194	172	171	172
5000ට වැඩි	17	5	5	7
පෞද්ගලික පාසල් සංඛ්‍යාව (d)	80	89	90	93
විශේෂ පාසල් සංඛ්‍යාව (e)	26	29	30	**30**
පිරිවෙන් සංඛ්‍යාව	763	801	816	819

දර්ශකය	2018	2019	2020	2021
ගුරුවරුන් (a)				
රජයේ පාසල්වල ගුරුවරුන් සංඛ්‍යාව	247,334	246,592	249,494	**241,054**
ස්ත්‍රී පුරුෂ භාවය අනුව				
ස්ත්‍රී	183,024	184,125	187,747	182,519
පුරුෂ	64,310	62,467	61,747	58,535
සුදුසුකම් අනුව				
උපාධිධාරී	110,741	119,323	121,569	136,998
වෘත්තීයමය සුදුසුකම් සහිත (f)	74,212	73,444	N/A	90,371
වෘත්තීයමය සුදුසුකම් රහිත	36,529	22,855	N/A	46,627
පුහුණු ගුරුවරු (g)	130,635	120,848	121,796	96,838
නුපුහුණු / අභ්‍යාසලාභී / වෙනත්	5,958	6,421	6,129	7,218
දර්ශකය				
වෘත්තීයමය සුදුසුකම් සහිත ගුරුවරු ප්‍රතිශතය (h)	83.0	83.5	**83.2**	**85**
ගුරු ශිෂ්‍ය අනුපාතය	17	17	16	**16**
ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව	**19**	19	**19**	**19**
ගුරු විද්‍යාල සංඛ්‍යාව	8	8	8	8
ගුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව (i)	111	112	112	112
ශිෂ්‍යයින් (a)				
රජයේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව	4,214,772	4,061,653	4,063,685	4,048,937
ස්ත්‍රී පුරුෂ භාවය අනුව				
ස්ත්‍රී	2,132,076	2,042,648	2,045,534	**2,034,616**
පුරුෂ	2,082,696	2,019,005	2,018,151	**2,014,321**
ප්‍රධාන ඉගෙනුම් මාධ්‍ය අනුව				
සිංහල	3,098,539	2,981,235	2,978,133	**2,968,086**
දෙමළ	1,026,877	988,773	986,156	**977,184**
ද්විභාෂා (w)	89,356	91,645	99,396	**103,667**
ඉගෙනුම් චක්‍රය අනුව				
ප්‍රාථමික (1-5 ශ්‍රේණි)	1,672,350	1,656,441	1,640,647	**1,618,867**
කනිෂ්ඨ ද්විතීයික (6-9 ශ්‍රේණි)	1,346,046	1,359,061	1,357,437	**1,343,485**
ජ්‍යෙෂ්ඨ ද්විතීයික (10-11ශ්‍රේණි)	622,565	627,477	636,985	**652,331**
ජ්‍යෙෂ්ඨ ද්විතීයික (12-13ශ්‍රේණි)	383,744	411,161	421,114	**426,964**
විශේෂ අධ්‍යාපන ඒකකවල	6,788	7,513	7,502	**7,290**
පිරිවෙන්වල ශිෂ්‍ය සංඛ්‍යාව	60,875	68,319	69,878	70,310
පැවිදි	32,160	35,264	36,497	**37,360**
ගිහි	28,715	33,055	33,381	**32,950**
පෞද්ගලික පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව (විශේෂ පාසල් ද ඇතුළුව)	142,032	138,067	138,726	141,219

(a) වාර්ෂික පාසල් සංගණන දත්ත ඇසුරිනි.

(b) 1AB : අ.පො.ස. (උ.පෙ) විද්‍යා විෂය ධාරාව සහිත (ජීව විද්‍යාව හා/ හෝ භෞතික විද්‍යා විෂය ධාරාව) පාසල් වේ.

1C : අ.පො.ස. (උ.පෙ) විද්‍යා විෂය ධාරාව හැර වෙනත් විෂය ධාරාවක් / කිහිපයක් සහිත හා /හෝ (උ.පෙ) වෘත්තීය විෂය ධාරාව සහිත පාසල් වේ.

2 වර්ගය : **1** සිට **11** හෝ **6** සිට **11** ශ්‍රේණි සහිත අ.පො.ස. (සා.පෙ) දක්වා වූ පාසල්

3 වර්ගය : **1** සිට **5** හෝ **8** ශ්‍රේණිය දක්වා ඇති ප්‍රාථමික හෝ කනිෂ්ඨ පාසල්

(c) නාගරික - මහ නගර සභා හෝ නගර සභා බල ප්‍රදේශයක පිහිටි පාසල්

ග්‍රාමීය - ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක පිහිටි පාසල්

(d) මුදල් අය කරනු ලබන හෝ අය කරනු නොලබන ජාතික විෂය මාලාව උගන්වන පෞද්ගලික අංශයෙන් පාලනය වන පාසල් (මෙහි දී ජාත්‍යන්තර පාසල් ඇතුළත් නොවේ)

(e) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් (අන්ධ, ගොළු, බිහිරි, ඔටිසම්) සඳහා වූ විශේෂ පාසල්

(f) පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහිත උපාධිධාරීන්

(g) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුළින් හෝ ගුරු විද්‍යාල තුළින් පුහුණුව ලබා ඇති ගුරුවරුන්

(h) වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන් සහ පුහුණු ගුරුවරුන් සංඛ්‍යාව, සමස්ත ගුරුවරුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස

(i*) මෙයට අඟී ගණ්‍ය ගුරු මධ්‍යස්ථාන වන බිබිල, යාකරවත්ත හා මන්නාරම යන මධ්‍යස්ථාන තුන ද ඇතුළත් වේ.

(j) වාර්ෂික පාසල් සංගණන දත්ත, සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජනගහන දත්ත හා ලෝක බැංකු දත්ත පාදකය ඇසුරිනි.

(k) අවුරුදු **5** සම්පූර්ණ වූ ජනගහනයෙන් රජයේ පාසල් හා පෞද්ගලික පාසල්වල පළමු ශ්‍රේණියට ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(l) අවුරුදු **5-10** වයස් සීමාවේ සිටින ජනගහනයෙන් රජයේ පාසල් හා පෞද්ගලික පාසල්වල ප්‍රාථමික අධ්‍යාපන චක්‍රයට ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(m) අවුරුදු **5-14** වයස් සීමාවේ ජනගහනයෙන් රජයේ පාසල් හා පෞද්ගලික පාසල්වල ප්‍රාථමික සිට කනිෂ්ඨ ද්විතීයික අවධිය දක්වා (**1-9** ශ්‍රේණිවලට) ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය.

(n) අවුරුදු **5-16** අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාවේ ජනගහනයෙන් රජයේ පාසල් හා පෞද්ගලික පාසල්වල ප්‍රාථමික සිට ජ්‍යෙෂ්ඨ ද්විතීයික පළමු අවධිය දක්වා (**1-11**ශ්‍රේණිවලට) ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(o) රජයේ පාසල්වලට පළමු ශ්‍රේණියට ඇතුළත් වන ශිෂ්‍යයින්ගෙන් **9** ශ්‍රේණිය හා **11** ශ්‍රේණිය දක්වා රැඳී සිටින ප්‍රතිශත

(p) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග ප්‍රතිඵල දත්ත ඇසුරිනි.

(q) පාසල්වල පවතින යටිතල පහසුකම් අතරින් ප්‍රධාන කිහිපයක් පමණක් මෙහි සලකා ඇත.

(r) පාසල් සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ ව සකස්කර ඇති ජාතික ප්‍රතිමානයන්ට අනුව අවශ්‍ය ප්‍රමාණයෙන් **50%** ක් හෝ ඇති පාසල්

(s) අධ්‍යාපන අමාත්‍යාංශයේ දත්ත සහ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ දත්ත ඇසුරිනි.

(t) කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කවල සියලු ම රජයේ පාසල් ද මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල ඇතැම් රජයේ පාසල් ද **2009** ජූනි **01** පාසල් සංගණන දිනය වන විට වසා තිබිණි.

(u) පළමු වර අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල අනුව

(v) පළමු වර හා දෙවන වර විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල අනුව

(w) සිංහල හෝ දෙමළ මාධ්‍ය සහිත ව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද විෂයයන් කිහිපයක් හදාරන සිසුන්

(x) සලකා බලන වර්ෂයේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා කරන සමස්ත වියදම, වර්ෂයේ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බෙදීමෙන් ඒක පුද්ගල ශිෂ්‍ය වියදම ගණනය කරනු ලැබේ.

(y) සාමාන්‍ය පෙළ විද්‍යාගාර/ විද්‍යා කාමර හෝ මිනි ලැබ සහිත **6-11/ 6-13** පාසල් ප්‍රතිශතය

N/A - අදාළ නොවේ

- කාන්තා හා ළමා සංවර්ධන හා පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා සේවා රාජ්‍ය අමාත්‍යාංශය මඟින් වියදම් දරා ඇත.

***** - **2019** වර්ෂයේ දී අ.පො.ස.(උ.පෙළ) විභාගය, පැරණි හා නව විෂය නිර්දේශය යටතේ පැවැත්වුණු අතර එහි එකතුව මෙහි දක්වා ඇත.

******* - කාර්යසාධන වාර්තාව පිළියෙළ කරන අවස්ථාව වන විට **2021** වර්ෂය සඳහා අ.පො.ස.(උ.පෙළ) විභාගය පවත්වා ප්‍රතිඵල නිකුත් කර නොනිබුණු අතර අ.පො.ස.(සා.පෙළ) විභාගය ක්‍රියාත්මක වෙමින් පැවතුණි.



අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயல்திறன் அறிக்கை
Annual Performance Report
2022

වෙළුම II - උසස් අධ්‍යාපනය
இதழ் II - உயர் கல்வி
Volume II - Higher Education

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2022



උසස් අධ්‍යාපන

පටුන

1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය ....01 - 20

1.1. උසස් අධ්‍යාපන අංශය පිලිබඳ හැඳින්වීම 01

1.2. උසස් අධ්‍යාපන අංශයේ දැක්ම /මෙහෙවර/ අරමුණු 01

1.3. උසස් අධ්‍යාපන අංශයේ සංවිධාන ව්‍යුහය 01

1.4. සංවිධාන සටහන 02

1.4.1 උසස් අධ්‍යාපන අංශයේ කාර්ය මණ්ඩලය - 2022.12.31 දිනට 03-04

1.5. ආංශික කාර්යය සාධනය..... 04-15

1.5.1 පාලන අංශය 04-05

1.5.2 මූල්‍ය කළමණාකරන අංශය 06

1.5.3 යටිතල පහසුකම් සංවර්ධන අංශය 06-07

1.5.4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය 08-11

1.5.5 සංවර්ධන අංශය 11-13

1.5.6 සැලසුම් අංශය 13-14

1.5.7 රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය.....15

1.6 උසස් අධ්‍යාපන මූල්‍ය ප්‍රගතිය - 2022 15-16

1.7 විදේශීය ණය හා ආධාර යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 16-20

1.8. අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 20-23

2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 24-53

3. පරිච්ඡේදය - 2022.12.31න් අවසන් වර්ෂය සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය 53-58

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය.....53

3.2 මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය 54

3.3 මුදල් ප්‍රවාහ පිලිබඳ ප්‍රකාශය 55-57

3.4 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 57

3.5 2022.12.31 දිනට මූලධන වියදම් සාරාංශය 57

4. පරිච්ඡේදය- කාර්ය සාධන දර්ශක 59

5. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය 59-61

6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 62-63

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 64-69

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 උසස් අධ්‍යාපන අංශය පිලිබඳ හැඳින්වීම

සියලු ම විශ්වවිද්‍යාල සිසුන් තාක්ෂණය සමඟ නව ලොව නව දැනුම සමඟ සම්බන්ධ කරවන්නටත්, 21 වැනි සියවසේ ඉදිරි දශකය තුළ ආර්ථිකය විසින් ඉල්ලා සිටින මානව ප්‍රාග්ධනය ඒ හරහා ගොඩනඟන්නටත් රටක උසස් අධ්‍යාපන පද්ධතිය මහඟු කාර්යභාරයක් ඉටු කරයි. රටක් නොව ලොවක් අභියෝග සමඟ ඉදිරියට රැගෙන යාමේ දී ප්‍රාථමික, ද්විතීයික, හා තෘතීයික උසස් අධ්‍යාපන පද්ධතීන් සංවර්ධනය වෙනුවෙන් අනාගත සැලසුම් ගොඩනඟන්නට සියලු පාර්ශවයන්හි සාමූහික සහාය අතිශයින් ම වැදගත් වෙයි. මේ යටතේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම, විශ්වවිද්‍යාලවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, උපාධිධාරීන්ගේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම තුළින් උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය වැඩිකිරීම, පර්යේෂණ හා නවෝත්පාදන වැඩි කිරීම යනාදී අංශ සඳහා දායකවීම දක්වා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්ය භාරය විහිදී යයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ශ්‍රී ලංකාව උසස් අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ටතම ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් බවට පත්කිරීම.

මෙහෙවර

ප්‍රතිඵල අරමුණු කොටගත් ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන පද්ධතියේ ශිෂ්‍යයන් සහ අනෙකුත් පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීම.

අරමුණු

- උසස් අධ්‍යාපනය වෙත ප්‍රමාණවත් ප්‍රවේශ අවස්ථා සැලසීම.
- ඉහළ ලෝක මානනීය දර්ශකයන් හිමි පරිණාමිත සහ නව විශ්වවිද්‍යාල ස්ථාපිත කිරීම.
- උපාධිධාරීන්ගේ රැකියා නියුක්තභාවය සහ ගුණාත්මය වැඩි දියුණු කිරීම.
- පර්යේෂණ, ප්‍රකාශන සහ වාණිජ්‍යකරණය වැඩි දියුණු කිරීම.
- උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

1.3 උසස් අධ්‍යාපන අංශයේ සංවිධාන ව්‍යුහය

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවිධාන ව්‍යුහය පිළිබඳව සලකා බැලීමේ දී, අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධානතම ආයතනය වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සෘජු අධීක්ෂණය යටතේ විශ්වවිද්‍යාල 17ක් සහ (සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල 16ක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්විද්‍යාලය මීට අයත් වේ) උසස් අධ්‍යාපන ආයතන 19ක් පවතී. එසේම අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) ක්‍රියාත්මක වේ.

මීට අමතරව, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25ඒ වගන්තිය යටතේ නිශ්චිත උපාධි ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සහ උපාධි ප්‍රදානය කිරීම සඳහා පිලිගත් ආයතන 24ක් පවතී.

1.4 සංවිධාන සටහන


ලේකම්
ප්‍රධාන ඉංජිනේරු
අතිරේක ලේකම් (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන)
අතිරේක ලේකම් (සංවර්ධන)
අතිරේක ලේකම් (පළාත් සභා මූල්‍ය)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සංඛ්‍යාලේඛනාධිපති
අධ්‍යක්ෂ (සැලසුම්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) 1
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) 2
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී
අධ්‍යක්ෂ (ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය)
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය)
අධ්‍යක්ෂ (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන)
අධ්‍යක්ෂ (සංවර්ධන)
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)
සහකාර අධ්‍යක්ෂ (ශිෂ්‍යත්ව)
අධ්‍යක්ෂ (විදේශ අධ්‍යාපන)
අධ්‍යක්ෂ (යටිතල පහසුකම් හා සංවර්ධන)
අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
නීති නිලධාරී
සහකාර ලේකම් (ආයතන)
සහකාර ලේකම් (පාලන)
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී
උපාධිධාරී අභ්‍යාසලාභී
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
උපාධිධාරී අභ්‍යාසලාභී
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
උපාධිධාරී අභ්‍යාසලාභී
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
සංවර්ධන නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
සංවර්ධන නිලධාරී
සංවර්ධන නිලධාරී
පරිපාලන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
භාෂා පරිවර්තක
කාර්යාල සේවක සේවය
රියදුරු

1.4.1 උසස් අධ්‍යාපන අංශයේ කාර්ය මණ්ඩලය - 2022.12.31 දිනට

	සේවක වර්ගය	තනතුරු	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු /අතිරික්ත සංඛ්‍යාව
(i)	ජ්‍යෙෂ්ඨ මට්ටම	ලේකම්	1	1	-
		අතිරේක ලේකම් (පාලන හා මූදල්)	1	1	-
		අතිරේක ලේකම් (සංවර්ධන හා ශිෂ්‍යත්ව)	1	1	-
		අතිරේක ලේකම් (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන)	1	1	-
		ප්‍රධාන මූල්‍ය නිලධාරී	1	1	-
		ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	1	1	-
		අධ්‍යක්ෂ (විදේශ අධ්‍යාපන)	1	1	-
		අධ්‍යක්ෂ (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන)	1	1	-
		අධ්‍යක්ෂ (සංවර්ධන)	1	1	-
		අධ්‍යක්ෂ (ශිෂ්‍ය ණය අංශය)	1	1	-
		අධ්‍යක්ෂ (සැලසුම්)	1	1	-
		අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන)	1	1	-
		අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)	1	1	-
		ප්‍රධාන ගණකාධිකාරී	1	1	-
		ප්‍රධාන අභ්‍යන්තර විගණක	1	1	-
		ඉංජිනේරු (සිවිල්)	1	පූර්ණකාලීනව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිදහස් කර ඇත.	
		නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන හා ශිෂ්‍යත්ව / කුසලතා සංවර්ධන)	2	1	-
		නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන)	1	1	--
		නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ (ශිෂ්‍ය ණය අංශය) - ශ්‍රී. ලං.ප.සේ.	1	0	-
		නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)	2	2	-
		නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ (ශිෂ්‍ය ණය අංශය) - ශ්‍රී ලං. ක්‍ර.සේ.	1	1	-
		සහකාර ලේකම්	2	1	-
		ගණකාධිකාරී	1	1	-
		නීති නිලධාරී	1	1	

1.1 වගුව

	සේවක වර්ගය	තනතුරු	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු /අතිරික්ත සංඛ්‍යාව
(ii)	තෘතියික	පරිපාලන නිලධාරි	1	1	-
		භාෂා පරිවර්තක	2	1	1
		තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	2	2	0
(iii)	ද්විතියික	සංවර්ධන නිලධාරී	80	131	අතිරික්ත 51
		තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	2	1	1
		මාධ්‍ය නිලධාරි *	1	-	-
		තාක්ෂණ නිලධාරි	1	-	1
		කළමනාකරණ සේවා නිලධාරි	36	13	23
		කළමනාකරණ සහකාර**	5	5	-
(iv)	ප්‍රාථමික	රියැදුරු***	22	17	5
		රියදුරු**	1	1	-
		කාර්යාල කාර්ය සහයක***	22	21	1
		කාර්යාල සහායක**	2	2	-
එකතුව			204	218	අතිරික්ත 14

1.2 වගුව

සටහන:-

*** මෙම නිලධාරියා ද්විතියන පදනම මත ජාතික අධ්‍යාපන ආයතනය වෙත නිදහස් කර ඇත.**

**** දෙපාර්තමේන්තුගත තනතුරු.**

****** රියදුරු සහ කාර්යාල සේවක සේවයේ තනතුරු පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන සහායකයින් අතුරින් අනුයුක්ත කර ගත් රියදුරන් 01ක් අයෙකු සහ කාර්යාල සේවක සේවකයින් 03ක් ද වශයෙන් සිවු දෙනෙකු සේවය කරයි.**

1.5 ආංශික කාර්ය සාධනය

1.5.1 පාලන අංශය

උසස් අධ්‍යාපනය නංවාලීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය මඟින් ඉටු කරනු ලබන කාර්යයන්හි ගුණාත්මකභාවය නංවාලීම සහ පවත්වාගැනීම සඳහා අමාත්‍යාංශයේ අභිමතාර්ථ සහ කාර්යයන් වලට ගැලපෙන උසස් තත්ත්වයක් සහිත ප්‍රශස්ථ සේවක මණ්ඩලයක් පවත්වා ගැනීම, අඛණ්ඩ සහ ඵලදායී ආකාරයෙන් සේවා සැපයීම, අනෙකුත් ආයතන සමඟ විධිමත් සම්බන්ධීකරණයක් ඇති කිරීම, කාර්ය මණ්ඩලයේ සුභසාධක පහසුකම් නංවාලීම සහ උසස් අධ්‍යාපන අංශයේ සමස්ත පරිපාලනය, මෙහෙයවීම සහ ඇගයීම නංවාලීම පාලන අංශය මඟින් සිදු කරනු ලැබේ.

1.5.1.1. පාලන අංශයේ කාර්යභාරය

- දෛනිකව උසස් අධ්‍යාපන අංශය වෙත ලැබෙන හා බැහැර යැවෙන ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම හා එහි සාධනීය බව සහතික කිරීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම හා තීරණ අදාල පාර්ශව වෙත දැන්වීම.
- වෙනත් අමාත්‍යාංශ මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත යවනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම.

- පාර්ලිමේන්තු ප්‍රශ්න, උපදේශක කාරක සභා යෝජනා, මහජන පෙත්සම්, මානව හිමිකම් කඩවීම් හා ජනාධිපති කාර්යාලයෙන් හා විවිධ පාර්ශ්වයන්ගෙන් ලැබෙන පැමිණිලි, යෝජනා හා ඉල්ලීම් අදාල පාර්ශව වෙත යැවීම සඳහා පියවර ගැනීම.
- උසස් අධ්‍යාපන අංශයේ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම.
- උසස් අධ්‍යාපන අංශයේ සියලු වාහන ලියාපදිංචි කිරීම, නඩත්තු කිරීම සහ රක්ෂණය කිරීම,ආදායම් බලපත්‍ර ලබා ගැනීම හා සියලු සංචිත වාහන සඳහා ඉන්ධන සැපයීම .
- උසස් අධ්‍යාපන අංශයේ යටිතල පහසුකම් කාර්යක්ෂම සහ ඵලදායී ආකාරයට සැපයීම, ගොඩනැගිලි,යන්ත්‍ර සූත්‍ර හා නඩත්තු සම්බන්ධයෙන් අදාළ ආයතනයන්ගෙන් සේවා ලබාගැනීම සහ පවත්වා ගැනීම
- උසස් අධ්‍යාපන අංශයේ ආරක්ෂක කටයුතු හා පවිත්‍රතා කටයුතු නිසි පරිදි පවත්වා ගැනීම.
- නිලධාරීන්ගේ රාජකාරී දුරකතන බිල්පත් පියවීම
- නිලධාරීන්ගේ විදේශ සංචාර සම්බන්ධ විදේශ ගමන් බලපත්‍ර, වීසා,VIP, ගමන් වියදම් හා දීමනා ලබාදීම පිලිබඳ කටයුතු හා දිවයිනෙන් බැහැර යාම සම්බන්ධ කටයුතු ඉටු කිරීම.
- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.
- නිලධාරීන්ගේ නිවාඩු, අතිකාල හා ගමන් වියදම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- නිලධාරීන් සඳහා ආපදා ණය, දේපල ණය, යතුරු පැදි ණය, උත්සව අත්තිකාරම් ණය ලබා දීම සම්බන්ධ කටයුතු හා අග්‍රහාර රක්ෂණ කටයුතු සිදු කිරීම.
- මාසික දුම්රිය වාර ප්‍රවේශපත්‍ර සහ දුම්රිය ගමන් බලපත්‍ර (warrants) නිකුත් කිරීම.
- මැතිවරණ පවත්වන අවස්ථාවලදී ඒවාට සම්බන්ධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම
- උසස් අධ්‍යාපන අංශයෙහි කාර්ය මණ්ඩලය බඳවාගැනීම්, අනුයුක්ත කිරීම්, ස්ථාන මාරුවීම්, උසස්වීම් හා විශ්‍රාම ගැන්වීම්
- උසස් අධ්‍යාපන ගරු අමාත්‍ය/ රාජ්‍ය අමාත්‍ය/නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලය බඳවාගැනීම්, අනුයුක්ත කිරීම් හා සේවය අවසන් කිරීම්
- බඳවා ගැනීම් පරිපාටි සකස් කිරීම
- කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණුවීමේ අවස්ථා ලබා දීම
- උසස් අධ්‍යාපන අංශය යටතේ ඇති ආයතනයන්හි හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා සහනදායී මෝටර් බලපත්‍ර නිකුත් කිරීම
- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල අනධ්‍යන කාර්ය මණ්ඩල පත් කිරීම හා පුරප්පාඩු පිරවීම
- විශ්වවිද්‍යාල සඳහා විදේශීය ආචාර්යවරුන් කොන්ත්‍රාත්/ තාවකාලික පදනම මත බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම
- විශ්වවිද්‍යාලවල අනධ්‍යයන කාර්ය මණ්ඩලය ද්විතීයන පදනම මත තාවකාලිකව/ ස්ථිරව මුදා හැරීම
- විශ්වවිද්‍යාල පද්ධතියේ දීමනා සම්බන්ධ මහා භාණ්ඩාගාරය හා සම්බන්ධීකරණ කටයුතු කිරීම
- විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් විෂමතා පිළිබඳව අමාත්‍යාංශයේ නිර්දේශ ලබා දීම
- විදේශ ආධාර හා ණය මත ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම හා කාර්ය මණ්ඩල බඳවා ගැනීම් කටයුතු සිදු කිරීම.

1.5.2. මූල්‍ය කළමනාකරණ අංශය

මුදල් රෙගුලාසි වලින් නියම කර ඇති පරිදි අමාත්‍යාංශයක හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල මූල්‍ය පරිපාලනයේ ක්‍රමවත්භාවය හා ප්‍රමාණාත්මක භාවය පිළිබඳව අමාත්‍යාංශ ලේකම් වරයා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වශයෙන් මුදල් අමාත්‍යවරයාට වගකිවයුතු වේ.

ඒ අනුව අමාත්‍යාංශයක් තුළ මූල්‍ය ප්‍රතිපත්ති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම හා මූල්‍ය වගකීම සම්බන්ධයෙන් ද අමාත්‍යාංශ ලේකම් වරයා පාර්ලිමේන්තුවට වගකිවයුතු කරුණු සම්බන්ධයෙන් ද අමාත්‍යාංශ ලේකම් වරයාට සහාය වීම මූල්‍ය කළමනාකරණ අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

කාර්යක්ෂම හා සඵලදායක මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, මූල්‍ය උපදෙස් හා මඟපෙන්වීම්, මූල්‍ය සැලසුම්කරණය හා අයවැය, ගිණුම්කරණය හා වාර්තා කරණය, අභ්‍යන්තර පාලනය, වත්කම් කළමනාකරණය, ප්‍රසම්පාදන කළමනාකරණය, විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධ මූල්‍ය කළමනාකරණ උපදෙස් හා සුපරීක්ෂණය යන කාර්යයන් රාජ්‍ය නිවේදිත ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවා ව්‍යවස්ථාව මගින් නියම කර ඇති කාර්යභාරයන් වේ.

2022.12.31 දිනට පුනරාවර්තන වියදම් සාරාංශය

(රු. මිලියන)

අයිතමය/විස්තරය	2022 ශුද්ධ ප්‍රතිපාදනය	ප්‍රතිපාදන		ප්‍රතිපාදන උපයෝජන ප්‍රගතිය %
		වියදම	ඉතිරිය	
පරිපාලන හා ආයතනික සේවා	**603.50**	**596.15**	**7.35**	**98.8%**
පුද්ගල පඩිනඩි	108.45	103.64	4.81	**95.6%**
වෙනත් පුනරාවර්තන වියදම්	495.05	492.51	2.53	**99.5%**
උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට ආයතනික දායකත්වය	**1,853.50**	**1,780.10**	**73.40**	**96.0%**
එකතුව	**2,457.00**	**2,376.25**	**80.75**	**96.7%**

1.3 වගුව

1.5.3 යටිතල පහසුකම් සංවර්ධන අංශය

1.5.3.1 2022.01.01 සිට 2022.12.31 දක්වා යටිතල පහසුකම් සංවර්ධන අංශය විසින් ඉටු කරන ලද කාර්යයන්

- ප්‍රසම්පාදන කාර්යන් 2006 ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය, මාර්ගෝපදේශ සංග්‍රහ, මුදල් රෙගුලාසි හා 2022 වර්ෂයට අදාළ අයවැය ප්‍රතිපාදන අනුව ඉටු කිරීම.
- ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව හා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සැලසී ඇති ප්‍රතිපාදන අනුව කාර්යක්ෂමව හා සඵලදායිව අදාළ සේවාවන් සැපයීම.
- රාජ්‍ය විශ්වවිද්‍යාලවලට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත කර එවනු ලබන ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය යන ආයතනයන්ගෙන් ලැබෙන ව්‍යාපෘති යෝජනා ඇගයීමකට ලක්කොට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබූ ව්‍යාපෘති යෝජනා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම.

- ව්‍යාපෘතිවලට අදාළ රේට් අනුමැතීන් ලබා ගැනීමට විශ්වවිද්‍යාල වෙතින් ලැබෙන ලිපිලේඛන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණික කමිටුව වෙත ඉදිරිපත් කිරීම හා අනුමත කරන ලද ප්‍රමාණ පත්‍ර (BOQ) අදාළ විශ්වවිද්‍යාලය වෙත යොමුකිරීම.

1.5.3.2 සේවා ප්‍රසම්පාදන සම්බන්ධයෙන් 2022 වර්ෂය තුළ දී කරන ලද කාර්යයන්,

1. සේවා ප්‍රසම්පාදන

- තාක්ෂණ ඇගයීම් කමිටු පත් කිරීම සඳහා අවශ්‍ය දැනුමැති වෘත්තිකයින්, විශේෂිය දැනුමැති පුද්ගලයන්ගේ නම් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

- අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු, අමාත්‍යාංශ ප්‍රධාන ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වලට අවශ්‍ය ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කර ලබාදීම.

- ලංසු විවෘත කිරීමේ කමිටු පත්කර ගැනීම හා නියමිත දින, නියමිත වේලාවට ලංසු විවෘත කිරීමට සහය ලබාදීම.

- ලංසු උපලේඛන ගත කර අදාළ තාක්ෂණ ඇගයීම් කමිටු වෙත ඉදිරිපත් කිරීම.

- තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයන් ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර අවසන් තීරණ ලබා ගෙන කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම.

2. උපදේශන සේවා

බොහෝ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ව්‍යාපෘතින්හි ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කල පසු අදාළ ඉදිකිරීම් ආරම්භ කිරීම හා අවසන් කිරීම සඳහා දිර්ඝ කාලයක් ගත වන අවස්ථාද, එම ව්‍යාපෘති කාලය මෙන්ම පිරිවැය ද දෙගුණ වූ අවස්ථා ද නිරීක්ෂණය විය. ඒ පිළිබඳ සොයා බැලීමේදී පෙනී ගියේ උපදේශකවරයෙකු තෝරා ගැනීමේ සුළු කාර්යයකදී පවා ඉතා විශාල කාලයක් ගත කර ඇති බවයි.

ඊට පිළියමක් ලෙස අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල පද්ධතියේ ඉදිකිරීම් වර්ගීකරණය කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව යෝජනා හා මිල ගණන් කැඳවා විශ්වවිද්‍යාල සඳහා අනුමත වන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා උපදේශකවරුන්ගෙන් ලැයිස්තුවක් සකස් කර විශ්වවිද්‍යාල වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව එවැනි ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදනය වෙනුවෙන් අධික කාලයක් වැය කොට විශ්වවිද්‍යාල සඳහා උපදේශකවරු පත්කර ගැනීම වෙනුවට වැඩි කාලයක් ගත නොකට මෙම ලැයිස්තුවෙන් උපදේකවරුන් තෝරා ගෙන කඩිනමින් නිර්මාණ වැඩ කටයුතු ආරම්භ කිරීමට අවකාශ සැලසී ඇත.

1.5.4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

උසස් අධ්‍යාපන අංශයේ හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ. එසේම රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ කාර්යක්ෂමතාවය හා තත්වය ඉහළ නැංවීම සඳහා යොදාගත හැකි තොරතුරු තාක්ෂණ ප්‍රතිපාදන සැකසීම ආදී කටයුතු මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

1.5.4.1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය විසින් 2022.01.01 සිට 2022.12.31 දක්වා ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

- Online Foreign Leave Approval System for University Staff, පද්ධතිය සංවර්ධනය කිරීම

  - ❖ දැනට කොළඹ විශ්ව විද්‍යාලය, බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, කැලණිය විශ්ව විද්‍යාලය, මොරටුව විශ්ව විද්‍යාලය, රුහුණ විශ්ව විද්‍යාලය, වයඹ විශ්ව විද්‍යාලය, සෞන්දර්ය විශ්ව විද්‍යාලය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, යාපනය විශ්ව විද්‍යාලය, සබරගමුව විශ්ව විද්‍යාලය, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය, නැගෙනහිර විශ්ව විද්‍යාලය, කිලිනොච්චි මණ්ඩපය යන විශ්ව විද්‍යාලවල, මණ්ඩපවල සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පාලනය වන සියළුම ආයතනවල මෙම වැඩ සටහන ක්‍රියාත්මක වේ.

  - ❖ විශ්ව විද්‍යාල අධ්‍යන හා අනධ්‍යන සියලුම කාර්ය මණ්ඩලය මෙම පද්ධතිය හරහා මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවාඩු ඉල්ලීම් කිරීම සිදුකරයි. නිවාඩු අනුමත කිරීමද මාර්ගගත ක්‍රමය ඔස්සේ මෙම පද්ධතිය හරහා සිදුකරයි.

- මහජනතාවට ගරු රාජ්‍ය අමාත්‍ය තුමා මුණගැසීම සඳහා වේලාව වෙන්කර ගැනීම සඳහා (Online Appointment Reservation System) පද්ධතියක් සකස් කිරීම.

  - ❖ මෙම පද්ධතිය සංවර්ධනය කර අවසන් කර ඇති අතර ගරු රාජ්‍ය අමාත්‍ය තුමා මුණගැසීම සඳහා වේලාව වෙන්කර ගැනීම මෙම පද්ධතිය ඔස්සේ මාර්ගගත ක්‍රමයට සිදුවේ.





- අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කරගෙන යාම සඳහා පද්ධතියක් සංවර්ධනය කිරීම.

  - ❖ දැනට මෙම පද්ධතිය සකස් කර අවසන් අතර , 2020 -12-31 දක්වා තොරතුරු ඇතුලත් කර ඇත.
  - ❖ එම දත්තවල නිරවද්‍යතාව පරීක්ෂා කරමින් පවතී.
  - ❖ 2021, 2022 වර්ෂවලට අදාල දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට අදාල කටයුතු සිදුකරයි.

- මීට අමතරව,අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශයේ පරිගණක උපාංග ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යාම සිදුකරයි.

- ❖ එම උපාංග ලැයිස්තු අංශ වශයෙන් පරීක්ෂා කර බලා ගිණුම් අංශයේ ලේඛන , ගබඩාවෙහි ලේඛන සහ පරිගණක ස්ථාවර වත්කම් ලේඛනවල අගයන් වල නිවැරදි භාවය සොයා බලා යාවත්කාලීන කිරීම සිදුකරයි.

- සහනදායී මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීමට මාර්ගගත ක්‍රමය යොදාගැනීම.(Online Management system for Vehicle Permit) සඳහා පද්ධතියත් සංවර්ධනය කිරීම.

  - ❖ මෙම නව පරිගණක මෘදුකාංගය නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය අවශ්‍යතාවයන් හඳුනාගෙන TOR සකස් කර , ලංසු කැඳවීම සඳහා ප්‍රසම්පාදන අංශයට භාර දී මේ සඳහා ආයතනයක් තෝරා ගන්නා ලදී.

  - ❖ පද්ධතිය සකස් කිරීමේ කටයුතු අවසාන් කර ඇති අතර , විශ්ව විද්‍යාල පද්ධතිය තුල මෙය ක්‍රියාත්මක කිරීම් ආරම්භ කල යුතුව ඇත.

- විදේශ ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවීමට මාර්ගගත ක්‍රමය යොදා ගැනීම.(Online Management System for Scholarships)

  - ❖ පද්ධතිය සකස් කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර, නව ශිෂ්‍යත්ව වැඩ සටහන් මෙම පද්ධතිය හරහා මාර්ගගතව ක්‍රියාත්මක වෙමින් පවතී.

  - ❖ ශිෂ්‍යත්ව අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මෙම පද්ධතිය භාවිතා කර ශිෂ්‍යත්ව අයදුම් කිරීම සිදු කරයි.

- සංවර්ධන අංශයේ Online Document Tracking System පද්ධතිය සංවර්ධනය කර ඇත.

  - ❖ මෙම පද්ධතිය ICTA ආයතනය සමග සාකච්ඡා කර Host කිරීමට අදාල කටයුතු සිදු කරගන යමින් පවතී.

- අමාත්‍යාංශයේ සේවකයින්ගේ තොරතුරු ඇතුලත් කිරීමට (HR Management System) පද්ධතියක් සකස් කිරීම.

  - ❖ මෙම පරිගණක මෘදුකාංගය නිර්මාණය කර අවසන් කර ඇත.

  - ❖ මෙම පද්ධතියේ දත්ත යාවත්කාලීන කරමින් පවතී.

  - ❖ මෙම පද්ධතිය මගින් අමාත්‍යාංශයේ පාලන අංශයට අදාළ ඇතැම් වාර්තා ලබා ගත හැකි අතර,අවශ්‍ය අනෙකුත් වාර්තා සකස් කිරීමට අදාළ කටයුතු ICTA ආයතනය සමග සාකච්ඡා කර සිදුකරගන යමින් පවතී.

- සංවර්ධන අංශයේ MOU පද්ධතිය සංවර්ධනය කිරීම.

  - ❖ මෙම පද්ධතිය සංවර්ධනය කරමින් පවතී.

- රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල අංශයේ Online Interest Free Student Loan Management System පද්ධතිය නඩත්තු කිරීම සහ නව අවශ්‍යතාවයන් ඇතුලත් කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරනය කිරීම.

- විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය විසින් ඵලඹෙන බැදුම්කර කඩ කිරීම හේතුවෙන් අයවිය යුතු මුදල් පිළිබඳ දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීම .

  - ❖ මෙම දත්ත පද්ධතිය සකස් කර අවසන් කර ඇති අතර පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා අභ්‍යන්තර විගණන අංශයට සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලබා දී ඇත.

- 2020 අයවැය යෝජනාවට අනුව රාජ්‍ය විශ්වවිද්‍යාලවල Wi-Fi පහසුකම් තවදුරටත් පුළුල් කිරීම සඳහා තුන්වන අදියර යටතේ පහත සඳහන් උසස් අධ්‍යාපන ආයතන 2021 වර්ෂයේ තෝරාගෙන ඇත.
    - ඌව වේල්ලස්ස , විශ්ව විද්‍යාලය - බදුල්ල
    - සබරගමුව විශ්ව විද්‍යාලය -බෙලිහුල්ඔය
    - පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය - කොළඹ

    ❖ මේ වන විට මෙම ව්‍යාපෘතියේ සමස්ථයක් ලෙස 85% ක ප්‍රමාණයක් අවසන් කර ඇත.

    - ඌව වේල්ලස්සවිශ්ව විද්‍යාලය , - බදුල්ල - 95% ක ප්‍රමාණයක් අවසන් කර ඇත
    - සබරගමුව විශ්ව විද්‍යාලයබෙලිහුල්ඔය- - 80% ක ප්‍රමාණයක් අවසන් කර ඇත
    - පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය - කොළඹ - 98% ක ප්‍රමාණයක් අවසන් කර ඇත

- 2022 තොරතුරු තාක්ෂණ සැලැස්ම සකස් කිරීම.

- 2016 අයවැය යෝජනාවලට අනුව, ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා පොළී රහිත ණය ලබාදීමේ ව්‍යාපෘතියට අදාළ රාජකාරි කටයුතු සිදු කිරීම

- උසස් අධ්‍යාපන අංශයේ වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම.

- අමාත්‍යාංශයේ ඇති පරිගණක, Laptop යන්ත්‍ර,Tabs සහ මුද්‍රණ යන්ත්‍ර වල දෘඩාංග දෝෂ නිරාකරණය කිරීම.

- පරිගණකවල මෘදුකාංග දෝෂ අන්තර්ජාල හා e-mail වල ගැටළු නිවැරදි කිරීම.

- අංශවල අවශ්‍යතාවය අනුව පරිගණක වලට භාවිත මෘදුකාංග ඇතුලත් කිරීම, දෘඩාංග සම්බන්ධ ගැටළු නීරාකරණය කිරීම.

- අමාත්‍යාංශයේ පරිගණක ආරක්ෂාව සඳහා වෛරස් මෘදුකාංග ඇතුලත් කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම.

- වෛරස් කොන්සෝල් පද්ධතිය නඩත්තු කිරීම.

- පරිගණක ජාලය නඩත්තු කිරීම හා පුළුල් කිරීම.

- පරිගණක ජාල පරිපාලක මධ්‍යස්ථානයේ ඇති Proxy Server, Firewall Server, e-mail server, Virus Console Server හා උසස් අධ්‍යාපන විදේශ නිවාඩු මෘදුකාංග Server යන්ත්‍ර , Server යන්ත්‍ර පරිපාලනය කිරීම.

- උසස් අධ්‍යාපන විදේශ නිවාඩු මෘදුකාංග පද්ධතිය නඩත්තු කිරීම හා සංවර්ධන අංශයේ අවශ්‍යතාවය අනුව අදාල ආකෘති සකස් කර දීම.

- අමාත්‍යාංශයේ දැනට ස්ථාපිත Wi-Fi පද්ධතිය නඩත්තු කිරීම හා වරින් වර ඇතිවන තාක්ෂණික ගැටළු නිරාකරණය කිරීම.

- අමාත්‍යාංශයට අවශ්‍ය පරිගණක දෘඩාංග හා මෘදුකාංග මිලදී ගැනීමේදී අදාල තාක්ෂණික කමිටු නියෝජනය කිරීම.

- තොරතුරු තාක්ෂණ පද්ධති මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විවිධ අවධිවලදී දායකත්වය ලබා දීම.

- අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී තාක්ෂණික ඇගයීම් කමිටු නියෝජනය කිරීම.

- ICTA මගින් ක්‍රියාත්මක කරන LGN ව්‍යාපෘතියේ කටයුතුවලට දායකත්වය ලබා දීම.

- තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- MS Mail Domain (mail.mohe.gov.lk) email පද්ධතියේ පරිපාලන කටයුතු (Office email Account Creation & Adding MS office Software Rights to Each Accounts) සිදු කිරීම හා තුන්වන පාර්ශවයේ S/W (Assure, SharePoint) වලට අදාල කටයුතු සිදු කිරීම .ඊට අමතරව Cloud Storage තාක්ෂණය යොදා ගනිමින් අමාත්‍යාංශයේ දත්ත කළමනාකරණය සඳහා පහසුකම් සැලසීම , උදා : One Drive, Google Drive

- Google Mail Domain (mohe.gov.lk) පද්ධතියේ පරිපාලන (නව email address සෑදීම පවතින email address වල ගැටළු නිරාකරණය කිරීම) කටයුතු සිදු කිරීම.

- MS Team තාක්ෂණය යොදා ගනිමින් අමාත්‍යාංශයේ ශිෂ්‍ය ණය අංශයේ සිසුන් 4500 කට අධික පිරිසක් සම්මුඛ පරීක්ෂණ සඳහා සම්බන්ධ කිරීම, තවද සංවර්ධන අංශයේ විදේශ ශිෂ්‍යත්ව සඳහා සම්මුඛ පරීක්ෂණ Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වීමට සියලු පහසුකම් සැලසීම.

- Online meeting සංවිධානය කිරීම සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
  <u>Zoom Video Conference</u>

  - ❖ අමාත්‍ය තුමා, ලේකම්තුමා, සහ අනෙකුත් සහ අනෙකුත් සියලු අංශවල Zoom Meeting සඳහා අවශ්‍ය සහය ලබා දීම.

  - ❖ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයේ සහ විශ්ව විද්‍යාල කොමිෂන් සභාවට අනුබද්ධිත ආයතන සමඟ සාකච්ඡා පැවැත්වීමට අවශ්‍ය තොරතුරු තාක්ෂණික සහය ලබාදීම.

- State, MOHE, DAI Online Progress Report සකස් කිරීම.

- පිටරට සිටින විදේශ ශිෂ්‍යයින් මාර්ගගත ක්‍රමයට ලියාපදිංචි කිරීම සඳහා මෘදුකාංගයක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- විදේශ ශිෂ්‍යයින් ලියාපදිංචි කිරීමට වෙබ් පෝටර්ල් සංවර්ධනය කිරීම.

- අංශවල ඉල්ලීම පරිදි අවශ්‍යතාවන්ට අනුකූලව Google Form නිර්මාණය කිරීම.

1.5.5. සංවර්ධන අංශය

ශ්‍රී ලංකාව තුළ නව රාජ්‍ය විශ්වවිද්‍යාල ස්ථාපනය කිරීම, පවතින විශ්වවිද්‍යාල පුලුල් කිරීමේදී අවශ්‍ය නෛතික පසුබිම සකස්කර දීම හා ඉඩම් අත්පත් කර දීම මගින් භෞතික සම්පත් සැපයීම මෙම අංශයෙහි වගකීමකි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම යටතේ නියාමනය නොවන භික්ෂු විශ්වවිද්‍යාලය සහ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සියලු කාර්යයන් අධීක්ෂණය සහ මෙහෙයුම් කටයුතු සිදුකරනුයේ මෙම අංශයෙනි. විශ්වවිද්‍යාලය කාර්ය මණ්ඩල අධ්‍යාපන හා පෞද්ගලික කාර්යයන් සඳහා විදේශ ගත වීමේදී ඒ සඳහා නිවාඩු ලබා ගැනීම හා වියදම් දැරීම පිළිබඳ අවශ්‍ය නිර්දේශ හා අනුමැතිය ලබාදීම, විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපන කටයුතුවලට අවශ්‍ය රසායන ද්‍රව්‍ය හා උපකරණ ආනයනයේදී අවශ්‍ය නිර්දේශ ලබා දීම මගින් එම කාර්යයන් සඳහා පහසුකම් සපයනු ලබයි.

නිලධාරි සංඛ්‍යාව

අනු අංකය	තනතුරු නාමය	2022.01.01 දිනට සේවක සංඛ්‍යාව	2022.12.31 දිනට සේවක සංඛ්‍යාව
01.	අතිරේක ලේකම් (සංවර්ධන)	01	01
02.	අධ්‍යක්ෂ (සංවර්ධන)	01	01
03.	සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)	-	-
04.	සංවර්ධන නිලධාරි	14	14
05.	කළමනාකරණ සේවා නිලධාරී 1	01	01
06.	කාර්යාල සේවක සේවය III	01	01
එකතුව		**18**	**18**

1.4 වගුව

1.5.5.1 සංවර්ධන අංශයේ කාර්යභාරය

1. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ නව පාඨමාලා ආරම්භ කිරීම, පාඨමාලා වෙනස්කිරීම, නව පීඨ හා අංශ ආරම්භ කිරීම ආදී නියමයන් හා නියමාවලි පළකිරීම

2. රජයේ විශ්වවිද්‍යාල ස්ථාපනය හා පුලුල් කිරීම සඳහා ඉඩම් පවරා ගැනීම හා අත්පත් කර ගැනීම පිළිබඳ කටයුතු

3. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට අදාළ කටයුතු (සේවක සංඛ්‍යා පිළිබඳ කරුණු හැර)

4. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, පශ්චාත් උපාධි ආයතන සහ අනෙකුත් උපාධි අධ්‍යාපන ආයතනයන්හි පාලක සභා / කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් පත්කිරීම

5. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සම්බන්ධ කටයුතු

6. සියලුම විශ්වවිද්‍යාල හා එම විශ්වවිද්‍යාලයන්ට අයත් පශ්චාත් උපාධි ආයතන වෙතින් ලැබෙන විදේශ නිවාඩු ඉල්ලුම්පත් සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ ගරු අමාත්‍යතුමාගේ සහ අතිරේක ලේකම් (සංවර්ධන)ගේ අවසරය ලබා දීමට අදාළ කටයුතු

7. විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනයන්හි කාර්ය මණ්ඩල එම ආයතන විසින් උපයන ලද අරමුදල් (Generated Funds) හා දේශීය අරමුදල් ප්‍රයෝජනයට ගෙන විදේශ චාරිකා සඳහා සහභාගිවීමේ දී වැයවන ප්‍රතිපාදනවලට අවශ්‍ය අනුමැතිය අමාත්‍යාංශ අතිරේක ලේකම් (සංවර්ධන)ගෙන් හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා දීමට කටයුතු කිරීම.

8. විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩල නිලධාරීන් සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව යානාපත්‍ර සඳහා අනුමැතිය ලබා දීමට අදාළ කටයුතු.

9. විශ්වවිද්‍යාලයන්හි කුලපතිවරුන් හා උපකුලපතිවරුන් පත් කිරීම සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු

10. විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයට අදාළ ගැටළු පිළිබඳ ජනාධිපති කාර්යාලයෙන් හා වෙනත් ආයතන වලින් ලැබෙන ලිපි සම්බන්ධව කටයුතු කිරීම.

11. විශ්වවිද්‍යාලයන්ට අවශ්‍ය රසායන ද්‍රව්‍ය, විද්‍යුත් උපකරණ කට්ටල හා විවිධ උපාංග ගුවන් මඟින් ආනයනය කිරීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 368 අනුව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාදීමට අදාළ කටයුතු.

12. විශ්වවිද්‍යාලයන්ට අවශ්‍ය රසායන ද්‍රව්‍ය, විද්‍යුත් උපකරණ කට්ටල හා විවිධ උපාංග ආනයනය කිරීමේදී එවැනි භාණ්ඩ සඳහා තීරුබදු සහ වැට්බදු නිදහස් කිරීම/සහන සම්බන්ධයෙන් ලැබෙන ඉල්ලීම් සඳහා 2021.03.24 දිනැති අංක 2220/42 දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව අනුමැතිය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

1.5.6. සැලසුම් අංශය

1.5.6.1 සැලසුම් අංශයේ කාර්යභාරය

- දේශීය හා විදේශීය ව්‍යාපෘති අනුමත කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යැවීම හා ඔවුන් විසින් ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් කරනු ලබන විමසීම් වලට පිළිතුරු යැවීම සඳහා විශ්වවිද්‍යාල සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම.

- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව විදේශීය ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු සංවිධානය කිරීම හා විදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ණය හා ආධාර දෙන රටවල් සමග මෙන්ම දේශීය ආයතන සමඟ ඇතිවන ගැටලු නිරාකරණය සඳහා අදාළ කටයුතු කිරීම.

- විදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකක පිහිටුවීමට අදාළ කටයුතු සංවිධානය කිරීම හා ව්‍යාපෘති සේවක තනතුරු අනුමත කරවා ගැනීම් හා බඳවා ගැනීම් සඳහා පාලන අංශය සමඟ සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම.

- නිම කරනු ලබන විදේශීය ව්‍යාපෘති සඳහා අවසන් ව්‍යාපෘති වාර්තා සකස් කරවා ඒවා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික විගණන කාර්යාලය සහ ව්‍යාපෘතියේ විදේශ අරමුදල් සපයන ආයතනය (donor) වෙත යැවීම.

- දේශීය ඉදිකිරීම් ව්‍යාපෘති, අයවැය යෝජනා ව්‍යාපෘති හා විදේශීය ව්‍යාපෘතිවලට අදාළව ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කාර්තුමය ප්‍රගති වාර්තා පිළියල කර භාර දීම.

- ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය,පාර්ලිමේන්තුව හා මහභාණ්ඩාගාරය විසින් දේශීය ඉදිකිරීම් ව්‍යාපෘති, අයවැය යෝජනා ව්‍යාපෘති හා විදේශීය ව්‍යාපෘතිවලට අදාළව කරනු ලබන විමසීම් වලට අදාළව තොරතුරු හා ප්‍රගති වාර්තා පිළියල කර භාර දීම.

- වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීම සඳහා විදේශීය ව්‍යාපෘති හා අයවැය යෝජනා ව්‍යාපෘතිවලට අදාළව අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කළ යුතු මුල්‍ය අවශ්‍යතා ලබා ගෙන භාණ්ඩාගාරය වෙත දැනුම් දීම සඳහා ගිණුම් අංශය වෙත ලබා දීම.

- අයවැය කථාවේ දී ඉදිරිපත් කළ යුතු අයවැය යෝජනා සඳහා විශ්වවිද්‍යාල වෙතින් ව්‍යාපෘති යෝජනා ලබා ගැනීම හා අයවැය යෝජනා ලේඛනයට ඇතුළත් කළ යුතු ව්‍යාපෘති යෝජනා ලේඛනය සකස් කර මුදල් අමාත්‍යාංශය වෙත ලබා දීම.

- අයවැය යෝජනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු කිරීම.

- අයවැය යෝජනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලනු ලබන ආකෘති පත්‍රවලට අනුකූලව ප්‍රගති වාර්තා සකස් කර ලබා දීම.

- විදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව හා විශ්වවිද්‍යාලයන්හි අයවැය යෝජනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම, රැස්වීම් වාර්තා පිළියෙල කිරීම, රැස්වීමේ දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක වන්නේ දැයි පරීක්ෂා කිරීම හා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ යුතු තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

- දේශීය ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව හා අයවැය යෝජනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් හා වෙනත් විශේෂිත රැස්වීම් පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම, රැස්වීම් වාර්තා පිළියෙල කිරීම, රැස්වීමේ දී ගනු ලබන තීරණ ක්‍රියාත්මක වන්නේ දැයි පරීක්ෂා කිරීම හා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ යුතු තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

- දේශීය ඉදිකිරීම් ව්‍යාපෘති, අයවැය යෝජනා ව්‍යාපෘති හා විදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටලු නිරාකරණය සඳහා මෙන්ම එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍රයට ගොස් පරීක්ෂා කිරීම.

- රජයේ විගණන අංශය හා අභ්‍යන්තර විගණන අංශය විසින් දේශීය ඉදිකිරීම් ව්‍යාපෘති, අයවැය යෝජනා ව්‍යාපෘති හා විදේශීය ව්‍යාපෘතිවලට අදාළව කරනු ලබන විගණන විමසීම් වලට පිළිතුරු සැපයීම.

- දිස්ත්‍රික් ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම.

- අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව භාෂාත්‍රෙයන්ම පිළියෙල කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

- අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රගති වාර්තාව භාෂාත්‍රෙයන්ම පිළියෙල කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල හා අනෙකුත් ආයතනවල වාර්ෂික වාර්තා සඳහා නිරීක්ෂණ ලබා දීම.

- රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුසාරයෙන් උසස් අධ්‍යාපන අංශයට ගැලපෙන ලෙස අමාත්‍යාංශයේ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම, කාර්ය සාධන දර්ශක මත පදනම්ව දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.

- අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, අධීක්ෂණය හා ඊට අදාළ කාර්තුමය ප්‍රගතිය වාර්තා කිරීම.

- අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවල ක්‍රියාකාරී හා සංයුක්ත සැලසුම් සකස් කිරීම අධීක්ෂණය, නියාමනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය වැඩමුළු සංවිධානය කිරීම.

- වෙනත් රේඛීය අමාත්‍යාංශවල සහ දෙපාර්තමේන්තුවල ජාතික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ දී අමාත්‍යාංශය නියෝජනය කරමින් දායකත්වය ලබාදීම.

- වාර්ෂිකව සහ අර්ධ වාර්ෂිකව හෝ කලානුරූපීව ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය හා යුනෙස්කෝ ආයතනය මගින් ප්‍රකාශ කරනු ලබන වාර්තාවන් සඳහා දත්ත ලබාදීම.

- මෙරට දී හා විදේශයන්හි දී රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා සඳහා සහභාගී වන දූත මණ්ඩල සාමාජිකයන් සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ තොරතුරු සැපයීම.

- තිරසර සංවර්ධන අරමුණු සඳහා වන සැලැස්ම සකස් කිරීමට දායකත්වය ලබා දීම.

- විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි කටයුතු සම්බන්ධයෙන් වන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සකස් කර ඉදිරිපත් කිරීම හා අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම.

- ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය මඟින් පවරනු ලබන කටයුතු සිදු කිරීම සහ සංවිධාන කටයුතු සිදු කිරීම.

- විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතනයන්හි කළමනාකරණ මණ්ඩලයන් සඳහා අමාත්‍යාංශ ලේකම් නියෝජනය කරමින් සාමාජිකත්වය දැරීම.

- රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයන්හි සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය.

1.5.7. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය

උසස් අධ්‍යාපනය සඳහා වැඩිවන ඉල්ලුමට අනුකූලව, සුදුසුකම්ලත් සියලුම අපේක්ෂකයින්ට අධ්‍යාපන අවස්ථා ලබාදීම සඳහා රාජ්‍ය අංශයේ විශ්වවිද්‍යාලවල සීමිත ධාරිතාව ප්‍රමාණවත් නොවේ. එබැවින්, විකල්පයක් ලෙස රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය හරහා අවස්ථා ලබාදීමේ සාපේක්ෂ වැදගත්කම සලකා රාජ්‍ය නොවන අංශයේ සංවර්ධනය සහ නියාමනය ඍජුවම උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයට පවරන ලද අතර ඒ අනුව රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය 2013 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී.

තවද, උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා විසින් මේ කාර්යය සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අංක 25 අ වගන්තිය ප්‍රකාරව උසස් අධ්‍යාපන ආයතන උපාධි ප්‍රදානය කිරීමේ ආයතන ලෙස පිළිගැනීමේ කාර්යය සඳහා උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා නිශ්චිත බලධාරියා ලෙස පත් කර ඇත. මෙම ක්‍රියාවලියට අදාළ කටයුතු ද මෙම අංශය මගින් ක්‍රියාත්මක කෙරේ.

01. ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව (SCAQA)

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ ප්‍රතිපාදන හා නියෝග යටතේ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යාංශයේ ලේකම් නිශ්චිත බලධරයා වශයෙන් පත්කර ඇත. ඒ අනුව නිශ්චිත බලධරයා විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතන පිළිගැනීමේ ක්‍රියාවලියේදී ඔහුට සහාය වීම සඳහා ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව පත් කර ඇත. 2022-01-01 දින සිට 2022-12-31 දින දක්වා කමිටුව විසින් රැස්වීම් වාර 09 ක් පවත්වා ඇති අතර එම රැස්වීම් වාරයන්හි ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීම මෙම අංශය විසින් සිදු කර ඇත.

1.5.8. පොළී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය

පසුබිම

උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ඉහළ නැංවීමේ අරමුණින් 2017 වර්ෂයේ අයවැය යෝජනාවකට අනුව පොළී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය (IFSLS) 2017 වර්ෂයේ දී දියත් කරන ලදී. තරුණ තරුණියන්ට උසස් අධ්‍යාපනයේ යෙදීමට වැඩි අවස්ථා සලසන අතරම රටේ ආර්ථික හා මානව සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන ඉහළ මට්ටමේ මානව ප්‍රාග්ධන සංචිතයක් බිහි කිරීමට මෙම වැඩසටහන මඟින් පහසුකම් සැලසේ.

මෙම සන්දර්භය තුළ, රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වූ සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක (NSHEI) උපාධිය හැදෑරීමට පාඨමාලා ගාස්තු දැරිය නොහැකි සිසුන්ට උපරිම සීමාව රු. 800,000ක් දක්වා පොළී රහිත ණය පහසුකම් ලබා ගත හැකිය. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගෙන ඇති රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන දාහතක (17) උපාධි පාඨමාලා එකසිය අටක් (108) සිසුන්ට මෙම ණය යෝජනා ක්‍රමයේ පහසුකම් යටතේ හැදෑරිය හැකිය.

1.6. උසස් අධ්‍යාපන මූල්‍ය ප්‍රගතිය - 2022

2022 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ලබාදුන් ප්‍රතිපාදන හා උපයෝජනය පහත පරිදි වේ.

විශ්වවිද්‍යාල හා ආයතන	පුනරාවර්තන			ප්‍රාග්ධන			මුළු එකතුව		
	2022 (රු.මී.)			2022 (රු.මී.)			2022 (රු.මී)		
	වෙන් කිරීම	වියදම්	%	වෙන් කිරීම	වියදම්	%	වෙන් කිරීම	වියදම්	%
උසස් අධ්‍යාපන අංශය	185.6	179.0	96.5%	4.0	2.0	48.8%	190	181	95.5%
උසස් තාක්ෂණ ආයතනය	933.5	923.0	98.9%	87.5	36.5	41.7%	1,021	960	94.0%
බෞද්ධ පාලි විශ්වවිද්‍යාලය	510.0	461.9	90.6%	50.0	0.0	0.0%	560	462	82.5%
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය	410.0	395.2	96.4%	62.5	23.1	37.0%	473	418	88.5%
විදේශ ව්‍යාපෘති	0.0	0.0	0.0%	14,686.0	13,441.6	91.5%	14,686	13,442	91.5%
අයවැය යෝජනා	417.9	417.1	99.8%	1,749.3	1,743.9	99.7%	2,167	2,161	99.7%
අමාත්‍යාංශයේ මුළු එකතුව	**2,457.0**	**2,376.2**	**96.7%**	**16,639.3**	**15,247.2**	**91.6%**	**19,096**	**17,623**	**92.3%**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව									
මුළු එකතුව	**2,457.0**	**2,376.2**	**96.7%**	**16,639.3**	**15,247.2**	**91.6%**	**19,096**	**17,623**	**92.3%**

1.5 වගුව

1.7 විදේශීය ණය හා ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

2022 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ උසස් අධ්‍යාපන සඳහා වෙන් වූ මුළු ප්‍රාග්ධන වියදමින් රුපියල් මිලියන 14,686ක් විදේශීය ණය හා ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා වෙන් වී ඇත. මේ යටතට ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 63,072ක ව්‍යාපෘති 10ක් ඇතුළත් වේ. ව්‍යාපෘති ලේඛනය ඇමුණුම 01 යටතේ දක්වා ඇති අතර ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 1,000ට වැඩි ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහතින් දක්වා ඇත.

1.7.1 නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය - නැගෙනහිර විශ්වවිද්‍යාලය

මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 5,480ක් වන අතර ඉදිකිරීම් කටයුතු සඳහා පමණක් රුපියල් මිලියන 2,507 ක් වෙන් කර ඇත. 2016 වර්ෂයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක වේ. 2022 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියට රුපියල් මිලියන 892.8ක් ලබාදී ඇත.මෙම ව්‍යාපෘතිය අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදලින් ලැබෙන ණය මුදලක් යටතේ ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතිය නිම කළ පසු වෛද්‍ය උපාධිය සඳහා 100ක් ද, හෙද උපාධිය සඳහා 70ක් ද, ඖෂධවේදී උපාධිය සඳහා 20ක් ද, මහජන සෞඛ්‍ය පිළිබඳ උපාධිය සඳහා 20ක් ද වශයෙන් වාර්ෂිකව මෙම පීඨයට විද්‍යාර්ථයින් ඇතුළත් කර ගැනීමට හැකි වනු ඇත. මෙම පීඨය යටතේ පහත සඳහන් අධ්‍යයන දෙපාර්තමේන්තු 03 පිහිටු වීමට සැලසුම් කර ඇත.

I. ප්‍රාථමික සෞඛ්‍ය සේවා අධ්‍යයන අංශය සහ වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය
II. ශායනික විද්‍යා අධ්‍යයන අංශය සහ අතිරේක වෛද්‍ය අධ්‍යයන අංශය
III. මානව ජීව විද්‍යා අධ්‍යයන අංශය සහ ව්‍යාධි විද්‍යා අධ්‍යයන අංශය

2022 වර්ෂය අවසන් වන විට ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර ගොඩනැගිලිවල රූප සටහන් කිහිපයක් පහත දක්වා ඇත.



පුස්තකාලය සහ ස්වයං ඉගෙනුම් පහසුකම්



සායනික විද්‍යා දෙපාර්තමේන්තුව සහ
අතිරේක සෞඛ්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව

1.7.2 විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර ලබන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන (STHRD) ව්‍යාපෘතිය වෙළඳපළට අදාළ කුසලතා සහ ව්‍යවසායකත්ව ජවයෙන් සන්නද්ධ තාක්ෂණ-දිශානුගත උපාධිධාරීන් බිහි කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලය, රජරට විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා හා තාක්ෂණ පීඨ සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට සහාය දක්වයි. මෙම ව්‍යාපෘතිය මගින් නව්‍ය තාක්ෂණය සහ කර්මාන්තයට අදාළ අධ්‍යාපනය සහ පර්යේෂණ පහසුකම් සැපයීම, ගුණාත්මක විෂයමාලා සැලසුම් කිරීම සහ කර්මාන්ත ඉල්ලුම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා උපකාර කිරීම සහ තරඟකාරී කර්මාන්ත සහ විදේශීය විශ්වවිද්‍යාල සහයෝගිතා යෝජනා ක්‍රමය සහ ධාරිතා සංවර්ධන අවස්ථා ලබා දෙනු ඇත. යෝජිත නව උසස් අධ්‍යාපන ව්‍යාපෘතියක් සකස් කිරීමේදී රජයට සහාය වීම සඳහා වන සංරචකයක් ද ව්‍යාපෘතිය තුළ අන්තර්ගතය.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 26,400 කි. (ඇමරිකානු ඩොලර් මිලියන 165) එයින් රු. මිලියන 23,200ක්, ආසියානු සංවර්ධන බැංකුවේ ණය යටතේ සහ ඉතිරි මුදල දේශීය අරමුදල් යටතේ මූල්‍යයනය කිරීමට සැලසුම් කර ඇත. 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 7,313ක ප්‍රතිපාදන ලබා දුන් අතර සමස්ථ භෞතික ප්‍රගතිය 68%කි. 2018 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක වේ. මෙම නව පීඨ ඉදිකිරීමෙන් පසු 2023 වර්ෂයේ සිට එක් අධ්‍යයන වර්ෂයක් සඳහා ශිෂ්‍යයින් 1,500 ක් ඇතුළත් කරගැනීමට හැකිවනු ඇත. ව්‍යාපෘතියේ මුළු ප්‍රතිපාදනයෙන් වැඩි ප්‍රතිශතයක් වෙන්වන්නේ පීඨයන් ඉදිකිරීමට හා උපකරණ ලබාදීම සඳහාය. මේ යටතේ විශ්වවිද්‍යාල සතර සඳහා හරිත ගොඩනැගිලි ප්‍රමිතීන් අනුව හා කාන්තා හිතකාමී පහසුකම් වලින් සමන්විත පීඨයන් ඉදිකිරීමට සැලසුම් කර ඇත. එසේම මෙම සෑම පීඨයක් සඳහා අවශ්‍ය රසායනාගර පහසුකම්, උපකරණ මෙම ව්‍යාපෘතිය යටතේ සපයනු ලැබේ. ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය පහතින් දක්වා ඇත.

1.6 වගුව විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පීඨ ඉදිකිරීම්

රු.මි.

පීඨ ගොඩනැගිල්ල	ඇස්තමේන්තුගත පිරිවැය	ක්‍රොන්ත්‍රාත් ප්‍රදානය	සමුච්චිත වියදම*	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
තාක්ෂණ පීඨය, කැලණිය වි.	4,079.6	4,363.6	3,529.71	81	84
තාක්ෂණ පීඨය, සබරගමුව වි.	1,941.5	2,278.14	1,686.75	74	88
ඉංජිනේරු පීඨය, ශ්‍රී ජයවර්ධනපුර වි.	4,189.2	3,624.9	1,156.22	32	26
තාක්ෂණ පීඨය, රජරට වි.	2,933.7	3,000.0	847.99	28	25
එකතුව	**13,144**	**13,266.64**	**7,220.67**	**54**	

*** මිල වැඩි කිරීමේ වියදම් (price escalation payment) ඇතුළත් නොවේ.**

2022 වර්ෂයේ 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ඉහත විශ්වවිද්‍යාලයන්හි පීඨයන් සතර සඳහා ඇතුළත් කර ගත් මුළු සිසුන් සංඛ්‍යාව 1,008 කි. තවද මෙම ව්‍යාපෘතියට අයත් වන පීඨයන්හි සුදුසුකම් ලත් ආචාර්යවරුන් සඳහා පශ්චාත් උපාධි හා ආචාර්ය උපාධි හැදෑරීම සඳහාද ප්‍රතිපාදන ලබා දී ඇත. එම ප්‍රගතිය පහතින් දක්වා ඇත.

1.7 වගුව, **විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය පශ්චාත් උපාධි හා ආචාර්ය උපාධි අවස්ථා**

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය	ප්‍රදානය කළ පශ්චාත් උපාධි හා ආචාර්ය උපාධි	ප්‍රතිපාදන (ඇ.ඩො.)	**2022.12.31** දිනට ලබාදුන් ප්‍රතිපාදන (ඇ.ඩො)
කැලණිය	6	411,000.00	120,916.44
සබරගමුව	5	305,500.00	142,074.08
රජරට	11	1,000,000.00	358,135.94
එකතුව	22	1,716,500.00	621,126.46

මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගත් පර්යේෂණ ව්‍යාපෘති යෝජනා 22ක් සඳහා අරමුදල් ලබා දී ඇති අතර ඒවා දැන් විශ්වවිද්‍යාල මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතී.



විද්‍යාගාර ගොඩනැගිල්ල - තාක්ෂණ පීඨය, කැලණිය වි.වි.



පර්යේෂණ ගොඩනැගිල්ල - සබරගමුව වි.වි.

1.7.3 උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD)

ලෝක බැංකු ණය යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 14,500 ක් වන අතර 2022 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් වූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 4,593ක් මෙම ව්‍යාපෘතියේ සංරචක හා ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ඉදිකිරීම් ව්‍යාපෘතින්හි ප්‍රගතිය පහතින් දක්වා ඇත.

***1.8** වගුව* ව්‍යාපෘති සංරචක — **රු.මී.**

ප්‍රතිඵල ක්ෂේත්‍රය	ඇස්තමේන්තුගත වියදම
1. ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රමුඛතා විෂය ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපනය සඳහා බඳවා ගැනීම් වැඩි කිරීම	**4,350.0**
- *උසස් අධ්‍යාපන ආයතනවල විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, ගණිත (STEM) උපාධි පාඨමාලා සඳහා බඳවා ගැනීම් වැඩි කිරීම*	*(3,190.0)*
- *උසස් අධ්‍යාපන අංශයේ සංවර්ධන උපාය මාර්ගය (HEDS) ක්‍රියාත්මක කර නිතිපතා යාවත්කාලීන කර ඇත*	*(1,160.0)*

2. උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම	**6,815.0**
- . *ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම් වැඩිදියුණු කිරීම (ELTA) සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩිදියුණු කිරීම (ELSE) සඳහා පීඨ මට්ටමේ පද්ධති තරඟකාරී ප්‍රදාන මගින් සංවර්ධනය කර ඇති අතර කලා, කළමනාකරණ සහ විද්‍යා උපාධි වැඩසටහන් සඳහා ලබා ගන්නා ප්‍රතිඵල.*	*(3,480.0)*
- *ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම් වැඩිදියුණු කිරීම (ELTA) සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩිදියුණු කිරීම (ELSE) සඳහා අධ්‍යයන අංශ මට්ටමේ පද්ධති තරඟකාරී ප්‍රදාන මගින් සංවර්ධනය කර ඇති අතර කලා, කළමනාකරණ සහ විද්‍යා උපාධි වැඩසටහන් සඳහා ලබා ගන්නා ප්‍රතිඵල.*	*(1,595.0)* *(1,740.0)*
- *විශ්වවිද්‍යාල, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සහ උසස් තාක්ෂණ ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද ආචාර්ය උපාධිය සහ පශ්චාත් උපාධි සහ වෘත්තීය ආචාර්ය උපාධි.*	
3. පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම	**2,320.0**
- *පර්යේෂණ හා සංවර්ධන, නවෝත්පාදන සහ වාණිජ්‍යකරණ (RDIC) වැඩසටහන් සඳහා විශ්වවිද්‍යාල මට්ටමේ පද්ධතසංවර්ධනය කර ප්‍රතිඵල ලබා ඇත*	
වෙනත් වියදම්	**1,015.0**
එකතුව	**14,500.0**

1.9 වගුව **උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ඉදිකිරීම් ව්‍යාපෘති**

(රු.මි.)

විශ්වවිද්‍යාලය	ව්‍යාපෘතියේ නම	මුළු ඇ.පි.	ක්‍රොන්ත්‍රාත් මුදල	සමුච්චිත වියදම	භෞතික ප්‍රගතිය %
යාපනය	ඉංජිනේරු තාක්ෂණය සහ ජෛව පද්ධති තාක්ෂණය ගොඩනැගිලිල්ල II අදියර	645.0	491.7	132.5	24
රුහුණ	තාක්ෂණ පීඨය සඳහා තෙමහල් දේශන ශාලා ගොඩනැගිල්ල	412.2	337.9	368.1	100
වයඹ	නැනෝ විද්‍යා තාක්ෂණ ගොඩනැගිල්ල, තාක්ෂණ පීඨය	520.8	508.0	176.0	69
පේරාදෙණිය	නිෂ්පාදන සහ කාර්මික ඉංජිනේරු ගොඩනැගිල්ල දිගුව , ඉංජිනේරු පීඨය	188.0	138.0	73.6	60
ශ්‍රී ජයවර්ධනපුර	ව්‍යුහ විද්‍යා ගොඩනැගිල්ල, වෛද්‍ය පීඨය	156.0	140.0	29.0	58
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය -	ATI මධ්‍යස්ථානය. මන්නාරම	529.0	445.0	30.0	73
	ATI මධ්‍යස්ථානය. නාවලපිටිය	529.0	367.0	25.0	61
එකතුව		**3,220.0**	**2,183.4**	**731.3**	

උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි රූප සටහන්



තාක්ෂණ පීඨය සඳහා තෙමහල් දේශන ශාලා ගොඩනැගිල්ල, රුහුණ වි. ඇ.පි. රු.මි. 412



ATI මධ්‍යස්ථානය, මන්නාරම ඇ.පි. රු.මි. 529

1.7.4 වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය

සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල (SFD) සෞදි රියාල් 105ක සහන ණයක් යටතේ ක්‍රියාත්මක වන වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම ඇමරිකානු ඩොලර් මිලියන 28 ක් වේ (රු.මි.4,088). "වයඹ විශ්ව විද්‍යාල නගර සංවර්ධන වැඩසටහන" අවට විශ්වවිද්‍යාල ප්‍රජාව සමඟ සමීප අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම මෙන්ම ග්‍රාමීය ප්‍රදේශ ශක්තිමත් කිරීම තුළින් සැලකිය යුතු සංවර්ධන බලපෑමක් ඇතිකිරීමේ අරමුණින් යුත් නවතම සංකල්පයකි. මෙම ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පහසුකම් සහ යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම විශ්වවිද්‍යාල ආසන්න ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය නංවාලීම සඳහා සැලසුම් කර ඇත. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණවන්නේ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය සඳහා දැනුම පදනම් කරගත් ස්වයං විශ්වාස සහ තිරසාර ප්‍රජා අන්තර් ක්‍රියාකාරී පද්ධතියක් ස්ථාපිත කිරීමයි. මෙම විශ්ව විද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය පරිශ්‍රය සහ මාකඳුර පරිශ්‍රය ආවරණය කරයි. 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 1,658.5ක ප්‍රතිපාදන ලබා දුන් අතර සමස්ථ භෞතික ප්‍රගතිය 50%කි.

1.8. අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 6,118.7 වටිනාකමකින් යුත් අයවැය යෝජනා ව්‍යාපෘති 05 ක් සඳහා 2022 වර්ෂයේ රුපියල් මිලියන 1,200ක ප්‍රතිපාදන ලබාදී ඇත. ව්‍යාපෘති ලේඛනය ඇමුණුම 02 යටතේ දක්වා ඇත.

1.8.1 රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොලහක ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය

2017 වසරේ අයවැය යෝජනාවක් මත ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 1,179 කි. වර්ග මීටර් 8,199ක වපසරියකින් යුක්ත වූ ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 200ක් වෙන් කර ඇති අතර එම සම්පූර්ණ මුදලම 2022.12.31 වන විට වියදම් කර ඇති අතර 2022.12.31 දින වන විට දරා ඇති සමුච්චිත වියදම රුපියල් මිලියන 835.34කි. පළමු කොන්ත්‍රාත්කරුට වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම ලෙස 2018.01.17 දින රුපියල් මිලියන 187ක මුදලක් ලබා දී තිබූ අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අඩු ප්‍රගතිය නිසා 2019.12.23 දින පලමු කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර 2020.07.09 වන දින ව්‍යාපෘතිය නව කොන්ත්‍රත් සමාගමකට ප්‍රදානය කරන ලදී. 2022 වසරේ දෙසැම්බර් මස 31 දින වන විට 48.5%ක භෞතික ප්‍රගතියක් අත් කර ගෙන ඇත. ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු ඇතුලත් කර ගන්නා වෛද්‍ය සිසුන් සංඛ්‍යාව 160 සිට වසරකට සිසුන් 10 බැගින් වසර 4ක් තුලදී සිසුන් 40කින් වැඩි කර වාර්ෂිකව ඇතුලත් කර ගන්නා සිසුන් ගණන 200ක් කිරීමට යෝජිතය.

1.8.2 රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහාචාර්ය ඒකකයක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය

2018 අයවැය යෝජනාවක් අනුව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 1,300 ක් වන අතර ව්‍යාපෘතියේ ඉදිකෙරෙන ගොඩනැගිලි වල වපසරිය වර්ග අඩි 110,655.64 කි. මෙම ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත්තුව 2019.06.24දින ප්‍රදානය කර ඇත. මෙම ව්‍යාපෘතිය අවසන් වන විට වෛද්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ලබා ගැනීමේ පහසුකම් වැඩි දියුණු කිරීම, අධ්‍යන කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ යටිතල පහසුකම්, විද්‍යාගාර සහ භෞතික සම්පත් වර්ධනය කිරීම ආදී අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂිතය. අත්තිකාරම් මුදල් ලෙස 2020 වසරේ දී රුපියල් මිලියන 131.7 නිදහස් කර ඇති අතර 2022 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 155ක් වෙන් කර ඇති අතර එම මුදලින් 2022.12.31 වන විට රුපියල් මිලියන 237.56ක මුදලක් වියදම් කර ඇති අතර 2022.12.31 දින වන විට දරා ඇති සමුච්චිත වියදම රුපියල් මිලියන 714.13කි. 2022.12.31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 55%ක මට්ටමක පවතී.

1.8.3 රුහුණ විශ්විද්‍යාලයේ නාවුක අධ්‍යයන මධ්‍යස්ථානය ඉදි කිරීමේ ව්‍යාපෘතිය

2018 අයවැය යෝජනාවක් අනුව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය අගය රු.මිලියන 943ක් වන මෙම ව්‍යාපෘතියේ ඉදිකෙරෙන ගොඩනැගිලි වල වපසරිය වර්ග මීටර් 4,449 කි. මෙම කොන්ත්‍රාත්තුව 2019.05.28 දින ප්‍රධානය කර ඇත .මෙහි ඉදිකිරීම් කටයුතු ස්ථාන දෙකක සිදුවන අතර හපුගල සිදුවන ඉදිකිරීම් කටයුතු 2019.08.01 වන දින ද මාගාල්ලේ සිදුවන ඉදිකිරීම් කටයුතු 2019.12.01 වන දින ද ආරම්භ කර ඇත. අත්තිකාරම් මුදල් ලෙස 2020 වසරේ දී රුපියල් මිලියන 223.83 නිදහස් කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සඳහා නාවුක ඉංජිනේරු සහ නාවුක ගෘහ නිර්මාණ ශිල්පය යන පාඨමාලා සඳහා පහසුකම් සැපයීම, යාත්‍රා ඉදිකිරීමේ

කටයුතු සඳහා පර්යේෂණ සහ සංවර්ධන පහසුකම් සැපයීම, එම අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයන්ට අවශ්‍ය යටිතල පහසුකම් සැපයිම ආදී අරමුණු ඉටු කර ගැනිමට අපේක්ෂා කරන අතර විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම සිසුන්100 දෙනෙකුගෙන් පමණ ඉහල යනු ඇතැයි ද අපේක්ෂා කරයි. 2022 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 65ක් වෙන් කර ඇති අතර එම මුදලින් 2022.12.31 වන විට රුපියල් මිලියන 85.9ක් මුදලක් වියදම් කර ඇති අතර 2022.12.31 දින වන විට දරා ඇති සමුච්චිත වියදම රුපියල් මිලියන 435.2කි. 2022.12.31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 93%ක මට්ටමක පවතී.

1.8.4 රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය ඉදි කිරීමේ ව්‍යාපෘතිය

2019 අයවැය යෝජනාවක් අනුව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය අගය රුපියල් මිලියන 3,000 ක් වන මෙම ව්‍යාපෘතියේ ඉදි කෙරෙන ගොඩනැගිලි වල වපසරිය වර්ග අඩි 117,929.60 කි. මෙම ව්‍යාපෘතිය සඳහා 2020.11.24 දිනැතිව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. අත්තිකාරම් මුදල් ලෙස 2020 වසරේ දි රුපියල් මිලියන 134.69ක් නිදහස් කර ඇත. 2022 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 350ක් වෙන් කර ඇති අතර එම මුදලින් 2022.12.31 වන විට රුපියල් මිලියන 415.9ක මුදලක් වියදම් කර ඇති අතර 2022.12.31 දින වන විට දරා ඇති සමුච්චිත වියදම රුපියල් මිලියන 1101.7කි. 2021.12.31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 58%ක මට්ටමක පවතී.



රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් දොලහක ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය



රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය ඉදි කිරීමේ ව්‍යාපෘතිය

1.8.5 සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදි කිරීමේ ව්‍යාපෘතිය අදියර

2018 අයවැය යෝජනාවක් අනුව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය අදියර 03ක් යටතේ ක්‍රියාත්මක වේ. මෙම වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීමෙන් පසුව වසරකට වෛද්‍ය පීඨය සඳහා ඇතුලත් වන ශිෂ්‍ය සංඛ්‍යාව 75 – 100ත් අතර වේ. වෛද්‍ය පීඨයේ සියළුම ඉදි කිරීම් අවසන් වූ පසුව රත්නපුර ශික්ෂණ රෝහලේ යටිතල පහසුකම්, වෛද්‍ය සේවා සැපයීම්, සායනික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ සමාජ සුභ සාධනය ඇතුළු සියළුම අංශවල ප්‍රගතියක් අපේක්ෂා කෙරේ.

පළමු අදියර - මෙම අදියර දේශීය අරමුදල් යටතේ මූල්‍යනය කරන අතර මුළු පිරිවැය අගය රුපියල් මිලියන 3,070කි. මේ වන විට ඉදි කිරීම් සිදු කරන මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2022 වර්ෂය දී රුපියල් මිලියන 250ක් වෙන් කර ඇති අතර එම මුදලින් 2022.12.31 වන විට රුපියල් මිලියන 350ක මුදලක් වියදම් කර ඇති අතර 2022.12.31 දින වන විට දරා ඇති සමුච්චිත වියදම රුපියල් මිලියන 1,233.6කි. 2022.12.31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 85%ක මට්ටමක පවතී.

දෙවන අදියර - සවුදි සංවර්ධන අරමුදල මඟින් මූල්‍යනය කරන මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. මිලියන 9,096 කි. මෙම ව්‍යාපෘතියේ ඉදිකෙරෙන ගොඩනැගිලි වල වපසරිය වර්ග මීටර් 38, 000 කි. ණය ගිවිසුම බලපැවැත්වෙන දිනය

2019.12.19 වන අතර එතැන් පටන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියේ උපදේශන සේවා ආයතනය මඟින් අවශ්‍ය ඉදිකිරීම් සැලසුම් කරමින් පවතී. 2022 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 400ක් වෙන් කර ඇති අතර එම මුදලින් 2022.12.31 වන විට රුපියල් මිලියන 444.49ක මුදලක් වියදම් කර ඇත. 2022.12.31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 34.62%ක මට්ටමක පවතී.

තෙවන අදියර - දෙවන අදියර ක්‍රියාත්මක වී අවසන් වීමෙන් පසු ඉතිරිවීම් තිබුනහොත් තෙවන අදියර පිලිබඳව සලකා බැලීමට නියමිතය.

1.9 කොළඹ විශ්වවිද්‍යාලයේ පූර්ව සායනික ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය (දේශීය ණය)

2000 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර එහි සම්පූර්ණ පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 290 කි. අනතුරුව 2005 මැයි 04 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් වෛද්‍ය පීඨයේ මිල ඉහළ යාම සහ අමතර අවශ්‍යතා සලකා බැලීමෙන් පසු පිරිවැය සංශෝධනයක් සඳහා අනුමැතිය ලබා දුන් අතර අරමුදල් පවතින ප්‍රමාණයට අනුව සම්පූර්ණ ව්‍යාපෘතිය අදියරෙන් අදියර අවසන් කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව,

1. මාස 71 කින් වර්ග මීටර් 37,801 ක මුළු භූමි ප්‍රමාණයකින් සමන්විත ගොඩනැගිල්ල ඉදිකිරීම සහ නිම කිරීම සඳහා රුපියල් මිලියන 1,139 ක ඇස්තමේන්තුව රුපියල් මිලියන 5,688 දක්වා සංශෝධනය කිරීම.

2. ව්‍යාපෘතියේ මුළු පිරිවැයෙන් 4% ක උපදේශන ගෙවීමක් යටතේ එම උපදේශකයා වන "රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව" ඊළඟ අදියරේ වැඩ සඳහා පත් කිරීම.

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2017.06.05 දින ආරම්භ කරන ලදී. 2018-09-11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහල් 17 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 5,000ක ණයක් ලබා ගැනීමට නිර්දේශ වූ අතර ඒ අනුව ලංකා බැංකුව විසින් පහසුකම් සපයන ලදී.

උසස් අධ්‍යාපන අංශයේ දේශීය ණය යටතේ ක්‍රියාත්මක වන විශාලතම ව්‍යාපෘතිය මෙය වේ. මේවන විට මෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර අඩුපාඩු සැකසීමේ කටයුතු තවදුරටත් සිදුවෙමින් පවතී. 2022.06.08 ව්‍යාපෘතිය භාර ගන්නා ලද දිනය ලෙස උපදේශන සමාගම අදාල සහතිකය (Taking over Certificate) නිකුත් කර ඇත. කොන්ත්‍රාත්කරු විසින් අවසාන බිල් පත්‍රය ද උපදේශන සමාගම වෙත භාරදී ඇත. මේ දක්වා කොන්ත්‍රාත්කරුට රු.5,346,658,175.00 (වැට් සමඟ) ක් ද උපදේශන සමාගමට රු.198,124,312.91 ක් ද ව්‍යාපෘතිය වෙනුවෙන් සිදුකල අනෙකුත් ගෙවීම් වශයෙන් රු.100,984,769.33 ක් ද වශයෙන් රුපියල් 5,645,767,257.24ක මුදලක් ගෙවා ඇත.



පූර්ව සායනික ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය, කොළඹ විශ්වවිද්‍යාලය

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2. 1. ආංශික ප්‍රගතිය

2.1.1. පාලන අංශය

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 876 චක්‍රලේඛයට අදාළව විශ්වවිද්‍යාල සහ ආයතනවල තනතුරු පුරප්පාඩු පිරවීම

2022 වර්ෂය තුළදී විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 876 ප්‍රකාරව තනතුරු පුරප්පාඩු පිරවීමක් සිදු කර නොමැත.

2. පුහුණු වැඩසටහන්

මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් 2022 වර්ෂය තුළදී දේශීය පුහුණු සඳහා යොමු කර ඇති අතර එහි තොරතුරු පහත පරිදි වේ.

දේශීය පුහුණු වැඩසටහන්

පුහුණු වැඩසටහන	පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව	අමාත්‍යාංශයෙන් දරන ලද වියදම (රු)
දේශීය පුහුණු වැඩසටහන්	08	245	188,020.00

2.1 වගුව

විදේශීය පුහුණු වැඩසටහන්

පුහුණු වැඩසටහන	*පුහුණු වැඩසටහන් සංඛ්‍යාව*	*සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව*	*අමාත්‍යාංශයෙන් දරණ ලද වියදම (රු)*
විදේශීය පුහුණු වැඩසටහන්	*03*	*03*	-

2.2 වගුව

3. සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2018.02.15 දින නිකුත් කරන ලද වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක.01/2018 හා 2018.06.08 දින නිකුත් කරන ලද 01/2018 (I) චක්‍රලේඛ අනුව මෙම අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේදී සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කරන ලදී.ඒ අනුව උසස් අධ්‍යාපන අංශයේ, උසස් අධ්‍යාපන අංශය යටතේ පවතින විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල හා අනෙකුත් උපාධි ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩලවල, අනධ්‍යයන කාර්ය මණ්ඩලවල ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් විධායක තනතුරක සේවය කරන සහනදායී මෝටර් රථ බලපත්‍ර ලබාගැනීම සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් සඳහා ඉහත සඳහන් චක්‍රලේඛ යටතේ 2022 වර්ෂයේදී නිකුත් කරන ලද සහනදායී මෝටර් රථ බලපත්‍ර පිළිබඳ විස්තර පහත වගුවේ සඳහන් වේ. (0001 - 1000 දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය ද 1001 සිට ඉහළට උසස් අධ්‍යාපන අංශය ද බලපත්‍ර අංකනය සිදු කරන ලදී.)

අනු අංකය	විශ්වවිද්‍යාලය/ආයතනය	අධ්‍යාපන අමාත්‍යාංශය (උසස් අධ්‍යාපන අංශය	මුළු ගණන
01	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	03	03
02	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	19	19
03	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	14	14
04	කැළණිය විශ්වවිද්‍යාලය	14	14
05	රුහුණ විශ්වවිද්‍යාලය	07	07
06	කොළඹ විශ්වවිද්‍යාලය	15	15
07	යාපනය විශ්වවිද්‍යාලය	04	04
08	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	13	13
09	මොරටුව විශ්වවිද්‍යාලය	10	10
10	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	05	05
11	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	12	12
12	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	02	02
13	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	14	14
14	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	23	23
15	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	17	17
16	සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය	07	07
17	ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාය	05	05
18	ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	15	15
19	දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය	02	02
20	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	01	01
21	ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය	03	03
22	ශ්‍රීපාලි මණ්ඩපය- කොළඹ විශ්වවිද්‍යාලය	01	01
23	පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි ආයතනය	01	01
	මුළු ගණන	**207**	**207**

2.3 වගුව

4. රාජකාරි විදේශ ගමන් බලපත්‍ර/ රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර

උසස් අධ්‍යාපන අංශයේ නිලධාරීන් ඇතුලු රාජකාරි විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද විශ්වවිද්‍යාල පද්ධතියේ නිලධාරීන් සඳහා 2022 වර්ෂය තුළ පහත පරිදි රාජකාරි විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇත.

උසස් අධ්‍යාපන අංශයේ නිලධාරීන් වෙත රාජකාරි විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇති ප්‍රමාණය	විශ්වවිද්‍යාල පද්ධතියේ නිලධාරීන් වෙත රාජකාරි විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇති ප්‍රමාණය	එකතුව
-	06	06

2.4 වගුව

එසේම රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද විශ්වවිද්‍යාල පද්ධතියේ නිලධාරීන් සඳහා 2022 වර්ෂය තුළ පහත පරිදි රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇත.

විශ්වවිද්‍යාල පද්ධතියේ නිලධාරීන් වෙත රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර නිකුත් කර ඇති ප්‍රමාණය	එකතුව
02	02

2.5 වගුව

5. 2022 වර්ෂය තුළ ශ්‍රී ලංකා පුරවැසියකු නොවන ආරාධිත ආචාර්ය වරුන්ගේ සේවාව ලබා ගැනීම

විශ්වවිද්‍යාලය හෝ ආයතනය	සංඛ්‍යාව
යාපනය විශ්වවිද්‍යාලය	02
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	04

2.6 වගුව

6. 2022 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල සංදේශ, පාර්ලිමේන්තු ප්‍රශ්න, මහජන පෙත්සම් කාරක සභා

විස්තරය	ප්‍රමාණය
අමාත්‍ය මණ්ඩල කාර්යාලයට යොමු කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව	48
2022.12.31 දක්වා තීරණ ලැබී නොමැති අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව	18
පිළිතුරු සපයා ඇති පාර්ලිමේන්තු ප්‍රශ්න සංඛ්‍යාව	10
පිළිතුරු සපයා ඇති ස්ථාවර නියෝග යටතේ අසනු ලබන ප්‍රශ්න	-
2022 වර්ෂය තුළ මහජන පෙත්සම් කාරක සභාවෙන් ලැබුණු ලිපි	04
2022 වර්ෂය තුළ වාර්තා යවන ලද මහජන පෙත්සම් කාරක සභා ලිපි	03

2.7 වගුව

7. තොරතුරු පනත අනුව ක්‍රියා කිරීම

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීම් සම්බන්ධව 2022 වර්ෂය තුළ ක්‍රියා කිරීම පහත සාරාංශ කර ඇත.

වර්ෂය තුළදී ලද මුළු ඉල්ලීම් සංඛ්‍යාව	සපයන ලද තොරතුරු ප්‍රමාණය	වෙනත් ආයතන වෙත යොමු කරන ලද තොරතුරු ප්‍රමාණය	2022 වර්ෂයේ අභියාචන සංඛ්‍යාව
12	**9**	**3**	**2**

2.8 වගුව

8. විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවලට අදාළ වාර්ෂික ගිණුම් හා පාලන වාර්තා

අධ්‍යාපන අමාත්‍යාංශයේ, උසස් අධ්‍යාපන අංශය යටතේ පවතින ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනද ඇතුළුව ආයතන 38ක 2022.12.31 දින වන විට වාර්ෂික වාර්තා හා ගිණුම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තාවට අදාල වර්ෂය	විස්තරය	ප්‍රමාණය
2019	පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති වාර්ෂික වාර්තා	02
2020	පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති වාර්ෂික වාර්තා	29
	පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියාමිත වාර්ෂික වාර්තා	05
	අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති වාර්ෂික වාර්තා	04
2021	පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත වාර්ෂික වාර්තා	02
	අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති වාර්ෂික වාර්තා	10
	අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිත වාර්ෂික වාර්තා	09
	අමාත්‍යාංශ නිලධාරීන්ගේ නිරීක්ෂණ අනුව සකස් කර භාෂාත්‍රයෙන් එවීමට ලිපි යවා ඇති වාර්ෂික වාර්තා	17

2.9 වගුව

9. ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා ඇතුළු සියළුම නඩත්තු වියදම්

කාර්යය	**2022** වසරේදී දරන ලද වියදම සහ පියවන ලද බිල්පත් සංඛ්‍යාව
ආරක්ෂක සේවා	4,741,692.67
සනීපාරක්ෂක සේවා	4,475,074.00
තැපෑල	464,981.00
යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්	1,436,355.18
ගොඩනැගිලි හා ඉදිකිරීම් නඩත්තු වියදම්	7,696,687.81
විදුලිය	5,492,623.29
ජලය	341,953.74
කාර්යාල දුරකථන හා ෆැක්ස්	1,638,420.40
අමාත්‍යාංශ අන්තර්ජාල සම්බන්ධතා	3,647,593.76

2.10 වගුව

10. ප්‍රවාහන පහසුකම් සැපයීම

2022 වර්ෂයේදී අමාත්‍යාංශයට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම

කාර්යය	**2022** වර්ෂයේ වියදම (රු.)
සංචිත වාහන සඳහා ඉන්ධන සැපයීම හා අතිරේක ඉන්ධන සැපයීම	4,011,770.37
වාහන සේවා කිරීම හා අළුත්වැඩියා කිරීම	4,083,878.94

නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනා ගෙවීම, අතිරේක ඉන්ධන ලබා දීම හා ඉන්ධන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම	11,025,604.00
වාහන රක්ෂණය කිරීම හා අදාළ බලපත්‍ර ලබා දීම සම්බන්ධ කටයුතු	580,014.37
දුම් පරීක්ෂණ	15,310.00
රියදුරන් සඳහා අතිකාල හා ගමන් වියදම්	2,406,653.49
වාහන සඳහා ටයර්, ටියුබ්, බැටරි හා අනෙකුත් උපාංග සපයා දීම	901,208.49
එකතුව	**23,024,439.66**

2.11 වගුව

11. ණය

2022 වර්ෂයේ අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ලබා දී ඇති ආපදා ණය හා අත්තිකාරම් පිළිබඳ විස්තර

ණය/අත්තිකාරම් වර්ගය	නිලධාරීන් සංඛ්‍යාව	ලබා දී ඇති මුදල (රු.)
ආපදා ණය	89	8,203,429.10
විශේෂ අත්තිකාරම්	18	72,000.00
උත්සව අත්තිකාරම්	61	61,000.00
එකතුව	168	8,336,429.10

2.12 වගුව

2.1.2. ගිණුම් අංශය

2022 වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ලබාදුන් ප්‍රතිපාදන හා උපයෝජනය පහත පරිදි වේ.

2.13 වගුව **උසස් අධ්‍යාපන මූල්‍ය ප්‍රගතිය - 2022**

රු. 000'

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	2,457,000	2,456,995	2,376,246	96.7%
ප්‍රාග්ධන	14,050,000	16,639,345	15,247,150	91.6%
එකතුව	**16,507,000**	**19,096,340**	**17,623,397**	**92.3%**

විශ්වවිද්‍යාල හා ආයතන	පුනරාවර්තන			ප්‍රාග්ධන			මුළු එකතුව		
	2022 (රු.මි.)			2022 (රු.මි.)			2022 (රු.මි)		
	වෙන් කිරීම	වියදම්	%	වෙන් කිරීම	වියදම්	%	වෙන් කිරීම	වියදම්	%
උසස් අධ්‍යාපන අංශය	185.6	179.0	96.5%	4.0	2.0	48.8%	190	181	95.5%
උසස් තාක්ෂණ ආයතනය	933.5	923.0	98.9%	87.5	36.5	41.7%	1,021	960	94.0%
බෞද්ධ පාලි විශ්වවිද්‍යාලය	510.0	461.9	90.6%	50.0	0.0	0.0%	560	462	82.5%

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය	410.0	395.2	96.4%	62.5	23.1	37.0%	473	418	88.5%
විදේශ ව්‍යාපෘති	0.0	0.0	0.0%	14,686.0	13,441.6	91.5%	14,686	13,442	91.5%
අයවැය යෝජනා	417.9	417.1	99.8%	1,749.3	1,743.9	99.7%	2,167	2,161	99.7%
අමාත්‍යාංශයේ මුළු එකතුව	**2,457.0**	**2,376.2**	**96.7%**	**16,639.3**	**15,247.2**	**91.6%**	**19,096**	**17,623**	**92.3%**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව									
මුළු එකතුව	**2,457.0**	**2,376.2**	**96.7%**	**16,639.3**	**15,247.2**	**91.6%**	**19,096**	**17,623**	**92.3%**

2.14 වගුව

2022 වර්ෂයේ අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ලබා දී ඇති ආපදා ණය හා අත්තිකාරම් පිළිබඳ විස්තර

ණය/අත්තිකාරම් වර්ගය	නිලධාරීන් සංඛ්‍යාව	ලබා දී ඇති මුදල (රු.)
ආපදා ණය	95	13,207,626.90
විශේෂ අත්තිකාරම්	18	72,000.00
උත්සව අත්තිකාරම්	82	820,000.00
වාහන ණය	01	6,000.00
එකතුව	196	14,105,626.90

2.15 වගුව

2022 වර්ෂය සඳහා අක්මුදල් ලැබීම් විස්තර

අග්‍රිම ගිණුම් අංකය	භාණ්ඩාගාරයෙන් හා වෙනත් මූලාශ්‍ර වලින් ලද අක්මුදල් ප්‍රමාණය (රු.)	වියදම් කරන ලද ප්‍රමාණය (රු.)	අක් මුදල් භාවිතයේ ප්‍රගතිය %
7002/0000/00/0254/00/0022000	2,878,185,039.22	2,878,185,039.22	100.00%
7003/0000/00/0090/00/0022000	641,880,000.00	641,659,472.00	99.97%
එකතුව	**3,520,065,039.22**	**3,519,844,511.22**	**99.99%**

2.16 වගුව

2022 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

	වියදම (රු.)	ලැබීම් (රු.)	හර ශේෂ (රු.)
2022.12.31 දිනට සත්‍ය අගයන්	15,000,743.90	9,450,436.40	27,322,140.39

2.17 වගුව

2022.12.31 දිනට මූල්‍ය නොවන වත්කම්

(රු.)

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	76,922,000.00	76,922,000.00	-	100%
9152	යන්ත්‍රෝපකරණ	394,050,459.73	394,050,459.73	-	100%
9153	ඉඩම්	794,700,000.00	794,700,000.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	1,755,000.00	1,755,000.00	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-
	එකතුව	**1,267,427,459.73**	**1,267,427,459.73**	**-**	**100%**

2.18 වගුව

ගිණුම් අංශය මගින් ක්‍රියාත්මක කරන ලද මූල්‍ය හා ගිණුම්කරණ කාර්යයන්

	කාර්යය	ක්‍රියාත්මක කල යුතු දිනය / කාල සීමාව	ක්‍රියාත්මක කල දිනය
01	මු.රෙ. 135 අනුව මූල්‍ය අධිකාරී බලය පැවරීම	2022 වර්ෂය සඳහා අදාළ අධිකාර බලය ලේකම්වරයාගේ අත්සනින් පවරා ඇත.	
02	රු. 500,000/-ට වැඩි මූලධන වියදම් දැරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම	1971 අංක 38 මුදල් පනත අනුව අධිකාරී බලය පැවරීමට කටයුතු කර ඇත.	
03	2022 වාර්ෂික ගිණුම සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	2023.02.28 දිනට පෙර	2023.02.28
04	2022 පොදු තැන්පත් ගිණුම සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	2023.02.28 දිනට පෙර	2023.02.28
05	2022 රජයේ නිලධාරීන්ගේ ණය අත්තිකාරම් බී ගිණුම සකස්කර විගණකාධිපතිට ඉදිරිපත් කිරීම	2023.02.28 දිනට පෙර	2023.02.28
06	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	2022.02.17 දිනට පෙර	
07	බැංකු සැසඳුම් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම	ඊළඟ මස 15 දිනට පෙර	ඊළඟ මස 15 දිනට පෙර

2.19 වගුව

- 2022 වර්ෂයට අදාළව අමාත්‍යාංශය සතු සියළුම වත්කම් තක්සේරු කොට ගිණුම් ගත කර ඇත. 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දී හඳුනාගත් භාණ්ඩ අපහරණය කිරීමේ කටයුතු ද 2022 වර්ෂය තුලදී අවසන් කර ඇත.

- 2022 වර්ෂයේ විගණන විමසුම් **08**ක් ලැබී ඇති අතර එම විමසුම් 08 සඳහා නියමිත කාලයේදී පිළිතුරු යවා ඇත.

- ගිණුම් අංශය මගින් මාසික ගිණුම් සාරාංශ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම, වාර්ෂික ප්‍රතිපාදන වෙන්කර දීම, මාසික අග්‍රිම අවශ්‍යතාවයන්ට අනුව භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගෙන අදාළ ආයතන වෙත නිකුත් කිරීම, අතුරු අග්‍රිම පවත්වා ගෙන යාම, අග්‍රිම සැසඳීම් සිදුකිරීම, පොදු තැන්පත්

ගිණුම් හා ණය අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන යාම, වවුචර් සඳහා ගෙවීම් කිරීමේ කාර්යයන්, සරප් කටයුතු ආදී දෛනික හා මාසික කාර්යයන් කාලානුරූපව අප්‍රමාදව ඉටුකර ඇත.

2.1.3. ප්‍රසම්පාදන අංශය

2022 වර්ෂය තුල අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් රු.මිලි.709 ක වටිනාකමින් යුත් ඉදිකිරීම් ව්‍යාපෘති 02 ක ප්‍රසම්පාදන ආරම්භ කර ඇත.

අංකය	විශ්ව විද්‍යාලය	ව්‍යාපෘතිය	අමාත්‍ය මණ්ඩල අනුමැතිය	ප්‍රසම්පාදන ආරම්භ කිරීම	ව්‍යාපෘති කාලය (මාස)	ව්‍යාපෘති වටිනාකම රු. මී
1	මොරටුව	විවර්ච්ඡේද විද්‍යා, කායික විද්‍යා සහ ජෛව රසායන විද්‍යා විද්‍යාගාර පිහිටුවීමට වෛද්‍ය පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම	22.09.05	22.11.01	18	495
2	ශ්‍රී ජයවර්ධනපුර	ආසාත්මිකතා ප්‍රතිශක්ති විද්‍යා හා සෛල ජීව විද්‍යා ඒකකය පිහිටුවීම	21.04.27	22.11.01	12	214

2.20 වගුව

2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා අමාත්‍ය මණ්ඩලය පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව හෝ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් කොන්ත්‍රාත් පිරිනමා නැත.

2.1.4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

2022.01.01 සිට 2022.12.31 දක්වා බැංකු වෙත ගෙවන ලද පොළී මුදල් ප්‍රමාණය

අංක	මාසය	ලංකා බැංකුව (රු)	මහජන බැංකුව (රු)
1	ජනවාරි	470,523.32	147,794.14
2	පෙබරවාරි	396,561.06	148,987.09
3	මාර්තු	438,552.98	137,010.79
4	අප්‍රේල්	424,016.84	147,263.20
5	මැයි	673,305.60	140,830.17
6	ජුනී	784,727.86	134,239.92
7	ජූලි	795,815.39	130,806.71
8	අගෝස්තු	868,196.99	127,103.51
9	සැප්තැම්බර්	811,746.13	125,681.82
10	ඔක්තෝම්බර්	783,736.97	116,667.46

11	නොවැම්බර්	749,620.25	118,739.18
12	දෙසැම්බර්	776,268.07	119,682.71
	2022.01.01 සිට 2022.12.31 දක්වා බැංකු වෙත ගෙවන ලද පොළී මුදල් ප්‍රමාණය රු.	**9,567,878.16**	

2.21 වගුව

- උසස් අධ්‍යාපන අංශයේ වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම ඊට අදාළ නව තොරතුරු ඇතුලත් කිරීම.

අමාත්‍යාංශයේ වෙබ් අඩවියට තොරතුරු ඇතුලත් කිරීම් හා යාවත්කාලින කිරීම්

අංක	අංශය	තොරතුරු	ප්‍රමාණය (සිංහල)	ප්‍රමාණය (ඉංග්‍රීසි	ප්‍රමාණය (දමිළ)
1	සංවර්ධන අංශය	දේශීය හා විදේශීය සිසුන් සඳහා ශිෂ්‍යත්ව, රාජ්‍ය සේවකයන් සඳහා විදේශීය පුහුණු සැසි හා දැන්වීම්.	50	50	50
2	අතිරේක (ලේකම්) සංවර්ධන	වෙබ් අඩවියේ මුහුණත් වෙනස් කිරීම් අලුත් අංග ඇතුලත් කිරීම හා වෙනත් වෙබ් අඩවි වලට සම්බන්ධ කිරීම්.	10	10	10
3	රාජ්‍ය අමාත්‍ය තුමා	මුල්ගල් තැබීම්, වැඩ බාර ගැනීම්, විවෘත කිරීම්, අමාත්‍යාංශ රැස්වීම්, මහජන හමුවීම්, සම්බන්ධ ජයාරූප හා ලිපි.	40	40	40
4	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය.	ලැප්ටොප් පරිගණක පිළිබඳ මිළ ගණන් ලැයිස්තු, ශිෂ්‍යාණය ව්‍යාපෘතිය.	25	25	25
5	ප්‍රසම්පාදන	ටෙන්ඩර් දැන්වීම් පලකිරීම.	25	25	25
6	රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය	උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද උපාධි පාඨමාලා ලැයිස්තු.	60	60	60
7	පාලන	පුරප්පාඩු පලකිරීම	10	10	10
8	රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය	ශිෂ්‍යාණය ව්‍යාපෘතිය	20	20	20
9	STHRD ව්‍යාපෘතිය	ටෙන්ඩර් දැන්වීම්, පුරප්පාඩු පලකිරීම	15	15	15

2.22 වගුව

- උසස් අධ්‍යාපන අංශයේ වෙබ් අඩවිය නවීකරණය කර සකස් කිරීම.

- තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) දායකත්වය සහිතව, උසස් අධ්‍යාපන අංශයේ වෙබ් අඩවිය නව මුහුණුවරකින් සකස් කර අවසන් කර ඇත. මීට අමතරව රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල අංශයට අදාළ උපාධි හා උපාධි ලබාදෙන පෞද්ගලික විශ්වවිද්‍යාල ලියාපදිංචි කිරීම සඳහා ද මාර්ගගත තොරතුරු තාක්ෂණික පද්ධතිය ද සකස් කර ඇත. මේ වන විට උසස් අධ්‍යාපන අංශයේ නව වෙබ් අඩවිය නිර්මාණය කර අවසන් කර ඇති අතර එය 2019 නොවැම්බර් මස දියත් කරන ලදි.

- සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යක් වන විදේශ සිසුන් හට වීසා පත්‍ර දීර්ඝ කිරීම හා නිර්දේශ ලබා දීම සඳහා නව මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධව පද්ධති විශ්ලේෂනය කරමින් පවති.

- ICTA ආයතනය සමඟ එක්ව මානව සම්පත් කළමණාකරන නව මෘදුකාංග පද්ධතියක් අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය සඳහා නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධව පද්ධති විශ්ලේෂනය කරමින් පවති.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය මගින් ලබා දී ඇති Free Wi-Fi පහසුකම් සපයන ලද විශ්වවිද්‍යාල ලැයිස්තුව.

අංක	දිස්ත්‍රික්කය	විශ්වවිද්‍යාලය / ආයතනය
1	අම්පාර	ව්‍යවහාරික විද්‍යා පීඨය - කල්මුණෙයි
2	අම්පාර	ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය
3	අනුරාධපුරය	විවෘත විශ්වවිද්‍යාලය - අනුරාධපුරය
4	අනුරාධපුරය	රජරට විශ්වවිද්‍යාලය - සාලියපුර
5	අනුරාධපුරය	රජරට විශ්වවිද්‍යාලය - මිහින්තලේ
6	මඩකලපුව	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය - ව්‍යවහාරික විද්‍යා පීඨය
7	කොළඹ	බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය - හෝමාගම
8	කොළඹ	කොළඹ විශ්වවිද්‍යාලය - තුන්මුල්ල
9	කොළඹ	කොළඹ විශ්වවිද්‍යාලය - වෛද්‍ය අංශය
10	කොළඹ	මොරටුව විශ්වවිද්‍යාලය
11	කොළඹ	සෞන්දර්ය විශ්වවිද්‍යාලය
12	කොළඹ	විවෘත විශ්වවිද්‍යාලය - නාවල
13	ගාල්ල	රුහුණු විශ්වවිද්‍යාලය - ඉංජිනේරු පීඨය - හපුගල
14	ගාල්ල	රුහුණු විශ්වවිද්‍යාලය - වෛද්‍ය අංශය - කලාප 01
15	ගම්පහ	කැළණිය විශ්වවිද්‍යාලය
16	ගම්පහ	විවෘත විශ්වවිද්‍යාලය - මිරිස්වත්ත
17	යාපනය	යාපනය විශ්වවිද්‍යාලය
18	කළුතර	ශ්‍රී පාලි මණ්ඩපය - හොරණ
19	නුවර	පේරාදෙණිය විශ්වවිද්‍යාලය - කලාප 01
20	නුවර	පේරාදෙණිය විශ්වවිද්‍යාලය - නේවාසිකාගාරය

2.23 වගුව

අමාත්‍යාංශය නියෝජනය කරමින් වෙනත් ආයතනවල සේවා සැපයීම.

අංක	අමත්‍යාංශය/දෙපාර්තමේන්තුව	විස්තර
1	National Institute of Library & Information Science University of Colombo	දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයෙකු ලෙස ක්‍රියාකිරීම
2	තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA)	Implementation of Cross Government Digital Document Management & Internal Workflow System for 20 Government Institutions- (Phase 1)
3	උසස් අධ්‍යාපන අමත්‍යාංශය	විශ්වවිද්‍යාල සඳහා Wi-Fi සම්බන්ධතා පුළුල් කිරීමේ තාක්ෂණික ඇගයීම් කමිටුව නියෝජනය කිරීම.
4	University of Colombo School of Computing	විගණන කමිටු සාමාජික / පාලක සභා සාමාජික

2.24 වගුව

අමාත්‍යාංශයේ එක් එක් අංශයන් වෙත සේවා සැපයීම් (2022.01.01 සිට 2022.12.31 දක්වා)

අංක	සේවා සැපයුම් විස්තරය	වාර්තා කරන ලද හා නිරාකරණය කරන ලද ප්‍රශ්න සංඛ්‍යාව (2022.01.01 සිට 2022.12.31 දක්වා)
1	අන්තර්ජාලයට පිවිසීමේදී ඇති ගැටළු	300
2	E-Mail පිළිබඳ ගැටළු	200
3	මෘදුකාංග යාවත්කාලීන කිරීම්	125
4	නව මෘදුකාංග ස්ථාපනය කිරීම්	55
5	සුළු දෘඩාංග ගැටළු	600
6	පරිගණක මුද්‍රණ ගැටළු	350
7	පරිගණක මුද්‍රණ යන්ත්‍ර වල ඇති වන දෝශ	300
8	WI-FI පිළිබඳ ඇතිවන ගැටළු	550
9	ජාලකරණ ගැටළු	600
10	වෛරස් මගින් ඇති වන ගැටළු	10
11	Share Folder වල ඇති වන ගැටළු	50
12	N පරිගණක වලින් ඇති වන ගැටළු	60
13	වාහන බලපත්‍ර පද්ධතිය සම්බන්ධ ගැටළු	35

2.25 වගුව

මෙහෙයුම් පද්ධතිය නැවත ස්ථාපනය කරනු ලැබූ පරිගණක/ලැප්ටොප් සංඛ්‍යාව
(2022.01.01 සිට 2022.12.31 දක්වා)

අංක	අංශය	පරිගණක සංඛ්‍යාව
1	සංවර්ධන අංශය	7
2	රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය	-
3	තොරතුරු තාක්ෂණ අංශය	2
4	අභ්‍යන්තර විගණනය අංශය	0
5	ගිණුම් අංශය	6
6	රජයේ විගණනය අංශය	2
7	ප්‍රසම්පාදන අංශය	3
8	පාලන අංශය	6

2.26 වගුව

වාහන බලපත්‍ර නිකුතුව (2022.01.01 සිට 2022.12.31 දක්වා)

2022.01.01 සිට 2022.12.31 දක්වා		
1.	ජනවාරි මස වාහන බලපත්‍ර නිකුතුව	01
2.	පෙබරවාරි මස වාහන බලපත්‍ර නිකුතුව	11
3.	මාර්තු මස වාහන බලපත්‍ර නිකුතුව	19
4.	අප්‍රේල් මස වාහන බලපත්‍ර නිකුතුව	02
5.	මැයි මස වාහන බලපත්‍ර නිකුතුව	23
6.	ජූනි මස වාහන බලපත්‍ර නිකුතුව	-
7.	ජූලි මස වාහන බලපත්‍ර නිකුතුව	-
8.	අගෝස්තු මස වාහන බලපත්‍ර නිකුතුව	53
9.	සැප්තැම්බර් මස වාහන බලපත්‍ර නිකුතුව	35
10.	ඔක්තෝම්බර් මස වාහන බලපත්‍ර නිකුතුව	02
11.	නොවැම්බර් මස වාහන බලපත්‍ර නිකුතුව	42
12.	දෙසැම්බර් මස වාහන බලපත්‍ර නිකුතුව	19
	මුළු ගණන	**207**

2.27 වගුව

2.1.5. සංවර්ධන අංශය

1. කුලපතිවරුන් හා උප කුලපතිවරුන් පත් කිරීම (2022.01.01 සිට 2022.12.31 දක්වා)

අනු අංකය	විශ්වවිද්‍යාලය	කුලපති	සේවා කාලය	උප කුලපති	සේවා කාලය
1.	ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය	ශ්‍රී ලංකා සියම් නිකායේ මල්වතු පාර්ශවයේ මහානායක අතිපූජ්‍ය තිබ්බටුවාවේ සිද්ධාර්ථ සුමංගලාභිධාන නාහිමිපාණන් වහන්සේ	2021.06.01 2023.05.31	මහාචාර්ය පූජ්‍ය කනත්තේගොඩ සද්ධාරතන ස්වාමීන් වහන්සේ	2021.06.28 2024.06.27
2.	බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය	ශ්‍රී ලංකා සියම් නිකායේ මල්වතු පාර්ශවයේ මහානායක අතිපූජ්‍ය තිබ්බටුවාවේ සිද්ධාර්ථ සුමංගලාභිධාන නාහිමිපාණන් වහන්සේ	2022.01.16 2024.01.15	වැඩබලන මහෝපාධ්‍යායයන් වහන්සේ මහාචාර්යය පූජ්‍ය නෙළුවේ සුමනවංශ ස්වාමීන් වහන්සේ	2022.11.02 සිට මහෝපාධ්‍යාවරයෙකු පත් වන තෙක්
3.	නැගෙනහිර විශ්වවිද්‍යාලය	ආචාර්ය එම්.සෙල්වරජ්හ්	2022.06.02 2027.06.01	මහාචාර්ය වී. කනගසිංගම්	2022.01.22 2025.01.21
4.	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	පැල්මඩුල්ල රජමහා විහාරාධිපති, රත්නපුර මහ දිසාවේ ප්‍රධාන සංඝ නායක, පූජ්‍යපාද බෙංගමුවේ ධම්මදින්න නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ	2018.10.09 2023.10.08	මහාචාර්ය ජේ.එල්. රත්නසේකර	2020.11.02 2023.11.01
5.	කැලණිය විශ්වවිද්‍යාලය	කැලණිය රජමහා විහාරාධිපති මහාචාර්යය පූජ්‍ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නායක ස්වාමීන්ද්‍රයන්වහන්සේ	2021.11.05 2026.11.04	මහාචාර්ය නිලන්ති ද සිල්වා	2020.08.28 2023.08.27
6.	යාපනය විශ්වවිද්‍යාලය	මහාචාර්ය එස්. පත්මනාතන්	2019.09.23 2024.09.22	මහාචාර්ය සිවකොලුන්දු ශ්‍රීසත්කුණරාජා	2020.08.28 2023.08.27
7.	වයඹ විශ්වවිද්‍යාලය	මහාචාර්ය ටියුලි ද සිල්වා	2018.04.08 2023.04.07	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ.එම්.යූ.කේ. ජයසිංහ	2022.06.28 2025.06.27
8.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සංඝ සභාවේ ශ්‍රී මහා විහාර වංශාලංකාර විමලකීර්ති ශ්‍රී ධම්මාලෝක සාහිත්‍යසූරී ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාරාභිධාන මහානායක ස්වාමීන්ද්‍රයන්වහන්සේ	2023.01.23 2028.01.22	මහාචාර්ය එස්.එම්.සී.යූ.පී. සුභසිංහ (වැඩ බලන උපකුලපති)	2022.12.24 දින සිට උපකුලපති පත්වන තෙක්
9.	සබරගමුව විශ්වවිද්‍යාලය	මහාචාර්ය පූජ්‍ය කඹුරුගමුවේ වජිර නායක ස්වාමීන්ද්‍රයන්වහන්සේ	2021.01.01 2025.12.31	මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක	2020.11.03 2023.11.02
10.	සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය	මහාචාර්ය සංගීත් නිපුන් එච්.එම්. සනත් නන්දසිරි	2021.12.02 2026.12.01	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර්.පී. මහාලියනාරච්චි	2020.10.13 2023.10.12
11.	මොරටුව විශ්වවිද්‍යාලය	මහාචාර්ය කේ.කේ.වයි.කේ. පෙරේරා	2018.03.21 2023.03.20	මහාචාර්ය නිරංජන් දිපාල් ගුණවර්ධන	2020.09.02 2023.09.01

12.	රුහුණ විශ්වවිද්‍යාලය	ධර්ම කීර්ති ශ්‍රී ආචාර්ය අකුරටියේ නන්ද නාහිමිපාණන් වහන්සේ	2019.07.08 2024.07.07	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.එස්.ඩී. අමරසේන	2022.01.13 2025.01.12
13.	කොළඹ විශ්වවිද්‍යාලය	ශාසන කීර්ති ශ්‍රී බුද්ධශාසන සෝභන පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමිපාණන් වහන්සේ	2021.11.17 2026.11.16	මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න	2022.04.12 2025.04.11
14.	රජරට විශ්වවිද්‍යාලය	ගෞරව ශාස්ත්‍රවේදී, පණ්ඩිත පූජ්‍ය ඊතල වැටුණු වැවේ ඥාණතිලක ස්වාමීන්ද්‍රයන්වහන්සේ	2020.01.27 2025.01.26	මහාචාර්යය ජී.ඒ.එස් ගිනිගද්දර	2021.12.13 2024.12.12
15.	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	මහාචාර්ය ජී.එච්.පීරිස්	2022.05.06 2027.05.05	මහාචාර්ය එම්.ඩී ලමාවංශ	2021.08.01 2024.07.31
16.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	මහාචාර්ය දම්මික ඒ. තන්ත්‍රිගොඩ	2020.09.09 2025.09.08	මහාචාර්ය පි.එම්.සී තිලකරත්න	2021.06.23 2024.06.22
17.	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	ෆයිස් මුස්තාපා	2022.11.14 2027.11.13	මහාචාර්ය ඒ. රමීස්	2021.08.09 2024.08.08
18.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	අතිපූජ්‍ය ආචාර්යය නියංගොඩ ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ඛිත විජිතසිරි ස්වාමීන්ද්‍රයන්වහන්සේ	2021.02.25 2026.02.24	ජ්‍යෙෂ්ඨ මහාචාර්යය රංජන ඩබ්.සෙනෙවිරත්න	2022.06.09 2025.06.08
19.	වවුනියා විශ්වවිද්‍යාලය	ආචාර්යය සුබ්‍රමනියම් මොහනදාස්	2021.08.21 2026.08.20	මහාචාර්යය ටී. මංගෙල්ෂ්වරන්	2021.08.01 2024.07.31

2.28: *වගුව* කුලපතිවරුන් හා උප කුලපතිවරුන් පත්කිරීම

2. විදේශ නිවාඩු

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා නිවාඩු අනුමැතිය ලබා දීම - 2022.01.01 සිට 2022.12.31 දක්වා

විශ්වවිද්‍යාලය /ආයතන	රාජකාරී නිවාඩු	පෞද්ගලික නිවාඩු	එකතුව
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	7	9	**16**
භික්ෂු විශ්වවිද්‍යාලය	3	3	**6**
බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය	14	9	**23**
කොළඹ විශ්වවිද්‍යාලය	189	147	**336**
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	171	71	**242**
කැලණිය විශ්වවිද්‍යාලය	93	98	**191**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	110	129	**239**
මොරටුව විශ්වවිද්‍යාලය	76	93	**169**
රුහුණ විශ්වවිද්‍යාලය	112	39	**151**
යාපනය විශ්වවිද්‍යාලය	94	107	**201**
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	37	19	**56**

විවෘත විශ්වවිද්‍යාලය	47	40	**87**
සබරගමුව විශ්වවිද්‍යාලය	48	31	**79**
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	29	34	**63**
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය	19	15	**34**
රජරට විශ්වවිද්‍යාලය	53	14	**67**
වයඹ විශ්වවිද්‍යාලය	33	23	**56**
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	25	16	**41**
වවුනියා විශ්වවිද්‍යාලය	6	2	**8**
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	3	2	**5**
ස්වාමී විපුලානන්ද සෞන්දර්ය ආයතනය - නැගෙනහිර විශ්වවිද්‍යාලය	5	5	**10**
ත්‍රිකුණාමල මණ්ඩපය-නැගෙනහිර විශ්වවිද්‍යාලය	2	6	**8**
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM)- කොළඹ විශ්වවිද්‍යාලය	0	7	**7**
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය (IIM) – (කොළඹ වි.වි)	1	1	**2**
ශ්‍රී පාලි මණ්ඩපය (කොළඹ විශ්වවිද්‍යාලය)	6	1	**7**
කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක ආයතනය (VCSC)	1	4	**5**
පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය (PIM)- ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	1	8	**9**
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)	4	8	**12**
එකතුව	**1189**	**941**	**2130**

2.29 : වගුව විදේශ නිවාඩු

3. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන සියලුම විශ්වවිද්‍යාල හා එම විශ්වවිද්‍යාලයන්ට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතනයන්හි පීඨ සහ අධ්‍යයන අංශ පිහිටුවීම සම්බන්ධ ගැසට් පත්‍ර (2022.01.01 සිට 2022.12.31 දක්වා)

අනු අංකය	විශ්වවිද්‍යාලය	පිහිටුවන ලද පීඨය	පිහිටුවන ලද අධ්‍යනාංශ	ගැසට් අංකය හා දිනය
01.	කොළඹ විශ්වවිද්‍යාලය	-	ශාස්ත්‍ර පීඨයට අදාළව තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය	2276/04 2022.04.18
02.	සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය	-	නර්තන හා නාට්‍ය කලා පීඨයට අදාළව තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය	2293/63 2022.08.19
03.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	නාගරික හා ජලජ සම්පත් පීඨය	1.නාගරික ජෛව සම්පත් අධ්‍යයනාංශය 2.ජලජ ජෛව සම්පත් අධ්‍යයනාංශය 3.බහුවිධ අධ්‍යයන අධ්‍යයනාංශය	2267/35 2022.02.17
04.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	-	සම සෞඛ්‍ය විද්‍යා පීඨයට අදාළව දෘෂ්ඨීමිතික අධ්‍යයනාංශය	2266/73 2022.02.11
05.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	පරිගණක පීඨය	1.විද්‍යාත්මක පරිගණක අධ්‍යයනාංශය	2285/09 2022.06.10

			2.තොරතුරු පද්ධති ඉංජිනේරු විද්‍යා සහ තොරතුරු අධ්‍යයනාංශය 3.දැනුම් ඉංජිනේරු විද්‍යා සහ සන්නිවේදන අධ්‍යයනාංශය	
06.	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	-	තාක්ෂණික අධ්‍යයන පීඨයට අදාළව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයන අංශය	2294/43 2022.08.25
07.	ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය	-	සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයට අදාළව ආහාර විද්‍යාව සහ තාක්ෂණ අධ්‍යයන අංශය	2305/16 2022.11.09
08.	රුහුණු විශ්වවිද්‍යාලය	-	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයට අදාළව තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය	2274/15 2022.04.06
09.	රුහුණු විශ්වවිද්‍යාලය	-	කෘෂිකර්ම පීඨයට අදාළව කෘෂි ඉංජිනේරු අධ්‍යයන අංශයට වෙනුවට කෘෂිකාර්මික ඉංජිනේරු සහ පාරිසරික තාක්ෂණවේද අධ්‍යයන අංශය ලෙස සංශෝධනය	2299/66 2022.09.30
10	රුහුණු විශ්වවිද්‍යාලය	-	කෘෂිකර්ම පීඨයට අදාළව කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයට වෙනුවට කෘෂි ආර්ථික විද්‍යා සහ කෘෂි ව්‍යාපාර අධ්‍යයන අංශය ලෙස සංශෝධනය	2301/31 2022.10.11
11.	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	-	සමාජ විද්‍යා හා භාෂා පීඨයට අදාළව තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය	2274/15 2022.04.06
12.	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	-	වෛද්‍ය පීඨයට අදාළව ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණ සහ පවුල් වෛද්‍ය අධ්‍යන අංශය	2299/67 2022.09.30
13.	කැළණිය විශ්වවිද්‍යාලය	-	සමාජ විද්‍යා පීඨයට අදාළව තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය	2274/15 2022.04.06
14.	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	-	සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයට අදාළව තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය	2274/15 2022.04.06
15.	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය	-	දේශීය සමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨයට අදාළව තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය	2274/15 2022.04.06
16.	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය - ත්‍රිකුණාමල මණ්ඩපය	-	ජනසන්නිවේදනය හා ව්‍යාපාර අධ්‍යයන පීඨයට අදාළව තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය	2274/15 2022.04.06
17.	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	-	කලා හා සංස්කෘතික කටයුතු පීඨයට අදාළව තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය	2290/13 2022.07.26

18.	මොරටුව විශ්වවිද්‍යාලය	-	වාස්තු විද්‍යා පීඨයට අදාළව පහසුකම් කළමනාකරණ අධ්‍යයන අංශය	2290/30 2022.07.28
19.	මොරටුව විශ්වවිද්‍යාලය	-	ඉංජිනේරු පීඨයට අදාළව ප්‍රවාහන සහ පහසුකම් කළමනාකරණ අධ්‍යයන අංශය වෙනුවට ප්‍රවාහන කළමනාකරණය සහ කාර්යෝපාය ඉංජිනේරු අධ්‍යයන අංශය ලෙස සංශෝධනය	2311/12 2022.12.19
20.	යාපනය විශ්වවිද්‍යාලය	-	ඉංජිනේරු පීඨයට අදාළව යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශය	2292/30 2022.08.09
21.	යාපනය විශ්වවිද්‍යාලය	ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් ප්‍රාසාංගික සහ දෘශ්‍ය කලා පීඨය -	අධ්‍යයනාංශ 06ක් පිහිටුවීම කලා පීඨයට අදාළව අධ්‍යයනාංශ 15කින් යුත් සටහන ආදේශ කිරීම	2293/22 2022.08.16
22.	යාපනය විශ්වවිද්‍යාලය	-	කලා පීඨයට අදාළව තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය	2274/15 2022.04.06
23.	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	-	වෛද්‍ය පීඨයට අදාළව පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය	2269/53 2022.03.03
24.	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	-	1.ශාස්ත්‍ර පීඨයට අදාළව තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය 2.දන්ත වෛද්‍ය පීඨයට අදාළව පරිපූර්ණ මුඛ සෞඛ්‍ය සත්කාර අධ්‍යයන අංශය	2294/48 2022.08.25

2.30 වගුව

- **විදේශ අධ්‍යාපන අංශය**

ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

1. ශ්‍රී ලාංකික සිසුන් සඳහා විදේශ අධ්‍යාපන අවස්ථාවන් ලබා දීම

විදේශීය රාජ්‍යයන් විසින් මෙන්ම අධ්‍යාපනික ආයතන මඟින් ශ්‍රී ලංකාව වෙත ලබාදෙන ශිෂ්‍යත්ව අවස්ථාවන් පිළිබඳ තොරතුරු භාෂාත්‍රයෙන්ම ප්‍රසිද්ධ පුවත්පත් මඟින් හා අපගේ වෙබ් අඩවිය (www.mohe.gov.lk) මඟින් ප්‍රචාරය කරනු ලබන අතර මෙම වසරේ සිට මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවීම සිදුකර විධිමත් හා විනිවිදභාවයකින් යුතු ක්‍රමවේදයක් යටතේ සිසුන් තෝරා ගැනීම සිදුකරයි.

ඒ අනුව ශ්‍රී ලාංකික සිසුන් සඳහා පහත පරිදි ශිෂ්‍යත්ව අවස්ථාවන් ලබා දෙන ලදි.

පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව අවස්ථා 2019 – 2022 දක්වා

රට	2019	2020	2021	2022
ඉන්දියාව	53	61	56	සිසුන් 12 දෙනෙකුගේ නාම යෝජනා ඉන්දියානු රජය වෙත යවා ඇත.
චීනය	14	11	13	06
ජපානය	7	7	-	07
රුසියාව	3	-	-	-
නවසීලන්තය	2	-	-	-
එක්සත් රාජධානිය	-	2	5	ශිෂ්‍යත්ව 10 සඳහා නාම යෝජනා එක්සත් රාජධානි රජය වෙත යවා ඇත
බෙලරුසියාව	-	-	-	සිසුන් 02 දෙනෙකුගේ නාම යෝජනා බෙලරුසියානු රජය වෙත යවා ඇත
හංගේරියා				ශිෂ්‍යත්ව 12ක් ලැබී තිබූ අතර, තෝරා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවති.
එකතුව	**79**	**81**	**74**	**-**

2.31 වගුව

ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව අවස්ථා 2019 - 2022 දක්වා

රට	2019	2020	2021	2022	2022
ඉන්දියාව	109	56	32		සිසුන් 140 ගේ නාම යෝජනා ඉන්දියානු රජය වෙත යවා ඇත.
චීනය	10	-	-		-
කියුබාව	1	1	-	1	
රුසියාව	07	-	-		-
පකිස්ථානය	18	-	-		-
සර්බියාව	1	2	-	1	ශිෂ්‍යත්ව එකක් (01) ක් ලැබී තිබූ අතර, තෝරා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවති.
වියට්නාමය	5	5	-		-
ජපානය	-	-	-		ශිෂ්‍යත්ව සඳහා තෝරා ගැනීමේ තරඟ විභාගය සඳහා සිසුන් 200 ක් සහභාගී කරවන ලද අතර (ප්‍රථම උපාධි-100,තාක්ෂණ විශ්වවිද්‍යාල-100) ප්‍රතිඵල ලැබීමට නියමිතය.
හංගේරියා					ශිෂ්‍යත්ව අටක් (08) ක් ලැබී තිබූ අතර, තෝරා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවති.
බෙලරුසියා					ශිෂ්‍යත්ව අටක් (08) ක් ලැබී තිබූ අතර, තෝරා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවති.
එකතුව	**151**	**64**	**32**		-

2.32 වගුව

එසේම උක්ත ශිෂ්‍යත්ව අවස්ථාවන්ට අමතරව සෘජුව අයදුම් කල හැකි විදේශීය ශිෂ්‍යත්ව අවස්ථා අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කිරීම මඟින් සිසුන් දැනුවත් කිරීම සිදු කරනු ලබයි.

2. දේශීය සිසුන් සඳහා ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාව සැලසීම

2.1 ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම

ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2011 වසරේ සිට මේ දක්වා පිරිනමා ඇති ශිෂ්‍යත්ව ප්‍රමාණය 148 ක් වන අතර 2022 වසර වනවිට උපාධිය සාර්ථකව හදාරන ලද සිසුන් 88 දෙනෙකු තම රටවලට පිටත්ව ගොස් ඇත. එසේම 2016/2017 අධ්‍යයන වර්ෂයට අදාලව සිසුන් 2 දෙනෙකු ඉගෙනුම ලබමින් සිටින අතර තවත් සිසුන් 4 දෙනෙකු අවසාන ප්‍රතිපල අපේක්ෂාවෙන් සිටී.

2019/20 අධ්‍යයන වර්ෂයේ සිට අද දක්වා ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා සිසුන් බඳවා ගැනීම තාවකාලිකව අත්හිටුවන ලදි.

2.2 ක්වීන් එළිසබෙත් පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

"ශ්‍රී ලංකා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව වැඩසටහන" යටතේ පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය හා එක්ව සංවර්ධනය වෙමින් පවතින රටවල්හි තිරසර සංවර්ධන ඉලක්කයන් අරමුණු කරගනිමින් ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාද් උපාධි ආයතනය හා කොළඹ විශ්වවිද්‍යාලයේ පෛව රසායන, අණුක විද්‍යා හා පෛව තාක්ෂණ ආයතනය යන ආයතනයන් මඟින් වාර්ෂිකව පශ්චාද් උපාධි ශිෂ්‍යත්ව පිරිනමා ඇත.

වගුව 2.32 **2019-2022 මුළු පශ්චාද් උපාධි සිසුන් සංඛ්‍යාව**

අධ්‍යයන වර්ෂය	සිසුන් සංඛ්‍යාව
2019	02
2020	02
2021	01
2022	02
2023	02
එකතුව	**09**

2.33 වගුව

3. වෙනත් ශිෂ්‍ය ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

3.1 ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල සිසුන් සඳහා චීන තානාපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මූල්‍ය අනුග්‍රහයන් ලබාදීම

චීන රජය මඟින් චීන තානාපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මෙරට විශ්වවිද්‍යාලවල ප්‍රථම උපාධි හදාරන සිසුන් සඳහා වාර්ෂිකව රු.50,000/- ක වටිනාකමකින් යුතු මූල්‍යමය අනුග්‍රාහක ශිෂ්‍යත්ව අවස්ථාවන් පිරිනමනු ලැබේ. එහිදී, සියළුම රජයේ විශ්වවිද්‍යාල නියෝජනය වන පරිදි විශ්වවිද්‍යාලයන් හි මුළු සිසුන් සංඛ්‍යාව මත පදනම්ව අදාල පීඨ නියෝජනය වන පරිදි නාම යෝජනා කැඳවා ශිෂ්‍යත්ව සඳහා සිසුන් තෝරා ගනු ලබයි.

මෙම වැඩසටහන 2016 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මක වන අතර ශිෂ්‍යත්ව 497 ක් පමණ මේ දක්වා ප්‍රදානය කර ඇත. 2021 වර්ෂය සඳහා රු.6,070,000/- ක මුදලක් ලැබී ඇති අතර මෙම වසරේදී

රජයේ විශ්වවිද්‍යාල හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයන්හි ඉගෙනුම ලබන ඉහල GPA අගයක් සහිත සිසුන් 177 ක් සඳහා ශිෂ්‍යත්ව පිරිනමා ඇත.

3.2 "Huawei Sky Seeds for the Future" ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ මූල්‍ය අනුග්‍රහයන් ලබාදීම

මෙම අමාත්‍යාංශය Huawei Technologies Lanka Co., (PVT) LTD. සමඟ එක්ව නවතම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම ලබා දීම සඳහා Huawei මූලස්ථානය මඟින් වාර්ෂිකව පවත්වනු ලබන 'Huawei Sky Seeds for the Future' පුහුණු වැඩමුළුව මෙම වසරේදී තායිලන්තයේදී සහ සිංගප්පූරුවේදී පැවැත්වුණු අතර ඒ සඳහා මෙරට විශ්වවිද්‍යාලයන්හි/ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයන්හි ඉගෙනුම ලබන බුද්ධිමත් තාක්ෂණවේදීන් (Smart Technocrats) 11 ක් දෙනෙකු සහභාගී කරවීම.

4. වීසා (Visa) පහසුකම් ලබා දීම

4.1 විදේශීය සිසුන් සඳහා මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපනය හැදෑරීමට සහ විදේශ ආචාර්යවරුන් සඳහා වීසා (Visa) පහසුකම් ලබා දීම

අධ්‍යයන කටයුතු සඳහා මෙරටට පැමිණෙන විදේශ සිසුන් සහ මෙරටට පැමිණෙන විදේශ ආචාර්යවරුන් සඳහා සඳහා ඇතුළත්වීමේ වීසා (Entry Visa) සහ මෙරටට පැමිණීමෙන් පසුව අදාළ කාලසීමාවට අනුව නේවාසික වීසා (Residence Visa) ලබාදීම හා දීර්ඝ කිරීම සඳහා නිර්දේශ මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරනු ලැබේ. මෙම වීසා ලබා දීමේ ක්‍රියාවලිය 2022 මාර්තු මස 15 දිනැති අංක. අමප/22/0379/303/026 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සම්පූර්ණ අධ්‍යයන කාලසීමාව සඳහාම වීසා ලබා දීම 2022 සැප්තැම්බර් මස 15 දින සිට ක්‍රියාත්මක වේ.

2022.01.01 සිට 2022.12.31 දක්වා නේවාසික වීසාදීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබාදුන් විදේශ සිසුන්ගේ සහ විදේශ ආචාර්යවරුන්ගේ සංඛ්‍යාව **ඇමුණුම 01** ලෙස අමුණා ඇත.

5. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ජාත්‍යන්තර අධ්‍යාපනික සහයෝගීතාවය වර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම් දර්ශකවල ඉහළ අගයකට ඔසවා තැබීම උදෙසා උසස් අධ්‍යාපනික සහයෝගීතාවයන් සඳහා ජාත්‍යන්තර සබඳතා වර්ධනය කිරීම සහ අන්තර්ජාතික පර්යේෂණ සඳහා සහභාගීවීම අරමුණු කරගනිමින් මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාලයන්, විදේශ විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන සමඟ ගිවිසුම්ගතවීමේදී නෛතික අනුමැතීන් ලබා දීම සිදු කරනු ලබයි.

ඒ අනුව, 2021 අවසන් කාර්තුවේ සිට 2022 තුන් වන කාර්තුව දක්වා පහත සඳහන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.

i. **එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) යටතේ සංවර්ධනය වෙමින් පවතින රටවල්හි කාන්තා විද්‍යාඥවරියන් සඳහා ලබාදෙන පර්යේෂණ සහයෝගීතාවයන් සඳහා වන ගිවිසුම්**

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) විසින් සංවර්ධනය වෙමින් පවතිනරටවල්හි කාන්තා විද්‍යාඥවරියන් සඳහා සහයෝගය දැක්වීම පිණිස "සංවර්ධනය වෙමින් පවතින රටවල්හි කාන්තා විද්‍යාඥවරියන් සඳහා වන සංවිධානය" (Organization for Women in Science for the Developing World - OWSD) යටතේ මූලික වෘත්තීය සහයෝගීතා වැඩසටහන (Early Career Fellowship - EC Programme) ආරම්භ කරන ලදි.

මෙම වැඩසටහන සඳහා සත්කාරකත්වය යුනෙස්කෝ සංවිධානයට අයත් ලෝක විද්‍යා ඇකඩමිය (The World Academy of Sciences - TWAS) නම් වැඩසටහන් ඒකකය විසින් දරනු ලබන අතර එම වැඩසටහන සඳහා සුදුසු පර්යේෂණ ව්‍යාපෘතීන් තෝරා ගැනීම ගෝලීය තරඟකාරී ක්‍රමවේදයට අනුව සිදු කරනු ලබයි.

ඒ අනුව 2019 සහ 2020 වර්ෂ සඳහා ශ්‍රී ලාංකික කාන්තා විද්‍යාඥවරියන් පස් දෙනෙකු ගේ (05) පහත දක්වා ඇති නව පර්යේෂණ ව්‍යාපෘතීන් තෝරා ගෙන ඇත.

#	නම	විශ්වවිද්‍යාලය	පර්යේෂණ ව්‍යාපෘතිය
1	ආචාර්ය දීමන්ති ජයතිලක	කෘෂිකර්මපීඨය,පේරාදෙණිය විශ්වවිද්‍යාලය	A Marker-assisted Breeding Tool Kit for Rice Breeders with Low Accessibility to Modern Technology
2	ආචාර්ය ප්‍රදීපා බණ්ඩාරනායක	කෘෂිකර්මපීඨය,පේරාදෙණිය විශ්වවිද්‍යාලය	Internet of Things (IoT) for Smart Agriculture: Assessment of agronomic traits and related gene expression of tomato (solanum lycopersicum) grown under filed, semi controlled, and controlled environmental conditions employed with' low cost, low energy IoT, solutions
3	ආචාර්ය වන්දිමා ආරියරත්න	විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය	An integrated, fast-tack platform for rice breeding for drought and salinity stress tolerance targeting production environments in Sri Lanka
4	ආචාර්ය දුල්හාරි තනුජා විජේරත්න	වෛද්‍ය රසායනාගාර විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	Association of functional peripheral blood NK cell responses with clinical disease severity of dengue viral infection
5	ආචාර්ය ප්‍රියංගා දිලිනි තලගල	පරිගණක ගණිත අංශය, මොරටුව විශ්වවිද්‍යාලය	RETINA: Revolutionising monitoring systems and Techniques in the Information Age

2.34 වගුව

එබැවින් යුනෙස්කෝ සංවිධානය සමඟ පහත පරිදි ගිවිසුම් සඳහා එළැඹිය යුතු වේ.

I. එක් එක් විද්‍යාඥවරිය අයත් විශ්වවිද්‍යාලය විසින් එම පර්යේෂණයේ “පරිපාලන ආයතනය” (Administrating Institution-AI) ලෙස යුනෙස්කෝ සංවිධානය සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹිය යුතුය.
II. එම විද්‍යාඥවරියන් “මූලික විමර්ශකයින්”(Principal Investigator-PI) ලෙස යුනෙස්කෝ සංවිධානය සමඟ ප්‍රදාන ගිවිසුමකට එළැඹිය යුතුය.

එසේම මෙම අවබෝධතා ගිවිසුම් මෙන්ම ප්‍රදාන ගිවිසුම් ද සියලුම රටවල විමර්ශකයින් සඳහා පොදු ආකෘතියකට අනුව සකස් කර ඇත. ඒ අනුව පහත සඳහන් අවබෝධතා ගිවිසුම් සහ ප්‍රදාන ගිවිසුම් අත්සන් කිරීමට අමාත්‍ය මණ්ඩල අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදි.

අවබෝධතා ගිවිසුම්

- පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ යුනෙස්කෝ සංවිධානය අතර අවබෝධතා ගිවිසුම
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ යුනෙස්කෝ සංවිධානය අතර අවබෝධතා ගිවිසුම
- මොරටුව විශ්වවිද්‍යාලය සහ යුනෙස්කෝ සංවිධානය අතර අවබෝධතා ගිවිසුම

ප්‍රදාන ගිවිසුම්

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය දීමන්ති ජයතිලක සහ යුනෙස්කෝ සංවිධානය අතර ප්‍රදාන ගිවිසුම
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය ප්‍රදීපා බණ්ඩාරනායක සහ යුනෙස්කෝ සංවිධානය අතර ප්‍රදාන ගිවිසුම
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය චන්දිමා ආරියරත්න සහ යුනෙස්කෝ සංවිධානය අතර ප්‍රදාන ගිවිසුම
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ආචාර්ය දුල්හාරි තනුජා විජේරත්න සහ යුනෙස්කෝ සංවිධානය අතර ප්‍රදාන ගිවිසුම
- මොරටුව විශ්වවිද්‍යාලයේ ආචාර්ය ප්‍රියංගා දිලිනි තලගල සහ යුනෙස්කෝ සංවිධානය අතර ප්‍රදාන ගිවිසුම

ii. **ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ හංගේරියාවේ විදේශ කටයුතු හා වෙළඳ අමාත්‍යාංශය අතර "STEPENDIUM HUNGARCUM" නම් දරන ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2022-2024 වසර සඳහා අධ්‍යාපන සහයෝගීතාව සඳහා වන අවබෝධතා ගිවිසුම**

මෙම අවබෝධතා ගිවිසුමට අනුව සෘජු ප්‍රතිලාභයන් ලෙස ශ්‍රී ලාංකික සිසුන් සඳහා පහත පරිදි හංගේරියානු රජය විසින් කෘෂිකර්ම,ඉංජිනේරු,ආර්ථික විද්‍යාවන් සහ ජල කළමනාකරණය පිළිබඳ ශිෂ්‍යත්ව අවස්ථාවන් 20 ක් වාර්ෂිකව හිමි වනු ඇත.

උපාධි පාඨමාලා	**වාර්ෂික**
ප්‍රථම උපාධි	8
පශ්චාත් උපාධි	8
ආචාර්ය උපාධි	4
එකතුව	**20**

එසේම, මෙම ශිෂ්‍යත්ව මාස තුනක (3) සිට දහය (10) දක්වා වූ පුහුණු වැඩසටහන් සඳහා ද භාවිතා කළ හැක.

iii. **වර්ෂ 2022-2026 කාලය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ වියට්නාම් සමාජවාදී ජනරජය අතර අධ්‍යාපනික සහයෝගීතාව සඳහා වන අවබෝධතා ගිවිසුම**
පූර්වයෙන් අත්සන් කරන ලද ගිවිසුම්වලට අනුව 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා මෙරට සිසුන්ට විදේශ ශිෂ්‍යත්ව 40ක් වියට්නාම රජය විසින් ලබා දී ඇති අතර ශ්‍රී ලංකා රජය විසින් වියට්නාම් සිසුන් සඳහා ශිෂ්‍යත්ව 08ක් ලබා දී ඇත. එසේම යෝජිත අවබෝධතා ගිවිසුමේ සෘජු ප්‍රතිලාභයන් ලෙස,

i. එක් එක් පාර්ශවය විසින් තම පාර්ශවයේ විශේෂ දක්ෂතා ඇති සිසුන් අනෙක් පාර්ශවයේ විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා හුවමාරු කිරීමත්,
ii. දෙපාර්ශවය විසින් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ ක්ෂේත්‍රවල ප්‍රථම උපාධිය හෝ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා ශිෂ්‍යත්ව 05 (පහක්) වාර්ෂිකව හුවමාරු කර ගැනීමත්,

iii. සෑම වසර දෙකකට වරක්, දෙරට අතර අත්දැකීම් හුවමාරු කර ගැනීම සහ සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා උපරිම දින 7 ක කාලයක් සඳහා නියෝජිතයින් හතරක් හෝ පහක් දක්වා සමන්විත ජ්‍යෙෂ්ඨ අධ්‍යාපන නියෝජිත කණ්ඩායම් හුවමාරු කර ගැනීමත්,

iv. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින්; වී, එළවළු, පලතුරු සහ කාබනික සහල් නිෂ්පාදනය, කෘෂිකාර්මික ඉංජිනේරු යාන්ත්‍රිකරණය, පිරිසිදු ජල/ මුහුදු ජල මත්ස්‍ය නිෂ්පාදන සංවර්ධනය, පුනර්ජනනීය බලශක්තිය සහ ශ්‍රී ලංකාව විසින් යෝජනා කරන ලද වෙනත් ක්ෂේත්‍රවල ඒකාබද්ධ පර්යේෂණ සිදුකිරීමේ ඉඩ ප්‍රස්ථා සැපයීමත්,

v. වියට්නාමයේ අධ්‍යාපන හා පුහුණු අමාත්‍යාංශය විසින් ධීවර කටයුතු, වී නිෂ්පාදනය, කෘෂිකාර්මික ඉංජිනේරු යාන්ත්‍රිකරණය, තෙල් ගවේෂණ කටයුතු සහ වියට්නාම රජය විසින් යෝජනා කරනු ලබන අනෙකුත් ක්ෂේත්‍රවල ඒකාබද්ධ පර්යේෂණ සිදුකිරීමේ ඉඩප්‍රස්ථා සැපයීමත්,

vi. දෙපාර්ශවය විසින්ම විශ්ව විද්‍යාල/පර්යේෂණ මධ්‍යස්ථාන සහ අදාළ ආයතන අතර සිසුන් සහ විද්වතුන් (කථිකාචාර්යවරුන්, පර්යේෂකයන්, තාක්ෂණික විශේෂඥයින් සහ තාක්ෂණවේදීන්) හුවමාරු කර ගැනීම දිරිමත් කිරීමත් සිදු කරනු ලබයි.

2.1.6. සැලසුම් අංශය

- දේශීය විදේශීය ව්‍යාපෘතිවලට අදාළව 2022 වර්ෂයේ කාර්තු හතර සඳහා ප්‍රගති වාර්තාව ජනාධිපති ලේකම් කාර්යාලයටත් 2022 වසරේ කාර්තු හතර සඳහා වූ ප්‍රගති වාර්තාව ව්‍යාපෘති මෙහෙයුම් හා කළමනාකරණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇත.

- දැනට ක්‍රියාත්මක වන ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය ලෝක බැංකු ව්‍යාපෘතියට හා වයඹ සංවර්ධන ව්‍යාපෘතිය, සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළ මෙහෙයුම් කමිටු තුන සඳහා පැවති පුරප්පාඩු පත් කිරීමට අදාළ කටයුතු සිදු කරන ලදී.

- 2022 වර්ෂයේ දී විදේශීය ව්‍යාපෘතිවලට හා අයවැය යෝජනාවලට අදාළව පවත්වන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් පහත පරිදි පවත්වා ඇත.

ව්‍යාපෘතිය	රැස්වීම් සංඛ්‍යාව
විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ADB)	05
නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	03
උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (World Bank)	03
වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය (WUTDP)	03
සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදි කිරීමේ ව්‍යාපෘතිය	03
රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් 12 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම	03
රුහුණු විශ්වවිද්‍යාලයේ නාවුක අධ්‍යයන හා නාවික කටයුතු පිලිබඳ ඒකකයක් පිහිටුවීම	
කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය	
රුහුණු විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යාපීඨයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය	
එකතුව	20

2.35 වගුව

- 2022 වර්ෂයේ විදේශ ව්‍යාපෘති 10 සහ අයවැය යෝජනා ව්‍යාපෘති 8ක් සැලසුම් අංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලදි.

- අයවැය යෝජනාවලට අදාළව මාසික ප්‍රගති වාර්තා ජාතික අයවැය දෙපාර්තුමේන්තුව වෙත යොමු කර ඇත.

- 2021 වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ප්‍රගති සමාලෝචන වාර්තාව සකස් කර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ලබා දී ඇත.

- මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මේ මාසික ප්‍රගති වාර්තාව සකස් කර විදේශ රැකියා අමාත්‍යාංශට, විදේශ කටයුතු අමාත්‍යාංශය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, සමාජ සවිබල ගැන්වීම් සුභසාධන හා කන්ද උඩරට උරුමය පිලිබඳ අමාත්‍යාංශය, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, නැවත පදිංචි කිරීම පුනරුත්තාපන උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.

- 2022 වර්ෂයට විගණන විමසීම් 07 ක් සඳහා පිළිතුරු සපයා ඇත.

- ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය පිලිබඳ ජනාධිපති කාර්ය සාධන බලකාය

- උසස් අධ්‍යාපනය සඳහා වන උපකමිටු නියෝජනය කරමින් අවසන් වාර්ථාව සකස් කිරීම සඳහා දායකත්වය ලබා දී ඇත.

- විදේශීය ප්‍රදාන යටතේ පහත දක්වා ඇති පරිදි ව්‍යාපෘති යෝජනා නිර්දේශ කර අනුමැතිය ලබා ගෙන ඇත.

විශ්වවිද්‍යාලය	අමාත්‍යාංශය මඟින් නිර්දේශිත ව්‍යාපෘති ගණන	ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව මඟින් නිර්දේශිත ව්‍යාපෘති ගණන	අනුමැතිය ලත් ව්‍යාපෘති ගණන	මුදල රු.මී
කොළඹ වි. වි.	3	3	2	18.40
පේරාදෙනිය වි.වි.	6	6	6	256.54
රුහුණ වි. වි.	4	4	3	103.97
වයඹ වි. වි.	1	1	1	6.91
එකතුව	**14**	**14**	**12**	**385.82**

2.36 වගුව

2.1.7. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය

- **2022 වර්ෂයේ දී පහත සඳහන් ආයතනය උපාධි ප්‍රදානය කරන ආයතන ලෙස පිළිගන්නා ලදී.**
  1) ලංකා නිපෝන් බිස්ටෙක් ඉන්ස්ටිටියුට් ප්‍රයිවට් ලිමිටඩ්

ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට, ආයතන 24ක් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයන් ලෙස පිළිගෙන ඇත.

2022.01.01 සිට 2022.12.31 දිනට මෙම ආයතන මඟින් පිරිනැමීමමට නව උපාධි පාඨමාලා 34ක් හා පිළිගෙන ඇත. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන වෙත උපාධි ප්‍රදානය කිරීමේ අවසරය ලැබී ඇති මුළු උපාධි පාඨමාලා ගණන 221 කි.

උපාධි පාඨමාලා සංඛ්‍යාව

	ප්‍රථම උපාධිය (Basic Degrees)	පශ්චාත් ඩිප්ලෝමා (P/G Diploma)	ශාස්ත්‍රපති/ විද්‍යාපති (Master)	දර්ශනශූරී (M Phil)	දර්ශනපති (Ph D)	මුළු ගණන
2021.12.31 දිනට පිළිගනු ගැබූ උපාධි පාඨමාලා සංඛ්‍යාව	136	14	16	11	10	187
2022.01.01 සිට 2022.13.31 දින දක්වා පිළිගනු ගැබූ උපාධි පාඨමාලා සංඛ්‍යාව	29	01	01	01	02	34
2022.12.31 දිනට පිළිගෙන ඇති උපාධි පාඨමාලා සංඛ්‍යාව	**165**	**15**	**17**	**12**	**12**	**221**

2.37 වගුව

03. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු පවත්වාගෙන යාම.

උපාධි ප්‍රදානය කරන ආයතන ලෙස පිළිගැනෙන ආයතනවල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමේ අරමුණින්, මෙම අංශය මඟින් එම ආයතනවල උපාධිපාඨමාලා සහ සිසුන් බඳවා ගැනීම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත සමුදායක් පවත්වාගෙන යනු ලබයි. එම තොරතුරු යාවත්කාලීන කිරීම ද මෙම අංශය මගින් සිදු කෙරේ. 2022 වර්ෂයේ විස්තර මේ සමඟ අමුණා ඇත.

වගුව 2.38 **2022** වසර සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය පිළිබඳ විස්තර

	උපාධි ප්‍රදානය කිරීමේ ආයතනය	***2022*** වසර		
		මුළු ශිෂ්‍ය ලියාපදිංචිය	2022 වර්ෂයේ ඇතුළත් කර ගත් ශිෂ්‍ය සංඛ්‍යාව	2022 වර්ෂයේ උපාධිය ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව
01	මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය (ISM)	13	0	13
02	ශ්‍රී ලංකා ඉන්ස්ටිට්යුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් (SLIIT)	15096	5714	1896
03	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)	164	25	0
04	ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)	1001	90	85
05	ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් (AQUINAS)	584	191	121
06	නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් (NSBM)	*Details not received*		
07	කොලම්බු ඉන්ටනැෂනල් නොලිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ්- CINEC	2795	930	267
08	ශ්‍රී ලංකා ඉන්ටර්නැෂනල් බුඩිස්ට් ඇකඩමි (SIBA)	559	456	142

09	ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (CASL)	1118	553	343
10	සණස කැම්පස් ලිමිටඩ් (SANASA)	171	44	09
11	හොරයිසන් කොලේජ් ඕෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් (HORIZON)	2130	734	175
12	සීමාසහිත කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ට්‍රේනින් ටෙක්නොලොජි (පෞද්ගලික) සමාගම (KIU)	7074	3061	1096
13	නාගානන්ද ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිට්යුට් ෆෝ බුඩිස්ට් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ්	272	144	*N/R*
14	එස්.එල්.ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් (SLTC)	4192	1624	*N/R*
15	ශ්‍රී ලංකා ඉන්ස්ටිට්යුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් (SLINTEC)	*තොරතුරු ලැබී නොමැත.*		
16	සිගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් (SAEGIS)	363	232	20
17	ඊසොෆ්ට් මෙට්‍රෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් (ESOFT)	175	72	0
18	ඉන්ස්ටිට්යුට් ඔෆ් කෙමෙස්ට්‍රි, සිලෝන් ආයතනය (ICHEM)	779	232	127
19	ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ්(ICBT)	41	32	0
20	බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිට්යුට් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් (BCI)	129	75	0
21	රෝයල් ඉන්ස්ටිට්යුට් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය (RIC)	3	3	0
22	බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් ප්‍රයිවට් ලිමිටඩ් (BMS)	තොරතුරු ලැබී නොමැත.		
23	ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිට්යුට් ඔෆ් හෙල්ත් සයන්ස් (පිවිටි) එල්ටීඩ්	තොරතුරු ලැබී නොමැත.		
24	**ලංකා නිපෝන් බිස්ටෙක් ඉන්ස්ටිට්යුට් ප්‍රයිවට් ලිමිටඩ්**	39	39	0
	එකතුව	36698	14251	4294

2.38 වගුව

මූලාශ්‍රය: අදාළ ආයතනය මඟින් ලබා දෙන ලද තොරතුරු

04. ආයතනික සහ විෂය සමාලෝචන සඳහා අවම ප්‍රමිතීන්

උපාධි ප්‍රදානය කරන ආයතනයක් (DAI) ලෙස පිළිගැනීමට නියමිත රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ආයතනික සහ විෂය සමාලෝචන සඳහා අවම ප්‍රමිතීන් සකස් කරමින් පවතින අතර ඒවා ජාතික වශයෙන් පිළිගත් ලේඛන ලෙස ප්‍රකාශයට පත් කිරීමට පියවර ගනිමින් සිටී.

05. අධීක්ෂණ ඒකකයක් පිහිටුවීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය පිහිටුවා ඇත්තේ විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය ප්‍රකාරව පිළිගනු ලබන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන මඟින් සපයන අධ්‍යාපනයේ ගුණාත්මක භාවය නිසි ලෙස පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ය. එම වගකීම වඩාත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටුකිරීමේ අරමුණින් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය යටතේ අධීක්ෂණ ඒකකය ලෙස උප අංශයක් ස්ථාපිත කරන ලදී.

06. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනවල තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතන ක්‍රියා පටිපාටියේ ප්‍රගතිය

2019 ජූනි 14 දින ගැසට් අතිරේකය යටතේ ජූනි 17 දිනැතිව නිකුත් කරන ලද උසස් අධ්‍යාපන (තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතනය) පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම සඳහා වන පනත් කෙටුම්පත සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට 2021.03.31 දිනැතිව "තත්ත්ව සහතිකකරණ සහ ප්‍රතීතනය පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම" යන මාතෘකාව යටතේ අමාත්‍ය මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී.

- ගරු මුදල් අමාත්‍ය, ගරු. වෙළඳ අමාත්‍යවරුන්ගේ මතය සහ නීතිපතිතුමා විසින් යෝජනා කරන ලද සංශෝධන ඇතුළත් කර පනත් කෙටුම්පත සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

- ඉහත කී කැබිනට් අමාත්‍යවරුන්ගේ නිරීක්ෂණ සමඟ ගරු අධිකරණ අමාත්‍ය, ගරු යෞවන හා ක්‍රීඩා අමාත්‍ය සහ විදේශ කටයුතු අමාත්‍යවරයාගේ අදහස් කෙටුම්පත් කරන ලද පනත් කෙටුම්පතට ඇතුළත් කිරීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කරන ලදී.

- ඉහත කෙටුම්පත් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් 2021 මැයි 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පිළිබඳ ගරු නීතිපතිවරයාගේ නිරීක්ෂණ 2021.11.12 දිනැති ලිපිය මගින් මෙම කාර්යාලයට ලැබී ඇත.

- 2022.02.28 දිනැති ලිපිය මගින් ගරු නීතිපතිතුමාගේ නිරීක්ෂණ ඇතුළත් කාරක සභා අවස්ථා සංශෝධන ඇතුළත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අතර, නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කරන ලද කාරක සභා අවස්ථා සංශෝධන 2022.04.01 දින යවන ලදී.

- මෙම කාර්යාලයේ නිරීක්ෂණ 2022.04.25 දිනැති ලිපිය මගින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යවන ලදී.

- තත්ත්ව සහතික සහ ප්‍රතීතන කොමිෂන් සභා පනත් කෙටුම්පතට නිරීක්ෂණ ඇතුළත් කමිටු අදියර සංශෝධන කෙටුම්පත් 2022.06.16 දිනැතිව භාෂා තුනෙන්ම නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

- එය නිශ්චිත බලධාරියා වෙත යොමු කර ඇති අතර, කමිටු-අදියර සංශෝධනවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලයක් පිහිටුවීමට නිශ්චිත බලධාරියා විසින් යෝජනා කරන ලදී.

2.1.8. පොළී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය

බඳවා ගැනීමේ ප්‍රගතිය

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ 2015 සිට 2020 දක්වා පසුගිය වසර පහ තුළ අ.පොෂ (උ.පෙළ) සමත් සිසු සිසුවියන් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට බඳවා ගන්නා ලදී.

වර්ෂය/ ඇතුළත් කර ගත් ශිෂ්‍ය කණ්ඩායම	රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව	උපාධි පාඨමාලා ගණන	ශිෂ්‍ය සංඛ්‍යාව
2017/ පළමු ශිෂ්‍ය කණ්ඩායම	6	26	80
2018/ දෙවන ශිෂ්‍ය කණ්ඩායම	8	38	903
2019/ තෙවන ශිෂ්‍ය කණ්ඩායම	10	50	1,978
2020/ සිව්වන ශිෂ්‍ය කණ්ඩායම	12	69	2,062
2021/ පස්වන ශිෂ්‍ය කණ්ඩායම	15	95	3,633
2022/ හයවන ශිෂ්‍ය කණ්ඩායම	16	100	4,664
එකතුව			**13,320**

2.39 වගුව

පළමු ශිෂ්‍ය කණ්ඩායමේ සිසුන් 153 ක් සහ 2වන ශිෂ්‍ය කණ්ඩායමේ සිසුන් 200 ක් දැනටමත් මෙම පහසුකම යටතේ උපාධි ලබා ඇත. දැනට, සිසුහු දහතුන් දහස් තුන්සිය විස්සක් (13,320) පහත සඳහන් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන (NSHEIs) දහසයේ (16) උපාධි හදාරති.;

i. ශ්‍රී ලංකා ඉන්ස්ටිට්යුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ට්) ලිමිටඩ් -SLIIT
ii. නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් -NSBM
iii. කොලම්බු ඉන්ටනැෂනල් නොට්කල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ්- CINEC
iv. ශ්‍රී ලංකා ඉන්ස්ටිට්යුට් ඔෆ් බුඩිස්ට් ඇකඩමි-SIBA
v. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය - ICASL
vi. සණස කැම්පස් ලිමිටඩ් ආයතනය - SANASA
vii. හොරයිසන් කොලේජ් ඕෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් - HORIZON
viii. සීමාසහිත කාට්සු හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ට්‍රේනින් ටෙක්නොලොජි (පෞද්ගලික) සමාගම -KIU
ix. එස්.එල්.ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් - SLTC
x. සීගීස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් - SAEGIS
xi. ඊසොෆ්ට් මෙට්‍රෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් - ESOFT
xii. ඇක්වයිනාස් කොලේජ් ඔෆ් හයර් ස්ටඩිස් - AQUINAS
xiii. ඉන්ස්ටිට්යුට් ඔෆ් කෙමිස්ට්‍රි සිලෝන් - ICHEM
xiv. ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් - ICBT
xv. බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිට්යුට් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් - BCI
xvi. රෝයල් ඉන්ස්ටිට්යුට් ඔෆ් කලම්බු ලිමිටඩ් -RIC

2022 වර්ෂයේ දී හයවන ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගැනීම

2018, 2019 සහ 2020 අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාග ප්‍රතිඵල මත 2022 වසරේ 6වන ශිෂ්‍ය කණ්ඩායම තෝරා ගැනීම සහ බඳවා ගැනීම් සම්බන්ධ කටයුතු ආරම්භ කිරීමට නියමිතව තිබිණි. ඒ අනුව උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ලබාගත් නව ආයතන දෙකක් පසුගියදා මෙය වැඩසටහන හා එක් විය.

1. රෝයල් ඉන්ස්ටිටියුට් ඔෆ් කලම්බු ලිමිටඩ් - RIC
2. බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් ප්‍රයිවට් ලිමිටඩ් - BMS

ශිෂ්‍ය ණය අංශය 2021 දෙසැම්බර් 21 වැනි දින 6වන බඳවා ගැනීම සඳහා මාර්ගගතව අයදුම්පත් කැඳවූ අතර මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීම 2022 පෙබරවාරි 15වන දින අවසන් කරන ලදී. 6වන බඳවා ගැනීම සඳහා මුළු අයදුම්පත් 15,186 ක් ලැබුණි.

අයදුම්කරුවන් සමඟ ශාරීරික සම්බන්ධතා වළක්වා ගනිමින් සියලුම සම්මුඛ පරීක්ෂණ මාර්ගගතව පවත්වන ලදී. ඒ අනුව අයදුම්කරුවන් 8,156 දෙනෙකු මාර්ගගත ක්‍රමය හරහා සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී විය. ස්වයංක්‍රීය පද්ධතියක් භාවිතයෙන් තෝරා ගැනීම සිදු කරන ලද අතර තේරීම් නිර්ණායක අනුව අයදුම්කරුවන් 6,847 ක් තෝරා ගන්නා ලදී. පවතින ආර්ථික අර්බුදය, විශේෂයෙන්ම, විදුලිබල හා බලශක්ති අර්බුදය 6වන බඳවා ගැනීම සඳහා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියට සෘජු බලපෑමක් ඇති කරන ලදී. මූල්‍ය වෙළෙඳපොළේ පොළී අනුපාතිකය ඉහළ යාම හේතුවෙන් ලංකා බැංකුව විසින් ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය තාවකාලිකව අත්හිටුවන ලද අතර, එම ණය යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා 6වන බඳවා ගැනීම් සඳහා බොහෝ ක්‍රියාමාර්ග සහ උත්සාහයන් ගැනීමට සියලුම නිලධාරීන්ට සහ ආයතනවලට සිදු විය.




6වන ශිෂ්‍ය කණ්ඩායම තෝරා ගැනීම සඳහා මාර්ගගත සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.




රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල 6වන බඳවා ගැනීම් සඳහා ලියාපදිංචිය පැවැත්වීම.

ණය පහසුකම්

2022 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා ලංකා බැංකුව විසින් අනුමත කරන ලද ණය මුදල් සංඛ්‍යාව පහත පරිදි වේ;

කාණ්ඩය	අනුමත කරන ලද ණය මුදල් ගණන	ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණය (රු.මිලියන)
පාඨමාලා ගාස්තු සඳහා ණය	99	77.2
ශිෂ්‍යාධාර සඳහා ණය	104	30.1
එකතුව	**203**	**107.3**

2.40 වගුව

සිසු සිසුවියන් වෙනුවෙන් අදාළ ආයතන වෙත සමාසික ගාස්තු ගෙවන ලෙස අමාත්‍යාංශය ලංකා බැංකුවට නියෝග කරයි. සියලුම ආයතන නියමිත වේලාවට සමාසිකය අවසන් කිරීමට බොහෝ ක්‍රියාමාර්ග ගත් බැවින් පවතින ආර්ථික අර්බුදය, විශේෂයෙන්ම විදුලිබල හා බලශක්ති අර්බුදය ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ අධ්‍යාපනය ලබන ශිෂ්‍ය කණ්ඩායම් හතරට බලපෑමක් ඇති නොකරන ලදී. එබැවින් නියමිත වේලාවට ආයතනවලට සමාසික ගාස්තු ගෙවීම සිදු කරන ලදී.

ඊට අමතරව සියලුම සිසුන්ට ඔවුන්ගේ අනෙකුත් අධ්‍යාපන වියදම් හා ජීවන වියදම් පියවා ගැනීම පිණිස රු. 18,750/-ක මුදලක් කාර්තුමය වශයෙන් (මසකට රු. 6,250/-) ගෙවනු ලබයි.

ශිෂ්‍ය ණය අංශය මඟින් පළමු ශිෂ්‍ය කණ්ඩායම් හතරේ සිටින සිසුන් සමඟ මාර්ගගත සමීක්ෂණයක් පවත්වන ලදී. ආයතන අනුව අධීක්ෂණ වාර්තා සකස් කරන ලද අතර අනතුරුව එම වාර්තා අදාළ ආයතන වෙත යවා අදාළ ගැටළු සඳහා පිළියම් යෙදීමට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට කටයුතු කරන ලදී.

03. පරිච්ඡේදය - 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

එසිජ්-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	2021 රු.	
0	ආදායම් ලැබීම්		-	-	
0	ආදායම් බදු	1	-	-	
0	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිජ්-1
0	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
0	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
0	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
0	ආදායම් නොවන ලැබීම්				
0	භාණ්ඩාගාර අග්‍රිම		3,804,554,407	4,403,920,553	එසිජ්-3
0	තැන්පතු		31,793,653	281,267,017	එසිජ්-4
0	අත්තිකාරම් ගිණුම්		9,450,436	9,211,679	එසිජ්-5
0	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				
0	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**3,845,798,496**	**4,694,399,249**	
0	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**3,845,798,496**	**4,694,399,249**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)				
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		3,845,798,496	4,694,399,249	
	අඩුකළා : වියදම්				
0	**පුනරාවර්තන වියදම්**				
108,450,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	103,637,511	98,885,469	
91,353,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	88,954,598	58,596,625	එසිජ්-2(ii)
2,257,192,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	2,183,654,207	2,086,327,356	
0	පොළී ගෙවීම්	8	0	0	
0	වෙනත් පුනරාවර්තන වියදම්	9	0	0	
2,456,995,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**2,376,246,315**	**2,243,809,451**	
	මූලධන වියදම්				
2,900,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා	10	924,557	823,149	
12,244,686,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	11,010,406,292	11,537,000,265	
210,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	69,212,523	491,630,392	එසිජ්-2(ii)
0	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	0	0	
2,335,270,000	හැකියා වර්ධනය	14	2,327,213,606	1,947,734,465	
1,846,489,000	වෙනත් මූලධන වියදම්	15	1,839,393,397	1,358,010,240	
16,639,345,000	**මුළු මූලධන වියදම් (උ)**		**15,247,150,375**	**15,335,198,511**	
	තැන්පතු ගෙවීම්		334,960,823	118,083,459	එසිජ්-4
	අත්තිකාරම් ගෙවීම්		15,000,744	10,092,707	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		130,745	0	
	ර.ආ. ආපසු ගෙවීම්		177,600	100,518	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**350,269,912**	**128,276,684**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**17,973,666,602**	**17,707,284,646**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(14,127,868,105)	(13,012,885,397)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(14,128,088,633)	(13,014,205,564)	එසිජ්-7
-	**2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය**		220,528	1,320,166	එසිජ්-3
			(14,127,868,105)	(13,012,885,397)	

ඒසිඒ-8

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්ෂ 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,267,427,460	3,939,804,729
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	605,735,697	963,626,568
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	220,528	1,320,166
මුළු වත්කම්		**1,873,383,684**	**4,904,751,463**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		-76,332,384	-385,049,861
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,267,427,460	3,939,804,729
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	578,413,556	941,854,735
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	103,654,525	406,821,694
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	220,528	1,320,166
මුළු වගකීම්		**1,873,383,684**	**4,904,751,463**

එසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	180,522,834	4,284,192
අග්‍රිම ලැබීම්	3,520,065,039	4,388,654,644
අත්තිකාරම් අයකර ගැනීම්	1,462,187	842,885
තැන්පතු ලැබීම්	30,026,900	280,794,133
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**3,732,076,959**	**4,674,575,854**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	175,163,394	140,082,053
සහනාධාර සහ මාරුකිරීම්	403,559,207	386,927,356
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම්	32,793,268	1,163,652
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	220,528	1,320,166
අත්තිකාරම් ගෙවීම්	14,105,627	8,454,046
තැන්පතු ගෙවීම්	240,266,678	118,083,459
ආදාමෙන් ආපසු ගෙවීම්		100,518
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**866,108,702**	**656,131,251**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,865,968,257**	**4,018,444,604**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	2,865,968,257	4,018,444,604
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,865,968,257**	**4,018,444,604**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(2,865,968,257)**	**(4,018,444,604)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ) -(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-

3.4. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000'

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	2,457,000	2,456,995	2,376,246	96.7%
ප්‍රාග්ධන	14,050,000	16,639,345	15,247,150	91.6%
එකතුව	**16,507,000**	**19,096,340**	**17,623,397**	**92.3%**

3.1 වගුව

2022.12.31 දිනට මූලධන වියදම් සාරාංශය

(රු.මිලියන)

අයිතමය/විස්තරය	2022 ශුද්ධ ප්‍රතිපාදනය	ප්‍රතිපාදන		ප්‍රතිපාදන උපයෝජන ප්‍රගතිය %
		වියදම	ඉතිරිය	
පරිපාලන හා ආයතනික සේවා	**1,753.35**	**1,745.90**	**7.45**	**99.58%**
පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	2.90	0.92	1.98	31.88%
මූලධන වත්කම් අත්පත් කර ගැනීම	1.00	0.93	0.07	92.86%
සේවක පුහුණු වැඩසටහන්	0.11	0.10	0.00	99.07%
විශ්වවිද්‍යාල සිසුන් සඳහා පොලී රහිත ලැප්ටොප් ණය ලබා දීමේ හා විශ්වවිද්‍යාලයන්හි වයි-ෆයි පහසුකම් නැංවීමේ ව්‍යාපෘතිය	10.00	9.60	0.40	96.03%
රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහල් 12ක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	200.00	200.00	0.00	100.00%
සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය	350.00	350.00	0.00	100.00%
කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය	155.00	155.00	0.00	100.00%
රුහුණු විශ්වවිද්‍යාලයේ සාගර හා නාවික කටයුතු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය	65.00	60.00	5.00	92.31%
කුලියාපිටිය සහ රත්නපුර රෝහල්වල මහාචාර්ය ඒකක පිහිටුවීම, රුහුණ විශ්වවිදයාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය සංවර්ධනය කිරීම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා විද්‍යාගාර පහසුකම් සැලසීම	430.00	430.00	0.00	100.00%
කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහල් 17ක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	539.34	539.34	0.00	100.00%
උසස් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති	**14,686.00**	**13,441.64**	**1,244.36**	**91.53%**

පර්යේෂණ හා පුහුණු සංකීර්ණය ඉදිකිරීම - යාපනය විශ්වවිද්‍යාලය	6.67	6.67	0.00	99.99%
උසස් අධ්‍යාපනය පුළුල් කිරීම හා සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය	4,593.00	4,588.40	4.60	99.90%
Healthcare	892.80	643.44	249.36	72.07%
වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය	1,658.50	1,041.13	617.37	62.78%
විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	7,313.00	6,965.55	347.45	95.25%
පිරිසිදු බලශක්ති තාක්ෂණයක් සඳහා නිනිති ද්‍රව්‍ය පිළිබඳ උසස් අධ්‍යාපන හා පර්යේෂණ සහයෝගිත්ව ව්‍යාපෘතිය	5.20	5.20	0.00	99.99%
ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය	14.52	0.00	14.52	0.00%
සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය	105.55	94.50	11.05	89.53%
යාපනය විශ්වවිද්‍යාලය සහ බර්මින්හැම් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම	46.58	46.57	0.00	100.00%
Foreign Grants	50.19	50.18	0.00	100.00%
උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට ආයතනික දායකත්වය	**200.00**	**59.61**	**140.39**	**29.81%**
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	87.50	36.50	51.00	41.71%
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය	62.50	23.11	39.39	36.98%
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය	50.00	0.00	50.00	0.00%
එකතුව (මූලධන වියදම්)	**16,639.35**	**15,247.15**	**1,392.19**	**91.63%**

3.2 වගුව

- **පාසල් අංශය හා උසස් අධ්‍යාපන අංශය යන දෙඅංශයේම තනි විගණන වාර්තාවක් නිකුත් කර ඇති බැවින් එය පාසල් අංශයේ 2022 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ 3 පරිච්ඡේදයේ 3.10 ඡේදය යටතේ දක්වා ඇත.**

04. පරිච්ඡේදය - කාර්ය සාදන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ෂක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	**75%-89%**	**50%-74%**
උපාධිධාරී රැකියා නියුක්ත භාවය.		85.5%	
ජාතික උසස් අධ්‍යාපන පද්ධතිය වෙත සිසුන් ඇතුලත් කර ගැනීමේ වැඩිවීම.	**2022** වර්ෂයේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව **(UGC)** යටතේ පවතින ජාතික විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව **42519**. නමුත් **2022** වසර සඳහා මේ වන විටත් සිසුන් බඳවා ගැනීම අවසන්ව නැත.		
විශ්ව විද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම.		76.5%	

4.1 වගුව

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	**50%-74%**	**75%-100%**
4.3 2030 වන විට සියළුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඇතුලත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම.	• පොළී රහිත ශිෂ්‍යණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම. • ජාතික උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම. • විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) යටතේ පවතින ජාතික විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම. • ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම. • ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම.	ඇතුලත් කර ගන්නා සිසුන් ගණනේ වැඩිවීම.			93.2% 76% 105% (*) 102% 97.5%

4.5 2030 වන විට I. අධ්‍යාපනයේ සුදුසු පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම. II. අධ්‍යාපනයේ සියළුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම III. අබාධිත පුද්ගලයින්ට, ස්වදේශිකයන්ට සහ අවදානමට ලක්විය හැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබාගැනීමට අවස්ථාව සැලසීම.	• ඉලක්ක සපුරා ඇත. • ඉලක්ක සපුරා ඇත. • මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් නොවේ.				100% 100% -
4.7 2030 වන විට ඉගෙනුම් ලබන සියළුම දෙනා තිරසර සංවර්ධන ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම සහ කුසලතාවයන් ලබා ගෙන සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම් , සාමය සහ ප්‍රවන්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභානය සහ සංස්කෘතික විවිදත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායක වීම ඇතුලත් වේ.	-	-	-	-	-

5.1 වගුව

(*) 2022 වර්ෂයේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව **(UGC)** යටතේ පවතින ජාතික විශ්වවිද්‍යාල සඳහා සිසුන් **42519** ඇතුලත් කර ගැනීමට අපේක්ෂා කරන ලදී. නමුත් **2022** වසර සඳහා මේ වන විටත් සිසුන් බඳවා ගැනීම අවසන්ව නැත. එසේ වුවද **2021** වර්ෂයේ දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව **(UGC)** යටතේ පවතින ජාතික විශ්වවිද්‍යාල සඳහා සිසුන් **41775** බඳවා ගැනීමට අපේක්ෂා කල අතර සිසුන් **43882** බඳවා ගන්නා ලදී. එය ප්‍රතිශතයක් ලෙස **105%** වේ.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන අරමුණු (SDG) 4.5 සපුරා ගැනීම සම්බන්ධව.

1. අධ්‍යාපනයේ සුත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම. -	උසස් අධ්‍යාපන අවස්ථා සඳහා තෝරා ගැනීම හුදෙක් Z- අගය මත රඳා පවතී. එය සුත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් නොවේ.
2. අධ්‍යාපනයේ සියළුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම. -	උසස් අධ්‍යාපනයේ එක් එක් මට්ටම් අර්ථ දක්වා ඒ සඳහා ප්‍රවේශ වීමට අවශ්‍ය සුදුසුකම් ද දක්වා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) මත සකස් කර ඇත. ඒ අනුව සුදුසුකම් සපුරා ලන ඕනෑම අයෙකුට විවිධ මට්ටම් වලට ප්‍රවේශ වීමට ඇති අවස්ථාවන් තහවුරු කර තිබේ. අමාත්‍යාංශය යටතෙහි වූ සියළුම අධ්‍යාපන ආයතනයන් මෙම රාමුවට අනුගත කර ඇත.
අබාධිත පුද්ගලයින්ට, ස්වදේශිකයන්ට සහ අවදානමට ලක්විය හැකි ළමුන්ට - වෘත්තීය පුහුණුව ලබාගැනීමට අවස්ථාව සැලසීම.	මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් නොවේ.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛාව	ඇබෑර්තු/(අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	27	23	4
තෘතීයික	5	4	1
ද්විතියික	125	150	25 (සංවර්ධන නිලධාරී අතිරික්ත - 51)
ප්‍රාථමික	47	41	6

6.1 වගුව

06.2 ** මෙලෙස තනතුරු පුරප්පාඩු පැවතීම හේතුවෙන් එක් නිලධාරියෙකුට විෂයන් කිහිපයක කාර්යයන් ඉටු කිරීමට සිදුවීම නිසා අමාත්‍යාංශයේ අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමව හා සඵලදායීව ඉටු කිරීම දුෂ්කර වී ඇත. එබැවින් අදාල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණුව ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය රුපියල්		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
වැටුප් පරිවර්තනය	74	දින 1	34,300.00	-	දේශීය	නිලධාරීන් සඳහා වැටුප් පරිවර්තනය පිළිබඳ අවබෝධයක් ලබා දීම
ලිපිගොනුකරණය	18	දින 1	8,650.00	-	දේශීය	කාර්යාල කටයුතු විධිමත්ව පවත්වා ගැනීම තුළින් කඩිනම් සේවාවක් ලබා දීමට හැකිවීම
කාර්ය පටිපාටික රීති සහ නිවාඩු	17	දින 1	9,075.00	-	දේශීය	නිලධාරීන් සඳහා කාර්ය පටිපාටික රීති සහ නිවාඩු පිළිබඳ අවබෝධයක් ලබා දීම
විශේෂිත අමුත්තන් සඳහා සංග්‍රහ කටයුතු කිරීමේ නිවැරදි පිළිවෙත්	16	දින 1	11,450.00	-	දේශීය	විශේෂිත අමුත්තන් සඳහා සංග්‍රහ කටයුතු කිරීමේ නිවැරදි පිළිවෙත් පිළිබඳ අවබෝධයක් නිලධාරීන් හට ලබාදීම.

මූල්‍ය කළමනාකරණය පිළිබඳ රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යභාරය හා වගකීම	54	දින 1	36,080.00	-	දේශීය	කාර්යාල කටයුතු විධිමත්ව පවත්වා ගැනීම සඳහා මූල්‍ය කළමනාකරණය පිළිබඳ රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යභාරය හා වගකීම පිළිබඳ පුළුල් දැනුමක් ලබා දීම
මූල්‍ය කළමනාකරණය හා ලංසු කැඳවීම	64	දින 1	45,465.00	-	දේශීය	කාර්යාල කටයුතු විධිමත්ව පවත්වා ගැනීම සඳහා මූල්‍ය කළමනාකරණය හා ලංසු කැඳවීම පිළිබඳ පුළුල් දැනුමක් ලබා දීම
Diploma in English for Professionals (DEP) Batch 6	1	සති 30	25,000.00	-	දේශීය	-
Government Payroll System	1	දින 3	18,000.00	-	දේශීය	රාජ්‍ය අංශයේ වැටුප් පිළියෙල කිරීම සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දීම
17th FICCI Higher Education Summit 2022	1	දින 5	-	-	විදේශීය	-
Recognition of H.B among Asian Countries Discussion by RecoAsia Project	1	දින 6	-	-	විදේශීය	-
The Project of the Professional Development Program 2022 (ADB)	1	දින 7	-	-	විදේශීය	-

6.2 වගුව

- රාජකාරි කටයුතු කාර්යක්ෂමව හා සඵලදායීව ඉටු කිරීම සඳහා නිලධාරීන්ගේ දැනුම කුසලතා වර්ධනය සිදු කිරීම අත්‍යවශ්‍ය කරුණකි. නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමෙන් නව විෂය කරුණු සම්බන්ධයෙන් දැනුම වර්ධනය වන අතර කාර්යක්ෂම සේවාවක් එමඟින් ඉටු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**		_	_
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	_	_
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	_	_
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	_	_	_
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	_	_	_
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	_	_	_
1.6	වෙනත්	_	_	_
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**		_	_
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	_	_
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
අංකය	**අදාළ කර ගත යුතු අවශ්‍යතාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**		_	_

3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ	_	_
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	_	_
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ	_	_
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	_	_
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	_	_
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	_	_
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	_	_
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	_	_
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	_	_
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**	-	-	-
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	_	_
අංකය	**අදාළ කර ගත යුතු අවශ්‍යතාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	_	_
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	_	_
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	_	_
7	**විගණන හා කළමනාකරණ කමිටු**		_	_
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	අංක DMA/AMC/M/2021/2 හා 2021.09.06 ලිපිය පරිදි කටයුතු කර ඇත.	_

8	**වත්කම් කළමනාකරණය**		_	_
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	_	_
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ	_	_
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	_	_
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ	_	_
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	_	_
අංකය	**අදාළ කර ගත යුතු අවශ්‍යතාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
9	**වාහන කළමනාකරණය**		_	_
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	_	_
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ	_	_
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	_	_
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	_	_
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ	_	_
10	**බැංකු ගිණුම් කළමනාකරණය**		_	_

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	_	_
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	_	_
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	_	_
අංකය	**අදාළ කර ගත යුතු අවශ්‍යතාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
11	**ප්‍රතිපාදන උපයෝජනය**		_	_
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	_	_
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල නොවේ	විදුලි, ජල හා දුරකථන වැනි පුනරාවර්තන වියදම් වලට අදාළ බිල්පත් ලැබීමේ ප්‍රමාදය නිසා	_
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**		_	_
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ	_	_
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	_	_
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	සේවය අතහැර ගොස් ඇති නිළධාරීන් දෙදෙනෙකු හා විශ්‍රාම ගිය නිළධාරියෙකුගේ ණය ශේෂය නිරවුල් කර නොතිබීම - සේවය අතහැර ගොස් සිටි නිළධාරීන් දෙදෙනාට නීති මගින් කටයුතු කිරීමට පියවර ගෙන ඇති අතර විශ්‍රාමික නිලධාරියා මිය ගොස් ඇති අතර ඔහුට විශ්‍රාම පාරිතෝෂිකයක් නොමැති නිසා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් මරණ පාරිතෝෂිකයන් හෝ වෙනත් දීමනා මගින් එම ණය ශේෂය අඩු කරන ලෙස ඉල්ලා වි.වැ. දෙ. අධ්‍යක්ෂ	

			ජනරාල් වෙත දන්වා යවා ඇත.	
13	**පොදු තැන්පත් ගිණුම**		_	_
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ	_	_
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
14	**අග්‍රිම ගිණුම**		_	_
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	_	_
අංකය	**අදාළ කර ගත යුතු අවශ්‍යතාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	_	_
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	_	_
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	_	_
15	**ආදායම් ගිණුම**		_	_
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	_	_	_
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	_	_	_
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	_	_	_
16	**මානව සම්පත් කළමනාකරණය**		_	_
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ	_	_
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	_	_
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**	අනුකූල වේ	_	_
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	_	_
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	_	_

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	_	_
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**	අනුකූල වේ	_	_
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ	_	_
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ	_	_
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**		_	_
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ	_	_
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	_	_
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ	_	_
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ	_	_
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**		_	_
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ	_	_

7.1 වගුව



අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயல்திறன் அறிக்கை
Annual Performance Report
2022

වෙළුම III - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම්

இதழ் III - திறன்கள் அபிவிருத்தி, தொழில் கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்கம்

Volume III - Skills Development, Vocational Education, Research and Innovation

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2022

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,

පර්යේෂණ හා නව නිපැයුම් අංශය

අධ්‍යාපන අමාත්‍යාංශය

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය

වැය ශීර්ෂ අංකය - 421,126

අන්තර්ගතය

			පිටු අංකය
පරිච්ඡේදය	01-	ආයතනික පැතිකඩ /විධායක සාරාංශය	01
පරිච්ඡේදය	02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	05
පරිච්ඡේදය	03 -	2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	23
පරිච්ඡේදය	04 -	කාර්යසාධන දර්ශක	29
පරිච්ඡේදය	05 -	තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්යසාධනය	30
පරිච්ඡේදය	06 -	මානව සම්පත් පැතිකඩ	33
පරිච්ඡේදය	07 -	අනුකූලතා වාර්තාව	36

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/ විධායක සාරාංශය

1.1 හැඳින්වීම

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති රාමුව තුළ නිපුණ ශ්‍රම බලකායක් බිහි කිරීම සහ පර්යේෂණ හා නව නිපැයුම් තුලින් ජාතික ආර්ථිකය නැංවීමහා නව නිපැයුම් සඳහා සහයෝගී වටපිටාවක් ඇති කිරීම සඳහා, 2020 වසරේදී ආරම්භ කරන ලද නිපුණතා අධ්‍යාපනයට අදාළ වැඩසටහන් රැසක් ඉදිරියට ගෙන යෑම අරමුණු කර ඊට සමත් උපාය මාර්ග තව දුරටත් පුළුල් කිරීම සඳහා 2022 වාර්ෂික සැලැස්ම ක්‍රියාවට නංවන ලදී. වසංගත තත්වය හමුවේ පසුබෑමට ලක් වූ වෘත්තීය අධ්‍යාපන පද්ධතිය ද වර්ෂය ආරම්භයේදී ලබා දුන් ඉලක්ක මත පදනම් වූ නව උපාය මාර්ග හා අනුගතව අපේක්ෂා සහගතව ඉදිරියට යෑම ආරම්භ කරන ලදි. නිපුණතා සංවර්ධන ක්ෂේත්‍රයේ ප්‍රබෝධයක් ඇති කරමින් ඒකාබද්ධ ප්‍රවේශයකින් සියළු අංශවල කඩිනම් ඉදිරි පිම්මකට පසුබිම සැකසීම සඳහා පළාත් මට්ටමින් "නිපුණතා උදාන" වැඩසටහන ආරම්භ කරන ලදී. නමුත් ප්‍රවාහන ක්ෂේත්‍රයට අහිතකර බලපෑම් එක් කළ පළමු කාර්තුව අවසන් වීමටත් පෙර ඇති වූ මූල්‍ය අර්බුදය මත මෙහි අපේක්ෂිත ප්‍රතිපල ලබාගැනීමට නොහැකි විය. මෙම අර්බුදකාරී තත්වය ආයතනවල ඉලක්කගත ශිෂ්‍ය බඳවා ගැනීම්වල කඩා වැටීමට ද හේතු විය. එහි ප්‍රතිඵලය වූයේ 124,637 ක වාර්ෂික බඳවා ගැනීම් ඉලක්කය දෙසැම්බර් 31 දිනට 106,762 කට සීමා වීමය.

කොවිඩ් වසංගත තත්වය හමුවේ ගෝලීය ආර්ථිකය විකල්ප උපාය මාර්ග වෙත වේගයෙන් යොමු වෙමින් සිටින පසුබිමක විවිධ සීමාකම් මැද වුවද වෘත්තීය අධ්‍යාපන ක්‍රමය ද සියළුම විකල්ප අවකාශයන් එලදායීව යොදා ගැනීමට පියවර ගන්නා ලදී. අධ්‍යාපනය, ඇගයීම් සහ පෙර දැනුම ඇගයීම ක්‍රමය, පුහුණුකරුවන් පුහුණුව ආදී විවිධ අංශ සඳහා මාර්ගගත ක්‍රමවේදයන් භාවිතය පුළුල් කෙරිණි. විද්‍යුත් මාධ්‍ය උපයෝගී කර ගනිමින් පාඨමාලා පැවැත්වීම සිදු කරන අතර වෘත්තීය මාර්ගෝපදේශනය ද පුළුල් කර ඇත. රැකියා අවස්ථාවන් තහවුරු කිරීමේ උපාය මාර්ගයක් වශයෙන් කර්මාන්ත සමඟ සම්බන්ධවෙමින් පුහුණු පාඨමාලා පවත්වාගෙන යාමටත්, ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනයටත් පියවර ගෙන ඇත. එමෙන්ම විදේශ රැකියා වෙළඳපොළ අවකාශයන් සලසා ගැනීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හා එම අමාත්‍යාංශයේද සහය ඇතිව රාජතාන්ත්‍රිකව විදේශ රටවල් සමඟ එකඟතාවයන්ට එළඹෙමින් සිටින අතර ඒ අනුව නිපුණ ශිල්පීන් පුහුණු කිරීමට පියවර ගෙන ඇත.

මධ්‍යස්ථාන පාදක, ආධුනිකත්ව පාදක, මාර්ගගත හා නම්‍යශීලී ක්‍රම ඔස්සේ පුහුණු අවකාශයන් පුළුල් කිරීමටත් එමගින් පහළ, මධ්‍යම හා අඩු ආදායම්ලාභී පවුල්වලට ප්‍රශස්ත ආදායමක් සහිත රැකියා අවස්ථාවක් තහවුරු කිරීමටත් පියවර ගෙන ඇත. එසේම, පෙර දැනුම ඇගයීමේ ක්‍රමය (RPL) යටතේ රැකියාවන්හි නියුතු ශිල්පීන්ගේ දැනුම සහතික කිරීමේ ක්‍රමවේදය කඩිනම් හා පුළුල් කිරීමටත් පියවර ගෙන ඇත.

පර්යේෂණ හා නව නිපැයුම් ක්ෂේත්‍රය යටතේ රටේ පවත්නා ආර්ථික තත්ත්වය කෙරෙහි අවධානය යොමු කරමින් කාලීන වශයෙන් වැදගත් කමකින් යුක්ත පර්යේෂණයන් වෙත ප්‍රමුඛතාවය ලබා දෙමින්, තිරසර සංවර්ධනයක් අත්පත්කර ගැනීම උදෙසා විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පර්යේෂණ ආයතනයන් සහ බහුපාර්ශ්වික සහයෝගීතා මඟින් ක්‍රියාත්මක වන පර්යේෂණයන් තෝරා ගැනීම, මෙහෙයවීම හා කළමණාකරණය වෙනුවෙන් විධිමත් ක්‍රියා පටිපාටීන් ස්ථාපිත කිරීම, ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව යාවත්කාලීන කිරීම සඳහා කටයුතු කිරීම, රටෙහි ආර්ථික වර්ධනය උදෙසා නිර්මාණශීලීත්වය, නව නිපැයුම් හා නවෝත්පාදනයන්හි වැදගත්කම පිළිබඳව පාසැල් ප්‍රජාව සහ මහජනතාව දැනුවත් කිරීම, විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ජාත්‍යන්තර පර්යේෂණ සහයෝගීතාවයන් හා දැනුම හුවමාරු වැඩසටහන් ඒ අතරට ගැනේ.

එමෙන්ම දේශීය ස්වභාවික හා මානව සම්පත් උපයෝගී කර ගනිමින් නිෂ්පාදන සේවා සංවර්ධනය කිරීම උදෙසා නිනිති සහ උසස් තාක්ෂණික ක්ෂේත්‍රවල පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල නියැලීම මෙන්ම නැනෝ සහ උසස් තාක්ෂණය පිළිබඳ විශේෂ වූ ලෝක මට්ටමේ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන පහසුකම් සැලසීම මගින් දේශීය හා ජාත්‍යන්තර ආයෝජකයින් ආකර්ශනය කර ගැනීමට සමත් විය. අනාගත බලශක්ති අර්බුදයට විසඳුම් සැපයීම අරමුණු කර ගනිමින් සූර්ය බලශක්ති හා ඒ ආශ්‍රිත තත්ත්වයන් පිළිබඳව ලෝක මට්ටමේ ශ්‍රම බලකායක් පුහුණු කිරීම සඳහා සුදුසු වැඩසටහන් පැවැත්වූ අතර NVQ 4

මට්ටමේ සූර්ය තාක්ෂණ ශිල්පීන් 34 ක් සහ NVQ 3 මට්ටමේ සූර්ය තාක්ෂණ ශිල්පීන් 31 ක් පුහුණු කරන ලදි.

පවත්නා කාලීන ආර්ථික අර්බුදයට පිළියමක් වශයෙන් 2022 වර්ෂය මැද භාගයේ දී පර්යේෂණ හා සංවර්ධන ප්‍රවර්ධනය කිරීම සහ වානිජකරණය කිරීම සඳහා අතුරු අයවැය යෝජනා යටතේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි. නිවාස සහ වීදී ආලෝකකරණය සඳහා සූර්ය හා සුලං බලයෙන් ක්‍රියාත්මක දෙමුහුන් බල පද්ධතියක් නිපදවීමේ කටයුතු කළ අතර නාගරික ඝන අපද්‍රව්‍ය සහ කොම්පෝස්ට් මිශ්‍රකර දෙමුහුන් පොහොර පෙති වර්ගයක් නියමු ව්‍යාපෘතියක් ලෙස සාර්ථකව ක්‍රියාත්මක කෙරිණි.

1.2

දැක්ම

නිපුණත්වයෙන් සපිරි පර්යේෂණශීලී නවෝත්පාදක සමාජයක්

මෙහෙවර

දැනුමෙන්, වෘත්තීය නිපුණත්වයෙන් සහ කුසලතාවයෙන් පිරි සුහුරු සමාජයක් බිහි කිරීම සහ පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනයට හිතකර පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම මඟින් කලාපීය නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් සඳහා පසුබිම සැකසීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යාපන සුදුසුකම් නොසලකා වෘත්තීය අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථා ඇති කිරීම.
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම.
- වෘත්තීය විෂයමාලා නවීකරණයක් කොට, - One TVET˜සංකල්පය යටතේ අදාළ ආයතන ජාලගත කර, තාක්ෂණවේදී උපාධි ආයතන බවට පත් කිරීම.
- පාසැල් අධ්‍යාපනය හැරයාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම.
- ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම.
- දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූපව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සංශෝධනය කිරීම.
- වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවන්ට ව්‍යවසායකත්වය, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ අනෙකුත් භාෂා ඇතුළත් කරමින් විෂය මාලා සංශෝධනයක් සිදු කිරීම.
- ජංගම තාක්ෂණික අධ්‍යාපන සේවා මඟින් වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම.
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපොල ඉලක්ක කරගත් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රැකියා අවස්ථාවන්ට ගැලපෙන උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතන ලෙස නගර විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට කටයුතු කිරීම.
- ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම.
- නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ප්‍රයෝජනයට ගැනීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම.
- ජාතික නවෝත්පාදන ආයතනය පිහිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- නව සොයාගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙළඹවීම.

1.4. සංවිධාන ව්‍යුහය


ලේකම්
අතිරේක ලේකම් (පාලන)
ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් (පාලන)
ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් (පාලන)
සහකාර ලේකම් (පාලන)
සහකාර ලේකම් (ආයතන)
නිති නිලධාරී
පරිපාලන නිලධාරී
අතිරේක ලේකම් (කාර්ය සම්පාදන)
අධ්‍යක්ෂ (කාර්යසම්පාදන සහ ප්‍රසම්පාදන)
සහකාර ලේකම් (කාර්යසම්පාදන)
සහකාර ලේකම් (ප්‍රසම්පාදන)
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)
පරිපාලන නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
අධ්‍යක්ෂ (යටිතලපහසුකම් සංවර්ධන)
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන)
අතිරේක ලේකම් (වෘත්තීය පුහුණු)
අධ්‍යක්ෂ (වෘත්තීය පුහුණු)
අධ්‍යක්ෂ (නිපුණතා සංවර්ධන)
අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන)
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය පුහුණු)
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (නිපුණතා සංවර්ධන)
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශ)
අතිරේක ලේකම් (නිපුණතා ආංශික සංවර්ධන)
අධ්‍යක්ෂ (නිපුණතා ආංශික සංවර්ධන)
අධ්‍යක්ෂ (පූර්වවර විශ්වවිද්‍යාල)
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (නිපුණතා ආංශික සංවර්ධන)
නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (පූර්වවර විශ්වවිද්‍යාල ව්‍යාපෘතිය)
සහකාර අධ්‍යක්ෂ (අධීක්ෂණ)
අතිරේක ලේකම් (සංවර්ධන හා නමෝත්පාදන)
අධ්‍යක්ෂ (සංවර්ධන හා නමෝත්පාදන)
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන සහ නමෝත්පාදන)
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (ජාත්‍යන්තර සබඳතා)
අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ)
අධ්‍යක්ෂ (පර්යේෂණ)
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ)
අධ්‍යක්ෂ ජනරාල් (කෘෂිකර්ම)
අධ්‍යක්ෂ (කෘෂිකර්ම)
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන) - VT
අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) - VT
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) I
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) II
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන) - RI
අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) - RI
අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන) - RI
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) III
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) IV
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ප්‍රධාන ගණකාධිකාරී I
ප්‍රධාන ගණකාධිකාරී I
ගණකාධිකාරී I
ගණකාධිකාරී II
ගණකාධිකාරී III
ගණකාධිකාරී IV
ප්‍රධාන අභ්‍යන්තර විගණක
අභ්‍යන්තර විගණක I
අභ්‍යන්තර විගණක II
සහයක කාර්ය මණ්ඩලය

1.5. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු

- **කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

1.6. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය යටතේ ක්‍රියාත්මක ආයතන

- **තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC)**
- **ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA)**
- **ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය(VTASL)**
- **ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය(CGTTI)**
- **වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය(UNIVOTEC) හා ඒ යටතේ ක්‍රියාත්මක විශ්වවිද්‍යාල විද්‍යාතන**
- **සාගර විශ්වවිද්‍යාලය (OCUSL)**
- **ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය (NIBM)**
- **ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය (NSBM)**
- **නිපුණතා සංවර්ධන අරමුදල (SDFL)**
- **නවීන තාක්ෂණය පිළිබඳව ආතර්.සී. ක්ලාක් ආයතනය (ACCIMT)**
- **ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC)**
- **ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)**
- **ජාතික නවෝත්පාදන නියෝජිතායතනය (NIA)**
- **ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)**
- **ජාතික පර්යේෂණ සභාව (NRC)**
- **ජාතික විද්‍යා පදනම (NSF)**
- **ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය (SLIBTEC)**
- **ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන්ගේ කොමිසම (SLIC)**
- **ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (SLINTEC)**
- **ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය (PLANETARIUM)**

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල විස්තර

ව්‍යාපෘතියේ නම	ක්‍රියාත්මක කරන ආයතනය	ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම (මිලියන)	ව්‍යාපෘති කාල සීමාව
අන්තර්ගෘහිත ආර්ථික වර්ධනයක් සඳහා නිපුණතා ව්‍යාපෘතිය (Skills for Inclusive Economic Growth Program (S4IG))	ඕස්ට්‍රේලියානු රජය	ඕස්ට්‍රේලියානු ඩොලර් 15	2022 මාර්තු සිට 2025
ජර්මානු රජයේ ආධාර මත ක්‍රියාත්මක වෘත්තීය පුහුණු වැඩසටහන(GIZ)	ජර්මන් රජය	යූරෝ 7	2019 ජූලි සිට 2022 ජූනි
YouLead ව්‍යාපෘතිය	ඇමරිකා එක්සත් ජනපදය	ඇමරිකානු ඩොලර් 18	2017 ජූනි 02–2024 මැයි
ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය (SSDP)	ආසියානු සංවර්ධන බැංකුව/ ලෝක බැංකුව/ශ්‍රී ලංකා රජය	ඇමරිකානු ඩොලර් 398.41	2014 ජූනි සිට 2023
ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීමේ පාඨමාලා සඳහා ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය	KOICA	ඇමරිකානු ඩොලර් 4	2020 -2024

පරිච්ඡේදය 02
ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

2.1. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශයේ 2022 වසරේ ජයග්‍රහණයන්

2.1.1 නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය

- **2022 වසරේ අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය**

2022 වසරේ මුදල් අමාත්‍යවරයා ලෙස ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යෝජනා මත අධ්‍යාපන අමාත්‍යාංශයේ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය සඳහා කාර්මික හා තාක්ෂණික අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීමටත් පාසල් අධ්‍යාපනය නිම කළ තරුණ තරුණියන්ගේ වෘත්තීය හා කාර්මික නිපුණතා වර්ධනය කිරීම සඳහා පවතින පහසුකම් වැඩිදියුණු කිරීමටත්, අතිරේක ප්‍රතිපාදන රු. මිලියන 2000.0 ක් ලබා දෙන ලදී. 2022 ඔක්තෝබර් 01 සිට ක්‍රියාත්මක වූ අතුරු අයවැය යටතේ මෙම ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 470.0 ලෙස සංශෝධනය වූ බැවින් සැලසුම් කළ ඇතැම් ක්‍රියාකාරකම් අත්හිටුවන ලදී.

ඉහත අයවැය යෝජනා යටතේ විවිධ නිපුණතා සහිත තරුණ ශ්‍රමිකයන් සඳහා පවතින විශාල ඉල්ලුම සපුරාලීම සඳහා පවතින අවශ්‍යතාවයන් සහ ඌණතාවයන් සම්පූර්ණ කිරීමට පහත සඳහන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- **ශ්‍රම වෙළඳපොළහි ඉහළ ඉල්ලුමක් සහිත පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම වැඩි කිරීම පිණිස අමාත්‍යාංශය විසින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව 2021 වසරේ ක්‍රියාත්මක වූ (ආයතන සතරක)පන්ති කාමර,වැඩහල්, විද්‍යාගාර, ආපන ශාලා, ඇඳුම් මාරු කිරීමේ කාමර, සනීපාරක්ෂක ඒකක, ශිෂ්‍ය / ගුරු නිල නිවාසවල අලුත්වැඩියා කටයුතු සහ වැඩි දියුණු කිරීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී. එමෙන්ම දිවයින පුරා පුහුණු මධ්‍යස්ථානවල අවශ්‍යතාවයන් ඉටු කිරීමේ අරමුණින්"නිපුණතා උදාන" වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ වයඹ සහ සබරගමුව පළාත්වල පුහුණු මධ්‍යස්ථානවල වැඩකටයුතු ආරම්භ කරන ලදී. මේ යටතේ සුලු අලුත්වැඩියා කිරීම් සහ වැඩිදියුණු කිරීමේ අවශ්‍යතා හඳුනා ගත් අතර, ඒ අනුව බුලත්සිංහල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සඳහා මුදල් වෙන් කරන ලදී. නමුත් ප්‍රතිපත්තිමය තීරණයන් නිසා ඉතිරි ක්‍රියාකාරකම් අත්හිටුවන ලදී.**

- **වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ සිසුන්හට ජාත්‍යන්තර මට්ටමේ කාර්මික දැනුම ලබා දීම සඳහා වැඩහල් හා විද්‍යාගාර සඳහා පුහුණු උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර ලබා දීමට පියවර ගන්නා ලදී. ඒ අනුව එක් ආයතනයක් සඳහා කාර්තුමය වශයෙන් රුපියල් මිලියන 7 බැගින් වෙන් කළ අතර VTA, CGTTI සහ NAITA යන ආයතන වෙත 2022 වර්ෂයේ වෘත්තීය අධ්‍යාපනය සඳහා අවශ්‍ය උපකරණ සම්පාදනය කිරීමට රුපියල් මිලියන 33ක් වැය කරන ලදී.**

- **නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශයේ ප්‍රධාන අරමුණක් වනුයේ, පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම ඉහළ නැංවීමයි. ඒ සඳහා දැනුවත් කිරීම් සිදු කිරීමටත්, නිපුණතා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමටත් මුදල් වෙන් කරන ලදී. "නිපුණතා උදානය" වැඩසටහන වයඹ සහ සබරගමුව පළාත්වල ආරම්භ කරන ලද අතර, පුහුණු මධ්‍යස්ථානවල ප්‍රවර්ධන වැඩසටහන් පවත්වන ලදී. එමෙන්ම නිපුණතා ක්ෂේත්‍රයේ නියැලී සිටින කාන්තා ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා "Wise Women" වැඩසටහන ක්‍රියාත්මක වූ අතර දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යන ආයතන සඳහා 2022 අතුරු අයවැය යෝජනා මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ අවසන් කාර්තුවේ තවත් ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කරන ලදී;

- **පෙර ඉගැනුම් හඳුනා ගැනීම ක්‍රමය (RPL) යටතේ නිපුණතා ඉහළ නැංවීම / නැවත නිපුණතා ගැන්වීම පිණිස "නිපුණතාව පදනම් කර නව රැකියා ලබා දීම" සඳහා රු. මිලියන 100.00ක් වෙන් කරන ලදී.**

- **සුළු පරිමාණ ස්වයං රැකියා / ජීවන වෘත්තීන්වල නියැලී සිටින ප්‍රජාවන්ගේ රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීමේ අරමුණින් "රැකියා සුරක්ෂිතභාවය ඉහළ නැංවීම" යටතේ රු. මිලියන 38.41ක් වෙන් කරන ලදී.**

මෙහිදී අග්‍රිම ලැබීම ප්‍රමාද වීම නිසා 2022 වසර අවසානය වන විට අපේක්ෂා කළ ප්‍රගතිය ලබා ගැනීමට නොහැකි විය.

- **2022 වසරේ කාර්මික හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ජයග්‍රහණයන්**

- **වෘත්තීය පුහුණු ආයතන හා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර මනා සම්බන්ධීකරණයක් ඇතිකරලීමට 2021.02.09 දින මෙම අමාත්‍යාංශය හා විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය අතර විදේශ ශ්‍රම වෙළඳපළ ඉලක්ක කරගත් නිපුණ ශ්‍රම බලකායක් සැපයීම සඳහා වන අවබෝධතා ගිවිසුම අත්සන් තබා ඇත. ඒ අනුව 2022 වර්ෂයේදී මැදපෙරදිග කලාපයේ පැවති සූපවේදය,ආහාර පාන සේවා, ජල නල කාර්මික, ශීතකරණ හා වායු සමීකරණ, වෑද්දුම් ශිල්පය, විදුලි කාර්මික යන වෘත්තීය ක්ෂේත්‍රවල පුරප්පාඩු සඳහා පුහුණුලාභීන් 1,084 දෙනෙකුගේ තොරතුරු විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත යොමු කරන ලදී.**

- **ජපන් රජය හා ශ්‍රී ලංකා රජය අතර 2019 අප්‍රේල් 1 දින අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම අනුව ජපන් රජය විසින් ලබා දී ඇති "විශේෂිත නිපුණ ශ්‍රමික"(Specified Skilled Worker) වැඩසටහන ඉලක්ක කරගත් ජපන් භාෂා පාඨමාලා හා වෘත්තීය නිපුණතා පාඨමාලා ආරම්භ කිරීම සඳහා වෘත්තීය පුහුණු ආයතන වෙත මඟපෙන්වීම සිදුකර ඇත. ඊට සමගාමීව හෙද සත්කාර සේවා හා ආහාර සේවා යන ක්ෂේත්‍රවලට අදාළව වෘත්තීය නිපුණතාවය සහිත පුහුණුලාභීන් 279 දෙනෙකු සඳහා පළාත්සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය සමඟ සහයෝගීතාවයෙන් ජපන් භාෂා පුහුණු පාඨමාලාවක් 2022.05.21 දින සිට ආරම්භ කරන ලද අතර එම පාඨමාලාව සාර්ථකව අවසන් කළ පුහුණුලාභීන් ජපන් භාෂා පදනම් විභාග සඳහා ඉදිරිපත් වීමට නියමිතය.**

  මීට අමතරව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය පහත සඳහන් පාඨමාලා දියත් කර ඇත.

	ආයතනය	පාඨමාලාව	පවත්වන මාධ්‍යය	සිසුන් ගණන
01	**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**	**ජපන් භාෂාව**	**මධ්‍යස්ථානගත**	**1,052**
		හෙද සත්කාර සේවා	**මධ්‍යස්ථානගත**	**393**
		ආහාර හා භෝජනාගාර සේවා	**මධ්‍යස්ථානගත**	**780**
02	**ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය**	**ජපන් භාෂාව**	**මාර්ගගත**	**140**

- **දකුණු කොරියාවේ E7 වීසා කාණ්ඩය යටතේ පවතින රැකියා අවස්ථා ඉලක්ක කර ගෙන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙහි K-Tech මධ්‍යස්ථානය මඟින් නැව් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වෑද්දුම් ශිල්පීන් 115 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් ආරම්භ කර ඇත.**

- දේශීය හා විදේශීය රැකියා අපේක්ෂාවෙන් පසුවන රාජ්‍ය සේවයේ නියුක්තිකයන්ට හා අනෙකුත් පුද්ගලයන්ට මහපෙන්වීමේ අරමුණින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් ආරම්භ කරනු ලැබූ **Integrated Guidance and Referral System (IGRS)** සම්බන්ධයෙන් වන කම්ටුව නියෝජනය කරමින් ඊට අදාළ කටයුතු සඳහා සහය විය. ඒ අනුව මේ වන විට විදේශ රැකියා අවස්ථා බහුලව පවතින ක්ෂේත්‍රයන් හඳුනාගෙන ඇති අතර ඊට අදාළ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමට හා හඳුනාගනු ලබන නිපුණතා අවශ්‍යතාවයන් සඳහා අමාත්‍යාංශය යටතේ ඇති පුහුණු ආයතන ජාලය සූදානම් කිරීමට නියමිතය.

- **13** වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහනෙහි පස්වන අදියර යටතේ ළමුන් **2,973**ක ප්‍රමාණයක් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා වෘත්තීය පුහුණුව සඳහා **VTA, NAITA, OCUSL** හා **DTET** ආයතන වෙත යොමු කර ඇත.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ශ්‍රම වෙළඳපල ඉල්ලීම් සපුරාලන උසස් තත්වයේ තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව මඟින් රැකියාගත කිරීම වැඩි කිරීමේ අරමුණින් "ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලා සඳහා ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය" යටතේ ඇමරිකානු ඩොලර් මිලියන **4** ක ප්‍රදානයක් කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය **(KOICA)** විසින් ලබා දී ඇත.ඒ අනුව කොරියානු ජනරජයේ කොරියානු ජාත්‍යන්තර නියෝජිතායතනය,අධ්‍යාපන අමාත්‍යාංශය සහ නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය අතර ගිවිසුම **(Record of Discussion) 2021** දෙසැම්බර් මස **03** වන දින අත්සන් කරන ලදී.

- උසස් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ නියැලී සිටින සිසුන්හට (ජාතික වෘත්තීය සුදුසුකම් **(NVQ 5,6** සහ **7)** වෘත්තීය මාර්ගෝපදේශනය සහ රැකියා සඳහා ගැළපෙන සේවාවන් පිළිබඳ උපදෙස් ලබාදෙන මාර්ගගත පසුබිමක් සකස් කිරීම අරමුණු කරගනිමින් ඇමරිකානු ඩොලර් මිලියන **6**ක පිරිවැයක් යටතේ ආරම්භ කිරීමට නියමිත **TVET Career Platform Project in Sri Lanka** ව්‍යාපෘතියට අදාලව කොරියානු ජනරජයේ කොරියානු ජාත්‍යන්තර නියෝජිතායතන හා අධ්‍යාපන අමාත්‍යාංශය අතර ගිවිසුම **(Record of Discussion) 2022.10.18** වන දින අත්සන් කරන ලදී.

- **YouLead** ව්‍යාපෘතිය හරහා ව්‍යාපෘති ශ්‍රම බලකාය සංවර්ධනය කරන ලද අතර **2022** වර්ෂයේ එම පුද්ගලයන් සංඛ්‍යාව **22,777**ක් විය. මීට අමතරව වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන පුහුණු වැඩසටහන් ද මෙම ව්‍යාපෘතිය හරහා සිදු කර ඇති අතර එහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව **35,842**ක් විය. එසේම **1,186**ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වෘත්තිකයන් සඳහා වැඩසටහන් පවත්වා ඇති අතර වෘත්තීය පුහුණුකරුවන් **953**ක් සඳහා පුහුණු අවස්ථා ලබා දෙන ලදී.

- වෘත්තීය අධ්‍යාපනයට යොමු වන ශිෂ්‍ය සංඛ්‍යාව දෙගුණ කරමින් තරුණ ප්‍රජාව සඳහා වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම අරමුණු කර ගෙන වෘත්තීය පුහුණුවේ යෙදෙන සිසුන් සඳහා ක්‍රියාත්මක වන "නිපුණතා සිසු සවිය" ශිෂ්‍යාධාර වැඩසටහන යටතේ සිසුන් **41,623**ක් සඳහා රුපියල් මිලියන **388**ක ශිෂ්‍යාධාර ලබා දී ඇත.

- මාතර ජර්මානු කාර්මික විද්‍යාලය ඉදිකිරීම සඳහා වූ මාතර ඉඩම අමාත්‍යාංශය වෙත පවරාගැනීමට අවශ්‍ය පියවර ගැනීම හා ජර්මානු රජයේ යූරෝ මිලියන **15.7**ක ණය ආධාර සඳහා එකඟතා ඇති කර ගැනීම සඳහා ජර්මානු රජය සහ ශ්‍රී ලංකා රජය අතර **2022.01.27** දින ණය ගිවිසුම අත්සන් කරන ලදී. ඊට සමගාමීව අමාත්‍යාංශය සහ ජර්මනියේ **KFW** මූල්‍ය ආයතනය සමග ගිවිසුමක් **(separate agreement) 2022.03.30** දින අත්සන් කරන ලදී.

- ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පනත සංශෝධනය සම්බන්ධ ලේඛන නීති කොටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම හා ඊට අදාල සාකච්ඡා පැවැත්වන ලදී.

- **GIZ Vocational Training in Sri Lanka** ව්‍යාපෘතිය යටතේ යූරෝ මිලියන **7** ප්‍රදානය මඟින් කිලිනොච්චි ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය **(SLGTI)** ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ ඇති තෝරාගත් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සහ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය සඳහා

පුහුණු ද්‍රව්‍ය හා පුහුණු උපකරණ ලබා දීම, පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම/ ප්‍රවර්ධනය කිරීම සිදු වෙමින් පවතී.

- ඕස්ට්‍රේලියානු රජයේ ආධාර වැඩසටහන යටතේ ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 12ක මූල්‍ය ප්‍රදානයක් මත ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ අන්තර්ගෘහිත ආර්ථික වර්ධනයක් සඳහා නිපුණතා ව්‍යාපෘතියේ (S4IG) දෙවන අදියර (අවුරුදු 4) සඳහා 2022 පෙබරවාරි මස කැබිනට් මණ්ඩල අනුමැතිය ලද අතර, 2022.03.31 දින ශ්‍රී ලංකා රජය හා ඕස්ට්‍රේලියානු රජය අතර ගිවිසුම් අත්සන් කරමින් වැඩ ආරම්භ කරන ලදී.

- "ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ පර්යේෂණ ධාරිතාව වර්ධනය කිරීම හා විශ්වවිද්‍යාලය ගොඩනැගීම සම්බන්ධව යෝජිත සහනදායී ණය පහසුකම් ලබා ගැනීමේ ව්‍යාපෘතියේ" ප්‍රධාන සැලැස්ම (Master Plan) සකස් කර ඇත. එසේම විශ්වවිද්‍යාලය ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් ලබා ගත් පාරිසරික ඇගයීම් වාර්තාව සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත. එසේම කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල (ECDF) විසින් ලබාදෙන ඇමරිකානු ඩොලර් මිලියන 84.934 ක සහනදායී ණය අරමුදල ලබා ගැනීම හා ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීම වෙනුවෙන් පාරිසරික ඇගයීම් වාර්තාවද සමඟ 2022.12.09 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

- වැඩහල්වල වෘත්තීය පුහුණුව ලබන සිසුන් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටලයක් (Overall Kit) ලබා දීමේ වැඩසටහන යටතේ ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය හා විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි පුහුණුව ලබන සිසුන් වෙත ආරක්ෂක ඇඳුම් කට්ටල 40,000ක් ලබා දෙන ලදී.

- පාසල් ළමුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ දිස්ත්‍රික්ක 25 ආවරණය වන ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් නිපුණතා සංවර්ධන නිලධාරීන්ගේ දායකත්වයෙන් අ.පොෂ. (සෘ/පෙළ) සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 1,738ක් පවත්වා ඇත. එසේම අ.පොෂ. (උ/පෙළ) සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 1,157ක් පවත්වා ඇත. එසේම පාසැල් හැරගිය තරුණ කණ්ඩායම් සඳහා වෘත්තීය පුහුණුව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 2,617ක් සිදු කර ඇත.

- කර්මාන්ත ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සම්බන්ධීකරණය, ස්වයං රැකියා දිරිගැන්වීම, රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම, ප්‍රජා නායකයින් දැනුවත් කිරීම, දහම්පාසල් ගුරුවරුන් දැනුවත් කිරීම, ගුරුවරුන් දැනුවත් කිරීම, දෙමාපියන් දැනුවත් කිරීම, ශ්‍රමිකයන් දැනුවත් කිරීම, විදුහල්පතිවරුන් දැනුවත් කිරීම හා RPL පිළිබඳ දැනුවත් කිරීම සඳහා අදාල වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදු කරන ලදී.

- මනෝමිතික පරීක්ෂණ අර්ථකථනය සඳහා නිපුණතා සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් උතුරු, නැගෙනහිර, බස්නාහිර, දකුණ, වයඹ, මධ්‍යම හා උතුරු මැද පළාත් තුළ පවත්වන ලදී.

- "බිම් මට්ටමින් ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන" යටතේ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ගම්වාසීන්ට වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම, වෘත්තීය පුහුණුවට යොමු කිරීම, රැකියා විරහිත තරුණ තරුණියන් හඳුනා ගැනීම හා ඔවුන්, RPL ක්‍රමවේදය සහ SEPI ණය යෝජනා ක්‍රමය පිළිබඳ දැනුවත් කරන ලදී. එසේම හඳුනාගත් වෘත්තීය පුහුණුලාභීන් රැකියාගත කිරීම හා ව්‍යායවසායකයන් බවට පත් කිරීම අරමුණු කර ගනිමින් මෙහි පළමු නියමු ව්‍යාපෘතිය ලෙස කෑගල්ල දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී 2022.08.14 දින මෙම වැඩසටහන පවත්වන ලදී.

- රාජ්‍ය, රාජ්‍ය නොවන හා ප්‍රජා පදනම් කරගත් සංවිධාන අතර සහයෝගිතාවය වර්ධනය කර ගැනීම සඳහා දිස්ත්‍රික් මෙහෙයුම් කමිටු හා ඊට අදාල අනුකමිටු 7ක් පිහිටුවීම සිදු කරන ලදී.

ජාතික වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන මධ්‍යස්ථානය 2022 ජනවාරි මස සිට දෙසැම්බර් මස 31 දක්වා පැවැත් වූ වැඩසටහන්

අනු අංකය	වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	අ.පො.ස (උ.පෙළ) සිසුන් සඳහා	2,499
02	අ.පො.ස (සා.පෙළ) සිසුන් සඳහා	192
03	පාසල් සිසුන් සඳහා	1,107
04	රැකියා සොයන්නන් සඳහා	276
05	වෙනත් වැඩසටහන්	1,594
	මුළු සංඛ්‍යාව	5,668

ජාතික වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන මධ්‍යස්ථානය පැවැත්වූ වෙනත් වැඩසටහන්

- 2022.01.03 -2022.01.31 දක්වා වයඹ පළාත කේන්ද්‍ර කර ගනිමින් කුරුණෑගල දිස්ත්‍රික්කය සහ පුත්තලම දිස්ත්‍රික්කයන්හි පාසල් සිසුන්, පාසල් හැර ගිය තරුණ තරුණියන් ඇතුළු සමස්ත ප්‍රජාව දැනුවත් කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

- කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කයන්හි සියලුම වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් පුහුණු කිරීමේ දෙදින වැඩසටහන පැවැත්වීම. (2022.03.03 සහ 2022.03.04)

- 2022.04.01, 02 සහ 03 යන දිනයන්හිදී අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පවත්වන ලද Colombo Education Fair 2022 අධ්‍යාපනික ප්‍රදර්ශනයේදී ජාතික වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන මධ්‍යස්ථානයේ ප්‍රදර්ශන කුටියක් පැවැත්වීම.

- වෘත්තීය මාර්ගෝපදේශනයට අදාලව දිවයින පුරා සේවාලාභීන්ට අවශ්‍ය සියළු වෘත්තීය මග පෙන්වීම දුරකථනය ඇමතුම් මඟින් සිදු කිරීම.

- ජාතික වෘත්තීය මාර්ගෝපදේශ සහ උපදේශන මධ්‍යස්ථානය වෙත පැමිණෙන පාසල් සිසුන්, ගුරුවරුන්, දෙමාපියන්, තරුණ තරුණියන්, විශ්වවිද්‍යාල සිසුන්, රාජ්‍ය නිලධාරීන්, පෞද්ගලික අංශය, විශ්‍රාමිකයින් සහ පූජ්‍ය පක්ෂයේ සේවාලාභීන් සඳහා පුද්ගලික වෘත්තීය මාර්ගෝපදේශන සැසි පැවැත්වීම.

2.1.2. පර්යේෂණ සහ නව නිපැයුම් අංශය

පර්යේෂණ සහ නව නිපැයුම් සඳහා පහසුකම් සැපයීම

මෙය පර්යේෂණ සහ නව නිපැයුම් අංශයේ එක් ප්‍රමුඛතා කාර්යයක් වන අතර රට තුළ සිදුකෙරෙන පර්යේෂණ පිළිබඳ දත්ත ලබා ගැනීම, එලෙස ලබාගත් දත්තයන් ගබඩා කිරීම, එවන් පර්යේෂණ සඳහා පහසුකම් සපයා දීම මෙන්ම ඒ සඳහා වෙළඳපලක් නිර්මාණය කර දීම මේ යටතේ අපේක්ෂා කෙරේ. ඉහත කී අරමුණු සපුරා ගැනීම උදෙසා පහත වැඩසටහන් ක්‍රියාවට නැංවිණි.

- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක පර්යේෂණ ආයතන මගින් සහ ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික සහයෝගීතා පර්යේෂණ යටතේ සිදුකෙරෙන පර්යේෂණ කාර්යයන්, කළමනාකරණය සහ ඇගැයීම සඳහා ක්‍රියාපටිපාටියක් ස්ථාපනය සහ පවත්වාගෙන යාම

  අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන මඟින් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ ව්‍යාපෘතීන් සමාලෝචනය සඳහා ආයතනික පර්යේෂණ කළමනාකරණ සහ ඇගැයීම් කමිටුවක් පත්කරනු ලැබිණි. එහි පළමු කමිටු රැස්වීම 2022 අප්‍රේල් මසදී පවත්වනු ලැබිණි. ජාතික පර්යේෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව (NPD) වෙත යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිණි.

- කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 හා අනුකූලව පර්යේෂණ දීමනා ගෙවීම් කිරීම සඳහා පර්යේෂණ ව්‍යාපෘති සමාලෝචනය

  චක්‍රලේඛ අංක 02/2014 හා අනුකූලව පර්යේෂණ ව්‍යාපෘති 28ක් ඇගයීමට ලක්කරනු ලැබිණි. දැනට ක්‍රියාත්මක කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2014 සඳහා සංශෝධන සිදුකරනු පිණිස සමාලෝචන කමිටුවක් පත්කරනු ලැබිණි.

විද්‍යාව හා තාක්ෂණය ප්‍රචලිත කිරීමේ වැඩසටහන

රටෙහි පාසල් සිසුන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සහ සාමාන්‍ය ජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කිරීම සහ විද්‍යා සහ පර්යේෂණ අංශය හා සබැඳි විවිධ රැකියාවන් නිර්මාණය කරදීම මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වේ. ඉහත කී අරමුණු සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කෙරෙන විවිධ වැඩසටහන් පිළිබඳ තොරතුරු සහ ඒවායේ ප්‍රගතිය පහත පරිදි වේ.

- 2022 ජාතික විද්‍යා දිනය සහ ජාතික විද්‍යා සතිය සමරනු පිණිස අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන සමඟ සහයෝගීතාවයෙන් වැඩසටහන් සංවිධානය කිරීම.

- මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සහ භෞතිකව එක් වූ විද්‍යාඥයින්, ආයතන ප්‍රධානීන් සහ පාසල් සිසුන් ඇතුළු 500 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ගරු අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන්, ඉසුරුපාය ශ්‍රවණාගාරයේදී "තිරසර හෙටක් උදෙසා විද්‍යාව, දේශීය බව මුසු වූ ගෝලීය ප්‍රවණතා" යන තේමාව යටතේ ජාතික විද්‍යා දින උත්සවය සාර්ථකව පවත්වන ලදී.

- ජාතික විද්‍යා සතිය සමරනු පිණිස සියලුම ආයතන විසින් සංවිධානය කරනු ලැබූ වැඩසටහන් සම්බන්ධීකරණය කරනු ලැබිණි.

- අධ්‍යාපනික විනෝදාස්වාදාත්මක ක්‍රියාකාරකම්

  පුවත්පත් ලිපි තරගයක් සංවිධානය කිරීම සහ විද්‍යා ඊ-පුවත් වෙබ් අඩවියෙහි ලිපි පල කිරීම.

  ICTA ආයතනයේ මාර්ගෝපදේශකත්වය යටතේ අමාත්‍යාංශය විසින් විද්‍යා ඊ-පුවත් වෙබ් අඩවිය වැඩිදියුණු කරනු ලැබිණි. ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත ගරු අමාත්‍යතුමන් විසින් නොවැම්බර් 10 දින ජාතික විද්‍යා දින සැමරුමෙහි ප්‍රධාන අංගයක් ලෙස මෙම වෙබ් අඩවිය දියත් කරනු ලැබිණි.

  විද්‍යා ඊ-පුවත් ලිපි තරගය ක්ෂේත්‍ර 10ක් යටතේ පවත්වනු ලැබූ අතර විශේෂඥ ඇගයුම් කමිටුවක් විසින් ලිපි තේරීම සිදු කෙරිණි. තෝරා ගනු ලැබූ ලිපි විද්‍යා ඊ-පුවත් වෙබ් අඩවියෙහි පල කරනු ලැබිණි.

- විද්‍යා ඊ පුවත්පත

  2022 ජාතික විද්‍යා දිනය සැමරීම හා සමගාමීව සී/ස ලංකා එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම හා එක්ව මුද්‍රිත පිටපත වෙනුවට විද්‍යා ඊ-පුවත්පත පල කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, අතිරේක ලේකම් (සංවර්ධන හා නවෝත්පාදන) විසින් ලේක්හවුස් පරිශ්‍රයේදී ඊ පුවත්පත දියත්කරනු ලැබූ අතර එම අවස්ථාව සඳහා

දෙපාර්ශ්වයේම සහභාගීත්වය හිමි විය. නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ පුවත්පත් දෙකක් නිකුත් කෙරිණි.

- විද්‍යා දැනුම හුවමාරු කර ගැනීම සඳහා විවිධ ප්‍රදර්ශන සහ මාධ්‍ය පදනම් කරගත් වැඩසටහන් සංවිධානය කිරීම.

2022 ජාතික විද්‍යා දිනය පදනම් කර ගත් රූපවාහිනී සාකච්ඡාමය වැඩසටහන් 03ක් විකාශය කරන ලදී.

- සඳ ටීවී - අමාත්‍යාංශය
- සිරස ටීවී – ජාතික මෙහෙවර
- ජාතික රූපවාහිනිය – ඉරිදා ආයුබෝවන්

ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව ක්‍රියාත්මක කිරීම - (NRDF)

ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව යාවත්කාලීන කිරීම පිලිබඳ සාකච්ඡා කරනු පිණිස ජාතික විද්‍යා සහ තාක්ෂණ කොමිෂන් සභාව (NASTEC) සමඟ හමුවක් පැවැත්වීමට අමාත්‍යාංශය විසින් කටයුතු කරන ලදී. ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව යාවත්කාලීන කිරීම පිලිබඳ ප්‍රගතිය සහ ඒ ආශ්‍රිතව පැන නැඟ ඇති ගැටලු සම්බන්ධයෙන් ලේකම්වරයා දැනුවත් කරමින් වාර්තාවක් ඉදිරිපත් කෙරිණි. තවද, ජාතික විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන රාමුව ලෙස ජාතික විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබ ඇත.

නවීන විද්‍යා හා තාක්ෂණ පුහුණුව

ICTA ආයතනය සහ අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ සහයෝගීතාවය යටතේ අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ස්වාධීන අර්ධකාලීන රැකියා (freelancer) සංවර්ධන වැඩසටහනක් සාර්ථකව පවත්වන ලදී. 2022 ජාතික විද්‍යා දිනය හා සමගාමීව අමාත්‍යාංශ නිලධාරීන් සහ පාසල් සිසුන් සඳහා ස්ලින්ටෙක් විවෘත දිනය සාර්ථකව පවත්වනු ලැබිණි. (නිනිති තාක්ෂණය භාවිතය පිළිබඳ දනුම්වත් කිරීමේ වැඩසටහන)

ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සහයෝගීතාවයන් යටතේ ඇති කර ගනු ලැබූ විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවන්

- ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන

මෙම අමාත්‍යාංශය විසින් ඉන්දියානු රජයේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීතා වැඩසටහනක් (PoC) ආරම්භ කරනු ලැබ ඇති අතර ඒ හරහා දෙරටෙහි විද්‍යාඥයින් සඳහා ඒකාබද්ධ සහයෝගීතා පර්යේෂණ සහ වැඩමුළු සඳහා සහභාගී වීමටත් දෙරටෙහි පවතින පහසුකම් භාවිතය සඳහා චාරිකාවන්හි නියැලීමටත් අවස්ථාව උදාවේ.

- ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන-2019

තෝරාගනු ලැබූ පර්යේෂණ යෝජනා 08ක් සහ වැඩමුළුවක් සඳහා ප්‍රතිපාදන ප්‍රදානය කිරීම

තෝරාගනු ලැබූ පර්යේෂණ යෝජනා 08ක් සහ වැඩමුළුවක් සඳහා අමාත්‍යාංශය සහ පර්යේෂණ ආයතන අතර හවුල් ගිවිසුම් අත්සන් තබන ලදී. පර්යේෂණ ව්‍යාපෘති 8ක් සහ වැඩමුළු 01ක් සඳහා පළමු සහ දෙවැනි කාර්තුමය ගෙවීම් නිදහස් කරනු ලැබ ඇති අතර හවුල් වැඩසටහන්හි ප්‍රගතිය සමාලෝචනය කරනු පිණිස කමිටුවක් පත් කරනු ලැබිණි.

- ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන-2017

ශ්‍රී ලංකා සහ ඉන්දියානු පාර්ශ්වයන් අතර 05 වන ඒකාබද්ධ කමිටුව 2022.01.18 දින පැවැත්විණි.

ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන-2017 යටතේ තෝරාගනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘති 17ක් සම්පූර්ණ කරනු ලැබ අවසන් වාර්තා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එම ව්‍යාපෘති පිලිබඳ අවසන් ප්‍රගති සමාලෝචනයන් 2022.03.08 සහ 2022.10.03 දිනයන්හිදී සිදු කෙරිණි. මෙම වැඩසටහන යටතේ සිදු කරනු ලැබූ පර්යේෂණයන් හරහා විද්‍යාත්මක ජර්නල් ප්‍රකාශන 28ක්, විද්‍යා සම්මන්ත්‍රණ පත්‍රිකා 211ක් සහ සාරාංශ 21ක් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත.

- න්‍යෂ්ටි පර්යේෂණ පිලිබඳ යුරෝපා සංවිධානයෙහි (CERN) අධිශක්ති භෞතික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධි වැඩසටහන

  තරුණ ශ්‍රී ලාංකීය විද්‍යාඥයින් සහ පර්යේෂකයින් සඳහා අධිශිෂ්‍යත්ව පිරිනැමීමේ අරමුණින් න්‍යෂ්ටික පර්යේෂණ පිලිබඳ යුරෝපා සංවිධානය (CERN) සමඟ මෙම වැඩසටහන ආරම්භ කරන ලදි. ඒ අනුව ,2018 සිට 2022 දක්වා කාල සීමාව තුල පශ්චාත් උපාධි සිසුන් 04 දෙනෙකු සඳහා න්‍යෂ්ටික පර්යේෂණ පිලිබඳ යුරෝපා සංවිධානයෙහි සිය ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු සිදුකිරීමේ අවස්ථාව සලසා දෙන ලදී.

  සිය ආචාර්ය උපාධියෙහි අවසන් වසරෙහි අධ්‍යයන කටයුතු සඳහා න්‍යෂ්ටික පර්යේෂණ පිළිබඳ යුරෝපා සංවිධානය වෙත සංචාරය කිරීමට මෙම පශ්චාත් උපාධි සිසුන් 04 දෙනා සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙනු ලැබිණි. මෙම පශ්චාත් උපාධි සිසුන් 04 දෙනා විසින් ඒ වෙනුවෙන් දරනු ලැබූ වියදම් ප්‍රතිපූර්ණය සිදු කරනු ලැබ ඇත. න්‍යෂ්ටික පර්යේෂණ පිලිබඳ යුරෝපා සංවිධානය වෙත සිදු කල යුතු අනිවාර්ය ගෙවීම් සිදු කර ඇත. න්‍යෂ්ටික පර්යේෂණ පිළිබඳ යුරෝපා සංවිධානයෙහි සිය අධ්‍යයන කටයුතුවල නිරතව සිටින ආචාර්ය උපාධි සිසුන් විසින් 2022 වසර තුලදී පර්යේෂණ ලිපි 57ක් ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කර ඇත.

  මෙම පශ්චාත් උපාධි සිසුන් සිව්දෙනාගේ සහභාගීත්වයෙන් උසස් පෙළ විද්‍යා විෂය ධාරාව යටතේ ඉගැන්වීම් සිදුකරන ගුරුවරුන් සඳහා අංශු භෞතික විද්‍යාව පිළිබඳ දීප ව්‍යාප්ත වෙබිනාර් මාලාවක් සිදු කරනු ලැබූ අතර න්‍යෂ්ටික පර්යේෂණ පිලිබඳ යුරෝපා සංවිධානයෙහි විද්‍යාගාරයන්හි දී අධිශක්ති භෞතික විද්‍යාව පිළිබඳ ලබාගත් ඔවුන් ලද දැනුම ප්‍රවර්ධනය, භාවිතයට ගැනීම සහ බෙදාදීම අරමුණු කර ගනිමින් මෙය සිදුකෙරිණි.

- ශ්‍රී ලංකාව තුළ ක්‍රියොටයිල් ඇස්බැස්ටස්හි ආරක්ෂිත භාවිතය පිළිබඳ තේමා ගත පර්යේෂණ වැඩසටහන

  ශ්‍රී ලංකාවේ කර්මාන්තයන්හි, ඉදිකිරීම් වැඩබිම්හි මෙන්ම අවසන් පාරිභෝගික මට්ටම් දක්වා ඇස්බැස්ටස් භාවිතයෙහි හිතකර සහ අහිතකර තත්ත්වයන් පිළිබඳ පර්යේෂණ කණ්ඩායම් 4ක් විසින් සකසනු ලැබූ අවසන් වාර්තාව පදනම් කර ගනිමින් අමාත්‍යාංශය සහ රුසියාවේ යූරල් වාණිජ මණ්ඩලය අතර ඇති කරගනු ලැබූ සහයෝගීතාවන්හි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාව තුල ක්‍රියොටයිල් ඇස්බැස්ටස් හි ආරක්ෂිත භාවිතය පිළිබඳ රුසියානු හා ශ්‍රී ලාංකීය නියෝජිතයින්ගෙන් සැදුම් ලත් ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කරනු ලැබිණි.

  ඒ අනුව, පර්යේෂණ ව්‍යාපෘති 4ක් අවසන් කරනු ලැබ 2022.08.22 දින ජාතික පර්යේෂණ සභා පරිශ්‍රයේදී අවසන් පර්යේෂණ ඉදිරිපත් කිරීම් සිදු කරනු ලැබිණි. තවද, ක්‍රියාකාරී කණ්ඩායමේ අවසන් වාර්තාව සහ අවසන් පර්යේෂණ වාර්තා 4 ගරු අධ්‍යාපන අමාත්‍යතුමන් වෙත පිරිනැමීම ක්‍රියාකාරී කණ්ඩායම විසින් 2022.08.23 දින සිදු කෙරිණි. ගරු අධ්‍යාපන අමාත්‍යතුමන්, රුසියානු සමූහාණ්ඩුවේ තානාපතිතුමන් සහ ක්‍රියාකාරී කණ්ඩායම අතර හමුවක් 2022.08.31 දින පැවැත්විණි.

- ශ්‍රී ලංකාව සඳහා වන ඉන්දියානු විද්‍යා හා පර්යේෂණ අධි ශිෂ්‍යත්ව (ISRF) වැඩසටහන

  මෙම වැඩසටහනෙහි අරමුණ වනුයේ ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, භූතානය, මාලදිවයින, මියන්මාරය, නේපාලය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන අසල්වැසි රටවල්හි විද්‍යාඥයින් සහ පර්යේෂකයින් සඳහා ප්‍රමුඛ පෙලේ ඉන්දියානු පර්යේෂණ විද්‍යාගාර සහ අධ්‍යාපනික ආයතනයන්හිදී

ඉංජිනේරු සහ වෛද්‍ය විද්‍යාව ඇතුළු විද්‍යා සහ තාක්ෂණ අංශය හා සබැඳි ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්හි නූතන පර්යේෂණ ක්ෂේත්‍ර පිලිබඳ කටයුතු කිරීමේ අවස්ථාව සලසාදීමය.

2021/2022 ඉන්දියානු විද්‍යා හා පර්යේෂණ අධි ශිෂ්‍යත්ව **(ISRF)** වැඩසටහන සඳහා කැඳවීම් ඉන්දියානු පාර්ශ්වය වෙතින් **2022.02.18** දින ලද අතර සිංහල, දමිළ සහ ඉංග්‍රීසි භාෂා වලින් ජාතික පුවත්පත්හි දැන්වීම් පළ කෙරිණි. ඒ අනුව, අයදුම්කරුවන් **17** දෙනෙකු අතරින් **10** දෙනෙකු සඳහා අධි ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබිණි.

2022/2023 ඉන්දියානු විද්‍යා හා පර්යේෂණ අධි ශිෂ්‍යත්ව **(ISRF)** වැඩසටහන සඳහා කැඳවීම් **2022.09.02** දින ලද අතර සිංහල, දමිළ සහ ඉංග්‍රීසි භාෂා වලින් අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි දැන්වීම් පල කෙරිණි.

- අත්සන් තබන ලද සහ ආරම්භ කරනු ලැබූ ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම්

  2022.03.30 දින පැවති බෙංගාල බොක්ක ආශ්‍රිත කලාපයේ බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ මූලාරම්භයේ **(BIMSTEC)** පස්වන සමුළුවේදී ශ්‍රී ලංකාව තුළ **BIMSTEC** තාක්ෂණ පැවරුම් පහසුකමක් ස්ථාපනය සඳහා සාංගමික සංස්ථා පත්‍රයක් අත්සන් තැබිණි.

- ඉන්දියානු සාගර කලාපීය සංගමය **(IORA)**

  ඉන්දියානු සාගර කලාපීය සංගමය **(IORA)** යටතේ ශ්‍රී ලාංකීය ක්‍රියාකාරී කණ්ඩායම හා අදාළ කාර්යයන් සම්බන්ධීකරණය කරනු ලැබූ අතර ඉන්දියානු සාගර කලාපයේ සමුද්‍රීය පර්යේෂණ උදෙසා පහත සංකල්ප සටහන් සකස් කිරීම සිදුකෙරිණි.

  - ඉන්දියානු සාගර කලාපයේ තෝරාගනු ලැබූ රෝපණ විභව්‍යතා සහිත ජීවී විශේෂයන්හි උෂ්ණත්ව දරාගැනීමේ මට්ටම් තීරණය කිරීම පිළිබඳ සංකල්ප සටහන
  - ආර්ථික වශයෙන් වැදගත් සමුද්‍රීය මත්ස්‍යයින්ගේ සංක්‍රමණ ගමන් මාර්ග හඳුනා ගැනීම පිළිබඳ සංකල්ප සටහන

  ඉහත සංකල්ප සටහන් ඉන්දියානු සාගර කලාපීය සංගමයෙහි ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අතර ඔවුන්ගේ අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ.

පොහොර වර්ග වැඩි දියුණු කිරීම සහ පාංශු කළමනාකරණය හරහා නිසරු වූ බිම් සාරවත් භාවයට පත්කිරීම

රසායනික පොහොර වෙනුවට පූර්ණ වශයෙන් ජෛව පටල ජෛව පොහොර **(BFBF)** භාවිතයට ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීමට සහ ජෛව පටල ජෛව පොහොර **(BFBF)** භාවිතය **100%**ක් කාබනික තත්ත්වයට පත් කරනු පිණිස ජෛව පටල ජෛව පොහොර **(BFBF)** ඝන සහ දියර ආකාරයන් සමඟ **NPK (CF)** රසායනික පොහොර සහ තෝරාගනු ලැබූ, හොඳ තත්ත්වයේ කාබනික පොහොර පරීක්ෂාවන් **2022** වසර තුළදී සිදුකෙරිණි.

මෙම භාවිතය පරීක්ෂා කර බැලීම සඳහා සිදුකරනු ලැබූ පළමු පරීක්ෂාව මෙය වූ අතර පරීක්ෂාව සිදුකිරීම උතුරු සහ නැගෙනහිර පළාත්වලට සීමාවිය. මෙයට අමතරව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ **(DOA)** ඉල්ලීම මත, වී වගාවේදී **BFBF** හි සාර්ථකත්වය පිළිබඳ සොයාබැලීම සඳහා පැල්වෙහෙර සහ වවුනියා යන ප්‍රදේශවල පිහිටි කෘෂිකර්ම පාසල්හිදී පරීක්ෂා දෙකක් සිදුකෙරිණි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි, ආනයනය කරනු ලැබූ ට්‍රිපල් සුපර් පොස්ෆේට් **(TSP)** වෙනුවට ජෛව පටල මගින් පිළියම් කරනු ලැබූ එප්පාවල පොස්ෆේට් **(Biofilm-ERP)** භාවිතයට ගැනීමේ හැකියාව පරීක්ෂා කර බැලීම සඳහා සමන්තුරේහි පිහිටි සහල් පර්යේෂණ මධ්‍යස්ථානයේදී තවත් මූලික පරීක්ෂාවක් සිදු කෙරිණි. ඉහත සියලු පරීක්ෂාවන් කුඩා කුඹුරු බිම් කැබැලිවල සිදු කරනු ලැබිණි.

සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය, ව්‍යාපෘති යෝජනාවෙහි සඳහන් කර ඇති පරිදි සූර්ය බල ශක්ති ක්ෂේත්‍රයේ දේශීය විද්‍යාඥයින් සහ කාර්මික ශිල්පීන්ගේ ධාරිතා ගොඩනැංවීමේ ව්‍යාපෘතියකි. අවශ්‍ය පර්යේෂණ යටිතලයන් (උපකරණ) වැඩිදියුණු කිරීම ද මෙම ධාරිතා ගොඩනැංවීම සඳහා අවශ්‍ය කෙරෙන අත්‍යාවශ්‍ය අංගයකි. NVQ 3 සහ 4 මට්ටමේ සූර්ය බලශක්ති කාර්මික ශිල්පී පුහුණුවෙහි පළමු කණ්ඩායම සඳහා අවසන් ඇගයුම් කටයුතු 2022 ජනවාරි මසදී හම්බන්තොට පිහිටි සූර්ය බල ශක්ති උද්‍යානයෙහි දී සාර්ථකව අවසන් කෙරිණි.

අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2022 අගෝස්තු මස පැවති සහතික ප්‍රදානෝත්සවයේදී NVQ 4 මට්ටමේ සහතිකකරණය ලද අපේක්ෂකයින් 34 දෙනෙකු සහ NVQ 3 මට්ටමේ සහතිකකරණය ලද අපේක්ෂකයින් 31 දෙනෙකු සඳහා සහතික පිරිනැමිණි.

NVQ 4 මට්ටමේ පුහුණු වැඩසටහන සඳහා දෙවන කණ්ඩායම ලෙස ලියාපදිංචි වූ සිසුන් 70ක් සඳහා සූර්ය බල ශක්ති උද්‍යානයෙහි දී උසස් පුහුණු වැඩසටහන පැවැත්වීමට කටයුතු කෙරෙමින් පවතී.

ව්‍යාපෘතිය හා සම්බන්ධිත එක් එක් විශ්වවිද්‍යාල සඳහා උපකරණ, රසායනික ද්‍රව්‍ය හා පරිභෝජ්‍ය ද්‍රව්‍ය ලැබී ඇති අතර මේ වනවිට අඩු වියදම්, තුනී පටල සූර්ය කෝෂ සැකසීම සඳහා එම ද්‍රව්‍ය යොදාගැනේ.

ව්‍යාපෘතියෙහි පර්යේෂණ සහකාර නිලධාරීන් ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල සාර්ථකව නියැළී සිටින අතර ඔවුන්ගේ ඇතැම් පර්යේෂණ ප්‍රතිඵලයන් ජාත්‍යන්තර ජර්නලයන්හී ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. එක් පර්යේෂණ සහකාර නිලධාරියෙකුගේ දර්ශනපති උපාධිය සම්පූර්ණ කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (පෞද්) සමාගම (SLINTEC)

ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය විසින් දේශීය ස්වාභාවික සහ මානව සම්පත භාවිතයෙන් නිෂ්පාදන සහ සේවා වැඩිදියුණු කිරීම සඳහා ප්‍රධාන වශයෙන් නිනිති සහ උසස් තාක්ෂණ ක්ෂේත්‍රයේ විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධනයන්හි නියැළී සිටී. දැනට අවධානය යොමු වී ඇති ක්‍රියාකාරී ක්ෂේත්‍ර වනුයේ බලශක්තිය, උසස් ද්‍රව්‍ය, ඛනිජ, සංවේදක, රෙදි පිළි සහ ක්‍රියාවලි, රබර්, ප්ලාස්ටික් සහ බහුඅවයවික, උසස් කෘෂිකාර්මික තාක්ෂණයන් සහ ස්වාභාවික නිෂ්පාදන යනාදියයි. දේශීය සහ ගෝලීය ප්‍රවණතා සහ SLINTEC හි ප්‍රධාන ශක්‍යතාවන් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව මෙම ක්ෂේත්‍රයන් තෝරාගනු ලැබ ඇත. කර්මාන්ත අංශය සහ විශ්වවිද්‍යාල සඳහා උසස් තත්ත්වයේ උපකරණ සේවා සැපයීමද SLINTEC ආයතනය විසින් සිදුකෙරේ.

නිනිති සහ උසස් තාක්ෂණයන් පිලිබඳ විශේෂිතව ගෝලීය මට්ටමේ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයක් ගොඩනැගීම සහ නිනිති තාක්ෂණ සහ විද්‍යා උද්‍යානය තුල සිය පර්යේෂණ පහසුකම් ස්ථාපනය කරනු පිණිස දේශීය සහ ජාත්‍යන්තර සේවාදායකයින් ආකර්ෂණය කරගැනීම SLINTEC වෙත නියෝගාත්මකව පැවරී ඇති කාර්යභාරයකි.

- උපාය මාර්ගික පර්යේෂණ
  - නව්‍ය ග්‍රැෆීන් ව්‍යුත්පන්න-විද්‍යුත් විශල්කිත (Exfoliated) මිනිරන් (EEG) ග්‍රැෆීන් නැනෝ ප්ලේට්ලට්ස් (GNP)

    සියවසකට අධික කාලයක් මුළුල්ලේ නිධි ආශ්‍රිතව ලබාගැනෙන ශ්‍රී ලංකා මිනිරන් සුළු වශයෙන් අගය එක් කිරීම හෝ අගය එක් කිරීමෙන් තොරව ඒවායේ ස්වාභාවික ආකාරයෙන් අපනයනය කිරීම සිදු කෙරේ. මිනිරන්, ග්‍රැෆීන් ඔක්සයිඩ (GO) සහ අවම කරනු ලැබූ ග්‍රැෆීන් ඔක්සයිඩ (rGO) බවට පරිවර්තනය කිරීමේ තාක්ෂණය සාර්ථක ලෙස පවරාදීමෙන් ලත් ප්‍රගතිය අඛණ්ඩව පවත්වා ගනිමින් මිනිරන්, විද්‍යුත් විශල්කිත මිනිරන් (EEG) සහ ග්‍රැෆීන් නැනෝ ප්ලේට්ලට්ස් (GNP) බවට පරිවර්තනය කිරීමේ නව්‍ය ක්‍රියාවලි වැඩිදියුණු කිරීමට SLINTEC ආයතනය සමත්ව ඇත. මෙම තාක්ෂණය පවරාදීම අරමුණු කර ගනිමින් ආයෝජකයින් සඳහා මෙහි සාර්ථකත්වය සනාථ කිරීමේ කාර්යයෙහි දැනට නියුක්තව සිටියි.

- දෙමුහුන් පොහොර : NPK+ නාගරික ඝන අපද්‍රව්‍ය (MSW) සහ b) NPK+ ග්ලිරිසීඩියා පත්‍ර වල /පොතු වල අවශේෂ

  නාගරික ඝන අපද්‍රව්‍ය වලින් සකසනු ලැබූ කොම්පෝස්ට් (ii) ග්ලිරිසීඩියා පත්‍ර වල/ පොතු වල අවශේෂ , සමඟ NPK පොහොර යෝග්‍ය ප්‍රමාණවලින් මිශ්‍ර කිරීම හරහා දෙමුහුන් පෙති දෙවර්ගයක් විද්‍යාගාර මට්ටමින් නිෂ්පාදනය කිරීමට ස්ලින්ටෙක් ආයතනය සමත්ව ඇත. බඩ ඉරිඟු (Zea mays) වගාවේ බඳුන් /ක්ෂේත්‍ර පරීක්ෂාවන් හරහා මෙම දෙමුහුන් පොහොර වර්ග සැලකිය යුතු මට්ටමින් අඩු මාත්‍රාවලින් භාවිතා කිරීමේදී ඒවායේ ක්‍රියාකාරිත්වය අකාබනික පොහොර හා බොහෝ සෙයින් සමාන බවට පෙන්නුම් කර ඇත. නිසරු භාවයට පත් වූ පසෙහි තත්ත්වය සහ සාරවත්භාවයද මෙම පොහොර මඟින් වැඩිදියුණු කෙරේ. අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ බාහිරින් ලබා ගත් පහසුකමක් හරහා නියාමක පරිමාණයෙන් MSW-NPK පෙති නිෂ්පාදනය කිරීමේ කාර්යය සිදු කෙරිණි. වාණිජකරණය කිරීමට පෙර එළඹෙන වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ස්වාධීන ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකිරීමට සැලසුම් කෙරේ.

- ජෛව අඟුරු හා සම්බන්ධිත ක්ෂුද්‍ර ජීවී ප්‍රජාවන් හරහා පසෙහි ශාක සඳහා ලබාගත හැකි පොස්පරස් හා නයිට්‍රජන් මට්ටම් වැඩිදියුණු කිරීම

  නයිට්‍රජන් තිරකිරීම සහ නිසරුභාවයට පත්වූ පසෙහි අක්‍රියව පවතින පොස්පරස් ද්‍රාව්‍යකරණය හරහා පසෙහි සාරවත්භාවය වැඩි දියුණු කිරීමට සමත්, දහයියා ඇසුරෙන් ලබාගත් ජෛව අඟුරු අනුකෘතියක් මත වෙසෙන නව්‍යකෘත්‍රිම ක්ෂුද්‍රජීවී සහ වාසී ප්‍රජාවක් වැඩි දියුණු කරන ලදී. ආයතනයෙහි දී සිදු කරනු ලැබූ හරිතාගාර පරීක්ෂාවක් මඟින් මෙම සංයෝගයෙහි වාණිජ මට්ටමින් භාවිත කිරීමේ හැකියාව තහවුරු කෙරිණි. අකාබනික පොහොර සමඟ ඒකාබද්ධව යෙදීමෙන් කෘත්‍රිම පොහොර භාවිතය 50% කින්අවම කිරීමට හැකියාව ලැබෙන බව මෙම ප්‍රතිඵල මඟින් පෙන්වාදී ඇත. අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ මෙම ජෛව පොහොර වාණිජකරණය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකිරීමට සැලසුම් කෙරේ.

- තේ වගාවේ පලිබෝධ පාලනය සඳහා පරිසර හිතකාමී කෘෂිරසායන ද්‍රව්‍ය වැඩිදියුණු කිරීම

  තේ පර්යේෂණ ආයතනය (TRI) සමඟ සිදුකරනු ලැබූ සහයෝගීතා පර්යේෂණ මත පදනම්ව පලිබෝධ නාශක දෙවර්ගයක් වැඩිදියුණු කිරීමට SLINTEC ආයතනය සමත් වී ඇත. ඒවා නම් shot-hole borer පාලනය සඳහා ප්‍රාචරිත Beauveria bassiana දිලීර බීජාණු මත පදනම් වූ තෙත්කල හැකි කුඩක් සහ බිබිලි අංගමාර රෝගය කළමනාකරණය කරගනු පිණිස නැනෝ-තෙලෝදයයි (hexaconazolenano-emulsion). SLINTEC ආයතනයේදී සිදු කරනු ලැබූ විද්‍යාගාර පරීක්ෂාවන්හි දී මෙන්ම තේ පර්යේෂණ ආයතනයේදී සිදු කරනු ලැබූ හරිතාගාර පරීක්ෂාවන්හිදී ද දිරිගන්වන සුළු ප්‍රතිඵල පෙන්නුම් කර ඇත. තේ පර්යේෂණ ආයතනය මඟින් ක්ෂේත්‍ර පරීක්ෂාවන් සැලසුම් කරමින් පවතින අතර එම ප්‍රතිඵලයන්හි සාර්ථකභාවය අනුව මෙම දැනුම ඒ පිළිබඳ උනන්දුවක් දක්වන සමාගම් වෙත වාණිජකරණය සඳහා ලබා දෙනු ඇත.

- සෙමෙන් මුදාහැරෙන නයිට්‍රජන් නැනෝ පොහොර

  යූරියා සමඟ hydroxyapatite (HA) නැනෝ අංශු ක්‍රියාකාරී වීමට සැලැස්වීමෙන් සෙමෙන් මුදාහැරෙන යූරියා පොහොර වර්ගයක් (ඝන සහ දියර ආකාරයෙන්) වැඩිදියුණු කිරීමට SLINTEC ආයතනය සමත්ව ඇති අතර ඒ සඳහා පේටන්ට් බලපත්‍රය ලබා ගෙන ඇත. මෙම නයිට්‍රජන් නැනෝ පොහොර මිශ්‍රණ හරහා යූරියා පරිභෝජනය 30% ක් ඉක්මවූ අගයකින් පහත හෙලීම අපේක්ෂා කෙරේ. මෙහි දියර ආකාර පොහොර වර්ගය, FertiMagic යන නාමය යටතේ සී/ස තුරු (පෞද්) සමාගම හරහා දැනට අලෙවිය අත්හදා බැලීම සිදුකෙරේ. SLINTEC හි දිනකට 50 kg ධාරිතාවක් සහිත නියාමක බලාගාරය භාවිතයෙන් නැනෝ පොහොර නිෂ්පාදනය සඳහා ජාතික විද්‍යා පදනම වෙතින් නිෂ්පාදන බලපත්‍රය ද, මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ද ලබාගැනීමට SLINTEC ආයතනය

සමත්ව ඇත. එළඹෙන කන්නය සඳහා ගොවීන් වෙත මෙම නැනෝ පොහොර වර්ගය නිෂ්පාදනය කර සපයාදීමට පෞද්ගලික පාර්ශ්වයක් හා කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවන් සිදු කෙරේ.

- මෙහෙවර හා බැඳුණු පර්යේෂණ

සමාලෝචිත කාල පරිච්ඡේදය තුල බාහිර අරමුදල් ඇසුරෙන් ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතීන්හි වත්මන් තත්ත්වය පහතින් දක්වා ඇත.

ව්‍යාපෘති නාමය	අරමුදල් සපයන ආයතනය	ව්‍යාපෘතිය සඳහා වැයවන වියදම ශ්‍රී.ලං.රු. (මිලියන)	වත්මන් තත්ත්වය
දේශීය			
පිළිකා නාශක කාරක සඳහා කෘත්‍රිම ජෛවීය විද්‍යා ප්‍රවේශයන්	ජාතික පර්යේෂණ සභාව(NRC)	5.2	ප්‍රධාන අන්වේෂක ඉල්ලා අස්වීම හේතුවෙන් ව්‍යාපෘතිය කොළඹ විශ්වවිද්‍යාලය වෙත පවරා දෙන ලදී.
